# සමාජ විද්‍යාව

## මූලික පිරිවෙණ

## ගුරු මාර්ගෝපදේශය

## 5 ශ්‍රේණිය

(2019 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ.)


පිරිවෙන් අධ්‍යාපන ශාඛාව
අධ්‍යාපන අමාත්‍යාංශය
ශ්‍රී ලංකාව

පිරිවෙන් අධ්‍යාපන ඒකකය
සිංහල භාෂා දෙපාර්තමේන්තුව
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය : www.nie.lk
විද්‍යුත් ලිපිනය : info@nie.lk

වෙබ් අඩවිය : www.pirivena.sch.lk
විද්‍යුත් ලිපිනය : Pirivena@moe.gov.lk



මුද්‍රණය හා බෙදාහැරීම අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

සමාජ විද්‍යාව

මූලික පිරිවෙණ

ගුරු මාර්ගෝපදේශය

5 ශ්‍රේණිය

ප්‍රථම මුද්‍රණය : 2020

ISBN 978 - 955 - 25 - 0577 - 5

© ජාතික අධ්‍යාපන ආයතනය

© පිරිවෙන් අධ්‍යාපන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය

පිරිවෙන් අධ්‍යාපන ශාඛාව

අධ්‍යාපන අමාත්‍යාංශය

ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය : www.pirivena.sch.lk

විද්‍යුත් ලිපිනය : pirivena@moe.gov.lk

පිරිවෙන් අධ්‍යාපන ඒකකය

සිංහල භාෂා දෙපාර්තමේන්තුව

භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය

ජාතික අධ්‍යාපන ආයතනය

ශ්‍රී ලංකාව

**වෙබ් අඩවිය** : www.nie.lk

**විද්‍යුත් ලිපිනය** : info@nie.lk

මුද්‍රණය

එස් ඇන්ඩ් එස් ප්‍රින්ටර්ස්

නො. 49, ජයන්ත වීරසේකර මාවත,

කොළඹ 10.

# අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ පණිවිඩය

ශ්‍රී ලාංකීය බෞද්ධ ජාතික අනන්‍යතාවයේ සංකේතය භික්ෂූන් වන්සේය. භික්ෂූන් වහන්සේගේ අධ්‍යාපනය කේන්ද්‍ර කර ගනිමින් සමස්ත ජාතියටම අධ්‍යාපනික මංපෙත විවර කර දුන් ජාතික පිරිවෙන් අධ්‍යාපනයට දුරාතීතයක් ඇත. අනුරාධපුර යුගයේ සිටම භික්ෂූන් වහන්සේගේ නායකත්වය යටතේ පිරිවෙන් අධ්‍යාපනය කෙතරම් සුහුඹුල්ව වැඩී ගියාද කිවහොත් විදේශිකයන් පවා මෙරටට පැමිණ අධ්‍යාපනය හදාළ බව පුරාවෘත්තවලින් පැහැදිලි වේ.

වර්තමානය වනවිට පාසැල් අධ්‍යාපනය හා සමාන පහසුකම් ලබමින් විහාරස්ථාන කේන්ද්‍ර කොටගත් පිරිවෙන් ආයතන අධ්‍යාපන අමාත්‍යාංශයේ නියාමනය යටතේ සිය අතීත උරුමයන් එලෙසින් ම ආරක්ෂා කරගනිමින් පවත්වා ගැනීමට ලැබීම අපගේ සතුටට කරුණකි.

පිරිවෙන් අධ්‍යාපනයට අවශ්‍ය පහසුකම් ලබා දෙමින් කාලීන අවශ්‍යතා සපුරා ගැනීමට සුදුසු වියත් යතිවර පරපුරක් හා උගත් විනයවත් ගිහි සමාජයක් බිහිකරලීම අපගේ පරම අභිලාෂය විය යුතුය. එයට ශක්තියක් වෙමින් 2018 නව විෂයමාලා සංස්කරණය යටතේ ඔබ අතට පත් කෙරෙන මෙම ගුරුමාර්ගෝපදේශය නව ඉගෙනුම් ක්‍රම ඔස්සේ ශිෂ්‍යයාට අවශ්‍ය දැනුම ලබාදීම සඳහා පරිවේණාචාර්යවරයාට ආධාරකයක් වනු ඇතැයි අපගේ විශ්වාසයයි. මෙය මැනවින් පරිශීලනය කර නිවැරදි අවබෝධයක් ශිෂ්‍ය ප්‍රජාවට ලබාදීම පරිවේණාචාර්යවරුන් වන ඔබගේ වගකීමක් සේ දකිමි.

මෙම භාරදූර කාර්ය සම්පූර්ණ කිරීම සඳහා ඇපකැපවූ පිරිවෙන් අධ්‍යාපන ශාඛාවට, ජාතික අධ්‍යාපන ආයතනයට හා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවට මාගේ හෘදයාංගම ස්තූතිය පළකරමි.

**එන්.එච්.එම්. චිත්‍රානන්ද**
අධ්‍යාපන ලේකම්

## අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය

අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් ශාඛාව මගින් සම්පාදනය කර තිබූ විෂය නිර්දේශයේ අන්තර්ගතය සංශෝධනය කිරීමෙන් පසු අදාළ නිපුණතා සාක්ෂාත් වන පරිදි පාඩම් සැලසුම් කිරීම සඳහා ජාතික අධ්‍යාපන ආයතනයේ අභිනවයෙන් පිහිටුවන ලද පිරිවෙන් අධ්‍යාපන ඒකකය මගින් මෙම ගුරු මාර්ගෝපදේශය සම්පාදනය කර ඇත.

පාසල් පද්ධතියේ ක්‍රියාත්මක වන පරිදි ගුරු මාර්ගෝපදේශ, පිරිවෙන් ගුරුවරුන්ට ද ලබා දී ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය උසස් මට්ටමකට ගෙන ඒම සඳහා සැලසුම් කිරීම අධ්‍යාපන අමාත්‍යාංශය ගත් යහපත් තීරණයකි. ඒ වෙනුවෙන් අපගේ ස්තුතිය හිමි වන අතර ගුරු මාර්ගෝපදේශ සම්පාදනය කිරීම ජාතික අධ්‍යාපන ආයතනයට පැවරීමෙන් එම තීරණය යථාර්ථයක් බවට පත් විය.

සාම්ප්‍රදායික ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට පමණක් සීමා නො වී නව ඉගෙනුම් ඉගැන්වීම් ප්‍රවේශ පිළිබඳ ව යොමු වීමට මෙම ගුරු මාර්ගෝපදේශයේ අන්තර්ගත උපදෙස් පිරිවෙන් ගුරුවරුන්ට උපකාර වනු ඇත. ඒ අනුව නව ප්‍රවේශ හා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද පිළිබඳ ව ගවේෂණය කර තම පාඩම් සැලසුම් කර ගැනීමෙන් ඉහළ ගුණාත්මක ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියක නිරත වීමට හැකියාව ලැබේ.

මෙහි අන්තර්ගතය ප්‍රධාන වශයෙන් කොටස් දෙකකින් සමන්විත වේ. එනම් විෂය නිර්දේශය සහ එහි නිපුණතා හා නිපුණතා මට්ටම් සාක්ෂාත් කර ගැනීමට උපකාර වන ක්‍රියාකාරකම් සංග්‍රහය යි. එක් එක් නිපුණතාවට අදාළ නිපුණතා මට්ටම් ආවරණය වන ආකාරයට ඉගෙනුම් පල සාක්ෂාත් වන පරිදි ඒ සඳහා වෙන් කර ඇති කාලය ද සැලකිල්ලට ගෙන ක්‍රියාකාරකම් සමූහය නිර්මාණය කර ඇත. ක්‍රියාකාරකම් පදනම් කර ගෙන නව ක්‍රියාකාරකම් නිර්මාණය කර ගැනීමට ද මෙමගින් අවකාශය ලැබෙනු ඇත.

ඉතා කෙටි කාලයකින් මූලික පිරිවෙන් විෂයමාලවෙහි සියලු විෂයයන් සඳහා ගුරු මාර්ගෝපදේශ සකස් කිරීමට ශාස්ත්‍රීය නායකත්වය දුන් ජාතික අධ්‍යාපන ආයතනයේ පිරිවෙන් අධ්‍යාපන ඒකකයටත් ජාතික අධ්‍යාපන ආයතනයේ විෂය විශේෂඥයන්ට මෙන් ම බාහිර සම්පත් දායකයන්ටත් මාගේ ස්තුතිය පිරිනැමේ.

**ආචාර්ය සුනිල් ජයන්ත නවරත්න.**
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය

# පෙරවදන

පිරිවෙන් ශ්‍රී ලාංකීය අධ්‍යාපනයේ කේන්ද්‍රස්ථානයකි. මිහිඳු මහ රහතන් වහන්සේ ශ්‍රී ලංකා ධරණීතලය තුළ ස්ථාපිත කළ උතුම් සම්බුද්ධ ශාසනය යුග යුග පසුකර නොයෙක් බාධා හමුවේ ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාව වෙත අවිච්ඡින්නව දායාද කරමින් ධර්මඥානයෙන් පිරිපුන් යතිවර පරපුරක් හා දෑ හිතකාමී ජන සමාජයක් පිරිවෙන මගින් නිර්මාණය කිරීමට භික්ෂූන් වහන්සේලා සමත් වූහ.

අතීතයේ පටන් ම කාලීන අවශ්‍යතා සපුරාලමින් හා සාම්ප්‍රදායික අනන්‍යතාව ආරක්ෂාකර ගනිමින් ගිහි පැවිදි සමාජයේ අභිවෘද්ධිය වෙනුවෙන් පිරිවෙන මගින් සිදු වූ මෙහෙය අනුපමේය ය. සම්භාව්‍ය අධ්‍යාපනය ආරක්ෂාකර ගනිමින් පාරම්පරික ශාසනික ක්‍රමවේද හා නූතන අධ්‍යාපන රටා මනාව සම්මිශ්‍රණය කර වර්තමානයේ පිරිවෙන් අධ්‍යාපනය ලබන ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාගේ සහ ගිහි සිසුන්ගේ අවශ්‍යතා සැලකිල්ලට ගෙන අද වන විට නිපුණතා පාදකව නව විෂයමාලාවක් ඔස්සේ අවශ්‍ය දැනුම ලබාදීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවන් අධ්‍යාපන ශාඛාව දරන ප්‍රයත්නය අතිශයින් අගය කරමු. එයට ශක්තියක් වෙමින් සියලු ම විෂය සඳහා නව විෂය නිර්දේශ මුද්‍රණය කරවීම හා මූලික පිරිවෙන සඳහා පෙළපොත් 54ක් වාර්ෂික ව මුද්‍රණය කර ලබා දීම මගින් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව ද අවශ්‍ය පහසුකම් සලසා ඇත.

නිපුණතා පාදකව නව විෂය මාලාව සඳහා ගුරු මාර්ගෝපදේශ සැකසීම පිරිවෙන් අධ්‍යාපනය වෙනුවෙන් පළමු වරට සිදුවන උසස් ක්‍රියාදාමයකි. ජාතික අධ්‍යාපන ආයතනය හා පිරිවෙන් අධ්‍යාපන ශාඛාව එක්ව සම්පාදනය කළ මෙම ගුරු මාර්ගෝපදේශ, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව මගින් මුද්‍රණය කර ඔබ අතට පත් කිරීමට ලැබීම සතුටට කරුණකි. මෙම කාර්යය සඳහා දායකත්වය සැපයූ උපදේශක, සංස්කාරක, ලේඛක මණ්ඩල සාමාජික සියලු දෙනාට ද අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට ද මගේ ස්තුතිය පිරිනමි. පිරිවෙන් අධ්‍යාපනයේ ඉදිරි දියුණුව ද පතමි.

**පී. එන්. අයිලප්පෙරුම**
අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
ඉසුරුපාය
බත්තරමුල්ල

## නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය

නූතන ලාංකීය පිරිවෙන් ක්ෂේත්‍රයෙහි මෙම ගුරු මාර්ගෝපදේශ බිහිවීම ඓතිහාසික අවස්ථාවක් බව මම පළමු ව සඳහන් කරමි. ජාතික අධ්‍යාපන ආයතනයත්, අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් අංශයත් සුසංයෝග වී මෙම ගුරු මාර්ගෝපදේශ සම්පාදනය වීම ඊට හේතුව යි.

ශ්‍රී ලංකාවේ සාමාන්‍ය පාසල් අධ්‍යාපනය සඳහා විෂය නිර්දේශ, ගුරු මාර්ගෝපදේශ, ගුරු පුහුණු, අධ්‍යාපන කළමනාකරුවන් පුහුණු කිරීම සහ අධ්‍යාපන පර්යේෂණ සිදු කිරීමේ ව්‍යවස්ථාපිත බලය ඇති එක ම ආයතනය 1985 අංක 28 දරන පනතින් ස්ථාපිත වූ ජාතික අධ්‍යාපන ආයතනය යි. එහෙත් මේ වන විට වසර 2325ක ඉතිහාසයක් ඇති මහා විහාරයීය අධ්‍යාපන සම්ප්‍රදායේ කේන්ද්‍රස්ථානය වූ 'පිරිවෙණ'ට ව්‍යවහාර වර්ෂ 2017 තෙක් ජාතික අධ්‍යාපන ආයතනයේ ඍජු දායකත්වයක් නො තිබිණ.

පිරිවෙන් අංශයක්/දෙපාර්තමේන්තුවක් නොමැති ජාතික අධ්‍යාපන ආයතනයක් තිබිය හැකි දැයි නිතර අපව පෙළන ලද කරුණකි. මෙයට විසඳුමක් ලබා ගැනීම සඳහා අපට දායක වීමට හැකි වූයේ වර්තමාන අතිගරු ජනාධිපතිතුමන්, ගරු අධ්‍යාපන ඇමතිතුමන්, 2018 වර්ෂයේ කටයුතු කළ අධ්‍යාපන ලේකම්තුමන් එවකට පිරිවෙන් අධ්‍යක්ෂ ස්වාමීන්ද්‍රයාණන්, ජාතික අධ්‍යාපන ආයතනයේ වර්තමාන අධ්‍යක්ෂ ජනරාල්තුමිය සහ ජාතික අධ්‍යාපන ආයතනයේ ආයතන සභාවේ පූර්ණ අනුග්‍රහය හා ආශිර්වාදය ලැබීමෙනි.

ඒ අනුව අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2017 ජනවාරි මස 31 දින රැස් වූ ජාතික බෞද්ධ බුද්ධි බල මණ්ඩලයේ තීරණය පරිදි සහ ජාතික අධ්‍යාපන ආයතනයේ ආයතන සභාවේ 2017.03.16 දිනැති 412.5.12 IM No.5157 තීරණය පරිදි ජාතික අධ්‍යාපන ආයතනයේ භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨයේ සිංහල භාෂා දෙපාර්තමේන්තුවට අයත් ව පිරිවෙන් ඒකකය ස්ථාපිත විය.

එහි ප්‍රතිඵලයක් ලෙස පිරිවෙන් ගුරු මාර්ගෝපදේශ, පිරිවෙන් ගුරු පුහුණුව සිදු කිරීමේ කාර්යයන්ට දායක වීමට ජාතික අධ්‍යාපන ආයතනයට ඍජුව හැකි විය. ජාතික අධ්‍යාපන ආයතනය සතු ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද පිළිබඳ පළපුරුදු බව, පර්යේෂණ, අත්දැකීම්, තාක්ෂණික ප්‍රාගුණ්‍යය සුසංයෝග කර ගනිමින් පිරිවෙන් පන්ති කාමරයෙහි අවදිමත් බවක් ඇති කිරීමට ලද මෙම අවස්ථාව මහාර්ඝ භාග්‍යයකි. අප්‍රමාණ සතුටකි.

පිරිවෙන්හි ගුරු භවතුන් මෙම ගුරු මාර්ගෝපදේශ පරිශීලනයෙන් පිරිවෙන් පන්ති කාමරය ශිෂ්‍ය මිත්‍රභාවයෙන් ප්‍රබෝධාත්මකව ඉහළ සාධනයකට පිරිවෙන් අධ්‍යාපනය නංවාලීමට කටයුතු කරන ලෙස ගෞරවයෙන් ආයාචනා කරමි. මෙම ගුරු මාර්ගෝපදේශ සම්පාදනයට දායක වූ ජාතික අධ්‍යාපන ආයතනයේ සිංහල භාෂා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ, පිරිවෙන් ඒකක ප්‍රධාන සහ සියලු විද්වතුනට ගෞරවය පිරිනමමි.

**ආචාර්ය පූජ්‍ය මාඹුල්ගොඩ සුමනරතන හිමි**
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය

## පිරිවෙන් අධ්‍යාපන අධ්‍යක්ෂගේ පණිවිඩය

පෙරදිග ලෝකයේ පැවති ඉතා ප්‍රශස්ත අධ්‍යාපන ආයතන අතර පිරිවෙනට හිමිවන්නේ සුවිශේෂ ස්ථානයකි. මෙම අධ්‍යාපන ආයතන ක්‍රමයෙන් වැඩී ගොස් ජාත්‍යන්තර විශ්වවිද්‍යාල මට්ටමට සංවර්ධනය වූ බව නොරහසකි. ශ්‍රී ලංකීය භික්ෂු අනන්‍යතාව හා දේශීය ජන විඥානය පුබුදුවාලීමට එදා සිට අද දක්වාම පිරිවෙන් අධ්‍යාපනය සමත් වී ඇත. අෂ්ට මූලායතන කේන්ද්‍ර කරගත් අතීත පිරිවෙන් අධ්‍යාපනය ආධ්‍යාත්මික ගුණයෙන් මෙන්ම ධර්මඥානයෙන්ද හෙබි පරපුරක් මෙරටට දායාද කළේ ය.

නූතන පිරිවෙන් අධ්‍යාපනය ජාතික අධ්‍යාපන ප්‍රවාහයේ තවත් එක් සුවිශේෂී පැතිකඩකි. පර්යාප්ති, ප්‍රතිපත්ති, ප්‍රතිවේධ යන ත්‍රිවිධශාසනෝන්තිය උදෙසා අවශ්‍ය භික්ෂූන් වහන්සේ ජාතියට දායාද කිරීම හා උගත් වියත් බුද්ධිමත් පිරිසක් බිහිකිරීම පිරිවෙන් අධ්‍යාපනයේ ප්‍රමුඛ අභිලාෂය යි.

සෞභාග්‍යමත් දේශයක් කරා යන මේ ගමනේදී ආකල්ප සම්පත්තියෙන් යුතු ප්‍රජාවක් නිර්මාණය කිරීමට මග පෙන්වීම භික්ෂූන් වහන්සේගේ ප්‍රබල වගකීමකි. ඒ සඳහා උන්වහන්සේලා අවශ්‍ය දැනුම් සම්භාරයක් පෝෂිත කරවීමට පිරිවෙන පෙරටත් වඩා ශක්තිමත්ව ක්‍රියාත්මක විය යුතුය.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය යාවත්කාලීන කරමින් නව විෂය නිර්දේශයන් යටතේ ඉදිරි පියවර රාශියක් තැබීමට අපට හැකිවීම සතුටට හේතුවකි. විවිධ උපාය මාර්ගයන් ඔස්සේ ඉදිරි අනාගත පිරිවෙන් අධ්‍යාපනය ශක්තිමත් කිරීමට අප ගන්නා උත්සාහයේදී ඔබ අතට පත් කෙරෙන නව ගුරු මාර්ගෝපදේශය ශිෂ්‍ය සාධනය ඉහළ මට්ටමකට ඔසවා තැබීමට ප්‍රබල ගුණාත්මක යෙදවුමක් වනු ඇතැයි මාගේ විශ්වාසයයි. සාම්ප්‍රදායික ඉගෙනුම් ක්‍රම මෙන් ම නූතන ඉගෙනුම් ක්‍රමවේද පිළිබඳව ද පරිවේණාචාර්‍යවරුන්ගේ දැනුම යාවත්කාලීන කරගනිමින් ක්‍රියාකිරීම ඔබ සතු වගකීමක් බව ද අවධාරණය කරමි. ගුරු මාර්ගෝපදේශය මැනවින් අධ්‍යයනය කර ඔබගේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට මෙය මැනවින් භාවිත කර ගන්නා ලෙසද සිහිපත් කරමි.

මෙවන් ගුරුමාර්ගෝපදේශයක් සකස්කර ඔබ අතට පත්කිරීම ඉතා භාරධූර ක්‍රියාවලියකි. මේ සඳහා මූලිකව ක්‍රියාකළ පිරිවෙන් අධ්‍යාපන ශාඛාවේ විෂය සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්ටත්, ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්තුමියටත්, නියෝජ්‍ය අධ්‍යක්ෂ හිමියන්තේ, පිරිවෙන් ශාඛා ප්‍රධානී හිමියන් හා අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්තුමන් ප්‍රධාන කාර්ය මණ්ඩලයට ද පිරිවෙන් අධ්‍යාපන ශාඛාව වෙනුවෙන් ගෞරවනීය ප්‍රසංසාව පිරිනමමින් ආශිර්වාදය මෙසේ පළකරමි.

**පූජ්‍ය වටිනාපහ සෝමානන්ද හිමි**
පිරිවෙන් අධ්‍යාපන අධ්‍යක්ෂ
පිරිවෙන් අධ්‍යාපන ශාඛාව
අධ්‍යාපන අමාත්‍යාංශය

## ගුරු මාර්ගෝපදේශ සම්පාදක මණ්ඩලය

**උපදේශකත්වය**
**හා අනුමැතිය** : ජාතික අධ්‍යාපන ආයතනය සහ පිරිවෙන් අධ්‍යාපන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය

**මෙහෙයවීම** : පූජ්‍ය වටිනාපහ සෝමානන්ද හිමි
අධ්‍යක්ෂ ( පිරිවෙන් )
පිරිවෙන් අධ්‍යාපන ශාඛාව
අධ්‍යාපන අමාත්‍යාංශය

ආචාර්ය සුනිල් ජයන්ත නවරත්න
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය

**අධීක්ෂණය** : ආචාර්ය පූජ්‍ය මාඹුල්ගොඩ සුමනරතන හිමි
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය

එම්. ආර්. ඩබ්ලිව්. මද්දුම
අධ්‍යක්ෂ
සිංහල භාෂා දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය

**සම්බන්ධීකරණය** : පූජ්‍ය කුකුරම්පොල ඤාණවිමල හිමි
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
ඒකක ප්‍රධාන
පිරිවෙන් අධ්‍යාපන ඒකකය
ජාතික අධ්‍යාපන ආයතනය

පූජ්‍ය කෙහෙල්වල විපස්සි හිමි
සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ
පිරිවෙන් අධ්‍යාපන ශාඛාව
අධ්‍යාපන අමාත්‍යාංශය

**විෂය නියාමනය** : ගමගේ වික්‍රම් සම්පත්
සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (වෛකල්පික විෂය)
පිරිවෙන් අධ්‍යාපන ශාඛාව
අධ්‍යාපන අමාත්‍යාංශය

**විෂය විශේෂඥ** :
**උපදේශනය**
ඒ. කේ. ජී. ජයසිංහ
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය (විශ්‍රාමික)
රුහුණු විශ්වවිද්‍යාලය

පූජ්‍ය උඩුගම්පොළ ගුණානන්ද හිමි
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුරය

**ලේඛක මණ්ඩලය** : ඩබ්. ඒ. කේ. සුදර්ශනී
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය

ගමගේ වික්‍රම් සම්පත්
සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ
පිරිවෙන් අධ්‍යාපන ශාඛාව
අධ්‍යාපන අමාත්‍යාංශය

පූජ්‍ය ඇලදුවේ පඤ්ඤාතිලක හිමි
උප පරිවේණාධිපති
කො/සුනේත්‍රාදේවී පිරිවෙණ, පැපිලියාන

පූජ්‍ය ගල්ගමුවේ ගුණරතන හිමි
පරිවේණාචාර්ය
ශ්‍රී රතනපාල පිරිවෙණ,
මීගහගොඩ, පැල්මඩුල්ල

පී. ජී. ජයන්ත ආනන්ද
පරිවේණාචාර්ය
කෑ/ශ්‍රී විද්‍යාමංගල මහ පිරිවෙණ
මංගලගම, මොළගොඩ

එම්. ඩී. අකිල රත්නකුමාර
පරිවේණාචාර්ය
කු/ප්‍රඥානන්ද මූලක පිරිවෙණ
මාහරගම, ගිරිඋල්ල

පූජ්‍ය උඩුගම්පොල ගුණානන්ද හිමි
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුරය

පූජ්‍ය කෙහෙල්වල විපස්සි හිමි
සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ
පිරිවෙන් අධ්‍යාපන ශාඛාව
අධ්‍යාපන අමාත්‍යාංශය

**භාෂා සංස්කරණය :**

යූ. කේ. රත්නායක
සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ
පිරිවෙන් අධ්‍යාපන ශාඛාව
අධ්‍යාපන අමාත්‍යාංශය

**සෝදුපත් කියවීම :**

පූජ්‍ය රත්මලවිට චන්දනන්ද හිමි
සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (ත්‍රිපිටක ධර්මය)
පිරිවෙන් අධ්‍යාපන ශාඛාව
අධ්‍යාපන අමාත්‍යාංශය

**පරිගණක වදන් :**

එල්. ඒ. සඳුනි නිලංකා පත්මසිරි
පරිගණක අංශය, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

**පිටකවර නිර්මාණය :**

තරිඳු හසංග
සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (පරිගණක විද්‍යාව),
පිරිවෙන් අධ්‍යාපන ශාඛාව,

# හැඳින්වීම

දර්ශනය, නීතිය, ආගම, ආර්ථික විද්‍යාව, මනෝ විද්‍යාව, දේශපාලන විද්‍යාව ආදී වශයෙන් වන අනෙකුත් සියලු සමාජීය විද්‍යා ගණයට අයත් විෂයයන් බිහි වී භාවිතයට ගැනෙමින් පැවති ශාස්ත්‍රීය ලෝකයට, තව දුරටත් පුරවා ගත යුතු ඉතා වැදගත් හිදැසක් ඇති බව කාර්මීකරණයත් සමග ම ගොඩ නැගෙන නව සමාජ පරිසරයෙහි උද්ගත වන්නට විය. 19 වැනි සියවසේ මැද භාගය වන විට එකී අවශ්‍යතාව ඉතාමත් දැඩිව දැනෙන්නට විය. ඒ මත ගොඩ නැගුණු දිගු කාලීන සංවාදයේ ප්‍රතිඵලයක් ලෙස මෙකී අඩුව පුරවාලීම සඳහා යෝග්‍ය විෂයයන් ලෙස යෝජනා රැසක් ඉදිරිපත් වූයේ ය. එහෙත් අවසානයේ ඒ අතරින් ශාස්ත්‍රීය ලෝකය තුළ පිළිගැනීමට ලක් වූයේ ප්‍රංශ ජාතික දාර්ශනිකයෙකු වූ ඔගස්ට් කොම්ට් විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව යි. ඒ වන විට යුරෝපාකරයේ අලුතින් බිහි වූ කාර්මික හා නාගරික සමාජ ඇසුරෙහි උද්ගත වෙමින් පැවති විවිධාකාර ආගන්තුක අභියෝග තේරුම් ගැනීමට වඩාත් යෝග්‍ය නව විෂය ලෙස ඔගස්ට් කොම්ට් විසින් යෝජනා කරන ලද්දේ "සමාජවිද්‍යාව" (Sociology) යන්න යි. මනුෂ්‍ය ශරීරය අධ්‍යයනය කිරීම සඳහා ජීවවිද්‍යාව (Biology) යම් සේ වැදගත් වන්නේ ද ඒ තරමට ම සමාජය නමැති සිරුර අධ්‍යයනය කිරීම සඳහා සමාජ විද්‍යාව වැදගත් වන බව එහි දී කොම්ට් විසින් පෙන්වා දෙන ලදි.

මිනිසාගේ සමස්ත සමාජ චර්යාව විද්‍යාත්මකව අධ්‍යයනය කරන විෂය සමාජ විද්‍යාව යි. ඒ අනුව කවර හෝ සමාජයක් පිළිබඳ පරිපූර්ණ අධ්‍යයනයක යෙදෙන්නට හැකි එක ම විෂය වන්නේ සමාජ විද්‍යාව බව කොම්ට්ගේ තර්කය වන්නේ ය. සමාජ විද්‍යාව නමැති විෂයයේ සැබෑ කාර්යභාරය දෙස බලන විට කොම්ට් විසින් ඉදිරිපත් කරන ලද මෙම තර්කය බැහැර කළ නොහැකි වේ.

සමාජීය සත්ත්වයෙකු ලෙස සෑම මනුෂ්‍යයෙකුට ම තමා සාමාජිකත්වය දරන සමාජය පිළිබඳ මෙන් ම එයින් බැහැර ලෝක සමාජය පිළිබඳව ද මනා අවබෝධයක් තිබිය යුතු වේ. එසේ නොවන තැන සමාජයේ පාර්ශ්වයෙන් සාමාජිකයාට ලබා දිය යුතු සෙවණ හා රැකවරණය නොලැබෙන්නට හෝ අඩුපාඩු සහගත වන්නට පුළුවන. අනෙක් අතට සාමාජිකයාගේ පාර්ශ්වයෙන් සමාජය උදෙසා ඉටු විය යුතු අනුපමේය මෙහෙවර මගහැරී යනු නොඅනුමාන ය. මේ අනුව පැහැදිලි වන්නේ සාමාජිකයා සමාජය මත මෙන් ම අනෙක් අතට සමාජය සාමාජිකයා මත රඳා පවතින බව යි. සමාජයක් යනු මෙම අන්‍යෝන්‍ය ගනුදෙනුවේ අවසන් ප්‍රතිඵලය යි. මෙය සර්ව විශ්වීය හා සර්ව කාලීන වශයෙන් එක හා සමානව වලංගු යථාර්ථයකි. කවර හෝ සමාජයක ජීවත් වන සෑම සාමාජිකයෙකු ම මෙම යථාර්ථය පිළිබඳ මනා අවබෝධයකින් යුක්ත විය යුතු ය. සමාජයේ මෙන් ම සාමාජිකයාගේ ප්‍රගමනය යථාර්ථයක් බවට පත් වන්නේ එවැනි අවබෝධයකින් යුක්ත වන්නේ නම් පමණි. මේ අනුව පිරිවෙන් අධ්‍යාපනය සඳහා යොමු වන සිසුනට ලබා දෙනු ලබන සමාජවිද්‍යා විෂය දැනුම පැවිදි හෝ ගිහි ප්‍රභේදයකින් තොරව කෙතරම් වැදගත් වන්නේ ද යන්න මනාව තහවුරු වේ.

ඉහත දක්වන ලද කෙටි හැඳින්වීම දෙස අවධානයෙන් බලන විට, සමාජවිද්‍යා විෂය ක්ෂේත්‍රය කෙතරම් සංකීර්ණ එකක් වන්නේ ද යන්න තේරුම් ගැනීමට අපහසු නොවනු ඇත. මෙම ගුරු මාර්ගෝපදේශය සම්පාදනය කිරීමෙන් අපේක්ෂා කරනු ලබන්නේ, පස්වන ශ්‍රේණියේ සිසුනට ඉගැන්විය යුතු විෂය කරුණු නිර්දේශ කිරීම හා එහි දී ගුරුවරයා කවර මට්ටමකට සීමා විය යුතු ද යන්න නිශ්චය කර දීම ය. පාඩම් 7ක් යටතේ සැලසුම් කරන ලද මෙම මාර්ගෝපදේශය මගින් ඉගැන්විය යුතු විෂය කරුණු නිර්දේශ කරන අතර ම ශිෂ්‍යයා මෙන් ම ගුරුවරයා ද ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී සක්‍රීය සාමාජිකයෙකු බවට පත් කිරීමට පොළඹවනු ලැබේ. ශිෂ්‍යයාට වුවමනා දැනුම සම්පාදනය කර දීම සඳහා ගුරුවරයාට ද නිරතුරුව සිය විෂය දැනුම යාවත්කාලීන කර ගැනීමට සිදු වේ. එමෙන් ම නිර්දේශිත ආකෘතියට අනුව ඉගැන්වීමෙහි නියැලෙන ගුරුවරයා ද රාජකාරිමය ආතතියෙන් තොර, විවිධත්වයෙන් හෙබි අතිශය තෘප්තිමත් සමාජ මෙහෙවරක යෙදෙන්නෙකු බවට පත් වනු ඇත. එහි අවසන් ප්‍රතිඵලය ලෙස වර්තමානයට වඩා සශ්‍රීක ගුරු පරපුරක් අනාගතයේ දී අපේක්ෂා කළ හැකි බවට පුරෝකථනය කිරීමට ද අවකාශයක් ඇත. විෂයයෙහි සක්‍රීය භූමිකාවක් රඟ දක්වන ගුරුවරයා පර්යේෂණාත්මක ලිපි ලේඛන මෙන් ම පොත් පත් ද සම්පාදනය කිරීමට පෙලඹෙනු ඇත.

# ගුරු මාර්ගෝපදේශය පරිශීලනය කිරීම සඳහා උපදෙස්

පිරිවෙන් අධ්‍යාපනය යටතේ සමාජ විද්‍යාව විෂය ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය විධිමත් කිරීම සඳහා ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය හඳුන්වා දීම පිරිවෙන් අධ්‍යාපන කටයුතු වඩාත් කාර්යක්ෂම කිරීමේ ඉදිරි පියවරක් ලෙස දකිමි. මෙහි දී නිපුණතා පාදක අධ්‍යාපන ක්‍රියාවලියකට අවතීර්ණ වීම ද තවත් විශේෂ පියවරකි.

විෂය අන්තර්ගතයට අදළ නිපුණතා සැලසුම් කර ඇත. එහි දී ප්‍රධාන නිපුණතාවයක් කරා ළඟා වීමට හැකි වන පරිදි නිපුණතා මට්ටම්වලට පෙළගස්වනු ලැබ ඇත. එමෙන් ම ඒ සඳහා පාදක වන පාඩම හා සම්බන්ධ ක්‍රියාකාරකම් ද හඳුන්වා දී ඇත. එමගින් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී ගුරුවරයාට නිවැරදි මග පෙන්වීම කිරීමට ද ශිෂ්‍යයට තම සාධනීය මට්ටම කරා ළඟාවීමට ද වඩාත් පහසු වනු ඇත.

වඩා කාර්යක්ෂම ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියක අග්‍රඵලය වන්නේ දැනුම, කුසලතා, ආකල්ප හා ජීවන පුරුදුවලින් පිරි පුරවැසියෙකු බිහි වීම ය. නිපුණතාවක් ලෙස අප අපේක්ෂා කරනුයේ එකී දැනුම, කුසලතා, ආකල්ප හා ජීවන හුරුපුරුදු ඇති කර ගැනීමයි. ඒ අනුව නිපුණතා මට්ටමට එළඹීම සඳහා ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපන සංකල්පය පෙරටු කර ගනිමින් පාඩම් සැලසුම් කිරීමට ද අවධානය යොමු කර ඇත. මෙහි දී සාකච්ඡා, කණ්ඩායම් ක්‍රියාකාරකම්, ගවේෂණය, විවාද, කථන අවස්ථා ආදි ඉගෙනුම් ක්‍රම භාවිතයෙන් පාඩම් අරමුණු ඉටු කර ගැනීමට අවශ්‍ය පරිදි මග පෙන්වා ඇත.

ඇගයීම හා තක්සේරුකරණය යටතේ අපේක්ෂිත මට්ටම කරා ශිෂ්‍යයාට ළඟා වීමට මෙන්ම ගුරුවරයාට පරීක්ෂා කර බැලීමට ද ඉඩ සලසා දී ඇත.

මේ අනුව මෙම ගුරු මාර්ගෝපදේශය නිපුණතා පාදකව, ශිෂ්‍ය කේන්ද්‍රීය ක්‍රමවේද ඇසුරින්, වඩාත් ඵලදායී මෙන් ම කාර්යක්ෂම ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියක් සඳහා සැලසුම් කර ඇත.

මෙම විෂය නිර්දේශය යාවත්කාලීන කරනු ලැබ ඇති හෙයින් ඇතැම් පාඩම් සඳහා අවශ්‍ය විෂය කරුණු පෙළපොතෙහි ඇතුළත්ව නැත. එහෙයින් එම විෂය කරුණු ඇමුණුම් ලෙස මෙහි ඇතුළත් කර ඇත. මෙතැන් සිට පවත්වනු ලබන පරීක්ෂණවලදී එකී විෂය කරුණු ද සැලකිල්ලට ගෙන ප්‍රශ්න පත්‍ර සකසනු ලැබේ. එහෙයින් පන්ති කාමරයේ දී එකී විෂය කරුණු ද ඉගැන්වීමට ගුරුවරයා සැලකිලිමත් විය යුතු ය.

- විෂයමාලා කමිටුව -

## පටුන


- අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ පණිවිඩය III
- අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය IV
- පෙරවදන V
- නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය VI
- පිරිවෙන් අධ්‍යක්ෂගේ පණිවිඩය VII
- ගුරු මාර්ගෝපදේශක සම්පාදක මණ්ඩලය VIII - IX
- හැඳින්වීම X
- ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස් XI
- සමාජ විද්‍යාව 5 ශ්‍රේණිය - වාර නියමය XIII
- විෂය නිර්දේශය - 5 ශ්‍රේණිය XIV- XXXII
- ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස් XXXIII

1. සමාජ විද්‍යාව හැඳින්වීම 01 - 16
2. සමාජ පරිණාමය 17 - 31
3. සංස්කෘතිය 32 - 44
4. සාමාජිකයා හා සමාජය 45 - 57
5. සමාජ පාලනය 58 - 67
6. සමාජ ගැටලු 68 - 79
7. සමාජ අධ්‍යයනය කිරීම සඳහා විද්‍යාත්මක ප්‍රවේශයක් 80 - 90

## සමාජ විද්‍යාව 5 ශ්‍රේණිය - වාර නියමය

| වාරය | නිපුණතා මට්ටම | කාලච්ඡේද |
|---|---|---|
| I | 1.1, 1.2, 1.3, 1.4<br>2.1, 2.2, 2.3, 2.4, 2.5 | 28 |
| II | 3.1, 3.2, 3.3. 3.4<br>4.1, 4.2, 4.3, 4.4<br>5.1, 5.2, 5.3 | 24 |
| III | 6.1, 6.2, 6.3,<br>7.1, 7.2, 7.3, 7.4 | 24 |

# සමාජ විද්‍යාව

## විෂය නිර්දේශය

## 5 ශ්‍රේණිය

(2018 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ.)

## පිරිවෙන් අධ්‍යාපනයේ පරමාර්ථ හා අරමුණු

2. (අ) භික්ෂූන් වහන්සේලාට, සහ

(ආ) පිරිවෙනක පවත්වනු ලබන අධ්‍යයන පාඨමාලාවක් හැදෑරීමට කැමැත්තෙන් සිටින්නා වූ ද බෞද්ධ පරිසරයක ස්වකීය අධ්‍යාපනය ලැබීමට අපේක්ෂා කරන්නා වූ ද වයස අවුරුදු දහහතර ඉක්ම වූ ගිහි පිරිමි ශිෂ්‍යයන්ට අධ්‍යාපන පහසුකම් සැලසීම පිරිවෙන් අධ්‍යාපනයේ අරමුණු වන්නේ ය.

3. (අ) පරියත්ති, පටිපත්ති, පටිවේධ යන ත්‍රිවිධ ශාසනයේ ආරක්ෂාව හා අභිවෘද්ධිය කෙරෙහි භික්ෂූන් වහන්සේලා අතර උනන්දුවක් ඇති කිරීම.

(ආ) සැරියුත් මහ මුගලන් තෙර පරපුරෙන් පැවත එන සඟ පරපුර අවිච්ඡින්න ව පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය විනය, ත්‍රිපිටක ඥානය, ධර්ම ගරුක බව භික්ෂූන් වහන්සේලා අතර ඇති කිරීම.

(ඇ) දේශීය සහ විදේශීය ධර්මදූත මෙහෙයෙහි මෙන් ම භික්ෂූන් වහන්සේලාට යෝග්‍ය වෙනත් සේවාවන්හි නිරත වීම සඳහා අවශ්‍ය ප්‍රායෝගික දැනුම සඳහා ශික්ෂණයක් දීම, සහ

(ඈ) බෞද්ධ දර්ශනය, බෞද්ධ සංස්කෘතිය, බෞද්ධ ඉතිහාසය, සිංහල, පාලි, සංස්කෘත ඇතුළු භාෂාන්තර හා විෂයාන්තර පිළිබඳ ගැඹුරු දැනීමක් ලබා ගැනීම සඳහා භික්ෂූන් වහන්සේලාට පහසුකම් සලසා දීම, පිරිවෙන් අධ්‍යාපනයේ පරමාර්ථ වන්නේ ය.

**(1979 අංක 64 දරන පිරිවෙන් අධ්‍යාපන පනත)**

## ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපනය සඳහා වූ ජාතික පොදු අරමුණු

(I) සෑම (ළමයෙකුටම) දෙනාටම පාසල් අධ්‍යාපනයට ඇති සාර්ව සහ සමාන අයිතිවාසිකම් තහවුරු කිරීම.

(II) සංස්කෘතික විවිධත්වය හඳුනා ගනිමින් ජාතික සහජීවනය පෝෂණය කිරීම, ජාතික අඛණ්ඩතාව සහ ජාතික සමගිය වර්ධනය කිරීමෙන් මව්බිමට ආදරය, ගෞරවය හා කැපවීමෙන් යුතු ශ්‍රී ලාංකික පුරවැසියෙකු නිර්මාණය කිරීම.

(III) දේශීය හා ගෝලීය අභියෝගයන්ට ප්‍රතිචාර දක්වමින් ජාතියේ සංස්කෘතික හා පාරිසරික උරුමයන් හඳුනාගැනීම සහ සංරක්ෂණය කිරීම.

(IV) නිර්මාණශීලීත්වය, නවෝත්පාදනය සහ විචක්ෂණශීලී චින්තනය සහිත ඵලදායී පුද්ගලයින් නිර්මාණය කිරීම.

(V) තෘප්තිමත් ජීවන රටාවකට අවශ්‍ය ශාරීරික, මානසික සහ ආධ්‍යාත්මික යහපැවැත්ම සාමාජිකයා තුළ ප්‍රවර්ධනය කිරීම.

(VI) ගෝලීය ප්‍රවණතාවන්ට සරිලන පරිදි සමාජ, ආර්ථික හා සංස්කෘතික උන්නතිය සඳහා දැනුම, කුසලතා, ආකල්ප සහ මානව ගුණාංග සංවර්ධනය කිරීම.

(VII) මානව හිමිකම්, රටේ නීතිය හා යුතුකම් සහ වගකීම්වලට ගරු කරන, සමාජ සාධාරණත්වය හා ප්‍රජාතන්ත්‍රවාදී ජීවන රටාවකට අවශ්‍ය සාධක නිර්මාණය කිරීම හා ඒ සඳහා අනුබල දීම.

(VIII) සංකීර්ණ හා අනපේක්ෂිත තත්වයන්ට මුහුණ දීම සඳහා යෝග්‍ය වන පරිදි වෙනස්වම් කළමනාකරනය සහ ඉගෙනුමට ඉගෙනීමේ හැකියාවන් සංවර්ධනය කිරීම.

**(ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව - 2019)**

## මූලික නිපුණතා

අධ්‍යාපනයෙන් වර්ධනය වන පහත දැක්වෙන මූලික නිපුණතා ඉහත සඳහන් ජාතික අරමුණු කර ගැනීමට දායක වනු ඇත.

(I) සන්නිවේදන නිපුණතා

සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය සහ තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය යන අනුකාණ්ඩ 4ක් මත සන්නිවේදන නිපුණතා පදනම් වේ.

සාක්ෂරතාව : සාවධානව ඇහුම්කන් දීම, පැහැදිලිව කථා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරදිව සහ නිරවුල්ව ලිවීම, ඵලදායි අයුරින් අදහස් හුවමාරු කර ගැනීම

සංඛ්‍යා පිළිබඳ දැනුම : භාණ්ඩ අවකාශය හා කාලය ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය

රූපක භාවිතය : රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති සහ වර්ණ ගලපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම

තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය : පරිගණක දැනුම සහ ඉගෙනීමේ දී ද සේවා පරිශ්‍රයක් තුළ දී ද පෞද්ගලික ජීවිතයේ දී ද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගී කර ගැනීම

(II) පෞරුෂ වර්ධනයට අදාළ නිපුණතා

» නිර්මාණශීලීබව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තීන්, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලී හා විශ්ලේෂණාත්මක චින්තනය,
» කණ්ඩායම් හැගීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයාගැනීම් සහ ගවේෂණය වැනි වරණීය කුසලතා:
» ඍජු ගුණය, ඉවසා දරා සිටිමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම, වැනි අගයයන්
» චිත්තවේගී බුද්ධිය.

(III) පරිසරයට අදාළ නිපුණතා
මෙම නිපුණතා සාමාජ, ජෛව සහ භෞතික පරිසරයට අදාළ වේ.

සමාජ පරිසරයට : ජාතික උරුමයන් පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සාමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදීතාව හා කුසලතා, සාධාරණ යුක්තිය පිළිබඳ හැගීම, සමාජ සම්බන්ධතා, පුද්ගලික චර්යාව, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදායන්, අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම්

ජෛව පරිසරය : සජීවී ලෝකයක, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස් වැල්, වනාන්තර, මුහුද, ජලය, වාතය සහ ජීවය ශාක, සත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදීබව හා කුසලතා

භෞතික පරිසරයඃ අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට එවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍ය, සුව පහසුව, ශ්වසනය, නින්ද, නිශ්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මලපහ කිරීම යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදිතාව හා කුසලතාවන් ඉගෙනීම, වැඩ කිරීම සහ ජීවත් වීම සඳහා මෙවලම් සහ තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුසලතා මෙහි අඩංගුවේ.

(IV) වැඩ ලෝකයට සුදානම් වීමේ නිපුණතා

ආර්ථික සංවර්ධනයට දායක වීම,
තම වෘත්තීය ලැදියා සහ අභියෝගතා හඳුනා ගැනීම
හැකියාවන්ට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම, සහ
වාසිදායක හා තිරසර ජීවනෝපායක නිරත වීම
යන හැකියාවන් උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා

(V) ආගම සහ සදාචාර ධර්මයන්ට අදාළ නිපුණතා

පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවන්ට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයයන් උකහා ගැනීම හා ස්වීයකරණය

(VI) ක්‍රීඩාව සහ විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා

සෞන්දර්යය, සාහිත්‍ය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටාවන් තුළින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්

(VII) "ඉගෙනීමට ඉගෙනුම" පිළිබඳ නිපුණතා

වේගයෙන් වෙනස් වන සංකිරණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස්වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදීව හා සාර්ථකව ප්‍රතිචාර දැක්වීමත් ස්වාධීනව ඉගෙන ගැනීමත් සඳහා පුද්ගලයින් හට ශක්තිය ලබා දීම. ( උපුටා ගැනීම 2003 අධ්‍යාපන කොමිෂන් සභා වාර්තතාව)

## සමාජ විද්‍යාව විෂයයේ අරමුණු

මූලික පිරිවෙන් විෂය මාලාවේ වෛකල්පික විෂයයක් ලෙස සමාජ විද්‍යාව තුන්වන ශ්‍රේණියේ සිට පස්වන ශ්‍රේණිය දක්වා උගන්වනු ලැබේ. මේ විෂය අධ්‍යයනය කිරීමෙන් පහත සඳහන් අරමුණු සිසුන් සාධනය කරගනු ඇතැයි අපේක්ෂා කෙරේ.

01. යහපත් සමාජ සම්බන්ධතා ගොඩනගා ගැනීමට අවස්ථාව උදා වීම.

02. පවුලේ/ පන්සලේ/ පිරිවෙනේ සාමාජිකයෙකු වශයෙන් තමාගෙන් සමාජයටත්, සමාජයෙන් තමාටත් ඉටු විය යුතු යුතුකම් හා අයිතිවාසිකම් පිළිබඳ දැන ගැනීම.

03. නිවැරදි ජීවන අරමුණු පෙරදැරිව යමින් ජීවිතය ජය ගැනීම.

04. සමාජ වෙනස්වීම හඳුනා ගෙන ඒ සඳහා බලපාන සාධක අධ්‍යයනය කිරීමට පෙලඹීම.

05. තම අනන්‍යතාව රැක ගනිමින් සමාජයට පිවිසීමේ අවශ්‍යතාව අවබෝධ කර ගැනීම.

06. ශ්‍රී ලාංකික සමාජයේ පවතින සුවිශේෂ වූ සංස්කෘතික ලක්ෂණ හඳුනා ගෙන ක්‍රියා කිරීමට අවස්ථාව උදාකර ගැනීම.

07. බුදු දහම ඇසුරේ ශ්‍රී ලාංකික සමාජය  පරිවර්තනය වූ ආකාරය අධ්‍යයනය කිරීමට හැකියාව ලැබීම.

08. සමාජ පාලනයට හේතුවන සාධක හඳුනා ගෙන ඒ ඒ සාධකවල වටිනාකම ඇගයීම.

09. සමාජ ප්‍රශ්න/ ගැටලු හඳුනා ගෙන ඊට සාධාරණ විසඳුම් සෙවීමේ අවස්ථාව උදාකර ගැනීම.

10. සමාජය අධ්‍යයනය කිරීම සඳහා විද්‍යාත්මක ක්‍රම වේදයක් පවතින බව දැන ගැනීම.

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලපරිච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 1.0"සමාජ විද්‍යාව" යන්න විවරණාත්මකව පැහැදිලි කරයි. | 1.1 නිර්වචන ඇසුරින් සමාජ විද්‍යාව යනු කුමක් දැයි අර්ථ දක්වයි. | • සමාජ විද්‍යාව පිළිබඳ නිර්වචන | • සමාජ විද්‍යාව පිළිබඳ නිර්වචන මගින් හැඟවෙන දේ ප්‍රකාශ කරයි.<br>• සමාජ විද්‍යාව පුළුල් පරාසයක පැතිරී ගිය විෂය ක්ෂේත්‍රයක් වීම නිසා විෂය නිර්වචනය කිරීමේ ගැටලුකාරී බව හඳුනාගනිමින් අදහස් දක්වයි.<br>• එකිනෙක නිර්වචනයන්ට අනුව විවිධ දෘෂ්ටිකෝණවලින් සමාජ විද්‍යාව දෙස බැලිය හැකි බව පැහැදිලි කරයි.<br>• සමාජ විද්‍යාව යනු සමාජයේ පවත්නා ගැටලු අධ්‍යයනය කර ඒ ඇසුරින් නිර්වචන ඉදිරිපත් කර ඇති බව පිළිගනිමින් අදහස් දක්වයි. | 02 |
| | 1.2 සම්භාව්‍ය සමාජ විද්‍යාඥයින් අනුසාරයෙන් සමාජ විද්‍යාව විෂයයක් ලෙස සංවර්ධනය වූ ආකාරය පැහැදිලි කරයි | • සම්භාව්‍ය සමාජ විද්‍යාඥයින් සහ ඔවුන්ගේ මතවාද<br>• එමිල් ඩුර්කයිම්<br>• මැක්ස් වේබර්<br>• කාල් මාක්ස් | • සමාජ විද්‍යාව විද්‍යාත්මක විෂයයක් ලෙස පෝෂණය කිරීමට දායක වූ සමාජ විද්‍යාඥයින් නම් කරයි.<br>• සමාජ විද්‍යාවේ වර්ධනය සඳහා මූලික වූ සම්භාව්‍ය සමාජ විද්‍යාඥයින් හඳුනා ගෙන, ඔවුන්ගේ මතවාද ප්‍රකාශ කරයි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලපරිච්ඡේද සංඛ්‍යාව |
| --- | --- | --- | --- | --- |
| | 1.3 සමාජ විද්‍යාවේ මූලික සංකල්ප හඳුන්වයි. | ● සමාජ විද්‍යාවේ මූලික සංකල්ප | ● සමාජ විද්‍යා විෂය වර්ධනය කිරීම සඳහා ප්‍රංශය තුළ එමිල් ඩුර්කයිම් විසින් කර ඇති සම්මාදම අගය කරමින් කතා කරයි.<br>● සමාජ විද්‍යා විෂය වර්ධනය සඳහා මැක්ස් වේබර්ගේ දායකත්වය සදහන් ක්ෂේත්‍ර හඳුනාගෙන ප්‍රකාශ කරයි.<br>● කාල් මාක්ස්ගේ විග්‍රහයන් සමාජ විද්‍යාවේ වර්ධනය සඳහා බලපෑම් කර ඇති ආකාරය පැහැදිලි කරයි.<br>● සමාජ විද්‍යාඥයින් ඉදිරිපත් කර ඇති නිර්වචන ඇසුරින් සමාජ සමූහ හඳුනාගෙන ප්‍රකාශ කරයි.<br>● ද්විතියික සමූහ පිළිබඳව තොරතුරු අධ්‍යයනය කරයි.<br>● තත්වය හා කාර්ය කොටස තේරුම් ගෙන පැහැදිලි කරයි.<br>● පුද්ගලයා සමාජය හා සම්බන්ධ වන විවිධ ආකාරයන් පැහැදිලි කරණු ලබන්නේ තත්ත්වය හා කාර්ය කොටස මාර්ගයෙන් බව විස්තර කරයි. | 04 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලපරිච්ඡේද සංඛ්‍යාව |
| --- | --- | --- | --- | --- |
| | | | • පුද්ගලයෙකු සමාජ ගත කිරීමේ දී සමාජානුයෝජන කාරක වල වැදගත්කම පැහැදිලි කරයි. | |
| | 1.4 බුදු දහමේ සමාජ විද්‍යාත්මක පදනම විමර්ශනය කරයි. | • බුදු දහමේ ඉගැන්වීම් සහ සමාජ විද්‍යාව | • බුදු දහමේ ඉගැන්වීම් සමාජ විද්‍යාවට අනුගත බව උදහරණ ඇසුරින් පැහැදිලි කරයි.<br>• බෞද්ධ සමාජ විද්‍යාවේ ප්‍රධාන ලක්ෂණ වෙන වෙන ම හඳුනාගෙන අදහස් දක්වයි.<br>• බුදු දහමේ අඩංගු සමාජ වෙනස් වීමේ සිද්ධාන්තය පිළිබඳ තොරතුරු විමර්ශනය කරයි. | 02 |
| 2.0 සමාජ පරිණාම ක්‍රියාවලිය අධ්‍යයනය කරයි. | 2.1 සාම්ප්‍රදායික සමාජ පිළිබඳ සම්භාව්‍ය න්‍යාය ඇසුරින් ශ්‍රී ලාංකීය සමාජය පැහැදිලි කරයි. | • සම්ප්‍රදයික ශ්‍රී ලාංකීය සමාජය<br>• අර්ථ නිරූපනය<br>• යාන්ත්‍රික ලක්ෂණ<br>• යහ ධර්ම<br>• පාර භෞතික විශ්වාස හා ඇදහිලි | • න්‍යායාත්මක අර්ථ නිරූපණය ඇසුරින් සාම්ප්‍රදයික ශ්‍රී ලාංකීය සමාජය හඳුන්වයි.<br>• සාම්ප්‍රදයික ශ්‍රී ලාංකීය සමාජයෙන් හමුවන යාන්ත්‍රික ලක්ෂණ විස්තර කරයි.<br>• සාම්ප්‍රදයික ශ්‍රී ලාංකීය සමාජය තුළ දක්නට ලැබුණු යහ ධර්ම අගය කරයි.<br>• සාම්ප්‍රදයික ශ්‍රී ලංකා සමාජයේ හමුවන පාර භෞතික විශ්වාස හා ඇදහිලි පෙන්වා දෙයි. | 04 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලපරිච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| | 2.2 සම්භාව්‍ය න්‍යාය ඇසුරින් නවීන ශ්‍රී ලාංකීක සමාජය පැහැදිලි කරයි. | • සම්භාව්‍ය න්‍යාය හා ශ්‍රී ලාංකීක සමාජය | • නවීන සමාජ පිළිබඳ සම්භාව්‍ය න්‍යාය හඳුන්වයි.<br>• සම්භාව්‍ය න්‍යාය ඇසුරින් ශ්‍රී ලාංකීය නවීන සමාජය අර්ථ දක්වයි.<br>• නවීන ශ්‍රී ලාංකීය සමාජයෙන් හමුවන ඓන්ද්‍රීය ලක්ෂණ නිදසුන් දෙමින් පැහැදිලි කරයි. | 04 |
| | 2.3 නව සොයා ගැනීම් සමාජ පරිණාමී ක්‍රියාවලියේ ගාමක බලවේගය බව තේරුම් කරයි. | • නව සොයා ගැනීම් සහ සමාජ පරිණාමී ක්‍රියාවලිය | • සමාජ පරිණාමය කෙරෙහි ඉවහල් වූ නව සොයා ගැනීම් හඳුන්වයි.<br>• සමාජ පරිණාමය කෙරෙහි බලපාන ලද නව සොයා ගැනීම් ලැයිස්තු ගත කරයි. | 03 |
| | 2.4 නූතන සමාජ පරිණාමය වේගවත් කරන බලවේග අධ්‍යයනය කරයි. | • නූතන සමාජ බලවේග | • නූතන සමාජ වෙනස් වීම<br>• නූතන සමාජ වෙනස් වීම සඳහා පදනම් වූ බලවේග නිදසුන් ඇසුරින් පැහැදිලි කරයි. | 04 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලපරිච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| | 2.5 බෞද්ධ ඉගැන්වීම් ඇසුරින් සමාජ පරිණාමී ක්‍රියාවලිය විග්‍රහ කරයි. | • බෞද්ධ ඉගැන්වීම් සහ සමාජ පරිණාමී ක්‍රියාවලිය | • සමාජ පරිණාමී ක්‍රියාවලිය බෞද්ධ ඉගැන්වීම්වලට අනුකූලව පැහැදිලි කරයි.<br>• සමාජ පරිණාමී ක්‍රියාවලිය බෞද්ධ ඉගැන්වීම් අනුව ප්‍රත්‍යක්ෂ කර ගනිමින් තුලනාත්මකව විස්තර කරයි. | 03 |
| 3.0 "සංස්කෘතිය" යන්න අධ්‍යයනය කරයි. | 3.1 සංස්කෘතිය පිළිබඳ න්‍යායාත්මක විග්‍රහය සත්‍යාක්ෂණය කරයි. | • සංස්කෘතිය පිළිබඳ න්‍යායාත්මක මතවාද | • සංස්කෘතිය පිළිබඳ න්‍යායාත්මක මත ඉදිරිපත් කරයි.<br>• සංස්කෘතිය පිළිබඳ න්‍යායාත්මක මතවාද ඇසුරින් සංස්කෘතිය යනු කුමක් දැයි හඳුනාගෙන ප්‍රකාශ කරයි.<br>• සංස්කෘතිය නම් සාධකය අපගේ සමාජයෙහි ක්‍රියාත්මක වන ආකාරය පෙන්වා දෙයි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලපරිච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| | 3.2 විවිධ සංරචක ඇසුරින් ශ්‍රී ලංකාවේ සංස්කෘතිය පැහැදිලි කරයි. | • සංස්කෘතික ලැග්ම | • සංස්කෘතිය හා පෞරුෂ වර්ධනය අතර සම්බන්ධතාව පෙන්වා දෙයි.<br>• සාරධර්ම වල ක්‍රියාකාරීත්වය හඳුනා ගෙන විස්තර කරයි.<br>• සාරධර්ම ඇසුරින් ශ්‍රී ලාංකික සංස්කෘතිය පිළිබඳ විග්‍රහ කරයි.<br>• සංස්කෘතික විසරණය බටහිරකරණය ඇසුරින් පැහැදිලි කරයි. | 02 |
| | 3.3 පෞරුෂ වර්ධනයෙහිලා සංස්කෘතියේ කාර්යභාරය ගවේෂණය කරයි. | • සංස්කෘතිය හා පුද්ගල පෞරුෂය | • සමාජානුයෝජනය හා සංස්කෘතිය අතර ඇති අන්තර් සම්බන්ධතාව අවබෝධ කොට ගෙන අදහස් දක්වයි.<br>• සංස්කෘතික හර පද්ධතිය හඳුනාගෙන විස්තර කරයි.<br>• සංස්කෘතික හර ජීවිතයට ආදේශ කර ගැනීමේ වැදගත්කම පැහැදිලි කරයි.<br>• සංස්කෘතිය හා පෞරුෂය අතර ඇති සම්බන්ධතාව පැහැදිලි කරයි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලපරිච්ඡේද සංඛ්‍යාව |
| --- | --- | --- | --- | --- |
| | 3.4 ගෝලීය ප්‍රවණතා සංස්කෘතියට බලපාන ආකාරය විශ්ලේෂණය කරයි. | • සංස්කෘතිය හා ගෝලීය ප්‍රවණතා | • ගෝලීය ප්‍රවණතා ලෝකයේ විවිධ සංස්කෘතීන් කෙරෙහි බලපෑම් කරන ආකාරය හඳුනාගෙන ප්‍රකාශ කරයි.<br>• ශ්‍රී ලංකාව ගෝලීය ප්‍රවණතා වලට ලක්ව ඇති ආකාරය සමාජ වෙනස්වීම් ඇසුරින් වටහා ගෙන පැහැදිලි කරයි.<br>• ගෝලීය ප්‍රවණතා හමුවේ ශ්‍රී ලාංකික සංස්කෘතියට සිදු වූ බලපෑම විස්තර කරයි.<br>• ශ්‍රී ලාංකික සංස්කෘතියට එල්ල වූ බලපෑම් වල යහපත් හා අයහපත් ලක්ෂණ පැහැදිලි කරයි. | 02 |
| 4.0 සාමාජිකයා හා සමාජය අතර ඇති අන්තර් සම්බන්ධතාව විවරණය කරයි. | 4.1 පුද්ගලයා සමාජයේ සාමාජිකයෙකු වන ආකාරය පෙන්වා දෙයි. | • පුද්ගලයා හා සාමාජිකයා | • පුද්ගලයා සමාජයේ අනිවාර්ය කොටස්කරුවෙක් වන බව පෙන්වා දෙයි.<br>• පුද්ගලයා සමාජීය සත්වයෙකු බවට පත්වීමේ ප්‍රතිඵලයක් ලෙස සමාජය අඛණ්ඩව විකාශය වන බව පැහැදිලි කරයි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලපරිච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| | 4.2 සමාජයේ කොටස් කරුවෙකු ලෙස සාමාජිකයාගේ කාර්යභාරය අවබෝධ කර ගනියි. | ● සමාජයේ කොටස්කරුවෙකු ලෙස සාමාජිකයාගේ කාර්යභාරය | ● සාමාජිකයා කුමන හෝ සමූහයක කොටස්කරුවෙක් වන බව නිදසුන් දක්වමින් පැහැදිලි කරයි.<br>● සමූහයේ කොටස්කරුවෙක් ලෙස සාමාජිකයාට විවිධ කාර්ය කොටස් පැවරෙන බව පෙන්වා දෙයි. | 02 |
| | 4.3 සමාජයේ හවුල්කරුවෙකු ලෙස සාමාජිකයාට පැවරෙන භූමිකා සමූහය වටහා ගනියි. | ● සාමාජිකයා හට පැවරෙන භූමිකා | ● සාමාජිකයා මත සමාජය රඳා පවතින අයුරු විස්තර කරයි.<br>● සමාජයේ යහ පැවැත්ම හා සංවිධානය සඳහා විවිධ භූමිකාවන්හි වැදගත්කම අවධාරණය කරයි. | 02 |
| | 4.4 සමාජ යහපත සලසන ධර්මානුකූල සාමාජිකයෙකු නිර්මාණය කර ගැනීමට මග පෙන්වන බෞද්ධ ඉගැන්වීම් කෙරේ අනුගත වෙයි. | ● සාමාජිකයාගේ යහපත සඳහා හේතු වන බෞද්ධ ඉගැන්වීම් | ● බෞද්ධ සූත්‍ර ඇසුරින් සාමාජිකයාගේ භූමිකාව පැහැදිලි කරයි.<br>● සදිසා නමස්කාරය ඇසුරින් සාමාජිකයාගේ අන්‍යෝන්‍ය වගකීම විස්තර කරයි.<br>● සිඟාලෝවාද සූත්‍රය ඇසුරින් ඒ ඒ භූමිකාවට අයත් යුතුකම් හා වගකීම්වල වැදගත්කම විවරණය කරයි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලපරිච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 5.0 සමාජ පාලනයේ අවශ්‍යතාව අවධාරණය කරයි. | 5.1 සමාජ පාලනයේ අවශ්‍යතාව හා එහි ඓතිහාසික විකාශනය විමසා බලයි. | ● සමාජ පාලනය සහ එහි ඓතිහාසික විකාශනය | ● සමාජය හා පාලනය අතර සම්බන්ධතාව පැහැදිලි කරයි.<br>● සමාජ පාලනය පිළිබඳ ඓතිහාසික විකාශනය විස්තර කරයි.<br>● දසරාජ ධර්ම, සප්ත අපරිහානි ධර්ම මාර්ගයෙන් සමාජය පාලනය වන අයුරු නිදසුන් දක්වමින් පැහැදිලි කරයි.<br>● පවුල් ඒකකය මගින් සාමාජිකයා පාලනය වන ආකාරය අත්දකියි. | 02 |
| | 5.2 සමාජ පාලනය සඳහා නීති පද්ධතියෙන් කෙරෙන බලපෑම පැහැදිලි කරයි. | ● ශ්‍රී ලංකාවේ නීති පද්ධතිය සහ සමාජ පාලනය | ● නීතිය සමාජ පාලනයට දයක වන ආකාරය පැහැදිලි කරයි.<br>● අතීත ලංකාවේ පැවති සමාජ පාලන විධි පිළිබඳ පැහැදිලි කරයි.<br>● සිවිල් නීතිය සහ අපරාධ නීතිය පිළිබඳව කරුණු හදාරයි.<br>● ශ්‍රී ලංකාවේ නීතිය ක්‍රියාත්මක කරන පොලිසිය, අධිකරණය, බන්ධනාගාරය යන ආයතනවල වගකීම අධ්‍යයනය කරයි. | 03 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලපරිච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| | 5.3 බෞද්ධ ඉගැන්වීම් මගින් දිරි ගන්වන ස්වයං පාලනය නූතන සමාජ පාලනයෙහි ද ව්‍යවහාරික වශයෙන් වැදගත් වන ආකාරය පැහැදිලි කරයි. | • සමාජ පාලනයෙහි ලා උපකාරී වන බුදු දහමේ ඉගැන්වීම් | • සමාජ පාලනයට ස්වයං විනය අත්‍යාවශ්‍ය බව පැහැදිලි කරයි.<br>• බුදු දහමේ ඉගැන්වෙන පංච නීවරණ, පංච ශීලය, සප්ත අපරිහානි ධර්ම, දසරාජ ධර්ම යන සංකල්ප මාර්ග යෙන් සමාජ පාලනය වන අයුරු පැහැදිලි කරයි. | 03 |
| 6.0 සමාජ ගැටලු විශ්ලේෂණය කරයි. | 6.1 එකිනෙක සමාජ ගැටලුවලට පසුබිම් වන හේතු සාධක විශ්ලේෂණය කරයි. | • විවිධ සමාජ ගැටලු සහ ඒවාට පසුබිම් වන හේතු | • සමාජ ගැටලු නිර්මාණය වීම කෙරෙහි බලපාන සාධක හඳුන්වයි.<br>• එක් එක් සමාජ ගැටලු නිර්මාණය වීම කෙරෙහි බල පෑ සමාජ පසුබිම පැහැදිලි කරයි. | 04 |
| | 6.2 කසල කළමනාකරණ ගැටලුව, මදිරාබාධය සමාජ ගැටලු බවට පත්වන අකාරය පැහැදිලි කරයි. | • තෝරා ගත් සමාජ ගැටලු 02ක් මගින් සමාජයට වන බලපෑම<br>• කසල කළමනාකරණය<br>• මදිරාබාධය | • කසල කළමනාකරණ ගැටලුව මගින් පුද්ගලයාට හා සමාජයට වන බලපෑම පැහැදිලි කරයි.<br>• මදිරාබාධයෙන් පුද්ගලයාට සහ සමාජයට වන බලපෑම පැහැදිලි කරයි. | 04 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලපරිච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| | 6.3 තෝරා ගත් සමාජ ගැටලු කළමනාකරණය සඳහා බුදු දහමේ ඉගැන්වීම් භාවිතා කරයි. | • සිගාලෝවාද සූත්‍රය<br>• ආරාම රෝපා වන රෝපා සූත්‍රය<br>• පරාභව සූත්‍රය<br>• චක්කවත්ති සීහනාද සූත්‍රය | • තෝරාගත් සමාජ ගැටලු කළමනාකරණයෙහි ලා උපයෝගී කර ගත හැකි බෞද්ධ ඉගැන්වීම් හඳුන්වයි.<br>• ඒකී සමාජ ගැටලු වළක්වා ගැනීමෙහිලා බෞද්ධ ඉගැන්වීම් උපයෝගී කර ගනියි. | 04 |
| 7.0 සමාජය විද්‍යාත්මකව අධ්‍යයනය කිරීම සඳහා වන ක්‍රමවේද හඳුනා ගනියි. | 7.1 සමාජ විද්‍යාත්මක පර්යේෂණ සැලසුම් කරයි. | • පර්යේෂණ සැලැසුමක් යනු කුමක් ද?<br>• පර්යේෂණ සැලැස්මක් සැකසීමේ පියවර | • පර්යේෂණ සැලැස්මක් යනු කුමක් ද යන්න පැහැදිලි කරයි.<br>• සැලැස්මක් සැකසීමේ පියවර පැහැදිලි කරයි.<br>• සමාජීය ජීවිතයේ දී මිනිසා නිශ්චිත රටාවකට අනුව ක්‍රියා කරන අයුරු උදාහරණ සහිතව පෙන්වා දෙයි.<br>• යම් පර්යේෂණයක් සාර්ථකව නිම කිරීමට සැලැස්මක් අනිවාර්ය වන බව පහදා දෙයි. | 03 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලපරිච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| | 7.2 මූලාශ්‍ර භාවිතය පිළිබඳ කරුණු අධ්‍යයනය කරයි. | • සමාජ පර්යේෂණ මූලාශ්‍ර<br>• මූලාශ්‍ර යොදා ගැනීමේ වැදගත්කම<br>• ලිඛිත හා අලිඛිත මූලාශ්‍ර | • සමාජ පර්යේෂණ සඳහා මූලාශ්‍ර යොදා ගැනීමේ වැදගත්කම ප්‍රකාශ කරයි.<br>• ලිඛිත සහ අලිඛිත මූලාශ්‍ර භාවිත කරමින් පර්යේෂණ කරන අයුරු පැහැදිලි කරයි. | 02 |
| | 7.3 දත්ත එක් රැස් කිරීම පිළිබඳ නිර්ණායකයන් අධ්‍යයනය කරයි. | • දත්ත එක්රැස් කිරීමේ ක්‍රමවේද<br>• දත්ත එක්රැස් කිරීමේ දී මතු විය හැකි ගැටලු හඳුනා ගානීම සහ නිරාකරණය කිරීම. | • දත්ත රැස් කිරීමට යොදා ගන්නා ක්‍රමවල වැදගත්කම පිළිබඳ මනා අවබෝධයකින් යුතුව අදහස් දක්වයි.<br>• දත්ත රැස්කිරීමේ දී සැලකිය යුතු කරුණු හඳුන්වයි.<br>• දත්ත රැස් කිරීමේ ක්‍රියාවලියේ ඇති වාසි අවාසි පැහැදිලි කරයි.<br>• දත්ත එක් රැස් කිරීමේ දී ඇති විය හැකි ගැටලු සහ අභියෝග වලට සාර්ථකව මුහුණ දෙන අයුරු පැහැදිලි කරයි. | 03 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලපරිච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| | 7.4 අවට සමාජය පිළිබඳ සරල පර්යේෂණයක් කර වාර්තාවක් ඉදිරිපත් කරයි. | • පර්යේෂණ වාර්තා සැකසීම | • තොරතුරු රැස්කරන අයුරු අවබෝධයෙන් ප්‍රකාශ කරයි.<br>• රැස්කර ගත් තොරතුරු පිළිවෙළකට පෙළගසා ගන්නා අයුරු පැහැදිලි කරයි.<br>• සරල නිබන්ධනයක් සකස් කරන අයුරු ප්‍රකාශ කරයි.<br>• ගැටලු අධ්‍යයනය කිරීමෙහි වැදගත්කම පැහැදිලි කරයි. | 04 |

# ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්

## 01. සමාජ විද්‍යාව හැඳින්වීම

**නිපුණතාව 01 -** සමාජ විද්‍යාත්මක දැනුම අනුසාරයෙන් සමාජය තේරුම් ගනියි.

**නිපුණතා මට්ටම් -** 1.1 සමාජ විද්‍යාව නිර්වචන ඇසුරින් අර්ථ දක්වයි.

1.2 සමාජ විද්‍යාව බිහි වූ බටහිර සමාජ පසුබිම අධ්‍යයනය කොට අවබෝධය ලබා ගනියි.

1.3 සමාජ විද්‍යාවේ සුවිශේෂ බව වටහා ගනියි.

1.4 බෞද්ධ සමාජ විද්‍යාත්මක චින්තනය විමර්ශනය කරයි.

1.5 සමාජ සමූහ විමර්ශනය කරයි.

1.6 මූලික සමාජ සංස්ථා විවරණය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව - 12**

**හැඳින්වීම** -

සමාජ විද්‍යාව යනු සමාජය පිළිබඳ විද්‍යාත්මක අධ්‍යයනය යි. එහිදී මානව සමාජ සම්බන්ධතා පිළිබඳව විද්‍යාත්මකව අධ්‍යයනය කිරීමක් සිදු වේ. සමාජයක් යනු අන්තර් පුද්ගල සම්බන්ධතාවලින් යුත් සාමාජිකයන්ගේ එකතුවකි. විද්‍යාත්මක ක්‍රමය උපයෝගී කරගෙන සොයාගත් දැනුම් සම්භාරය විද්‍යාව වේ. මේ අනුව සාමූහික සම්බන්ධතා පිළිබඳ විද්‍යාත්මක ක්‍රමය උපයෝගී කරගෙන ගවේෂණය කිරීම සමාජ විද්‍යාව මගින් සිදු වේ.

බටහිර යුරෝපා සමාජය කේන්ද්‍ර කරගෙන සමාජ විද්‍යාව විෂයය බිහි වී ඇත. බටහිර සමාජය තුළ ඇති වූ කාර්මික විප්ලවය, ආගමික පුනරුදය හා ප්‍රංශ විප්ලවය යන ප්‍රධාන සාධක මුල්කරගෙන සමාජය සංකීර්ණත්වයට පත් විය. එම සංකීර්ණ වූ සමාජ පසුබිම අධ්‍යයනය කිරීමේ විෂයයක් වශයෙන් මෙම විෂයය ප්‍රභව විය. මෙම විෂයය ප්‍රංශ ජාතික ඔගස්ට් කොම්ට් විසින් බිහි කරන ලද අතර, එමිල් ඩුර්කයිම්, හර්බට් ස්පෙන්සර්, මැක්ස් වේබර්, කාල්මාක්ස් යන දාර්ශනිකයින් ඉදිරිපත් කළ න්‍යායාත්මක පසුබිම විෂයය පෝෂණයට මහඟු දායකත්වයක් විය.

සමාජ විද්‍යාව සමාජීය විද්‍යාවන්ගෙන් එකකි. එක් එක් සමාජ විද්‍යාවන්ට ආවේණික විෂය පථයක් ඇත. සමාජයේ ඓතිහාසික තොරතුරු අධ්‍යයනය ඉතිහාසය විෂයය මගින් සිදු කෙරේ. එම තොරතුරුවල සත්‍යතාව මතු කිරීමේ පුරාවිද්‍යාව මගින් සිදු වේ. පුද්ගලයාගේ දේශපාලන හැසිරීම දේශපාලන විද්‍යාව මගින් ද ආර්ථික සබඳතාව ආර්ථික විද්‍යාව මගින් ද අධ්‍යයනය කරනු ලබයි. ඒ ඒ විෂයයන් මගින් සමාජය විවිධ ක්ෂේත්‍ර හා සම්බන්ධ පුද්ගල හැසිරීම් විමර්ශනය කරන අතර සමාජ විද්‍යාව පුද්ගලයාගේ සමස්ත සමාජ චර්යාව අධ්‍යයනය කරනු ලබයි. එමෙන්ම සමාජ විද්‍යාව අනෙකුත් සමාජීය විද්‍යාවන් සමග පවත්නා සම්බන්ධතාව නිසා සමාජ විද්‍යාවේ උප විෂය ක්ෂේත්‍ර රාශියක් ගොඩ නැගී ඇත.

ලොව බිහි වූ ආගම් අතර බුදු දහම සුවිශේෂ වූ දර්ශනයක් පදනම් කරගත් ආගමකි. මෙම දර්ශනය ලෞකික දියුණුව හා ලෝකෝත්තර සැපය අරමුණු කර ගන්නකි. ලෞකික වශයෙන් ගත් කළ සාරධර්මයන් පිරිපුන් යහපත් සමාජයක් ගොඩ නගන්නට බුදු දහමින් ලැබෙන උපදෙස් ඉතා වැදගත් ය. බුද්ධ දේශනාව තුළ ඇතුළත් විවිධ සූත්‍ර දේශනා, ප්‍රතිපදාවන් යහපත් සමාජයක් ගොඩ

නැගීමට බෙහෙවින් හේතු සාධක වේ. සමාජ විද්‍යාත්මක සංකල්ප බෞද්ධ සංකල්පවලින් පෝෂණය වී තිබීම තුළ සමාජ විද්‍යාත්මක දැනුමත් විද්‍යාත්මක චින්තනයත් දියුණු කිරීමට බෞද්ධ දර්ශනය උපකාරී කරගත හැකි ය.

මිනිසා සමාජීය සත්ත්වයකු වන අතර ඔහුට ඇත්තේ රංචු මනසකි. මානවයාගේ ආරම්භයේ සිට සමූහගත ව ජීවත් වීම සිදු වූ බව ඓතිහාසික සාධකවලින් පැහැදිලි ය. විශේෂයෙන් පුද්ගලයාගේ විවිධ වූ අරමුණු ඉටුකර ගැනීම සඳහා මෙසේ සමූහගත වීම දක්නට හැකි ය. සමාජ විද්‍යාවේ මූලික සංකල්පයක් ලෙස සමාජ සමූහ පිළිබඳව අධ්‍යයනය කරන අතර එම සමාජය තේරුම් ගැනීමට බලපානු ලබයි. සමාජ සමූහ පිළිබඳව විවිධ නිර්වචන ඉදිරිපත් වී ඇති අතර පොදු අභිප්‍රායයන් හවුලේ භුක්තිවිඳින හැසිරීම පිළිබඳ සම්මතයක් පනවාගත් සාමාජිකයන් දෙදෙනෙකුගේ හෝ ඊට වැඩි ගණනකගේ එකතුවක්. සමාජ සමූහයක් ලෙසින් නිර්වචනය කරයි. ඒ අනුව පවුල, මිතුරු කණ්ඩායම්, දේශපාලන පක්ෂ, වෘත්තිය සමාගම්, සමාජ සමූහ වේ. මෙකී සමාජ සමූහ විවිධ අයුරින් වර්ගීකරණය කර දක්වා ඇත. චාල්ස් හෝර්ටන් කූලි දැක්වූ ප්‍රධාන වර්ගීකරණය වන්නේ ප්‍රාථමික හා ද්විතීයික සමූහයක්ය. ඊට අමතරව සිරස් සමූහ, තිරස් සමූහ, කුඩා සමූහ, මහ සමූහ, ජන වාර්ගික සමූහය හා වෙනස්වන සමූහ ආදී විවිධ ප්‍රභේදයක් ද දක්නට ලැබේ.

පුද්ගල අවශ්‍යතාව ඉටුකර ගැනීම සඳහා ගොඩනැගුණු ආයතන සමාජ සංස්ථා නම් වේ. මානවයාගේ ආරම්භය දක්වා ම සමාජ සංස්ථාවල ඉතිහාසය ගමන් කරන අතර මෙය සංස්ථාපිත ආයතනයකි. සමාජයක පැවැත්මට සමාජ සංස්ථා අවශ්‍ය වන අතර සමාජය නැමැති දේශය ගොඩනැගී ඇත්තේ සමාජ සංස්ථා මගිනි. සමාජ සංස්ථාවන් එකිනෙක බැඳී පවතින අතර එමගින් සමාජ අවශ්‍යතාවන් සපුරාලයි. සමාජය තුළ ගොඩ නැගී ඇති සමාජ සංස්ථා රාශියකි. ආර්ථික, දේශපාලනික, ආගමික, අධ්‍යාපනික, පවුල විවාහය, ඥාතීත්වය ආදී විවිධ සංස්ථා පිළිබඳව සමාජ විද්‍යාව අධ්‍යයනය කරන අතර එකී සංස්ථාවන්ගෙන් සමාජයෙහි පැවැත්ම නිර්මාණය වී ඇත.

**නිපුණතාව -** සමාජ විද්‍යාත්මක දැනුම අනුසාරයෙන් සමාජය තේරුම් ගනියි.

**නිපුණතා මට්ටම -** 1.1 "සමාජ විද්‍යාව" නිර්වචන ඇසුරින් අර්ථ දක්වයි.

**කාලච්ඡේද සංඛ්‍යාව - 02**

**ඉගෙනුම් පල**

1. සමාජ විද්‍යාව පිළිබඳ ඉදිරිපත් කර ඇති නිර්වචන විස්තර කරයි.
2. විවිධ අර්ථ නිරූපනවලට සාපේක්ෂව සමාජය දෙස බැලීමට ඇති හැකියාව තහවුරු කරයි.
3. සමාජ විද්‍යාව මිනිසාගේ සමාජ ජීවිතයේ සෑම අංශයක්ම අධ්‍යයනය කරන බව හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
4. සමාජ විරෝධී චර්යා ඇතිවීම කෙරෙහි පදනම් වන සමාජීය සාධක අධ්‍යයනය මගින් සමාජ ගැටලු අවබෝධ කරගත හැකි බව පෙන්වා දෙයි.

**හැඳින්වීම -**

සමාජ විද්‍යා විෂය ආරම්භයේ දී ම විෂය සංවර්ධනය සඳහා නිර්වචනවලට මුල් තැනක් හිමි විය. සමාජය විද්‍යාත්මක ව හැදෑරීම සඳහා විද්‍යාඥයින්ගේ නිර්වචන අතිශයින් වැදගත් වේ. "මානව පරිසරය මිනිසා හා ඒ සියල්ල අතර ඇති අන්‍යෝන්‍ය සබඳතාව හදාරණ විෂය සමාජ විද්‍යාව වේ. "(එම්. පී. ෆෙයාචයිල්ඩ්) මෙවැනි නිර්වචන රාශියක් හඳුනාගෙන ඇතත් සමාජ විද්‍යාව සඳහා අංග සම්පූර්ණ එක් නිර්වචනයක් වෙන්කර හඳුනා ගැනීම අපහසුවී ඇත. කෙසේ වෙතත් සමාජ විද්‍යා විෂය ක්ෂේත්‍රය පුරාම නිර්වචන ඉදිරිපත් වී තිබීම විශේෂත්වයකි.

**ආකල්ප හා ඇගයුම්**

1. සමාජ විද්‍යා විෂය හැදෑරීමේ දී නිර්වචනවල වැදගත්කම හඳුනා ගනියි.
2. සමාජ විද්‍යාඥයන්ගේ නිර්වචන අධ්‍යයනය කිරීම සමාජය විද්‍යාත්මක දැනුම පුළුල් කර ගැනීමට මහත් උපකාරයක් බව අවබෝධ කර ගනියි.

**ගුණාත්මක යෙදවුම්**

- සමාජ විද්‍යාඥයින්ගේ රූප රාමු
- සමාජ විද්‍යාඥයින් ඉදිරිපත් කරන ලද නිර්වචන ඇතුළත් දෘශ්‍යාධාරක
- වයිට් බෝඩ්, පෑන්

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්**

පිවිසීම : සමාජ විද්‍යාව පිළිබඳ මුල් කාලීන සමාජ විද්‍යාඥයෙකු වූ එමිල් ඩුර්කයිම් ඉදිරිපත් කර ඇති නිර්වචනයක් ප්‍රදර්ශනය කරමින් පාඩමට පිවිසෙන්න.

නිර්වචනය "සමාජ ආයතන හෙවත් සමාජ සංස්ථා පිළිබඳ විද්‍යාව සමාජ විද්‍යාවයි"

- සමාජ විද්‍යාව යනු කුමක් දැයි නිර්වචන ඉදිරිපත් කළ සමාජ විද්‍යාඥයින් හඳුන්වා දෙන්න. ඒ සඳහා සමාජ විද්‍යාඥයින් කීපදෙනෙකුගේ රූප රාමු ද යොදා ගන්න. (ඇමුණුම් 1)

- සමාජ විද්‍යාඥයින් ඉදිරිපත් කර ඇති නිර්වචන ඇසුරින් සමාජය හඳුනා ගන්නා ආකාරය පෙන්වා දෙන්න.

- විද්‍යාත්මක අධ්‍යයනවල ප්‍රධාන ලක්ෂණයක් වන්නේ කිසියම් ගැටලුවක් විද්‍යාත්මක ක්‍රමය උපයෝගී කරගෙන අධ්‍යයනය කිරීම බව පෙන්වා දෙන්න.

- සමාජ විද්‍යාත්මක අධ්‍යයන මගින් සමාජ ගැටලු හඳුනාගත හැකි අයුරු පෙන්වා දෙන්න.

**ක්‍රියාකාරකම් සැලැස්ම**

| ක්‍රියාකාරකම | ක්‍රමවේදය |
|---|---|
| එක් එක් සමාජ විද්‍යාඥයා ඉදිරිපත් කර ඇති නිර්වචන ලියන ලද පුවරු සිසුන්ට ප්‍රදර්ශනය කරන්න. ඒ ඇසුරින් නිර්වචන පැහැදිලි කරන්න. (ඇමුණුම් 02) | ප්‍රදර්ශන |
| සමාජ විද්‍යාව ආරම්භ වූ ආකාරය හා ව්‍යාප්තිය පිළිබඳව සාකච්ඡා කරන්න. | සාකච්ඡා ක්‍රමය |
| සමාජ විද්‍යාව මගින් සමාජ ගැටලු හඳුනා ගන්නා අයුරු පැහැදිලි කරන්න. | සාකච්ඡා ක්‍රමය |
| සමාජ විරෝධි චර්යා කෙරේ හේතු වන සාධක පිළිබඳ හඳුන්වා දෙන්න. විවිධ සමාජ ගැටලු සමාජීය යහපැවැත්ම බිඳි දැමීමට බලපාන අයුරු පෙන්වා දෙන්න. | දේශන ක්‍රමය |

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක**

- සමාජ විද්‍යාව පිළිබඳ නිර්වචන ඉදිරිපත් කළ සමාජ විද්‍යාඥයින් කවුරුන් දැයි වාචිකව පිළිතුරු දීම

- සමාජ විද්‍යාව පිළිබඳ සමාජ විද්‍යාඥයින් දෙදෙනෙකු ඉදිරිපත් කර ඇති නිර්වචන කෙටියෙන් පැහැදිලි කිරීම

- සමාජ විද්‍යාඥයින් ඉදිරිපත් කර ඇති නිර්වචන ඇසුරින් සමාජය හඳුනා ගන්නා ආකාරය උදාහරණ 02 ඇසුරින් පැහැදිලි කිරීම

- සමාජ විරෝධී චර්යාවන් ඇති වීමට බලපාන සාධක 3ක් ලිවීම

- යහපත් සමාජීය ජීවිතයක් ගත කිරීම උදෙසා ඔබට දයකත්වය ලබා දිය හැක්කේ කෙසේ ද? කරුණු 02ක් ලිවීම

**ඇමුණුම 01**



ඔගස්ට් කොම්ට්



එමිල් ඩුර්කයිම්

**ඇමුණුම 02**

- "සමාජ විද්‍යාව යනු මානව සමාජය පිළිබඳව අධ්‍යයනය කිරීමයි"

  \- එලිසබත් ජේ. විල්කින්ස් (Elizabeth J. Wlkins)

- "සමාජ විද්‍යාව මිනිසාගේ සකල සමාජ ජීවිතය විද්‍යාත්මකව අධ්‍යයනය කරන්නකි"

  \- එල්. ටී. හොබ්හවුස් (L. T. Hobhouse)

- "සමාජ ශාස්ත්‍රවල රැජින සමාජ විද්‍යාව වේ"

  \- ඔගස්ට් කොම්ට් (Augaste Comte)

- "සමාජ විද්‍යාව 'මානව වංශ විද්‍යාව' වේ"

  \- ජෝන් ස්ටුවට් මිල් (John Stvart Mill)

- "සමාජ විද්‍යාව සමාජ ආයතන හෙවත් සමාජ සංස්ථා පිළිබඳව අධ්‍යයනය කරන විද්‍යාව යනුවෙන් හඳුන්වයි"

  \- එමිල් ඩුර්කයිම් (Emile Durkheim)

**නිපුණතාව -** සමාජ විද්‍යාත්මක දැනුම අනුසාරයෙන් සමාජය තේරුම් ගනියි.

**නිපුණතා මට්ටම -** 1.2 සමාජ විද්‍යාව බිහි වූ බටහිර සමාජ පසුබිම අධ්‍යයනය කොට අවබෝධය ලබා ගනියි.

**කාලච්ඡේද සංඛ්‍යාව - 02**

**ඉගෙනුම් පල**

1. සමාජ විද්‍යාව බිහි වූ බටහිර සමාජය අධ්‍යයනය කරයි.
2. 19 වන ශත වර්ෂය වන විට යුරෝපා සමාජයෙන් ප්‍රකට වන විශේෂතා හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
3. 19 වන සියවසේ බටහිර සමාජය විවිධ විපර්යාසයන්ට ලක් වීමට බලපෑ හේතු පැහැදිලි කරයි.
4. කාර්මීකරණය නිසා බටහිර සමාජ ව්‍යුහය විපර්යාසයට ලක් වූ ආකාරය අවබෝධ කරගෙන ප්‍රකාශ කරයි.

**හැඳින්වීම -**

සමාජ විද්‍යාව නැමැති නැවුම් විෂය විද්‍යාත්මක විෂයයක් ලෙස බිහි කිරීමට මෙන්ම එය සංවර්ධනය කිරීම උදෙසා 19 වන සියවසේ සිටි සමාජ විද්‍යාඥයින් බොහෝ වෙහෙසක් ගනු ලැබිය. එසේ කැප වූ විද්‍යාඥයින් අතර ඔගස්ට් කොම්ට්, හර්බට් ස්පෙන්සර්, එමිල් ඩුර්කයිම්, මැක්ස් වේබර් හා කාල් මාක්ස් යන සම්භාව්‍ය සමාජ විද්‍යාඥයින් ප්‍රධාන වේ. බටහිර සමාජය විවිධ හේතූන් නිසා විවිධ විපර්යාසයන්ට පත් වෙමින් පැවැතුණි. එයට බලපෑම් කළ හේතු සාධක රාශියක් මෙහි දී අධ්‍යයනය කෙරේ.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය**

- සාකච්ඡා ක්‍රමය
- ප්‍රශ්නකරණය
- ප්‍රදර්ශන ක්‍රමය

**ආකල්ප හා ඇගයුම්**

1. සමාජ විද්‍යා විෂය බිහිවීම හේතුවෙන් නූතන සමාජයේ උද්ගත වන බොහෝ ගැටලුවලට විද්‍යාත්මක පදනමින් විසඳුම් සොයා ගත හැකි වූ බව අවබෝධ කර ගනියි.
2. සමාජ විද්‍යාව බිහි වීමට පදනම් වූ බටහිර සමාජ පසුබිම අධ්‍යයනය කිරීමේ වැදගත්කම අවබෝධ කර ගනියි.

**ගුණාත්මක යෙදවුම්**

- ඔගස්ට් කොම්ට්ගේ ඡායාරූපය
- බටහිර සමාජය විපර්යාසයන්ට පත් වීමට බලපෑම් කළ හේතු සාධක ඇතුළත් සංකල්ප සිතියම

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්**

- සමාජ විද්‍යාව විෂයයක් වශයෙන් ආරම්භ වූයේ ක්‍රි.ව. 1838 ප්‍රංශයේ දී බව හඳුන්වා දෙන්න. ඔගස්ට් කොම්ට් (Auguste Comte) ගේ ඡායාරූපයක් පෙන්වා (ඇමුණුම් 01) ඒ පිළිබඳ විමසන්න. අනතුරුව ඔහු සමාජ විද්‍යාව විෂයයක් වශයෙන් ආරම්භ වීමට දායක වූ බව පෙන්වා දෙන්න.
- ඔහු සමාජ විද්‍යාව හඳුන්වා දුන් ආකාරය පෙන්වා දෙන්න.
- දහනව වන සියවස පමණ වන විට බටහිර සමාජය විවිධ විපර්යාසයන්ට පත් වීමට බලපෑම් කළ හේතු සාධක ජොර්ජ් රිට්සර් (George Ritzer) පෙන්වා දුන් ආකාරයට පැහැදිලි කරන්න.
- යුරෝපා සමාජය මහත් විපර්යාසයකට ලක් කිරීමට කාර්මික විප්ලවය හේතු වූ බව පෙන්වා දෙන්න.
- කාර්මිකරණය නිසා බටහිර සමාජ ව්‍යුහය විපර්යාසයට ලක් වූ ආකාරය පැහැදිලි කරන්න.
- බටහිර සමාජ පර්යාය වෙනස් වීමට බලපෑ තවත් සුවිශේෂ සාධකයක් ලෙස 1789 දී කරලියට එන ප්‍රංශ විප්ලවයේ වැදගත්කම පෙන්වා දෙන්න.
- ආගමික ප්‍රතිසංස්කරණ නිසා සමාජ විපර්යාසයට ලක් වූ ආකාරයත්, මෙම ආගමික ව්‍යාපාරය මගින් යුරෝපා සමාජයට නව ආචාර ධර්ම පද්ධතියක් හඳුන්වා දෙන ලද බවත්, පෞද්ගලිකත්වය හා ධනවාදය ඉස්මතු වන පරිදි එම ආචාර ධර්ම ගොඩ නඟා ඇති බවත්, එමගින් යුරෝපා සමාජය ධනවාදී සමාජයක් කරා යොමු කළ බවත් පෙන්වා දෙන්න.
- මැක්ස් වේබර් නැමැති ජර්මන් ජාතික සමාජ විද්‍යාඥයා ඔහුගේ ප්‍රොතෙස්තන්ත්‍ර ආචාර ධර්ම හා ධනවාදයේ සාරය (The Protestant Ethic The Spirit of Capitalism) යන කෘතියේ දී ප්‍රොතෙස්තන්ත්‍ර ආගම මගින් බටහිර සමාජය තුළ ධනවාදී ආකල්ප ගොඩනගන ලද ආකාරය සාකච්ඡා කරන්න. (ඇමුණුම 03)
- නාගරීකරණය මගින් බටහිර සමාජය උඩුයටිකුරු කළ ආකාරය පැහැදිලි කර දෙන්න.
- නව සොයා ගැනීම්, යන්ත්‍ර සූත්‍ර භාවිතයට ඒම හා කාර්මික ජනපද බිහිවීම ආදිය හේතුවෙන් බටහිර සමාජයේ හටගත් සමාජ ගැටලු හඳුනා ගැනීමට මඟ පෙන්වන්න.

**ක්‍රියාකාරකම් සැලැස්ම**

| ක්‍රියාකාරකම | ක්‍රමවේදය |
|---|---|
| 19 වන සියවස තුළ බටහිර සමාජය විවිධ වෙනසකම්වලට ලක්වීමට බලපෑ සාධක සංකල්ප සිතියම උපකාර කර ගනිමින් පහදන්න. (ඇමුණුම් 02) | ප්‍රදර්ශනය |
| විද්‍යාත්මක පුනරුදය යුරෝපා සමාජය වෙනස් වීමට හේතු වූ බවත් එයින් ඇති වූ ප්‍රතිඵලත් සාකච්ඡා කරන්න. | සාකච්ඡා ක්‍රමය |
| සමාජ විපර්යාසය නිසා බටහිර සමාජය තුළ ඇති වූ ගැටලු පිළිබඳ විමසන්න.<br>(මානසික අසහනය, මදිරාබාධය, සියදිවි නසා ගැනීම, අපරාධ ආදිය) | ප්‍රශ්නෝත්තර ක්‍රමය |


**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක**

- සමාජ විද්‍යාව විෂයයක් වශයෙන් ආරම්භ වූ වර්ෂය හා එයට දායක වූයේ කවුරුන් දැයි වාචිකව පිළිතුරු ලබා දීම
- 19 වන ශතවර්ෂය වන විට බටහිර සමාජය තුළ ඉස්මතු වී පැවති සුවිශේෂ ලක්ෂණ 5ක් ලිවීම
- බටහිර සමාජය විවිධ විපර්යාසයන්ට පත්වීමට බලපෑම් කළ හේතු සාධක ලිවීම
- බටහිර සමාජය වෙනස්වීම කෙරෙහි කාර්මීකරණය බලපෑ ආකාරය පැහැදිලි කිරීම

**මූලික වදන් හා සංකල්ප**


- ප්‍රොතෙස්තන්ත්‍ර
- මදිරාබාධය

**ඇමුණුම 01**



ඔගස්ට් කොම්ට්

ඇමුණුම 02




ඇමුණුම 03

ප්‍රොතෙස්තන්ත්‍ර ආචාරධර්ම හා ධනවාදයේ සාරය.

15 වැනි සියවසේ දී මාටින් ලූතර් හා කැල්වින් යන පූජකවරුන් දෙදෙනා විසින් හඳුන්වා දෙන ලද ප්‍රොතෙස්තන්ත්‍ර නම් නිකාය මගින් එතෙක් පැවති කතෝලික දහම වෙනත් මාවතකට යොමු කිරීමට සමත් වන බව මැක්ස් වෙබර්ගේ මතය යි. ඒ වන විට වඩාත් ජනප්‍රියව පැවතියේ එලොවට බර තවුස්වාදය නම් ආගමික ප්‍රතිපත්තිය යි. මරණින් මතු එළැඹෙන ස්වර්ග සුවය අරමුණු කොට ගෙන ප්‍රතිපත්ති ගරුක දැමුණු ජීවිතයක් ගත කිරීම එයින් අපේක්ෂා කරනු ලැබී ය. එහෙත් කැල්වින් හා ලූතර් විසින් එම ප්‍රතිපත්තිය මෙලොවට බර තවුස්වාදය දක්වා වෙනස් කරනු ලැබීය. දන් දීම, යාඥා කිරීම, සිල් රැකීම, වන්දනාවේ යාම වැනි එලොව සැප සාදන පින්කම් මගින් මිනිසා අකර්මණ්‍ය කරවන බව කැල්වින් හා ලූතර් විසින් අවධාරණය කරනු ලැබී ය. එය දෙවියන් වහන්සේගේ අසතුටට හේතු වන්නකි. එහෙයින් උන්වහන්සේ සතුටු කිරීමට නම් සෑම මිනිසෙකු ම දිව්‍ය නියමය පරිදි සක්‍රීය විය යුතු ය. එනම් හැකිතාක් ධන සම්පත් උත්පාදනය කර ඒ දෙස බලා සිටින දෙවියන් වහන්සේ සතුටු කළ යුතු බව යි. දෙවියන් වහන්සේ විසින් නිර්දේශ කරන ලද මෙලොවට බර තවුස්වාදය මගින් ඒ සඳහා මග පෙන්වන බව ද මොවුන් විසින් දේශනා කරන ලදි.

ප්‍රොතෙස්තන්ත්‍ර ඉගැන්වීමට අනුව මෙලොව උපත ලබන සියලු මිනිසුන් තෝරා ගත් හා තෝරා නොගත් යනුවෙන් දෙවියන් වහන්සේ විසින් කොටස් දෙකකට බෙදනු ලැබ ඇත. තෝරා ගත් යන්නෙන් අදහස් වන්නේ එම කොටසට අයත් වන්නවුන් මරණින් මතු දෙවියන් වහන්සේ හා සමග වාසයට යාමට හෙවත් ස්වර්ගයට යාමට සුදුසුකම් ලබා ඇති බව යි. ඔව්හු දෙවියන් වහන්සේගේ ප්‍රසාදයට පාත්‍ර වූවෝ වෙති. තෝරා නොගත් කොටස නියෝජනය කරනු ලබන්නේ පාපතර මිනිසුන් ය. තෝරා ගත් හා තෝරා නොගත් දෙපිරිස එකිනෙකාගෙන් වෙන් කර හඳුනා ගත හැකි චරිත ස්වභාවයක් හෝ යම් කිසි සංඥාවක් ඉදිරිපත් කර නොමැත. එහෙත් තෝරා ගත් කොටස නියෝජනය කරන්නෙකු ජීවත් වන ආකාරය විවරණය කර ඇත. මෙම අර්ථ නිරූපනය යටතේ සාමාන්‍ය මනුෂ්‍ය ස්වභාවයට මතු වන්නට අවකාශ ඇත. දෙවියන් වහන්සේ විසින් නිර්දේශ කරන ලද ජීවන ප්‍රතිපදාව අනුගමනය කරමින් තමන් ද උන් වහන්සේගේ ප්‍රසාදයට පාත්‍ර වූවෙකු යැයි ප්‍රකට වන ආකාරයට ක්‍රියා කිරීමට සෑම කෙනෙකුට ම අවකාශ සැලසීම යි.

මූලික වශයෙන් එවැනි කෙනෙකු කාලය යනු ධනය යි, යන සිද්ධාන්තය තේමා කොට ගෙන සිය ජීවිතය සැලසුම් කර ගනු ලැබූවෙකි. එමෙන් ම, දෙවියන්ගේ නියමය ලෙස ප්‍රොතෙස්තන්ත්‍රය මගින් නිර්දේශ කරන ලද කොන්දේසි හෙවත් ආචාර ධර්ම ඒ අයුරින් ම පිළිපදින්නෙකු ද වේ. දෙවියන් වහන්සේගේ ආශීර්වාදයට පාත්‍ර වන හෙවත් තෝරා ගත් තැනැත්තා පහත දැක්වෙන පිළිවෙත් උපරිමයෙන් අනුගමනය කරමින් උන් වහන්සේ වෙත සිය අනුකූල භාවය තහවුරු කර දක්වන්නේ ය.

1. උපරිම වශයෙන් දිනකට පැය හයකට වඩා නොනිදන්නේ ය.
2. ධනය ඉපැයීම සිය ජීවිතයේ මූලික ඉලක්කය කර ගනු ලබන්නේ ය.
3. උපයා ගත් ධනය අල්මාරි, පෙට්ටගම් තුළ හිර කර නොතබා යළි යළිත් ආයෝජනය කර තව තවත් ධනය උපයයි.
4. දෙවියන් අභියස යාඥා කරමින් නිකරුනේ කාලය අපතේ නොයවයි. එම කාලය ධනෝපායන කටයුත්තක යොදවයි.
5. විවාහයට පෙර හෝ විවාහයෙන් පරිබාහිර ලිංගික සම්බන්ධතා නොපවත්වයි.
6. විවාහයෙන් පසු දරුවෙකු අවශ්‍ය වන අවස්ථාවකට පමණක් ලිංගික සම්බන්ධතා සීමා කළ යුතු ය.
7. අනවශ්‍ය තරමට දරුවන් උත්පාදනය නොකළ යුතු ය. දරුවෙකු යනු කාලය, ධනය, ශ්‍රමය හා ශක්තිය කැප කිරීමකි.
8. ලිංගික උත්තේජනය අඩු කර ගැනීම සඳහා සීතල ජලය ඉස්නානය කළ යුතු ය. එමෙන් ම එළවලු පමණක් ආහාරයට ගත යුතු ය.
9. නාට්‍ය ශාලා ආදියෙහි විනෝදය සඳහා කාලය ගත කරමින් ආයෝජන අවස්ථා අහිමි කර නොගනී.
10. ප්‍රීති සම්භාෂණ ආදිය වෙනුවෙන් කාලය හා ධනය කැප නොකරයි.
11. ඔහුගේ/ඇයගේ එක ම සතුට වන්නේ හැකි තාක් ධනය එක් රැස් කිරීම ය.

වේබර්ගේ විශ්ලේෂණයෙන් දක්වා ඇති ආකාරයට මෙම ආචාර ධර්ම මගින් පෙන්වා දෙන ලද මාවත ඉතාමත් ආකර්ෂණීය වේ. මෙම ප්‍රතිපත්තියෙහි පිහිටා කටයුතු කිරීමේ ප්‍රතිඵල ත්‍රිවිධාකාර වන හෙයිණි. දෙවියන් වහන්සේ සතුටු කළ හැකි අතර ම තමාගේ ද මහත් වූ ප්‍රමෝදයට හේතු වේ. මෙම ප්‍රතිපත්තියට අනුගත වන කවර හෝ කෙනෙකු දෙවියන්ගේ ප්‍රසාදය දිනා ගැනීමට භාග්‍යවන්තයෙකු වී ඇත්තෙකු යැයි තහවුරු වන හෙයින් සමාජයේ මහත් වූ ප්‍රසාදයට පාත්‍ර වේ. ආර්ථිකමය වශයෙන් ශක්තිමත් වන සාමාජිකයා ඉහළ සමාජයේ අභිමානවත් සුව පහසු ජීවිතයක් ගත කිරීමට වරම් ලබා ගන්නේ ය. 15 වැනි සියවසෙන් පසු අවදියේ දී යුරෝපා රටවල කිතුනු බැතිමතුන් සාම්ප්‍රදායික ඇදහිලිවලින් ඉවත් වෙමින් මෙම නව ආගමික ඉගැන්වීම වටා රොක් වන්නට විය. මෙලෙස ප්‍රොතෙස්තන්ත්‍රය වටා ඒකරාශී වූ ජනයා මහත් භක්තියකින් හා කැප වීමෙන් වෙහෙස, මහන්සිය, රෑ, දහවල්, අව්ව, වැස්ස නොබලා යන්ත්‍ර සූත්‍ර හා සමානව වෙළෙඳ ව්‍යාපාර, කර්මාන්ත, ගොවිතැන ආදී විවිධ කටයුතුවල නියැලෙමින් ධනය උපයන්නට විය. සමාපත්තියට සම වැදුනෙකු සේ මෙලෙස දැඩි භක්තියකින් හා විශ්වාසයකින් මෙම ආර්ථික කටයුතුවල නියැලීමේ ප්‍රතිපත්තිය ද වනගතව සිල් රකින තවුසෙකුගේ හැසිරීමට සමාන වන බව වේබර්ගේ මතය යි. එහෙයින් මෙය මෙලොවට බර තවුස්වාදය ලෙස වේබර් විසින් හඳුන්වනු ලැබේ.

තමනට හැකි අයුරින් සෑම කෙනෙකු ම පාහේ ධනය එක් රැස් කර ගැනීමේ ව්‍යායාමයෙහි නිරත වීමේ අනෙක් ප්‍රතිඵලයක් ද ප්‍රායෝගික වශයෙන් අත් විඳින්නට අවස්ථාව උදා වී ඇත. එනම්, ආර්ථික වශයෙන් රටක් තුළ ඇති වන වේගවත් සංවර්ධනය යි. ලොව අනෙකුත් කලාපවලට පෙර යුරෝපාකරයේ රටවලට ආර්ථිකමය වශයෙන් සමෘධිමත් වීමට හා ධනේශ්වර සමාජ ක්‍රමයකට යාමට ඉවහල් වන මූල සාධකය ප්‍රොතෙස්තන්ත්‍ර ධර්මය බව මැක්ස් වේබර්ගේ පිළිගැනීම වන්නේ ය.

**නිපුණතාව -** සමාජ විද්‍යාත්මක දැනුම අනුසාරයෙන් සමාජය තේරුම් ගනියි.

**නිපුණතා මට්ටම -** 1.3 සමාජ විද්‍යාවේ සුවිශේෂ බව වටහා ගනියි.

**කාලච්ඡේද සංඛ්‍යාව - 02**

**ඉගෙනුම් පල**

1. සමාජ විද්‍යාව හා සමාජීය විද්‍යා අතර වෙනස තේරුම්ගෙන පැහැදිලි කරයි.
2. විද්‍යාවන්ගෙන් සමාජ විද්‍යාව වෙනස් වන ආකාරය කරුණු දක්වමින් පැහැදිලි කරයි.
3. සමාජ විද්‍යාවට ආවේණික ගති ලක්ෂණ පෙලගස්වමින් ඉදිරිපත් කරයි.
4. ස්වාභාවික විද්‍යා හා සමාජ විද්‍යාව අතර සමානකම් හා අසමානකම් පැහැදිලි කරයි.

**හැඳින්වීම -**

මිනිසුන් අතර සමාන බවක් නොමැති නිසා ඔවුන්ගේ හැසිරීම සාමාන්‍යකරණය කළ නොහැකි බැවින් සමාජ විද්‍යාව විද්‍යාවක් ලෙස පිළිගත නොහැකි බව ස්වභාවික විද්‍යාඥයින්ගේ මතය විය. එහෙත් මිනිසා විවිධ සමාජ අවස්ථාවල දී යම් පිළිවෙළකට හැසිරෙන බැවින් ඔවුන් පිළිබඳව විද්‍යාත්මක ව අධ්‍යයනය කළ හැකි බව සමාජ විද්‍යාඥයින් ඔප්පු කර ඇත. ඒ අනුව සමාජ විද්‍යාව විද්‍යාවක් ලෙස පිළිගැනීමට ලක්විය. ස්වභාභාවික ලෝකය පිළිබඳ හදාරණ විෂයයක් ස්වා භාවික විද්‍යාවක් ලෙසත් මිනිසා හා ඔහු ජීවත්වන ලෝකය පිළිබඳ හදාරණ විෂය සමාජයීය විද්‍යාව ලෙසත් හැඳින්වේ. සමාජයීය විද්‍යා මගින් එකිනෙකට වෙනස් දෘෂ්ටි කෝණවලින් මිනිසාගේ සමාජ ජීවිතය පිළිබඳ අධ්‍යයනය කෙරේ. එනම් මිනිසාගේ අතීත සිද්ධි පිළිබඳ තොරතුරු පුරාවිද්‍යාව මගින් ද රාජ්‍ය හා ආණ්ඩු සමග කරන දේශපාලන හැසිරීම දේශපාලන විද්‍යාව මගින් ද ආර්ථික සබඳතා ආර්ථික විද්‍යාව මගින් ද සමාජයේ විවිධ ක්ෂේත්‍ර හා සම්බන්ධ මිනිස් හැසිරීම් විමර්ශනය කරනු ලබයි. නමුත් සමාජ විද්‍යාව මගින් මිනිසාගේ සමස්ත සමාජ චර්යාව අධ්‍යයනය කරනු ලබයි.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය**

- ප්‍රශ්නකරණය
- සාකච්ඡා ක්‍රමය
- ප්‍රදර්ශන ක්‍රමය

**ආකල්ප හා ඇගයුම්**

1. සමාජ විද්‍යාවට ආවේණික ගති ලක්ෂණ හඳුනා ගැනීමේ වැදගත්කම පැහැදිලි කරයි.
2. අනෙක් ස්වභාවික විද්‍යා හා සමාජීය විද්‍යා ඉගෙනීම සමාජ විද්‍යාවේ සුවිශේෂිතාව හඳුනා ගැනීමට උපකාරී වන බව පිළිගනියි.

**ගුණාත්මක යෙදවුම්**

- ස්වභාවික විද්‍යා හා සමාජීය විද්‍යාවන්ට උදාහරණ ලියූ පුවරුව
- සමාජ විද්‍යාව හා සමාජීය විද්‍යා අතර සම්බන්ධය ලියූ පුවරුව

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්**

සමාජීය විද්‍යාව හා ස්වභාවික විද්‍යාව යන විද්‍යාවන් දෙකට උදාහරණ වෙන වෙනම ලියූ පුවරුවක් ප්‍රදර්ශනය කරමින් කරුණු විමසමින් පාඩමට පිවිසෙන්න. (ඇමුණුම් 01)

- ස්වභාවික විද්‍යා හා සමාජීය විද්‍යා යනු මොනවා දැයි හඳුන්වා දී ඒ සඳහා උදාහරණ පෙන්වා දෙන්න.
- මෙම ක්ෂේත්‍ර දෙකටම අයත් විද්‍යාවන් දැනුම නිර්මාණය කිරීමේ දී විද්‍යාත්මක ක්‍රම වේදය භාවිතයට ගන්නා බව තහවුරු කර එය වෙන වෙනම හඳුන්වා දෙන්න.
- ස්වභාවික විද්‍යා හා සමාජීය විද්‍යා අතර සමානකම් හා අසමානකම් පෙන්වා දෙන්න.
- සමාජ විද්‍යාව හා අනෙක් විද්‍යාවන් අතර පවතින සබඳතාවයන් හඳුන්වා දෙන්න. (ඇමුණුම 03)
- එම විද්‍යාවන් අතරින් සමාජ විද්‍යාවට හිමිවන සුවිශේෂී බව පැහැදිලි කරන්න.
- එල්. ටී. හොබ්හවුස්ට අනුව සමාජීය විද්‍යා එක් විෂය පථයක් කෙරෙහි අවධානය යොමු කරන අතර සමාජ විද්‍යාව බහු විධමාන එළඹුමක් ඔස්සේ සමාජය අධ්‍යයනය කරන බව පැහැදිලි කරන්න.
- සමාජ විද්‍යාව හා සමාජීය විද්‍යාවන් අතර පවතින සම්බන්ධය පැහැදිලි කරන්න.
- ඇමුණුම් 02හි සඳහන් වගුව සිසුන්ට ප්‍රදර්ශනය කර ඒ පිළිබඳව පැහැදිලි කරන්න.

**ක්‍රියාකාරකම් සැලැස්ම**

| ක්‍රියාකාරකම | ක්‍රමවේදය |
|---|---|
| ස්වභාවික විද්‍යාව පිළිබඳ හැඳින්වීමක් කර උදාහරණ පැහැදිලි කරන්න | සාකච්ඡා ක්‍රමය |
| සමාජීය විද්‍යාව යනු කුමක් දැයි සාකච්ඡා කරමින් උදාහරණ සපයන්න | සාකච්ඡා ක්‍රමය |
| සමාජීය විද්‍යා විෂය ක්ෂේත්‍රයට අයත් සමාජ විද්‍යාවේ සුවිශේෂීත්වය පැහැදිලි කර දෙන්න | සාකච්ඡා ක්‍රමය |
| සමාජ විද්‍යාව හා සමාජීය විද්‍යා අතර සම්බන්ධය පැහැදිලි කරන්න. ඇමුණුම් 02 ප්‍රදර්ශනය කරමින් පැහැදිලි කරන්න | ප්‍රදර්ශන |

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක**

- ස්වභාවික විද්‍යා හා සමාජීය විද්‍යා යනු මොනවා දැයි හඳුන්වා උදාහරණ තුන බැගින් වාචිකව පිළිතුරු ලබා දීම (කේවල ක්‍රමය)
- ස්වභාවික විද්‍යා හා සමාජීය විද්‍යා අතර සමානකම් හා අසමානකම් වෙන වෙනම වගු ගත කිරීම

සමානතා

| ස්වභාවික විද්‍යා | සමාජීය විද්‍යා |
|---|---|
| 1<br>2<br>3<br>4 | |

අසමානතා

| ස්වභාවික විද්‍යා | සමාජීය විද්‍යා |
|---|---|
| 1<br>2<br>3<br>4 | |

- සමාජීය විද්‍යා හා සම්බන්ධ උප විෂය ක්ෂේත්‍ර අතර පවතින සම්බන්ධතාව වෙන වෙනම ලියා දක්වන්නට පවරන්න.


**ඇමුණුම 01**

| ස්වභාවික විද්‍යා (උදාහරණ) | සමාජීය විද්‍යා |
|---|---|
| • භෞතික විද්‍යාව | සමාජ විද්‍යාව |
| • රසායන විද්‍යාව | මානව විද්‍යාව |
| • ජීව විද්‍යාව | මනෝ විද්‍යාව |
| • උද්භිද විද්‍යාව | දේශපාලන විද්‍යාව |
| • ගණිතය | ආර්ථික විද්‍යාව |

ඇමුණුම 02

| සමාජීය විද්‍යා | සමාජීය විද්‍යා සහ සම්බන්ධ උප විෂය ක්ෂේත්‍ර |
|---|---|
| <u>ආර්ථික විද්‍යාව</u><br>මිනිසාගේ නිෂ්පාදන හා පරිභෝජන චර්යාව හදාරන විෂයයි. | ආර්ථික සමාජ විද්‍යාව මිනිසාගේ සංස්කෘතික සාධක ආර්ථික චර්යාව තීරණය කිරීමෙහිලා බලපාන ආකාරය පැහැදිලි කරයි. සංවර්ධන ආර්ථික විද්‍යාව, සූක්ෂම ආර්ථික විද්‍යාව කාර්මික ආර්ථික විද්‍යාව වැනි ක්ෂේත්‍ර ද අධ්‍යයනය කරයි. |
| <u>මනෝ විද්‍යාව</u><br>මිනිසාගේ මානසික ජීවිතය හදාරයි. | සමාජ මනෝ විද්‍යාව මිනිසාගේ සමාජ හැසිරීම කෙරෙහි මනස බලපාන අයුරු අධ්‍යයනය කරයි. |
| <u>මානව විද්‍යාව</u><br>ප්‍රාථමික සමාජ අධ්‍යයනය කරයි මිනිස් චර්යාව පදනම් කරගෙන එය අධ්‍යයනය කරනු ලබයි. | සමාජ මානව විද්‍යාව ප්‍රාථමික සමාජවල හැඩය තීරණය කිරීමට පදනම් වන පරිසර සාධක, චාරිත්‍ර, නෑකම ආදිය අධ්‍යයනය කරයි. |
| <u>දේශපාලන විද්‍යාව</u><br>බලය, රාජ්‍යය, ආණ්ඩුව යන සාධක මත මිනිසාගේ දේශපාලන චර්යාව අධ්‍යයනය කරනු ලබයි. | දේශපාලන සමාජ විද්‍යාව මිනිසාගේ ජාත්‍යන්තර සම්බන්ධතා, ආණ්ඩු ක්‍රම, දේශපාලන විප්ලව, නීතිය වැනි ක්ෂේත්‍ර හදාරයි. |

ඇමුණුම 03



**නිපුණතාව -** සමාජ විද්‍යාත්මක දැනුම අනුසාරයෙන් සමාජය තේරුම් ගනියි.

**නිපුණතා මට්ටම -** 1.4 බෞද්ධ සමාජ විද්‍යාත්මක චින්තනය විමර්ශනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව - 02**

**ඉගෙනුම් පල**

1. බුදු දහම හා සමාජ විද්‍යා මූලධර්ම අතර පවතින සම්බන්ධතාව පැහැදිලි කරයි.
2. යහපත් අන්තර් පුද්ගල සම්බන්ධතා ගොඩනගා ගැනීමට උපකාරී වන කරුණු බෞද්ධ සූත්‍ර ඇසුරින් විස්තර කරයි.
3. සමාජ යහපත උදෙසා බෞද්ධ සාරධර්මවල වැදගත්කම අගය කරයි.
4. සමාජ විද්‍යා දැනුම මගින් විද්‍යාත්මක චින්තනය දියුණු කළ හැකි බව පෙන්වා දෙයි.

**හැඳින්වීම -**

ලෝකයේ බිහි වූ ආගම් අතර බුදු දහමට සුවිශේෂී ස්ථානයක් හිමිවේ. බුදු දහම දර්ශනය කි. එම දර්ශනය පිළිපදින්නේ නම් ලෞකික මෙන්ම ලෝකෝත්තර ඉලක්ක ලබා ගත හැකි ය. ඒ සඳහා අවශ්‍ය මඟ පෙන්වීම බුදුන් වහන්සේ දේශන කළහ. බුද්ධිය හා සදාචාරය මුල්කරගත් ගැඹුරු දර්ශනයක් වූ බුදු දහම සමාජ ගත කිරීමෙන් යහපත් සමාජ ක්‍රමයක් නිර්මාණය කළ හැකිය. ලොව බිහි වූ ශ්‍රේෂ්ඨතම හා පළමු සමාජ විද්‍යාඥයා බුදුන් වහන්සේ ය. උන්වහන්සේගේ දේශනා සමාජ විද්‍යාඥයන් පවා තම ක්ෂේත්‍රයට සම්බන්ධ කරගෙන සමාජ විද්‍යා දැනුම හා විද්‍යාත්මක චින්තනය දියුණු කිරීමට බුදුදහම උපකාරී කර ගත්හ.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය**

- සාකච්ඡා ක්‍රමය
- ඉදිරිපත් කිරීම්
- දේශනා ක්‍රමය

**ආකල්ප හා ඇගයුම්**

1. ආදර්ශමත් සමාජයක් ගොඩ නැගීමට බුදු දහමත් සමාජ විද්‍යා දැනුමත් උපයෝගී කරගත හැකි අයුරු අවබෝධ කර ගනී.
2. බෞද්ධ ආචාර ධර්ම හා සමාජ විද්‍යාත්මක දැනුම සමාජ පාලනයට හා පැවැත්මට මහෝපකාරී කරගත හැකි බව අවබෝධ කර ගනියි.

**ගුණාත්මක යෙදවුම්**

- ජාතක පොත් වහන්සේ
- ප්‍රශ්න ඇතුළත් කඩදාසි
- වයිට් බෝඩ්, පෑන්

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්**

සත්තිගුම්භ ජාතකය සිහිගන්වමින් පාඩමට පිවිසෙන්න. එයින් සමාජානුයෝජනය දක්විය හැක. විවිධ ආශ්‍රයන් පිළිබඳ සමාජ විද්‍යාත්මක සංකල්ප ඉස්මතු කරන්න. තාපසයන් ආශ්‍රය කිරීම නිසා සංවර වීම ද සොරුන්ගේ ඇසුර නිසා ආක්‍රමණශීලී වීම ද පැහැදිලි කළ යුතු වේ.

- පාඩම ආරම්භ කරමින් ක්‍රි. පු. හයවන සියවසේ බුදු දහමේ ආරම්භය පිළිබඳ තොරතුරු පැහැදිලි කර දෙන්න.
- සූත්‍ර පිටකයෙහි සමාජ සම්බන්ධතා, සමාජ සංස්ථා, සමාජානුයෝජනය, සමාජ ස්ථර, සමාජ සමූහ වැනි විෂය ක්ෂේත්‍ර විග්‍රහ කර ඇති අයුරු පහදා දෙන්න. ඒ සඳහා මංගල, පරාභව, සිඟාලෝවාද, චක්කවත්ති සීහනාද, අග්ගඤ්ඤ වැනි සූත්‍ර යොදා ගන්න.
- ඉහත සඳහන් කළ සූත්‍රවල අඩංගු සමාජ විද්‍යාත්මක අගය පැහැදිලි කරන්න.
- අන්තර් පුද්ගල සබඳතාවලින් පිළිබිඹු වන යුතුකම් හා වගකීම් පදනම් කොට ගත් සදිසා නමස්කාරය පිළිබඳ හඳුනා ගැනීමට මඟ පෙන්වන්න.
- සමාජානානුයෝජන සංකල්පය බුදු දහමට කෙතරම් සමීපදැයි කරුණු පහදා දෙන්න.
- බෞද්ධ පංචශීල ප්‍රතිපත්තිය ද සමාජ විද්‍යාත්මක අර්ථයෙන් පැහැදිලි කරන්න.
- සමාජ වෙනස්වීම, සමාජ ස්තරායනය, තත්ත්වය හා කාර්යභාරය යන සංකල්ප බුදු දහමට අනුව පැහැදිලි කරන්න.

**ක්‍රියාකාරකම් සැලැස්ම**

| ක්‍රියාකාරකම | ක්‍රමවේදය |
|---|---|
| බුදු දහමේ එන සමාජ විද්‍යාත්මක ලක්ෂණ පිළිබිඹු කරන සූත්‍ර ධර්ම පිළිබඳ සිසුන් සමඟ සාකච්ඡා කරන්න. | සාකච්ඡා ක්‍රමය |
| සදිසා නමස්කාරය නමින් ප්‍රකට වන යුතුකම් හා වගකීම් වල වැදගත්කම සිසුන්ගෙන් විමසා ඒ ඒ දිසාවනට අයත් වන පිරිස් කවුරුන් ද යන්න පංතියේ ප්‍රකාශ කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න | ඉදිරිපත් කිරීම් |
| පංච ශිල ප්‍රතිපදාව සමාජ විද්‍යාත්මක අර්ථයෙන් විග්‍රහ කිරීමේ දී එයින් සමාජ පාලනයට වන දායකත්වය පැහැදිලි කරන්න.<br>උදා : ප්‍රාණඝාතයෙන් වැළකීම නිසා මනුෂ්‍ය ඝාතන වැනි බරපතල අපරාධ වළක්වා ගැනීමට මඟ පෑදීම | සාකච්ඡා ක්‍රමය |

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක**

- ඇමුණුම් අංක 1හි සඳහන් ක්‍රියාකාරකමට අදාළ නිවැරදි පිළිතුරු තෝරා ලිවීම
- මංගල, පරාභව, සීගාලෝවාද යන ඕනෑම සූත්‍රයක කරුණු 02ක් ගෙන එය සමාජ ජීවිතය යහපත් කර ගැනීමට හේතු වන අයුරු කෙටියෙන් පැහැදිලි කිරීම

**ඇමුණුම 01**

1. බුදු දහම භාරතයේ ආරම්භ වූයේ ......................................................
2. ගුරු ශිෂ්‍ය සම්බන්ධය ........................................................................
3. ගිහි පැවිදි සබඳතාව ..........................................................................
4. පරාභව සූත්‍රයෙන් පැහැදිලි වන්නේ ...............................................
5. සත්‍යවාදි සන්නිවේදන අයිතිය ......................................................
6. නොදුන් දෙය ගැනීමෙන් වැළකීම ................................................
7. ලොව සියල්ල වෙනස් වීම ...............................................................
8. ජාතිය, කුලය, ස්ත්‍රී පුරුෂ භාවය ......................................................
9. පාරාජිකා, සංඝාදිසේස, අනියත ආදිය ............................................
10. ගැඹුරු ධර්ම ........................................................................................

(විනය පිටකයට අයත්ය. / ආරෝපිත තත්ත්වයට අයත්ය. / අභිධර්මය නම් වේ. / ක්‍රි. පූ. 6 වන සියවසේ දීය. / අනිත්‍ය සංකල්පයට අයත්ය. / දකුණු දිසාවයි. / උඩ දිසාවයි. / පුද්ගල අයිතිය තහවුරු කිරීමයි. / ක්‍රි.පූ. 3වන සියවසේ දීය. / පිරිහීමේ දොරටුයි. / දියුණුවට මගයි. / මුසාවාදයෙන් වැළකීමයි. / සූත්‍ර පිටකයටයි.)

**නිපුණතාව -** සමාජ විද්‍යාත්මක දැනුම අනුසාරයෙන් සමාජය තේරුම් ගනියි.

**නිපුණතා මට්ටම -** 1.5 සමාජ සමූහ විමර්ශනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව - 02**

**ඉගෙනුම් පල**

1. සමාජ සමූහ අර්ථ දක්වයි.
2. සමාජ සමූහ වර්ගීකරණය කරයි.
3. ප්‍රාථමික හා ද්විතියික සමාජ සමූහ අතර වෙනස පෙන්වා දෙයි.
4. සමාජ සමූහ මගින් සමාජ පැවැත්ම සඳහා කෙරෙන කාර්යභාරය අගයයි.

**හැඳින්වීම -**

සමාජය තේරුම් ගැනීමේ දී සමාජ සමූහ පිළිබඳ අධ්‍යයනය වැදගත් වේ. මිනිසා සමාජ සත්වයකු බැවින් ආරම්භයේ සිට ම සමූහ වශයෙන් ජීවත් වූ බව ඓතිහාසික සාධකවලට අනුව සනාථ වී ඇත. සමාජය නිර්මාණය වී ඇත්තේ විවිධ අරමුණු ඉටු කර ගැනීම උදෙසා අන්‍යෝන්‍ය වශයෙන් සම්බන්ධතා පවත්වන මිනිස් සමූහවල එකතුවකි. සමාජය පිළිබඳ තේරුම් ගැනීමේ දී සමාජ සමූහ පිළිබඳ විමර්ශනය කිරීම ප්‍රතිඵලදායක වේ.

මිනිස් එකතුවක් සමාජ සමූහයක් නොවේ. ආර්. එම්. ස්ටොඩිල් දක්වන පරිදි පොදු අභිලාෂයන් හවුලේ භුක්ති විඳින, චර්යාව පිළිබඳ සම්මතයක් පනවාගත් කාලාන්තරයක් මුල්ලේ අන්තර් ක්‍රියා හා අන්තර් සන්නිවේදනයක් පවත්වන සාමාජිකයන් දෙදෙනෙකු හෝ වැඩි පිරිසකගේ එකතුවක් "සමාජ සමූහයක් වේ. පවුල, වෘත්තීය සංගම්, මිත්‍ර සමූහ, ජනවාර්ගික කණ්ඩායම්, ආගමික සමූහ, දේශපාලන පක්ෂ ආදිය සමූහ ලෙස පෙන්වා දිය හැකි ය.

සමාජ සමූහවල දක්නට ලැබෙන විවිධ ලක්ෂණ පදනම් කරගෙන සමාජ වර්ගීකරණය කර ඇත. ඒ අතර ප්‍රාථමික සමුහ හා ද්විතීක සමුහ, කුඩා සමුහ හා මහා සමුහ, තිරස් සමුහ හා සිරස් සමුහ, ඉච්ඡානුග සමුහ හා අනිච්ඡානුග සමුහ, ඇතුළත් සමුහ හා පිටත් සමුහ ආදිය පෙන්වා දිය හැකි ය.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය**

- සාකච්ඡා ක්‍රමය
- ප්‍රශ්නකරණය
- ප්‍රදර්ශනය
- දේශන ක්‍රමය

**ආකල්ප හා ඇගයුම්**

1. සමාජ ජීවිතයේ දී සමූහවලින් සිදුවන මෙහෙය සාකච්ඡා කරයි.

2. සමූහ ජීවිතයට හුරු වෙයි.

**ගුණාත්මක යෙදවුම්**

- සමාජ සමූහ පිළිබඳ නිර්වචන ඇතුළත් කාඩ්පත

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්**

අවට සමාජයේ දක්නට ලැබෙන සමූහ පිළිබඳ තොරතුරු විමසමින් ඒවායෙහි ගති ලක්ෂණ හඳුන්වා දෙමින් පාඩමට පිවිසෙන්න

- සමූහගත වීමේ අවශ්‍යතාව පෙන්වා දෙන්න.
- සමාජ විද්‍යාඥයින් සමාජ සමූහ වර්ගකර ඇති අයුරු පැහැදිලි කරන්න.
- ප්‍රාථමික හා ද්විතීයික සමාජ සමූහවල ගති ලක්ෂණ හඳුන්වා දෙන්න. ඒවායේ වැදගත්කම පැහැදිලි කරන්න. (ඇමුණුම 03)

**ක්‍රියාකාරකම් සැලැස්ම**

| ක්‍රියාකාරකම | ක්‍රමවේදය |
|---|---|
| ඇමුණුම 01 සිසුන්ට ලබා දී සමාජ සමූහයක පොදු ලක්ෂණ ඇසුරින් සමාජ සමූහ පිළිබඳ අර්ථකතනයක් ගොඩ නගා ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දීම | සාකච්ඡා ක්‍රමය<br>ඉදිරිපත් කිරීම් |
| සමූහගත ලක්ෂණ පදනම් කරගෙන සමාජ සමූහයක වැදගත් කම අගයන්නට අවස්ථාව දීම | සාකච්ඡා කිරීම් |
| සමාජ සමූහ වර්ගීකරණය කරමින් එකිනෙක, අතර වෙනස පැහැදිලි කරන්න. | දේශනා ක්‍රමය |

**ඇගයීම හා තක්සේරුකරණය**

- සමාජ සමූහ අර්ථ දැක්වීම
- සමාජ සමූහයක දක්නට ලැබෙන මූලික ලක්ෂණ ප්‍රකාශ කිරීම
- සමාජ විද්‍යාඥයින් පෙන්වා දී ඇති සමාජ සමූහ වර්ග 3ක් නම් කිරීම
- ප්‍රාථමික හා ද්විතීයික සමාජ සමූහ අතර සාමානතා 2ක් හා අසමානතා 2ක් සඳහන් කිරීම
- සමාජ සමූහයක වැදගත්කම අගයමින් අදහස් දැක්වීම

ඇමුණුම 01

"පොදු අභිලාෂයන් හවුලේ භුක්ති විඳින, චර්යාව පිළිබඳ පොදු සම්මතයක් පනවා ගත් කාලාන්තරයක් මුලුල්ලේ අන්තර් ක්‍රියා හා අන්තර් සන්නිවේදනයක් පවත්වන සාමාජිකයන් දෙදෙනෙකු හෝ වැඩි ගණනක එකතුවක් සමාජ සමූහයක් වේ"

ආර්. එම්. ස්ටොඩිල්


"සමාජ සමූහයක් යනු අන්තර් ක්‍රියා පද්ධතියකි"

හැරී එම්. ජොන්සන්

"සැලකිය යුතු කාලයක් තිස්සේ අන්තර් ක්‍රියා කරමින් පොදු අභිප්‍රායන් හවුලේ භුක්ති විඳින හා හැසිරීම් පිළිබඳ නීතිරීති පනවා ගත්, දෙදෙනෙකු හෝ ඊට වැඩි ගණනක මිනිස් එකතුවක් සමාජ සමූහයක් වේ.

ස්ලැන්ඩර්

ඇමුණුම 02



ඇමුණුම 03

| සමූහයක අංග | ප්‍රාථමික සමූහය | ද්විතියික සමූහ |
|---|---|---|
| සාමාජික සංඛ්‍යාව | කුඩා පිරිසක් | විශාල පිරිසක් |
| අරමුණුවල ස්වභාවය | සාමූහිකයි | සුවිශේෂි වේ |
| අන්තර් සම්බන්ධතාවේ ස්වභාවය | මුහුණට මුහුණලා ඉතා කිට්ටු සමීප සම්බන්ධතාවක් පවත්වයි | නිල තත්ත්වයන්ට අදාල අපෞද්ගලික සම්බන්ධතා ඇත |
| හැසිරීම් පිළිබඳ පොදු සම්මත | හැසිරීම් මුල් කරගෙන අවිධිමත් ලෙස ගොඩනගා ගත් පොදු සම්මතයක් ඇත | පිළිගත් ලිඛිත නීත්‍යානුකූල ක්‍රමයක් මත සම්මතයක් සකස් වීම |

ඇමුණුම 04

සමාජ විද්‍යාව විෂය අධ්‍යයනයේ දී සමාජ සංකල්ප කෙරෙහි අවධානය යොමු කිරීම වැදගත්ම කාර්යයකි. සමාජ සංකල්ප යටතේ සමාජ සමූහ පිළිබඳව අවධාරණය කළ යුතු වේ.

සමාජ සමූහයක් පිළිබඳව සමාජ විද්‍යාඥයින් විවිධ නිර්වචන ඉදිරිපත් කර ඇත. මිනිස් එකතුවක් වූ පමණින් එය සමාජ සමූහයක් ලෙස විග්‍රහ කළ නොහැකි වේ. සමාජ සමූහයක් වීමට නම් සාපේක්ෂව ස්ථාවර සම්බන්ධතා පවත්වන මිනිස් එකතුවක් වීමේ අවශ්‍යතාව වැදගත් වෙයි. මේ අදහස්වලට අනුව සමාජ සමූහයක් හඳුනා ගැනීමට නිර්වචන දායක කර ගැනීමට සිදු වේ. "අන්‍යෝන්‍ය වශයෙන් සම්බන්ධතා ගොඩනගා ගත් කුමන හෝ මිනිස් එකතුවක් සමූහයක් ලෙස මැකයිවර් (Maciver 1950) අර්ථ කථනය කොට ඇත. කුඩා සමූහ, විශාල සමූහ, විස්තෘත සමූහ, මිත්‍ර සමූහ, සිරස් සමූහ, තිරස් සමූහ වශයෙන් සමූහ ඒවායේ ගති ලක්ෂණවලට අනුව වර්ග කර ඇත.

සමාජ සමූහ වර්ග කිරීමේ දී සි. එච් කුලි (C. H. Cooley 1992) ඇතුළු සමාජ විද්‍යාඥයින් ප්‍රාථමික සමූහ හා ද්විතීයික සමූහ වශයෙන් බෙදා දක්වා ඇත. ඒ අනුව මිත්‍රශීලි සබඳතා මත ප්‍රාථමික සමූහත්, ගිවිසුම් මත ද්විතීයික සමූහත් ගොඩ නැගෙන බව හඳුනාගෙන ඇත. මේ සමූහ අතරින් ප්‍රාථමික සමූහ පිළිබඳව පළමුව කරුණු අවධාරණය කළ හැකි ය.

**ප්‍රාථමික සමූහ**

ප්‍රාථමික සමූහයක ලක්ෂණ කිපයක් හඳුනාගත හැකියි. සාමාජික සංඛ්‍යාව දෙදෙනෙක් හෝ ඊට ආසන්න සංඛ්‍යාවක් විය හැකි ය. මානුෂීය සම්බන්ධතාවලින් යුක්ත ය. උදාහරණ ලෙස පවුල මිත්‍ර කණ්ඩායම් ආදිය දැක්විය හැකියි. ප්‍රාථමික සමූහ සබඳතා පිළිගත් නිතිරීති හෝ නියෝග පද්ධතිය කට අනුව සැකසි නැත. ප්‍රාථමික සමූහයක සාමාජිකයාගේ ජීවිතයේ සෑම ක්‍රියාවක් ම එම සමූහය හා බැඳී පවතී. සම්බන්ධතාවල සීමාවක් හෝ කාලයක් නිශ්චිත නැත. අදහස් හුවමාරු කර ගැනීමේ දී නිශ්චිත සීමාවකට යටත් නැත. අවිධිමත් ය. සාමාජිකයා මහා සමාජයට පිවිසීමට පෙර සම්පූර්ණ විය යුතු පෞරුෂ සංවර්ධන කාර්යය පවුල ඇතුළු ප්‍රාථමික සමූහ මගින් ඉටු කරනු ලැබේ.

සී. එච්. කූලිට අනුව සමාජය පිළිගත් සාරධර්ම එකඟතා ආදී සියල්ල පළමු ව උගන්වන්නේ දෙමාපියන් ය. එකී ලක්ෂණ පිළිඹිබු කරන සාමාජික එකතුවක් ප්‍රාථමික සමූහ ගණයට අයත් වේ.

**ද්විතීයික සමූහ**

විධිමත් රටාවකට අනුව සංවිධානය වූ සාමාජික කණ්ඩායම් ද්විතීයික සමූහ ගණයට අයත් වේ. ද්විතීයික සමූහයේ සංවිධාන ව්‍යුහය විධිමත් වන අතර අපෞද්ගලික සම්බන්ධතා රටාවක් ක්‍රියාත්මක වේ. දේශ පාලන පක්ෂ, වෘත්තීය සංවිධාන, ආගමික සංවිධාන, ශිෂ්‍ය සමිති ආදිය නිදසුන් ලෙස දැක්විය හැකි ය. විධිමත් ලෙස අධිකාරියක් මත ගොඩ නැගුණු ධුරාවලියක් එහි දක්නට ලැබේ. තත්ත්වය හා කාර්ය කොටස්වල විධිමත් බවක් මෙන් ම සුදුසුකම් හා හැකියාවන් මත පදනම් වී ඇත. එහි සංකීර්ණ ශ්‍රම විභජනයක් ක්‍රියාත්මක වෙයි. ව්‍යවස්ථාගත නීති පද්ධතියක් මත සියලු කටයුතු සංවිධානය වී ඇත.

**නිපුණතාව -** සමාජ විද්‍යාත්මක දැනුම අනුසාරයෙන් සමාජය තේරුම් ගනියි.

**නිපුණතා මට්ටම -** 1.6 මූලික සමාජ සංස්ථා විවරණය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව - 02**

**ඉගෙනුම් පල**

1. සමාජ සංස්ථාවල මූලික ලක්ෂණ හඳුනාගෙන ප්‍රකාශ කරයි.
2. පවුලේ සාමාජිකයන් සඳහා භාවිත වන ඥාති පද හඳුන්වයි.
3. මූලික සමාජ සංස්ථාවල අන්තර් රැඳියාව පැහැදිලි කරයි.
4. සමාජයේ පැවැත්ම සඳහා සමාජ සංස්ථාවල අවශ්‍යතාව පැහැදිලි කරයි.

**හැඳින්වීම -**

සමාජ විද්‍යා විෂය ක්ෂේත්‍රය තුළ සමාජ සංස්ථා අධ්‍යයනයට වැදගත් ස්ථානයක් හිමි වේ. යම් සමාජයක් විද්‍යාත්මක ව තේරුම් ගැනීමට එහි පවතින සමාජ සංස්ථා අධ්‍යයනය කිරීම ඉතා වැදගත් වේ. මෙම පාඩම මගින් තෝරාගත් සමාජ සංස්ථා කීපයක් ඇසුරින් අවබෝධයක් දෙනු ලැබේ.

සමාජ සංස්ථාවල ආරම්භය කුමන කාලයක දී සිදු වූයේ දැයි නිශ්චිතව දක්වා නැත. එසේ හෙයින් මිනිසුන් විසින් සමාජීය ජීවිතයක් ගත කිරීම ආරම්භ කළ මුල් අවධිය දක්වා සමාජ සංස්ථාවල ඉතිහාසය දිව යන බව සමාජ විද්‍යාඥයින්ගේ මතය වේ. ප්‍රාථමික යුගයේ මිනිසුන්ට තනිව ඉටුකර ගත නොහැකි අවශ්‍යතා ළඟා කර ගැනීම සඳහා සමූහගත වීම ආරම්භ විය. මේ අයුරින් ගොඩනගා ගත් සෑම සමූහයකම පදනම සංස්කෘතික ප්‍රතිමාන කට්ටලයකි. ඒ අනුව සලකා බලන කල සමාජ සංස්ථාවක් යනු සංස්කෘතික ප්‍රතිමාන සමූහයක් බව පැහැදිලි වේ.

පවුල, විවාහය, ඥාතිත්වය, ආගම හා අධ්‍යාපනය යන සමාජ සංස්ථා මෙම පාඩම යටතේ අධ්‍යයනයට ලක් වේ.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය**

- සාකච්ඡා ක්‍රමය
- ප්‍රශ්නකරණය
- ප්‍රදර්ශන
- නිරීක්ෂණ ක්‍රමය

**ආකල්ප හා ඇගයුම්**

1. පවුලේ සාමාජිකයන් සඳහා නියමිත ඥාති පද හඳුනා ගැනීමේ වැදගත්කම ප්‍රකාශ කරයි.
2. මූලික සමාජ සංස්ථාවල අන්තර් රැඳියාව තේරුම් ගැනීම අපගේ ජීවිතවලට වැදගත් වන බව වටහා ගනියි.

**ගුණාත්මක යෙදවුම්**

- සමාජ සංස්ථාවල ලක්ෂණ ඇතුළත් සංකල්ප සිතියම
- සමාජ සංස්ථාවල අන්තර් රැඳියාව ඇතුළත් රූප සටහන
- පවුලේ රූප සටහන

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්**

පිවිසිමඃ පවුලේ රූප සටහන ප්‍රදර්ශනය කර එහි සංස්ථායික ලක්ෂණ පැහැදිලි කරමින් පාඩමට පිවිසේ (ඇමුණුම් 01)

- සමාජයේ පැවැත්ම සඳහා මහෝපකාරී වන සංස්ථා ගණයට අයත් ප්‍රධාන ආයතන කීපයක් හඳුන්වා දෙන්න.
- සමාජ සංස්ථාවල ලක්ෂණ ඇතුළත් සංකල්ප සිතියම ප්‍රදර්ශනය කරමින් පැහැදිලි කරන්න. (ඇමුණුම් 02)
- න්‍යෂ්ටික පවුල පිළිබඳ හඳුන්වා පවුලේ සාමාජිකයින් සඳහා නියමිත ඥාති පද දක්වන්න.
- පවුලේ කෘත්‍යයන් 4 පිළිබඳ (ජී. පී. මර්ඩොක්) හැඳින්වීමක් කරන්න.
  1. ලිංගික කෘත්‍යය
  2. ප්‍රජනන කෘත්‍යය
  3. අධ්‍යාපන කෘත්‍යය
  4. ආර්ථික කෘත්‍යය
- සමාජ සංස්ථාවල අන්තර් සම්බන්ධතා ඇතුළත් රූප සටහන ප්‍රදර්ශනය කර පැහැදිලි කරන්න. මෙම ආයතන හෙවත් සමාජ සංස්ථා සියුම් දැලක් ලෙස එකිනෙක සම්බන්ධ වී සමාජය නිර්මාණය කරන බව පෙන්වා දෙන්න. (ඇමුණුම් 03)
- පහත ආයතනවල සංස්ථායික පදනම වෙන වෙනම පැහැදිලි කරන්න. (ඇමුණුම් 04)

  ⋆ ඥාතිත්වය ⋆ විවාහය ⋆ ආගම ⋆ අධ්‍යාපනය

- මූලික සමාජ සංස්ථා අන්තර් සබඳතා මත රඳා පවතින බවට කරුණු සනාථ කරන්න.

**ක්‍රියාකාරි සැලැස්ම**


| ක්‍රියාකාරකම | ක්‍රමවේදය |
|---|---|
| සමාජ විද්‍යාවේ මූලික සංකල්ප පිළිබඳ පැහැදිලි කරන්න. සංකල්ප පැහැදිලි කිරීමට උදාහරණ පෙන්වා දෙන්න. සිසුන්ගෙන් පිළිතුරු ලබා ගන්න. | සාකච්ඡා ක්‍රමය |
| △ පිරිමි සංකේතය<br>○ ගැහැනු සංකේතය<br>= විවාහ සංකේතය<br>ප්‍රදර්ශන කරමින් සාකච්ඡා කරන්න. | ප්‍රදර්ශන |

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක**

- න්‍යෂ්ටික පවුලේ රූප සටහන ඇඳ පෙන්වීම.
- සමාජ සංස්ථා යන්න පැහැදිලි කිරීම.
- සමාජ සංස්ථා වශයෙන් පවත්වාගෙන යන පහත මාතෘකා පිළිබඳ කෙටි සටහන් ලිවීම.
  - ⋆ පවුල් සංස්ථාව
  - ⋆ විවාහය
  - ⋆ ඥාතිත්වය
  - ⋆ ආගම
  - ⋆ අධ්‍යාපනය


ඒ අනුව කුඩා පොතක් වශයෙන් නිර්මාණයක් ඉදිරිපත් කිරීම.

ඇමුණුම 1





A - පියා
B - මව
C - තමා (EGO)
D - සොහොයුරා
E - සොහොයුරිය

ඇමුණුම 2




ඇමුණුම 3




සමාජ සංස්ථාවල අන්තර් සබඳතා

ඇමුණුම 4

## පවුල

සාමාජිකයාගේ ජීවිතයට බලපාන සමාජ සංවිධානයක් ලෙස පවුල නම් සමාජ සංස්ථාව හැඳින්විය හැකි ය. මූලික සමාජ ඒකකය වන්නේ ද පවුලයි. සමාජ විද්‍යාඥයින්ගේ මතයට අනුව විශ්විය ආයතනයක් වශයෙන් පවුල සමාජයේ පැවැත්ම සඳහා කරන මෙහෙය සුවිශාල ය. ලොව සෑම සමාජයක ම හමු වන පවුල එක හා සමාන නොවේ. ඒ ඒ සමාජයේ පවතින සංස්කෘතිය එකිනෙකින් වෙනස් වීම ඊට හේතු වේ. සමාජ මානව විද්‍යාඥයෙකු වන ජී. පී. මර්ඩොක් සමාජ 250ක පමණ කරන ලද අධ්‍යානය ඇසුරින් 1949 දී ප්‍රකාශයට පත් කරන ලද සමාජ ව්‍යුහය නැමැති ග්‍රන්ථයෙහි මානව පවුලක කාර්යභාරය සිව් වැදෑරුම් වන බව දක්වා ඇත.

එනම්, 1. ලිංගික
2. ප්‍රජනන
3. අධ්‍යාපන
4. ආර්ථික

මීට අමතරව න්‍යෂ්ටික පවුල, විස්තෘත පවුල යනුවෙන් පවුල් වර්ග දෙකක් දක්වා ඇත.

### අධ්‍යාපන සංස්ථාව

මෙය ද සංස්කෘතික ප්‍රතිමාන සමූහයකි. අනුයෝජනය යනු අධ්‍යාපනය යි. මව පියා ඇතුළු වැඩිහිටි පරම්පරාව විසින් දූ දරුවන් අනුයෝජනය කළ යුතු ය, යනු ප්‍රතිමානයකි. ආරම්භක සමාජවල ගැහැණු දරුවා, බිරිඳ, මව, ගෘහණීය යන භූමිකා අරමුණු කොට ගෙන අනුයෝජනය කළ යුතු විය. පිරිමි දරුවා පියා නිෂ්පාදකයා යන භූමිකා අරමුණු කොට ගෙන අනුයෝජනය කළ යුතු ය.

නවීන සමාජයේ මානව අවශ්‍යතා අතිශය සංකීර්ණ වේ. ඒ සඳහා විද්‍යාව, තාක්ෂණය පිළිබඳ දැනුම අවශ්‍ය වේ. එකී දැනුම දිය හැකි වන්නේ පාසලට බව පිළිගැනීම ප්‍රතිමානයකි. පාසල දැනුම සහිත ගුරුවරුන්ගෙන් සමන්විත ය. එහි දී ලබන අධ්‍යාපනය සහතික මගින් තහවුරු කර ඇත. එකී සහතික මත පදනම්ව විවිධ වගකීම් හෙවත් තනතුරු පවරනු ලැබේ.

### විවාහය

පවුල් සමූහය ද සංස්කෘතික ප්‍රතිමාන සමූහයක පිළිබිඹුවකි. පවුල නම් සමාජ සංස්ථාව සමග ඉතාමත් ම සමීප සම්බන්ධතා පවත්වන සර්ව විශ්වීය සමාජ සංස්ථාවකි විවාහය. එසේ වුවත් විවාහය. සර්ව විශ්වීය වශයෙන් ගත් කල සමාන නැත. එසේ වන්නේ එකිනෙක සමාජයට අදාළ සංස්කෘතික ප්‍රතිමාන එකිනෙකින් වෙනස් වීමයි.

විවාහය පිළිබඳ විවිධ නිර්වචන ඉදිරිපත් කර ඇත. ජී. පී. මර්ඩොක්ට අනුව "ස්ත්‍රියක් හා පුරුෂයෙක් අතර සමාජ ආර්ථික වශයෙන් ගොඩනැගෙන සම්බන්ධතාව විවාහය නම් වේ." සංස්ථායික පදනමක් මත විවාහය නම් ආයතනය මිනිසා විසින් ම පිහිටුවා ගැනීමෙන් ඉටුකර ගැනීමට අපේක්ෂා කරනු ලබන ඉලක්ක කිහිප ආකාරයකින් දක්වා ඇත. ඉන් එක් අදහසකට අනුව

1. ලිංගික ප්‍රේරණය සංතර්පණය කිරීම
2. ප්‍රජා වර්ධන කාර්යය
3. දරුවාට නීතිමය පිළිගැනීමක් ලබා දීම (සහජාත භාවය)
4. ඥාති සබඳතා ගොඩ නගා ගැනීමේ පදනම
5. සාමාජිකයා සංස්කෘතික සත්ත්වයෙකු බවට පත් කිරීම

විවාහ වර්ග කීපයක් ද මේ යටතේ සාකච්ඡා වේ.

ඒක විවාහය (එක් පුරුෂයෙකු එක් කාන්තාවක් සමග)

බහුභාර්යා විවාහය

බහු පුරුෂ විවාහය

සමූහ විවාහය

ඒ අනුව සමාජ සංස්ථාවක් වශයෙන් විවාහය සමාජයෙන් සමාජයට විවිධාකාර හැඩයෙන් යුක්ත ය.

**ඥාතිත්වය**

සෑම සමාජයක ම සාමාජිකයා අතර දැකිය හැකි සම්බන්ධතාවක් ලෙස ඥාති බැඳීම් හැඳින්විය හැකි ය. ඥාතීත්වය යනු ද ප්‍රතිමානමය බැඳීමකි. ඥාතීන් වර්ග දෙකකි. ලේ ඥාතීන් හා විවාහ ඥාතීන් යනුවෙනි. උපත ලබන දරුවාගේ ලේ සම්බන්ධතාව තීරණය වන ආකාරය අනුව ලේ ඥාතිත්වය වර්ග කරනු ලැබේ. එය සමාජයෙන් සමාජයට වෙනස් වන්නේ ප්‍රතිමාන වෙනස් වීමට අනුව ය. විවාහය සඳහා නිර්දේශිත ඥාතීන් විවාහ ඥාතීන් ය. එය ද සමාජයෙන් සමාජයට සාපේක්ෂව වෙනස් විය හැකි ය. ප්‍රතිමානක විවිධත්වයට අනුව ගැහැණුන් හා පිරිමින් අතර ඇති වන පිළිගත් ලිංගික සම්බන්ධතා මගින් දරුවන් බිහි කිරීම ඕනෑම ඥාති ක්‍රමයක පදනම යි. ඒ අනුව විවාහය හා පවුල යන සමාජ සංස්ථා ඥාතිත්වය මත පදනම් වේ. ලේ හා විවාහ ඥාතී පදනමින් මිනිසා විවිධ ඥාති සම්බන්ධතා ගොඩනගා ගනියි. ස්වාමියා බිරිඳ හා දරුවන් එකිනෙකා අතර පවත්නා සම්බන්ධතාවය ඥාතිත්වය මුල් කරගෙන පවත්වන බව විද්‍යාඥයින්ගේ මතය වේ. ඒ අනුව ඥාතිත්වය පිළිබඳ අධ්‍යයනය විශාල පරාසයක් ඔස්සේ විහිද යන බව පැහැදිලි වේ.

**ආගම**

සමාජ විද්‍යාවේ තවත් සුවිශේෂී සමාජ සංස්ථාවක් ලෙස "ආගම" නැමැති සමාජ සංස්ථාව හඳුන්වනු ලබයි. Religion යන වචනය විග්‍රහ කරන සමාජ විද්‍යාඥයින් මිනිසාගේ ජීවිතය පවත්වාගෙන යාම හා එහි පවතින පරමාර්ථ ළඟා කර ගැනීමේ දී පාරභෞතික බලවේග වෙත ඔහු බැඳී ඇති බව පෙන්වා දෙයි. පව, පින, අපාය, දිව්‍යලෝක, දෙවියන්, යක්ෂයන් යනු එවැනි බලවේගය. ආගම පිළිබඳව විවිධ විද්‍යාඥයින් විවිධාකාරයෙන් අර්ථ දක්වා ඇත.

ජේම්ස් ප්‍රේසර් නැමැති විද්‍යාඥයාට අනුව ආගම යනු පරිසරයත්, මානව ජීවිතයත් මෙහෙයවීම හා පාලනයට ලක් කරන මිනිසාට වඩා උත්කෘෂ්ට බලවේග පිළිබඳ විශ්වාසය ය. මෙවැනි නිර් වචන ඔස්සේ ආගමික සංස්ථාව අධ්‍යයනය කළ හැකි ය. සෑම ආගමක ම පොදුවේ දක්‍ක ගත හැකි ලක්ෂණ දෙකක් පවතින බව සමාජ විද්‍යාඥයින් පෙන්වා දී ඇත. එනම්

විශ්වාස හා මති මතාන්තර

පුදපූජා හා සම්මුති

එසේ ම පොදුවේ ආගමක දැකිය හැකි තවත් ලක්ෂණ පහක් දාර්ශනිකයින් විසින් පෙන්වා ඇත.

i. ආගමට සම්බන්ධිත මධ්‍යගත ධර්ම පද්ධතියක් පැවතීම
ii. යම් ශාස්තෘවරයෙක් සිටීම
iii. ශාස්තෘවරයා සම්බන්ධ පුද පූජා ක්‍රමයක් පැවැතීම
iv. ඇදහිලි ක්‍රම සම්බන්ධ සිරිත් විරිත් පැවැතීම
v. ආගම් හා සම්බන්ධ ධර්මතා පිළිගන්නා ජනතාවක් සිටීම

තව දුරටත් ආගමික සංස්ථාව පිළිබඳව විස්තර කරන විද්‍යාඥයින් ලෝකයේ පවතින ප්‍රධාන ආගම් පිළිබඳව වෙන වෙනම විග්‍රහ කර ඇත. ඒවා බෞද්ධ, ක්‍රිස්තියානි, හින්දු, ඉස්ලාම් යුදෙව් වශයෙන් හඳුන්වා ඇත. එම ආගම් පිළිබඳ විග්‍රහය මෙන්ම සමාජ විද්‍යාත්මක හැඳින්වීම අදල පාඩම මගින් තව දුරටත් අධ්‍යයනය කළ හැකිය.

## 02. සමාජ පරිණාමය

**නිපුණතාව 02** - සමාජ පරිණාමය පිළිබඳව විමර්ශනය කරයි.

**නිපුණතා මට්ටම් -** 2.1 න්‍යායාත්මක ආකෘති ඇසුරින් සමාජ පරිණාමය විශ්ලේෂණය කරයි.

2.2 ප්‍රාථමික සමාජ පිළිබඳ න්‍යායාත්මක ඉගැන්වීම් හදාරයි.

2.3 නූතන සමාජ පිළිබඳ න්‍යායාත්මක ඉගැන්වීම් හදාරයි.

2.4 සමාජ පරිණාමය පිළිබඳ බෞද්ධ විග්‍රහයට අනුව ශ්‍රී ලාංකීක සමාජ ජීවිතය අධ්‍යයනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව - 20**

**හැඳින්වීම** -

සමාජ විද්‍යාවේ දී සමාජ වෙනස්වීම නැතහොත් සමාජ පරිණාමය ඉතා වැදගත් සංකල්ප යක් ලෙස සැළකිය හැකි ය. එමෙන්ම සෑම සමාජයකම දැකිය හැකි අනිවාර්ය ලක්ෂණයක් වන්නේ ක්‍රම ක්‍රමයෙන් විකාශනය විම හා වෙනස්වීම යි. සමාජ වෙනස්වීම හෙවත් පරිණාමය සෑම විට ම පදනම් වන්නේ නියත වශයෙන් ම මානව ක්‍රියාකාරකම් මත ය.

බටහිර යුරෝපයේ සමාජ විද්‍යාව නැමැති විෂය බිහි වන්නේ ඉහත සඳහන් කළ අයුරින් ක්‍රම ක්‍රමයෙන් පරිණාමය වී සංකීර්ණත්වයට පත් වූ සමාජය අධ්‍යයනය කිරීමට වෙර දැරීමේ ප්‍රතිඵලයක් ලෙස ය.

වෙනස්වීම යන සංකල්පය පිළිබඳ සාකච්ඡා කළ හැක්කේ සාපේක්ෂ අවස්ථාවන් මුල්කරගෙන ය. වෙනස්වීමේ නිශ්චායකයක් ලෙස කාලය හා ස්ථානය යන දෙකම සැළකිල්ලට ගෙන පරිණාමය තේරුම් ගත හැකි වන අතර කිසියම් වෙනසක් ඇති වන්නේ දෙන ලද කාලයකට හෝ අවස්ථාවකට සාපේක්ෂාව බව පැහැදිලි කරගත යුතු වේ.

නිදසුනක් ලෙස දහනම වන සියවසේ ශ්‍රී ලංකා සමාජයේ පැවැති තත්ත්වය විසි එක්වන සියවස වනවිට බොහෝ සෙයින් වෙනස් වී ඇති බව දැකිය හැකි වේ.

දෙවනුව ස්ථාන අනුව ද වෙනස්කම් ඇතිවිය හැකි වේ. එනම් එකම කාල වකවානුවක ස්ථාන දෙකක වන එවැනි සාමාජීය වෙනස්කම් දැකිය හැකි ය. නිදසුනක් ලෙස උතුරු පළාතේ සහ බස්නාහිර පළාතේ එකම කාලසීමාවක වාර්තා වන වෙනස්වීම එක හා සමාන නොවිය හැකිය.

සමාජ විද්‍යාඥයන්ගේ නිර්වචන හා අදහස් ඇසුරින් සමාජ පරිණාමය යන්න විමර්ශනය කළ හැකි ය. එම අදහස් අනුව ක්‍රම ක්‍රමයෙන් සංකීර්ණත්වයට හා පරිණාමයට භාජනය වීම හා එහි වැදගත් කම විස්තරාත්මකව අවබෝධ කර ගැනීමට ද හැකි වේ. අභ්‍යන්තර හා බාහිර බලපෑම් මත සිදු වන සමාජ වෙනස් වීම් අධ්‍යයනය කිරීමට ද හැකි වේ.

සමාජ පරිණාමය හෙවත් සමාජ වෙනස්වීම අත්‍යවශ්‍ය හා අනිවාර්ය ලක්ෂණයක් වන හෙයින් සාමාජිකයා ඊට අනුගත වීමට තරම් ශක්තිමත් විය යුතු ය. බෞද්ධ දර්ශනය මත පදනම් වන ශ්‍රී ලංකා සමාජය විහාරස්ථානය හා පිරිවෙණ කේන්ද්‍ර කොට ගෙන වෙනස් වන ආකාරය තේරුම් ගැනීම මෙහි දී ඉතා වැදගත් වේ.

**නිපුණතාව -** සමාජ පරිණාමය පිළිබඳව විමර්ශනය කරයි.

**නිපුණතා මට්ටම -** 2.1 න්‍යායාත්මක ආකෘති ඇසුරින් සමාජ පරිණාමය විශ්ලේෂණය කරයි

**කාලච්ඡේද සංඛ්‍යාව - 04**

**ඉගෙනුම් පල**

1. සමාජ පරිණාමය යන්න අර්ථ දක්වයි.
2. සමාජ පරිණාමය පිළිබඳ න්‍යායාත්මක ආකෘති ඉදිරිපත් කළ සම්භාව්‍ය සමාජ විද්‍යාඥයින් නම් කරයි.
3. සම්භාව්‍ය සමාජ විද්‍යාඥයින් සමාජ පරිණාමය පිළිබඳ දක්වූ මතවාද ඇසුරින් ප්‍රාථමික සමාජයක හා නූතන සමාජයක ලක්ෂණ වගුගත කරයි.
4. සමාජ පරිණාමය අඛණ්ඩ ක්‍රියාවලියක් බව පැහැදිලි කරයි.

**හැඳින්වීම -**

සමාජ පරිණාමය පිළිබඳ සමාජ විද්‍යාඥයින් විසින් ඉදිරිපත් කළ පොදු අදහස වූයේ, සමාජය පරිණාමය වීමේ ප්‍රතිඵලයක් ලෙස සරළ ස්වභාවයක සිට සංකීර්ණ තත්ත්වයක් දක්වා ගමන් කරන බවය.

- ප්‍රාථමික සමාජය සාම්ප්‍රදායික කෘෂි ආර්ථිකයකට හිමිකම් කී අතර එහි ස්වයංපෝෂිත සමාජයක් දක්නට ලැබුණි. තාක්ෂණයේ දියුණුවත් සමග සාම්ප්‍රදායික ක්‍රමවලින් සමාජය බැහැර වී නවීන උපකරණ හා උපක්‍රම භාවිත කිරීමට පෙළඹිණි. එහි ප්‍රතිඵලයක් ලෙස මහා පරිමාණ නිෂ්පාදන ආර්ථික රටාවක් බිහිවනු දක්නට ලැබුණි.
- මේ හේතුවෙන් සාම්ප්‍රදායික ගැමි ආර්ථික ක්‍රමය නොවැදගත් තත්ත්වයන්ට පත් වේ. ඒ වෙනුවට කාර්මීකරණය (Industrialization) මත පදනම් වූ නාගරික වෙළෙඳපොළ ආර්ථික රටාවක් බිහි විය.
- සමාජ පරිණාමී ක්‍රියාවලිය හැඳින්වීමේ දී පූර්ව කාර්මික යුගය, කාර්මික යුගය, නාගරීකරණය වැනි සංකල්ප පිළිබඳ වැඩි දුරටත් අධ්‍යයනය කළ යුතු වේ.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය**

- සාකච්ඡා ක්‍රමය
- ප්‍රදර්ශන ක්‍රමය
- ප්‍රශ්නකරණය

**ආකල්ප හා ඇගයුම්**

1. සමාජ පරිණාමය කාලය හා අවස්ථාව අනුව සිදු වෙමින් පවත්නා අඛණ්ඩ ක්‍රියාවලියක් බව අවබෝධ කර ගනියි.
2. වෙනස්වීම මත සමාජය අඛණ්ඩ ගමනක යෙදෙමින් යම් යම් නව ස්වභාවයන්ට අනුගත වෙමින් විකාශය වන බව තේරුම් ගනියි.
3. නව අභියෝගවලට ශක්තිමත්ව මුහුණ දීමේ වැදගත්කම වටහා ගනියි.

**ගුණාත්මක යෙදවුම්**

ඇමුණුම 1

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

- ශ්‍රී ලංකික සමාජයේ අතීත හා වර්තමාන තත්ත්වය පිළිබඳ සිසුන් හා සාකච්ඡා කරමින් පාඩමට පිවිස සමාජ පරිණාමය පිළිබඳ සංකල්පය පැහැදිලි කරන්න.
- සමාජ පරිණාමය පිළිබඳ සම්භාව්‍ය සමාජ විද්‍යාඥයින් පෙන්වා දී ඇති ආකෘති සිසුන් සමග සාකච්ඡා කරන්න. (ඇමුණුම 02)
- සම්භාව්‍ය සමාජ විද්‍යාඥයින් සමාජ පරිණාමය පිළිබඳ දක්වා ඇති කරුණු ඇසුරින් ප්‍රාථමික හා නූතන සමාජවල ලක්ෂණ වෙන්කර පෙන්වා දෙන්න.
- සමාජ පරිණාමය අඛණ්ඩ ක්‍රියාවලියක් බව පෙන්වා දෙන්න.

**ක්‍රියාකාරකම් සැලැස්ම**

| ක්‍රියාකාරකම | ක්‍රමවේදය |
|---|---|
| සම්භාව්‍ය සමාජ විද්‍යාඥයින් සමාජ පරිණාමය පිළිබඳ දක්වා ඇති මතවාද පිළිබඳ සිසුන් හා සාකච්ඡා කිරීම (ඇමුණුම 01) | දේශන හා සාකච්ඡා ක්‍රමය |
| සිසුන් කණ්ඩායම් දෙකකට බෙදා සම්භාව්‍ය සමාජ විද්‍යාඥයින් දක්වා ඇති සමාජ පරිණාමය පිළිබඳ අදහස් ඇසුරින් එක් කණ්ඩායමකට ප්‍රාථමික සමාජ ලක්ෂණත් අනෙක් කණ්ඩායමට නූතන සමාජ ලක්ෂණත් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න | කණ්ඩායම් ක්‍රමය ඉදිරිපත් කිරීම් |

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක**

- සමාජ පරිණාමය යන්න අර්ථ දැක්වීම
- පහත සඳහන් සමාජ විද්‍යාඥයින් පෙන්වා දුන් සමාජ පරිණාමය පිළිබඳ අවධි නම් කිරීම
    - ඔගස්ට් කොම්ට්

- එමිල් ඩුර්කයිම්
- හර්බට් ස්පෙන්සර්
- මැක්ස් වේබර්
- කාල් මාක්ස්

- සම්භාව්‍ය සමාජ විද්‍යාඥයින් පෙන්වා දුන් සමාජ පරිණාමය අවධි ඇසුරින් ප්‍රාථමික සමාජ ලක්ෂණ හා නූතන සමාජ ලක්ෂණ වගුගත කිරීම
- "සමාජ පරිණාමය සර්වකාලීන ක්‍රියාවලියකි" යන මාතෘකාව යටතේ බිත්ති පුවත්පතකට ලිපියක් ලිවීම

ඇමුණුම 01


| සමාජ විද්‍යාඥයින් | සමාජ පරිණාමයේ අවධි |
|---|---|
| ඔගස්ට් කොම්ට් | දේවවාදි අවධිය ⟶ පාරභෞතික අවධිය ⟶ යථානුභූත අවධිය |
| එමිල් ඩුර්කයිම් | යාන්ත්‍රික ඒකාබන්ධතාව සහිත සමාජය ⟶ ඓන්ද්‍රිය ඒකාබන්ධතාව සහිත සමාජය |
| හර්බට් ස්පෙන්සර් | රණකාමී අවධිය ⟶ කාර්මික අවධිය |
| මැක්ස් වේබර් | සම්ප්‍රදායික අවධිය ⟶ තාර්කික අවධිය |
| කාල් මාක්ස් | පූර්ව කොමියුනිස්ට් යුගය ⟶ වහල් යුගය ⟶ වැඩවසම් යුගය ⟶ ධනවාදී යුගය ⟶ සමාජවාදී යුගය ⟶ කොමියුනිස්ට් යුගය |


ඔගස්ට් කොම්ට්


එමිල් ඩුර්කයිම්


හර්බට් ස්පෙන්සර්


මැක්ස් වේබර්


කාල් මාක්ස්

ඇමුණුම 02

සමාජය තේරුම් ගැනීම සඳහා සමාජ පරිණාමය හෙවත් සමාජ වෙනස්වීම පිළිබඳ අවබෝධය වැදගත් වේ. එහෙයින් සමාජ විද්‍යාවේ ආරම්භක අවධියේ සිටම සමාජ පරිණාමය පිළිබඳව ද අධ්‍යයනය කර ඇත. රොබට් නිස්බෙට් පෙන්වා දෙන පරිදි "වෙනස්වීමක් යනු කල්පවත්නා අනන්‍යතාවකින් යුතු කාලීන වෙනස්කම්වල අනුප්‍රාප්තිය යි". මේ අනුව වෙනස්වීම කාලයත් සමග සසඳා තක්සේරු කිරීමේ දී සමහර ලක්ෂණ වෙනස් වුව ද තවත් ලක්ෂණ එලෙසම පවතී. එය කල්පවතින අනන්‍යතාවකි. වෙනස්වීම පිළිබඳ මෙම ලක්ෂණ සමාජ පරිණාමයේ ද දක්නට ලැබේ. එනම් සමාජ සබඳතා, විශ්වාස, අගයන්, ප්‍රතිමාන, සමාජ සංස්ථා, ඇඳුම් පැළඳුම්, ගෘහ නිර්මාණය, භාෂාව ආදී ලක්ෂණ කාලයට සාපේක්ෂව වෙනස් විය හැකි ය. තව ද එකම කාලයක් තුළ සමාජ දෙකක පවතින වෙනස්කම් ඇසුරින් ද සමාජ වෙනස්වීම අධ්‍යයනය කළ හැකි ය. එනම් එකම කාල වකවානුවක කොළඹ නගරය හා හම්බන්තොට නගරය තුළ සමාජ ව්‍යුහයේ පවතින වෙනස්කම් ඇසුරින් එම සමාජයන්හි ස්වභාවය අවබෝධ කර ගත හැකි ය.

කිසියම් සමාජයක ජීවත්වන පුද්ගල සමූහ අතර පවතින අන්තර් සම්බන්ධතාවල ස්වභාවය, තත්ත්වය හා කාර්යභාරය ආදියෙහි ඇති වන වෙනස්කම් සමාජ වෙනස්වීම ලෙස දැක්විය හැකි ය. මේ පිළිබඳ ටොම් බර්න්ස් දක්වන්නේ " සමාජ ව්‍යුහය, සමාජ සංස්ථා, ගති පුරුදු හෝ බඩු භාණ්ඩ යන ක්ෂේත්‍රයන්හි අභ්‍යන්තර හා බාහිර බලපෑම් හේතුවෙන් මුලින් තිබූ තත්ත්වය නව හැඩයක් ගැනීම සමාජ වෙනස්වීම" බවයි. මෙම වෙනස්වීම සමාජයට හිතකර හෝ අහිතකර විය හැකි ය.

සමාජ විද්‍යා විෂය තුළ විවිධ ප්‍රවේශ ඔස්සේ සමාජ වෙනස්වීම පිළිබඳ න්‍යායත්මක මතවාදී විග්‍රහයන් ඉදිරිපත් කර ඇත.

## පරිණාමවාදී න්‍යාය

චාල්ස් ඩාවින් විසින් ජීවයේ පරිණාමය පැහැදිලි, කිරීම සඳහා ගොඩ නගන ලද මතවාදයට අනුරූපව සමාජය ද සරල අවස්ථාවක සිට සංකීර්ණ අවස්ථාවක් දක්වා පරිණාමය වූ ආකාරය සමාජ විද්‍යාඥයින් පෙන්වා දී ඇත.

- ඔගස්ට් කොම්ට් - මානවයාගේ ආරම්භක අවධිය දේවවාදී හෙවත් මිත්‍යා විශ්වාසී අවධියයි. ස්වාභාවික ලෝකය තේරුම් ගත නොහුන මිනිසා ඉර, හඳ, පෘථිවිය වැනි බොහෝ වස්තූන්ට දේවත්වයක් ආරෝපනය කර වැඳුම් පිදුම් කළේ ය. ස්වභාව ධර්මයට අනුකූල ජීවිතයක් ගත කරනු ලැබීය. දෙවන අවධිය අධි භෞතික අවධිය යි. මෙහි දී මිනිසා විසින් ම අදෘශ්‍යමාන දේව සංකල්ප නිර්මාණය කර ගනු ලැබේ. පවත්නා සමාජය හා එකී දෙවිවරු අතර සමීපතම සබඳතාවන් ද ගොඩ නගා ගනු ලැබීය. හින්දු කුල ස්තරායනික සමාජය හා මහා බ්‍රහ්මගේ මැවුම් සංකල්පය නිදසුන් වශයෙන් දැක්විය හැකි ය. මෙම දේවත්වය හා මැවුම හෙවත් නිර්මාණවාදී ඉගැන්වීම් ප්‍රශ්න කිරීමේ ප්‍රතිඵලයක් ලෙස ඊළඟ අවධිය බිහි වූයේ ය. එය යථානුභූත හෙවත් විද්‍යාත්මක අවධිය ලෙස නම් කරනු ලැබේ. එය ගොඩ නැගෙනුයේ පර්යේෂණාත්මකව තහවුරු කරන ලද හෙවත් තර්කානුකූල දැනුම මත යි.

- හර්බට් ස්පෙන්සර් - සරල සම ජාතීය යුධමය හා ආඥාදායක ස්වභාවයෙන් යුත් රණකාමී අවධියෙන් ආරම්භක වන සමාජය වඩාත් දියුණු සංකීර්ණ අවධිය දක්වා පරිණාමය වේ. මෙකී දෙවන අදියරේ දී විසම ජාතීය ගති ස්වභාවන්ගෙන් යුත් සමාජ ක්‍රමයක් දැකිය හැකි වේ. විද්‍යාත්මක ඥානය, කාර්මික නිෂ්පාදන ක්‍රමය, වෙළෙඳපොල අර්ථ ක්‍රමය හා ප්‍රජාතන්ත්‍ර වාදී පාලනය මෙම ගණයේ සමාජවල අනන්‍ය ලක්ෂණ වේ.

  ආකෘතිමය වශයෙන් සමාජය හා සත්ත්ව ශරීරය එක හා සමානව ප්‍රගමනය හෙවත් පරිණාමය වන බව ස්පෙන්සර්ගේ මතය විය. ළඳරු වයසේ දී දරුවෙකු හට ස්වකීය ඉන්ද්‍රිය යන් හසුරුවමින් තම මූලික අවශ්‍යතාවන් හෝ ඉටු කර ගැනීට නොහැක. එහෙත් ළමා කාලය වන විට ටිකින් ටික එකී අවයව ස්වකීය අවශ්‍යතාවන් වෙනුවෙන් ප්‍රයෝජනයට ගත හැකි තත්ත්වයට වර්ධනය වේ. තව දුරටත් ගැටවර, තරුණ වයස් එළැඹෙන විට සිරුරේ ක්‍රියාකාරී ශක්තිය උපරිමයට ළඟා වනු ඇත. එය ශාරීරික සංවර්ධනයේ උපරිමය යි. සමාජය ද ඉතාමත් ප්‍රාථමක අවධියකින් (ළදරු) ආරම්භ වී ක්‍රම ක්‍රමයෙන් ඉදිරියට ගමන් කර නවීන ධනේශ්වර අවධිය (තරුණ) දක්වා ගමන් කරන බව ස්පෙන්සර්ගේ ඉගැන්වීම වන්නේ ය.

## ගැටුම්වාදී න්‍යාය

ආර්ථික සම්පත් විසමාකාරයෙන් බෙදීයාම සූරා කෑම මෙම න්‍යායේ පදනම් සාධක වේ. ආර්ථික සම්පත් වැඩියෙන් උරුම වන පාර්ශ්වය අත බලය ද සංකේන්ද්‍රණය වේ. එනිසා ම එම කණ්ඩායමට ධනය අහිමි හෙවත් නිර්ධන පන්තිකයන් සිය අභිමතය පරිදි හැසිරවීමට හැකි වේ. ශ්‍රමය පමණක් හිමි ඔවුන්ගේ ශ්‍රමය සඳහා සැබෑ වටිනාකමට වඩා අඩුවෙන් ගෙවා එහි වාසිය තමන් සතු කර ගන්නා ධනවතුන් තව තවත් ධනයෙන් හා බලයෙන් ශක්තිමත් වේ. ශ්‍රමයේ සැබෑ වටිනාකම නොගෙවීම සූරාකෑම යනුවෙන් කාල් මාක්ස් හඳුන්වයි. මෙම ක්‍රියාවලිය දිනෙන් දින උග්‍ර වන අතර නිර්ධන පන්තික ජනයා මහත් පීඩාවට පත්වේ. එයින් නිදහස් වීමට නම් සූරාකෑම නවත්වා ලිය යුතු ය. ඒ සඳහා පෙළ ගැසෙන නිර්ධන පන්තික ජනයා අවසානයේ දී ධනේශ්වර පන්තියට එරෙහිව සටන් කරනු ලැබේ. එකී සටන් හෙවත් විප්ලවවල ප්‍රතිඵලයක් ලෙස පැවති සමාජ ක්‍රමය බිඳ වැටී නව සමාජ අවදියකට සමාජය අවතීර්ණ වන්නේ ය. මාක්ස්වාදී ඉගැන්වීමට අනුව සමාජය වෙනස් වෙමින් ඉදිරියට ගමන් කරනු ලබන්නේ නැතහොත් පරිණාමය වන්නේ නැවත නැවතත් ඇති වන මෙම ආකෘතියේ ගැටුම් හෙවත් පන්ති ගැටුම්වල ප්‍රතිඵලයක් ලෙස ය.

- ප්‍රාග් හෙවත් පූර්ව කොමියුනිස්ට් අවධිය - මෙය ශිෂ්ටසම්පන්න අවධියක් නොවන්නේ ය. චර්යාමය වශයෙන් සලකා බලන විට මිනිසා හා අනෙකුත් තිරිසන් සතුන් අතර වෙනසක් නොවීය. තමාගේ යැයි කීමට අවම වශයෙන් විලි වසා ගැනීමට යොදා ගත් රෙදි කඩක් හෝ මෙම අවධියේ මිනිසා හට නොවීය. ස්වභාවික පරිසරයෙන් ලැබෙන ගෙඩි, කොල, පොතු, අල ආදිය කමින් දිය කඩිත්තකින් පිපාසය සංසිඳුවා ගනිමින් ගල් ගුහාවක, ගස් හෙවණක දිවි ගෙවන ලදී. මේ අනුව මෙකී මිනිසාට අයිතිය පිළිබඳ හැඟීම් මාත්‍රයක් හෝ නොවීය. අයිතිය පිළිබඳ හැඟීමෙන් දූෂණය වී නොමැති හෙයින් මෙම අවධියේ මිනිසුන් අතර උස් පහත්කම් හෙවත් පන්ති විසමතාවන් නොවීය. සමාජීය වශයෙන් සමස්ත සාමාජිකත් වය එක හා සමාන ය. එහෙයින් එය කොමියුනිස්ට් ලක්ෂණවලින් හෙබි සමාජයක් ලෙස මාක්ස් විසින් වර්ග කර දක්වනු ලැබේ. ජනගහන වර්ධනය වැනි ස්වභාවික හේතු සාධකවල ප්‍රතිඵලයක් ලෙස මෙකී මිනිසා පැල්පතක් ඉදි කර ගැනීමට පෙළඹිණි. ගහ කොළ වගා කිරීමට පෙළඹිණි. එනම්, නිෂ්පාදන ක්‍රියාවලියට තල්ලු වූ බව යි. ස්වකීය ශ්‍රමය යොදවා

කරන ලද හෙයින් කවර හෝ නිෂ්පාදනයක් පිළිබඳ තමාගේ ය, යන හැඟීම මිනිසා තුළ මුල් වරට ජනනය වන්නේ මෙහි දී ය. එතැන් සිට අයිතියට සාපේක්ෂව මිනිසුන් අතර උස් පහත්කම් හෙවත් විසමතාවන් ඇතිවේ.

- වහල් අවධිය - පන්ති විසමතාවන්ගෙන් හෙබි මුල් ම සමාජය මාක්ස් විසින් හඳුන්වනු ලබන්නේ වහල් අවධිය ලෙස ය. එහි දී ආර්ථිකමය වශයෙන් මෙන් ම බලයෙන් ද සන්නද්ධ කණ්ඩායම වහල් හිමි පන්තිය ලෙස පෙනී සිටින බව මාක්ස්ගේ මතය යි. ධනයෙන් හා බලයෙන් හීන බහුතර ජන කණ්ඩායම වහල් පන්තිය නියෝජනය කරනු ලැබේ. මෙම සමාජයෙහි කොටස්කරුවෙකු වුව ද වහලා යනු වහල් හිමියාගේ දේපළක් වන්නේ ය. මෙම සමාජය තුළ වහලාට කිසිදු ස්වාධීනත්වයක් නොවීය. වහලා විසින් කළ යුතු නොකළ යුතු දෑ තීරණය කරන ලද්දේ වහල් හිමියා විසින් ය. වහලාට හිමි වූයේ තිරිසන් සත්ත්වයෙකුට හා සමාන තත්ත්වයකි. වහල් හිමි පන්තිය විසින් ස්වකීය ධන සම්පත් තව දුරටත් තර කර ගැනීමේ අභිලාෂයෙන් වහල් පන්තික සාමාජිකයාගේ ශ්‍රමය නිර්දය ලෙස සූරා කනු ලැබේ. එකී පීඩනය දිනෙන් දින උග්‍ර වන අතර දරා ගත නොහැකි තරමට වේදනාකාරී සීමාවට එළැඹුන විට සියලු වහලුන් එකට එක්ව පන්තියක් ලෙස ස්වකීය වර්ගයාගේ පොදු සතුරා වන වහල් හිමියාට එරෙහිව නැගී සිටින්නේ ය. මෙය දෙපාර්ශ්වය අතර ගැටුමක් දක්වා උග්‍ර වන අතර එහි අවසානය සනිටුහන් වන්නේ වහල් සමාජ ක්‍රමය බිඳ වැටීමෙන් ය. එයින් අනතුරුව මානව ශිෂ්ටාචාරය අවතීර්ණ වන්නේ වැඩවසම් අවදිය වෙත ය.

- වැඩවසම් අවදිය - මෙය ද පන්ති විසමතාවන්ගෙන් යුත් සමාජ ක්‍රමයකි. සුපුරුදු පරිදි දේපළ හා බලය හිමි පන්තිය රදළයින් ලෙස එක් පසෙක ද බලය හා ධනය අහිමි පන්තිය ප්‍රවේනි දාසයින් ලෙස අනෙක් පස ද වේ. සුපුරුදු පරිදි මෙහි දී ද ධනය හා බලය හිමි රදළ පන්තිය විසින් ප්‍රවේනි දාස පන්තිය නිර්දය ලෙස සූරා කමින් තව තවත් ධනයෙන් හා බලයෙන් ශක්තිමත් වේ. මෙහි දී ද ප්‍රවේනිදාසයා වෙත එල්ල වන අසීමාන්තික පීඩනය එක් අවස්ථාවකට එළැඹෙන විට කිසි සේත් දරා ගත නොහැකි තරමට වේදනාකාරී වන්නේ ය. එම අවස්ථාවේ දී පන්තියක් හැටියට එකට එකතු වන ප්‍රවේනිදාසයා පීඩාවට ලක් කරන පොදු සතුරා හෙවත් රදළයාගෙන් නිදහස් වීම සඳහා නැගී සිටින්නේ ය. පෙර අවස්ථාවේ දී මෙන් ම මෙම ගැටුම්වල අවසානය සනිටුහන් වන්නේ ද වැඩවසම් සමාජ ක්‍රමය බිඳ වැටීමෙන් ය. එයින් අනතුරුව බිහි වන නව සමාජ ක්‍රමය මාක්ස් විසින් නම් කරනු ලබන්නේ ධනේශ්වර හෙවත් ධනවාදී අවදිය ලෙස ය.

- ධනවාදී අවදිය - ධනවාදී අවදිය ද පන්ති සහගත සමාජ ක්‍රමයකි. මෙම සමාජයෙහි ද පන්ති දෙකක් පවතින අතර ඒවා හඳුන්වනු ලබන්නේ ධනය හෙවත් ප්‍රාග්ධන හිමි ධනේශ්වර පන්තිය හා ශ්‍රමය පමණක් හිමි නිර්ධන හෙවත් කම්කරු පන්තිය යනුවෙන් ය. මෙහි දී ද ධනය හා බලය හිමි ධනේශ්වර පන්තිය ස්වකීය ආර්ථික ශක්තිය තව තවත් තර කර ගැනීමේ අරමුණෙන් දිගින් දිගට ම නිර්ධන පන්තික කම්කරුවා පීඩනයට ලක් කරනු ලැබේ. අසීමාන්තික ධන හා බල තෘෂ්ණාවෙන් පීඩිත වූ ධනේශ්වර පන්තිකයා කම්කරුවා වෙත එල්ල කරන පීඩනය දිනෙන් දින වේගවත් වන්නේ ය. අවසානයේ දී කිසිසේත් දරා ගත

නොහැකි තත්ත්වයකට මෙම පීඩනය උග්‍ර වන බව මාක්ස්ගේ මතය යි. එම අවස්ථාවේ දී සමස්ත කම්කරු පන්තිය අන්‍යොන්‍ය වශයෙන් එකට අත්වැල් බැඳගෙන ස්වකීය පොදු හතුරා වන ධනේශ්වර පන්තියට එරෙහිව සටනට අවතීර්ණ වේ. ඉතිහාසයේ මීට පෙර දෙවරක් වූ ආකාරයට ම මෙවර ද වරප්‍රසාදලාභී ධනේශ්වර පන්තිය පෙරළා දැමීමට අති බහුතර ජනගහනය නියෝජනය කරනු ලබන කම්කරු පන්තිය සමත් වේ. ධනේශ්වර විප්ලවය යනුවෙන් හඳුන්වනු ලබන්නේ කම්කරු හා ධනේශ්වර පන්තිකයන් අතර මේ අයුරින් ඇවිල යන ගැටුම ය. ධනේශ්වර සමාජය බිඳ වැටීමෙන් අනතුරුව ශිෂ්ටාචාරය ගමන් කරනු ලබන්නේ සමාජවාදී නමින් හඳුන්වනු ලබන නව සමාජ අවදිය වෙත ය.

- සමාජවාදී අවදිය - මෙය පන්ති විරහිත සමාජ ක්‍රමයකි. සියලු සාමාජිකයන් සමාජ ආර්ථික වශයෙන් එක හා සමාන ය. ඇති නැති පරතරයක් නොමැත. සෑම කෙනෙකුට ම සමාජ ක්‍රමය පවත්වා ගෙන යාම සඳහා ශ්‍රමයෙන් දායක වීමට සිදුවනු ඇත. එනම්, වැඩ කිරීමට සිදුවන බව යි. ඒ අනුව පෙර අවදිවල මෙන් වැඩ කරන හා වැඩ නොක රන දෙපිරිසක් මෙහි දැකිය හැකි නොවන්නේ ය. ඉටු කරනු ලබන වගකීම කුමක් වුව ද ඒ සඳහා හිමි වන ප්‍රතිලාභ එක හා සමාන ය. එහෙයින් සාමාජිකත්වය අතර උස් පහත් භේදයක් නොමැත. මිනිසා පන්ති පදනම්වලට බෙදා වෙන් කරනු ලබන මූල සාධකය වන ධනය මෙහි දී සැවොම අතර සමානව බෙදී යන හෙයිණි. ඒ කෙසේ වුව ද සමාජවාදී අවදියට අවතීර්ණ වීමෙන් පසු ද සැළකිය යුතු කාලයක් ගෙවී යන තෙක් වරින් වර ප්‍රතිවිප්ලව උද්ගත වන බව මාක්ස්ගේ මතය යි. ඒ සමාජවාදී සමාජ ක්‍රමය යළි ධනේශ්වරය කරා ආපසු හැරවීම සඳහා ය. වරප්‍රසාද අහිමි වූ ධනේශ්වර පන්තික ජනයා විසින් වරින් වර මේ ආකාරයට ගසනු ලබන කැරලි පාලනය කිරීම සඳහා සමාජ සම්මත මැදිහත් කරුවෙකු සිටිය යුතු වේ. ඒ වෙනුවෙන් මැදිහත්වීම සඳහා පවත්වා ගෙන යනු ලබන "රාජ්‍ය යන්ත්‍රයක්" මෙම අවදියෙහි ක්‍රියාත්මක වේ. ටික කලක් ගෙවී යන විට මෙකී ධනේශ්වරයන් සිය බලාපොරොත්තු අත් හැර දමනු ලැබේ. වැඩ කරන මිනිසුන් බවට පත්ව ඇති තමන් හට අනෙකුත් සෑම කෙනෙකුට ම කළ හැකි දෙයට වඩා වැඩි යමක් කිරීමට මෙම සමාජයේ දී තව දුරටත් කිසිදු අවකාශයක් නොමැති බව ඔව්හු තේරුම් ගනිති. ඒ හා සමග ම ප්‍රතිවිප්ලව ද ක්‍රම ක්‍රමයෙන් අවසන් වී යයි. ප්‍රතිවිප්ලව මර්ධනය කිරීමේ සමාජ සම්මත මැදිහත්කරුවා ලෙස මේ දක්වා පවත්වා ගෙන යන ලද රාජ්‍ය යන්ත්‍රය තව දුරටත් අවශ්‍ය වන්නේ නැත. ප්‍රතිවිප්ලවවල බලපෑම හීන වී යාමට සමගාමීව මෙකී රාජ්‍ය යන්ත්‍රය ද ටිකින් ටික දිය වී යන බව මාක්ස්ගේ මතය යි. මේ දක් වා එහි වගකීම භාර ගෙන කටයුතු කරන ලද සාමාජිකයන් එකිනෙකා එතැනින් නික්ම තම තමනට හුරු පුරුදු සමාජ මෙහෙවර ඉටු කිරීම ආරම්භ කරනු ලැබේ. එනම්, කෙනෙ ක් රියැදුරෙකු ලෙස ද තව කෙනෙක් ගොවියෙකු ලෙස ද තවත් කෙනෙකු ගුරුවරයෙකු ද ආදී වශයෙන් සාමාන්‍ය සමාජය හා මිශ්‍ර වන බව ය. මේ ආකාරයට ක්‍රම ක්‍රමයෙන් දිය වී යන රාජ්‍ය යන්ත්‍රය සම්පූර්ණයෙන් අහෝසි වීමත් සමග ම සමාජවාදී අවදිය ද අවසන් වේ. එතැන් සිට ඇරඹෙන සමාජ ක්‍රමය "අපර" හෙවත් "පූර්ණ කොමියුනිස්ට්" සමාජය ලෙස මාක්ස් විසින් හඳුන්වනු ලැබේ.

- පූර්ණ කොමියුනිස්ට් අවදිය - මෙය ප්‍රතිවිරෝධතාවන්ගෙන් තොර සර්ව සමබර සමාජයකි. තව දුරටත් පීඩකයෙකු හෝ පීඩිතයෙකු නොමැත. එනිසා ම මෙය ප්‍රතිවිරෝධතාවන්ගෙන් තොර සමාජයක් වේ. එමෙන් ම මෙහි පාලකයෙකු හෝ පාලිතයෙකු නොමැත. පාලකයා ද පාලිතයා ද වන්නේ පොදු මහ ජනතාව ය. වසර මිලියන ගණනක් තිස්සේ වහල්, වැඩවසම් හා ධනේශ්වර යන අවදි පසු කරමින් පැමිණි මානව ශිෂ්ටාචාරය තව දුරටත් පරිණාමය නොවනු ඇත. මානව ශිෂ්ටාචාරයේ සදාකාලික නවාතැන්පොළ හෙවත් නිට්ටාව මෙකී කොමියුනිස්ට් අවදිය බව කාල් මාක්ස්ගේ පිළිගැනීම වන්නේ ය.

**චක්‍රීය න්‍යාය**

චක්‍රීය න්‍යාය පිළිබඳ වඩාත් විශ්වසනීයත්වයකින් අදහස් දක්වන විද්වතුන් විසින් දරන මතයට අනුව ගරා වැටීම හෙවත් ක්ෂය වීම අනිවාර්ය තත්ත්වයක් වන්නේ ය. ඔස්වල්ඩ් ස්පෙන්ග්ලර් (Oswald Spengler, 1918) නමැති ඉතිහාසඥයා විසින් දරන මතයට අනුව සෑම සමාජයක් ම කිසියම් අවස්ථාවක දී උපත ලබයි. නැත හොත් ආරම්භ වේ. එතැන් සිට ක්‍රම ක්‍රමයෙන් වර්ධනයට පාත්‍ර වේ. වර්ධනයේ උපරිම තලයට ළඟා වීමෙන් පසු ගරාවැටීම නැතහොත් ක්ෂයවීම ආරම්භ වේ. අවසානයේ දී විනාශ වී යයි. රෝම අධිරාජ්‍යය මේ ආකාරයට ආරම්භ වී ඉතාමත් බලසම්පන්න තත්ත්වයක් දක්වා වර්ධනය විය. අනතුරුව ක්‍රම ක්‍රමයෙන් එය බිඳවැටීමේ ධර්මතාවට නතු වූයේ ය. ඒ ආකාරයට ම මහා බ්‍රිතාන්‍ය අධිරාජ්‍යය ද උච්චතම සීමාව දක්වා වර්ධනය වූයේ ය. අවසානයේ දී එය ද පොදු න්‍යාම ධර්මයට අනුව බිඳ වැටීමට පටන් ගන්නා ලදී. සමාජ වෙනස් වීමේ හෙවත් පරිණාමී ක්‍රියාවලියේ දී ප්‍රගමනය හා බිඳ වැටීම නියතියක් වන අතර කිසිදු සමාජයකට එයින් බැහැරව සදාකාලිකව එක ම තත්ත්වයක පැවතිය නොහැකි බව ස්පෙන්ග්ලර්ගේ මතය වූයේ ය.

**ව්‍යුහාත්මක කෘත්‍යවාදී න්‍යාය**

සමාජයක් යනු සමාජ සංස්ථා (ආයතන) සමූහයක් ඒකරාශි වීමෙන් ගොඩ නැගෙන සමබර ආයතනයක් බව ව්‍යුහාත්මක කෘත්‍යවාදී න්‍යායාචාර්යවරුන්ගේ පිළිගැනීම වන්නේ ය. පවුල, ආගම, අධ්‍යාපනය, ආර්ථිකය, දේශපාලනය, විවාහය, ඥාතිත්වය යනාදී වශයෙන් හමුවන සියල්ල සමාජ සංස්ථා ගණයට අයත් වේ. ඒ එක් එක් සංස්ථාව මගින් සමාජ පැවැත්ම සඳහා අත්‍යාවශ්‍යයෙන් සම්පූර්ණ විය යුතු විශේෂතම කෘත්‍යයක් හෝ කෘත්‍ය ගණනාවක් ඉටු කරනු ලබයි. සමාජයෙන් බාහිරව හෝ සමාජය අභ්‍යන්තරයෙහි හටගනු ලබන යම් යම් සිදුවීම් මගින් සමාජ සමබරතාව බිඳී යන ආකාරයේ බලපෑමක් එල්ල විය හැකි බව ව්‍යුහාත්මක කෘත්‍යවාදී මතය වන්නේ ය. කිසියම් රටකට බාහිර රටවල වැසියන් බහුලව සංක්‍රමණයවීම ස්වභාවික විපත්, වසංගත, දුර්භික්ෂ, අභ්‍යන්තර යුද්ධ, බාහිර ආක්‍රමණ වැනි අභියෝග හමුවේ සමාජ පර්යාය බිඳ වැටීමට ලක්වීම සාමාන්‍ය තත්ත්වයකි. එවැනි අවස්ථාවක දී සමාජ සංස්ථා හා පවත්නා සමාජ පර්යාය අතර අන්‍යොන්‍ය සම්බන්ධතාව පරස්පර වන බව පෙනී ගොස් ඇත. එවැනි තත්ත්වයක් හා සමග සමාජයකට තව දුරටත් සාමාන්‍ය අකාරයෙන් ඉදිරියට ගමන් කිරීම පහසුකර නොවන්නේ ය. එහෙයින් මෙම තත්ත්වය මග හරවා ගැනීමට පියවර ගත යුතු ය. සමාජ සංස්ථා හා පර්යාය අතර සුගම සම්බන්ධතාවක් ගොඩ නගා ගත යුතු ය. එහෙත් එය ක්ෂණිකව සම්පූර්ණ වන්නේ නැත. වෙනස් වන සමාජ පර්යාය හා සංස්ථායික රාමුව අතර පරතරය සමාජ විද්‍යාඥයන් විසින් හඳුන්වනු ලබන්නේ සංස්කෘතික ලැග්ම යනුවෙන් ය.

කවර හෝ සමාජයක ව්‍යුහය නිර්මාණය වන්නේ සංස්ථායික රාමුව පදනම් කොට ගෙන ය. එහෙයින් යම් සමාජයක හැඩය හා ගුණය තීරණය කිරීමේ පදනම් සාධකය වන්නේ සමාජ සංස්ථා ය. එහෙයින් සමාජයේ මතු පිට වන ක්ෂණික වෙනස්කම් හොඳින් තෝරා බේරා ගෙන අදාළ සමාජයට වඩාත් යෝග්‍ය වන ආකාරයට අවශෝෂණය කර ගත යුතු ය. එකී ව්‍යායාමය සඳහා කිසියම් කාලයක් ගත වනු ඇත. සැබෑ වශයෙන් ම සංස්කෘතික ලැග්ම යන්න සක්‍රීයව පවතින්නේ මෙකී සීමිත කාල පරාසය තුළ පමණි. ස්වයං සංස්කෘතික අනන්‍යතාව වඩාත් හොඳින් ආරක්ෂා කර ගනිමින් නව ප්‍රවණතාවන් ග්‍රහණය වන ආකාරයට සමාජ සංස්ථා සිය හැඩය හා ගුණය වෙනස් කර ගනු ලැබේ. සමාජ පර්යාය හෙවත් සාමාන්‍ය පැවැත්ම තහවුරු කර ගැනීමට මේ අයුරින් සංස්ථායික වශයෙන් ඇති කර ගනු ලබන වෙනස්කම් නොවුන හොත් නියත වශයෙන් ම සමාජය බිඳ වැටෙනු ඇත. මේ අනුව සලකා බලන කල වරින් වර සංස්ථායික වශයෙන් ඇති කර ගනු ලබන වෙනස්කම්වල අවසන් ඵලය වන්නේ සමාජය සුරක්ෂිත කිරීම යි. එනම්, එය සමාජ සේවාවක් හෙවත් කෘත්‍යයක් වන බව යි.

යාන්ත්‍රික ඒකාබද්ධතාවෙන් යුක්ත සමාජයේ ද කාලය හා සමග උද්ගත වන මතු පිට වෙනස්කම් හමුවේ දිගින් දිගට ම සංස්ථායික වෙනස්කම් ඇති විය. එහි ප්‍රතිඵලයක් ලෙස එහි පැවති සරල ශ්‍රම විභජනය ක්‍රම ක්‍රමයෙන් සංකීර්ණත්වයට පත්වේ. ශ්‍රම විභජනයෙන් ප්‍රකට වන්නේ සමස්ත සංස්ථායික පදනම වෙනස් වන බව යි. වෙනත් ආකාරයකට කිවහොත් පොදුවේ මිනිසාගේ ජීවන ක්‍රමය වෙනස් වන බව යි. එහි අනෙක් ප්‍රතිඵලය වන්නේ සමාජ ක්‍රමය යාන්ත්‍රික අවදියෙන් පියමං වී ඓන්ද්‍රිය අවදිය වෙත පිවිසීම යි. ඓන්ද්‍රිය සමාජයෙහි ශ්‍රම විභජනය ඉතා වේගයෙන් තව තවත් සංකීර්ණත්වයට පත්වේ. එම අවදිය අත් කර ගනු ලබන දියුණුව යනු මෙලෙස සංකීර්ණත්වයට පත් වන ශ්‍රම විභජනයේ ප්‍රතිබිම්බය බව කෘත්‍යවාදී මතය යි. ඓන්ද්‍රිය සමාජයෙන් වාර්තා වන අතිශය වේගවත් වෙනස්කම් හමුවේ ද සංස්කෘතික ලැග්ම හා සංස්ථායික හැඩ ගැස්ම නොවෙනස්ව දැකිය හැකි වේ. කෙතරම් සංකීර්ණත්වයට පත් වුව ද කවර හෝ සමාජයක පර්යාය සුරක්ෂිත කිරීමේ වගකීම සමාජ සංස්ථා මත රඳා පවතින හෙයිණි. වයසින් මෝරා යාමට සාපේක්ෂව සත්ත්ව ශරීරය වර්ධනය වේ. වර්ධනයට සාපේක්ෂව ශාරීරික ක්‍රියාකාරිත්වය යළි යළිත් වෙනස් විය යුතු ය. සත්ත්වයාගේ සිත හා ඉන්ද්‍රියයන් අපේක්ෂිත ක්‍රියාකාරීත්වයට සරිලන මට්ටමට වෙනස් වන බව නොරහසකි. නවීන සමාජය ද ඓන්ද්‍රිය රටාවට අනුරූපව වෙනස් වෙමින් හා යළි ස්ථාවර වෙමින් ක්‍රියාත්මක වන හෙයින් එය ඓන්ද්‍රිය සමාජය යනුවෙන් හඳුන්වනු ලැබේ.

**නිපුණතාව -** සමාජ පරිණාමය පිළිබඳව විමර්ශනය කරයි.

**නිපුණතා මට්ටම -** 2.2 ප්‍රාථමික සමාජ පිළිබඳ න්‍යායාත්මක ඉගැන්වීම් හදාරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව - 04**

**ඉගෙනුම් පල**

1. ප්‍රාථමික සමාජය යන්න පැහැදිලි කරයි.
2. ප්‍රාථමික සමාජ අවධීන් පිළිබඳ සමාජ විද්‍යාඥයින් විසින් ඉදිරිපත් කරන ලද න්‍යායාත්මක අදහස් හඳුන්වා දෙයි.
3. ප්‍රාථමික සමාජ අවධීන් පිළිබඳ න්‍යායාත්මක අදහස් තුලනාත්මකව විස්තර කරයි.
4. නූතන හා ප්‍රාථමික සමාජ අතර පවතින වෙනස්කම් අවබෝධයෙන් පෙන්වා දෙයි.

**හැඳින්වීම -**

ඔගස්ට් කොම්ට්ගේ ඉගැන්වීමට අනුව මානව ශිෂ්ටාචාරය ආරම්භ වන්නේ දේවවාදි හෙවත් මිත්‍යා විශ්වාසී (Theological) නම් අතිශය ප්‍රාථමික අවධියෙන් ය. තමා අවට ස්වාභාවික ලෝකය හා එහි විවිධ ක්‍රියාකාරකම් කිසිවක් තේරුම් ගැනීමට තරම් මෙම ප්‍රාථමික මිනිසාගේ ඥාන ශක්තිය දියුණු මට්ටමක නොවීය.වරෙක මෙම භෞතික වස්තු හා ක්‍රියාකාරකම් තමා හා තම වර්ගයාට ආශීර්වාදයක් විය. තවත් වරෙක මහත් වූ ආක්‍රමණිකයන් විය. එවැනි අවස්ථාවල දී ජීවිත පවා අහිමි විය. තමාට වඩා බලසම්පන්න යැයි පෙනී ගිය මෙකී බලවේගයන් හමුවේ වැඳ වැටෙමින් පිළිසරණ පතන්නට පෙළඹෙන්නේ මෙහි දී ය. සූර්යයා, චන්ද්‍රයා, වැස්ස, පෘථිවිය, අකුණු සැර, සුළඟ, ගංගා, ගස්, වැල් ආදී සියල්ලට ප්‍රාණයක් ඇතැයි උපකල්පනය කරනු ලබන මොවුන් දේවත්වයක් ආරෝපණය කරයි. තමන් විසින් ම තීරණය කර ගන්නා ලද ආකාරයට මෙකී දෙවි දේවතාවන් උදෙසා විවිධ පුද පිළිවෙත් කරමින් පිහිට ප්‍රාර්ථනා කරනු ලැබීය. මෙලෙස මිත්‍යා විශ්වාස ක්‍රමයකට පරාධීනව ජීවිතය ගෙවන ලද හෙයින් මෙම අවධිය දේවවාදී හෙවත් මිත්‍යා විශ්වාසී ලෙස නම් කරනු ලබයි.

සමාජ පරිණාමය පිළිබඳ එමිල් ඩුර්කයිම්ගේ විග්‍රහයෙන් දක්වා ඇති ආකාරයට යාන්ත්‍රික ඒකාබද්ධතාව සහිත සමාජය (Mechanical Solidarity) යනු මානව ශිෂ්ටාචාරයේ ආරම්භක අවධිය යි. මූලික වශයෙන් මෙම සමාජය චිරාගතව පැවත එන සිරිත් විරිත්, විශ්වාස,ඇදහිලි මත පදනම් වන සමාජයකි. මෙහි ජීවත් වන සාමාජිකයා ඉතාමත් සරල ය. අවශ්‍යතාවන් සීමිත ය. අවශ්‍යතාවන් සියල්ල සමාජය තුළ ම සම්පූර්ණ කර ගනු ලැබේ. එහෙයින් එය ස්වයංපෝෂිත සමාජයකි. සෑම සාමාජිකයෙකුට ම එකී අවශ්‍යතාවන් සම්පූර්ණ කර ගැනීමට තරම් හැකියාවක් ඇත. එනම් ගොවිතැන, සත්ත්ව පාලනය, ගෙවල් ඉදි කිරීම, වඩු වැඩ, ආයුධ නිපදවා ගැනීම ආදී කටයුතු සියල්ල සාමාන්‍ය අයුරින් ඉටු කර ගැනීමට හැකියාවක් ඇති බව යි. මේ ආකාරයට ම කාන්තාවට ද ඉවුම් පිහුම්, ගෙවල් නඩත්තුව, දරුවන් හදා වඩා ගැනීම, දර දිය ගැනීම, වලං සෑදීම, රෙදි විවීම ආදී ගෘහස්ත කටයුතු සියල්ලම ඉටු කිරීමට හැකියාවක් ඇත. ඒ අනුව මෙහි පවතින ශ්‍රම විභජනය ලිංග භේදය මත පදනම් වී ඇත. එමෙන් ම මෙම සමාජයෙහි හමු වන

සාමාජිකයා හැකියාවනට අනුව එක හා සමාන ය. නැතහොත් සම වර්ගීය ය. පැවැත්ම සඳහා වුවමනා වන සියලු දෑ සම්පූර්ණ කිරීමේ හැකියාවෙන් යුක්ත වන හෙයින් එකිනෙකට වෙනස් කාර්‍යයන් ඉටු කරන කොටස් රැසක් එකලස්ව නිමවන ලද යන්ත්‍රයක් (ඔරලෝසුව, මෝටර් රථය වැනි)හා මෙම සාමාජිකයා ආකෘතිමය වශයෙන් එක හා සමාන වන බව ඩුර්කයිම්ගේ තර්කය යි.එවැනි සාමාජිකයන්ගෙන් සැදුම් ගනු ලබන හෙයින් මෙය යාන්ත්‍රික ඒකාබද්ධතාවෙන් යුත් සමාජයක් ලෙස හඳුන්වනු ලැබේ. මෙහි මූලික ලක්‍ෂණ පහත දැක්වේ.

මානව ශිෂ්ටාචාරය අවධි දෙකක් පසු කරමින් පරිණාමය වන බව මැක්ස් වේබර්ගේ පිළිගැනීම වන්නේ ය. එහි සඳහන් පළමු අදියර සාම්ප්‍රදායික අවදිය ලෙස නම් කරනු ලැබේ. මෙය ආරෝපිත දිශානතික ය. එනිසාම සාමාජිකයා අතර තරගකාරී බවක් නොමැත. මූලික වශයෙන් මෙහි ජීවත් වන සාමාජිකයා දැඩි සම්ප්‍රදාය ගරුක සත්ත්වයෙකි. දේවත්වයෙන් සලකන සම්ප්‍රදාය කවර තත්ත්වයක් යටතේ හෝ අභිභවනය නොකරයි. ඒ අනුව සලකා බලන විට මෙම ගණයේ සමාජ හසුරුවනු ලබන සැබෑ බලවේගය බවට පත් වන්නේ ඇදහිලි, විශ්වාස, සිරිත්, විරිත්, සම්ප්‍රදායයන්, ඥාතිත්වය යනාදියෙන් සැදුම් ගත් පාරම්පරික උරුමයන් ය.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය**

- ✳ සාකච්ඡා ක්‍රමය
- ✳ ප්‍රශ්න ඇසීම

**ආකල්ප හා ඇගයුම්**

1. ප්‍රාථමික සමාජ නොදියුණු මෙන් ම සාම්ප්‍රදායික ගති පැවතුමෙන් යුක්ත බව අවබෝධ කර ගනියි.
2. ප්‍රාථමික සමාජය සාමූහික හැඟීමෙන් එකට ගොනු වූ මිනිසුන්ගෙන් සමන්විත බව වටහා ගැනීමට සමත් වේ.
3. ප්‍රාථමික සමාජයේ පැවති යහපත් ගති ලක්ෂණ න්‍යායාත්මක මත ඇසුරින් තේරුම් ගෙන අගය කරයි.

**ගුණාත්මක යෙදවුම්**

- ඡායාරූප

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

- ඉහතින් දැක්වූ සමාජ විද්‍යාඥයන් විසින් ප්‍රාථමික සමාජ පිළිබඳ ඉදිරිපත් කර ඇති න්‍යායාත්මක අදහස් වෙන් වෙන්ව හඳුන්වන්න.
- එකිනෙක විද්‍යාඥයාගේ අදහස්වලින් කියැවෙන විශේෂ විෂය කරුණු පැහැදිලි කරන්න.

- ප්‍රාථමික සමාජය සමවර්ගීය යැයි වර්ග කරනු ලබන්නේ මන්දැයි පැහැදිලි කරන්න.
- ප්‍රාථමික සමාජයේ දක්නට ලැබෙන ආරෝපිත දිශානතික ලක්‍ෂණ පහදා දෙන්න.

**ක්‍රියාකාරකම් සැලැස්ම**

| ක්‍රියාකාරකම | ක්‍රමවේදය |
|---|---|
| ඔගස්ට් කොම්ට්<br>එමිල් ඩුර්කයිම්<br>හර්බට් ස්පෙන්සර්<br>මැක්ස් වේබර්<br>කාල් මාක්ස් යන සමාජවිද්‍යාඥයන්ගේ ඡායාරූප ප්‍රදර්ශනය කරන්න (ඇමුණුම 1) | ප්‍රදර්ශන ක්‍රමය |
| ඉහත සමාජ විද්‍යාඥයින් ප්‍රාථමික සමාජය පිළිබඳ ඉදිරිපත් කළ අදහස් සාකච්ඡා කරන්න. | සාකච්ඡා ක්‍රමය |

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක**

- ප්‍රාථමික සමාජ පිළිබඳ අදහස් දැක්වූ සම්භාව්‍ය සමාජ විද්‍යාඥයන් අතරින් දෙදෙනෙකුගේ මත පැහැදිලි කිරීම.
- ප්‍රාථමික සමාජයට අනන්‍ය වූ ගති ලක්ෂණ 10ක් ගෙන හැර දැක්වීම.
- ප්‍රාථමික සමාජයෙන් හමු වන, නවීන සමාජයෙහි ද පැවතිය යුතු යැයි ඔබ සිතන ගති ලක්ෂණ 05ක් නම් කිරීම.
- වර්තමාන සමාජයෙන් හමු වන සාම්ප්‍රදායික උත්සව දෙකක් නම් කිරීම.

**මූලික වදන් හා සංකල්ප**

✻ යාන්ත්‍රික ඒකාබද්ධතාව, ආරෝපිත දිශානතිය.

**ඇමුණුම 01**

ඔගස්ට් කොම්ට්

එමිල් ඩුර්කයිම්

හර්බට් ස්පෙන්සර්

මැක්ස් වේබර්

කාල් මාක්ස් යන සමාජවිද්‍යාඥයන්ගේ ඡායාරූප.

**නිපුණතාව -** සමාජ පරිණාමය පිළිබඳව විමර්ශනය කරයි.

**නිපුණතා මට්ටම -** 2.3 නූතන සමාජ පිළිබඳ න්‍යායාත්මක ඉගැන්වීම් හදාරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව - 04**

**ඉගෙනුම් පල**

1. නූතන සමාජය හඳුන්වයි.
2. නූතන සමාජය පිළිබඳ න්‍යායාත්මක අදහස් ඉදිරිපත් කළ සමාජ විද්‍යාඥයන් හඳුන්වයි.
3. නූතන සමාජය පිළිබඳ සමාජ විද්‍යාඥයන් විසින් ඉදිරිපත් කළ න්‍යායාත්මක මත විග්‍රහ කරයි.
4. සමාජ විද්‍යාඥයන් විසින් ඉදිරිපත් කර ඇති නූතන සමාජ ලක්ෂණ ප්‍රායෝගිකව අධ්‍යයනය කරයි.

**හැඳින්වීම -**

සමාජ ආර්ථික වශයෙන් යුරෝපයේ ඇති වූ පරිවර්තනයට සාපේක්ෂව ආර්ථික, දේශපාලනික, ආගමික හා සමාජීය වශයෙන් සිදු වූ වෙනස් වීම් න්‍යායාත්මක වශයෙන් අධ්‍යයනය කළ සමාජ විද්‍යාඥයන් ඒ ඇසුරින් න්‍යායාත්මක සිද්ධාන්ත ගොඩ නගන ලදි.

ඒ අනුව, නවීකරණය (Modernization)

නාගරීකරණය (Uabanization)

කාර්මීකරණය (Industrialization) පිළිබඳව විශේෂ අවධානය යොමු වේ.

නවීකරණය : ආර්ථික නවීකරණය

දේශපාලන නවීකරණය

ප්‍රවාහන හා බහු ජනමාධ්‍ය නවීකරණය

අධ්‍යාපන නවීකරණය දැක්විය හැකිය.

ග්‍රාමීය ප්‍රදේශවල ජීවත්වන ජනතාව නවීන නාගරික පහසුකම් අපේක්ෂාවෙන් නගර කරා සංක්‍රමණය විය. මෙහි ප්‍රතිඵලයක් ලෙස නිවාස විරැකියාව, ජලය, මුඩුක්කු වැනි ගැටලු රැසක් උද්ගත විය. ඒ හා සමගම හොරකම, මංකොල්ල කෑම, මත්කුඩු භාවිතය, ගණිකා වෘත්තිය වැනි අපරාධ වර්ධනය විය.

පවුල නැමැති සමාජ සමූහය වෙනස් කර ලීමෙහිලා කාර්මීකරණය ප්‍රබල බලපෑමක් එල්ල කළේ ය. විස්තෘත පවුල් රටාව බිඳ වැටී න්‍යෂ්ටික පවුල කේන්ද්‍ර කරගත් සමාජ ක්‍රමයක් නිර්මාණය වන්නේ එහි ප්‍රතිඵලයක් ලෙස ය.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය**

- සාකච්ඡා ක්‍රමය
- ප්‍රදර්ශන ක්‍රමය
- දේශන ක්‍රමය

**ආකල්ප හා ඇගයුම්**

1. සමාජ පරිණාමී ක්‍රියාවලියේ දී නූතන සමාජය තුළ දක්නට ඇති ආර්ථික, දේශපාලනික, සාමාජීය වෙනස්වීම් යථාර්ථවාදීව තේරුම් ගැනීම
2. නූතන සමාජය තුළ දක්නට ලැබෙන යහපත් ලක්ෂණ චරිතායනය කර ගැනීමට පෙළඹෙයි

**ගුණාත්මක යෙදවුම්**

- ඉහතින් දක්වන ලද සමාජ විද්‍යාඥයින් විසින් නූතන සමාජය පිළිබඳ දක්වන ලද මතවාද ඇතුළත් රූප සටහන.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්**

- 15 වන සියවසෙන් ආරම්භ වී බටහිර යුරෝපයේ, ව්‍යාප්ත වූ ආගමික ප්‍රතිසංස්කරණ, කාර්මීකරණය, නාගරීකරණය හා නවීකරණය පිළිබඳ හැඳින්වීමක් කරන්න.
- නූතන සමාජයේ අනන්‍ය ලක්ෂණ වන නවීකරණය, නාගරීකරණය හා කාර්මීකරණය පිළිබඳ විස්තර කරන්න.
- නවීකරණයවීම සඳහා බලපාන සමාජ සාධක හා සමාජ ගැටලු වෙන් වෙන්ව වගු ගත කර දක්වන්න.

**ක්‍රියාකාරකම් සැලැස්ම**

| ක්‍රියාකාරකම | ක්‍රමවේදය |
|---|---|
| ප්‍රාථමික සමාජයේ දක්නට ලැබුණු සාම්ප්‍රදායික ජන ජීවිතය නාගරීකරණ බලපෑමෙන් නවීකරණය වූ ආකාරය පිළිබඳ පුවත්පත් ලිපියක් පිළියෙළ කරන්න.<br>සැ: යු: ප්‍රාථමික සමාජය දක්වෙන පින්තූරයක් හා නාගරීකරණය වූ සමාජයේ පින්තූරයක් අලවන්න. | සාකච්ඡා කිරීම<br>රූප සටහන් ඉදිරිපත් කිරීම |
| නාගරීකරණ ලක්ෂණ 10ක් ප්‍රකාශ කිරීම | විස්තර කිරීම |

**ඇගයීම හා තක්සේරුකරණය**

- නවීකරණය නිසා අප ජීවත් වන සමාජයෙන් ගිලිහි යන යහපත් ආකල්ප පිළිබඳ හැඳින්වීම
- කාර්මීකරණය නිසා, නිෂ්පාදනය මහාපරිමාණ වීම හා ශ්‍රම විභජනය ඉහළ යාම පිළිබඳ විස්තර ඉදිරිපත් කිරීම
- නූතන සමාජය තුළ ඔබ අගය කරන වෙනස් වීම් 05ක් පැහැදිලි කිරීම

**නිපුණතාව -** සමාජ පරිණාමය පිළිබඳව විමර්ශනය කරයි.

**නිපුණතා මට්ටම -** 2.4 සමාජ පරිණාමය පිළිබඳ බෞද්ධ විග්‍රහය ඇසුරින් ශ්‍රී ලාංකේය සමාජ ජීවිතය අධ්‍යයනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව -** 08

**හැඳින්වීම -**

සමාජ පරිණාමය පිළිබඳව බෞද්ධ ඉගැන්වීම යටතේ සමාජ ප්‍රභවය, විකාශනය, දියුණුව හා පිරිහීම මෙන්ම රාජ්‍යයේ පහළ වීම, සමාජයෙහි බෙදීම් හා මිනිසාගේ සමාජ තත්ත්වය පිළිබඳ නව අර්ථකථනයක් ඉදිරිපත් කර ඇත. එම තොරතුරු සවිස්තාරාත්මකව ඇතුළත් වන්නේ අග්ගඤ්ඤ සූත්‍රයේ ය.

හින්දු දහමට අනුව සාමාජිකයා අතර බෙදීම අරෝපිත හා ස්ථාවර එකකි. එම ස්ථිර බෙදීම බෞද්ධ දර්ශනයෙන් ප්‍රතික්ෂේප විය. කෙනෙකු සිය ජීවිතය පවත්වා ගෙන යන ආකාරය මත උසස් හෝ පහත් පුද්ගලයෙකු වන බව දක්වා ඇත.

බ්‍රහ්ම නිර්මාණයක් වූ කුල ක්‍රමය බුදු දහමින් ප්‍රතික්ෂේප වී ප්‍රතිපත්තිය මත පදනම්ව භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා යන නව සමාජ ස්තර 4ක් බිහි විය. කූට දන්ත, චක්කවත්ති සීහනාද, ව්‍යග්ඝපජ්ජ හා සිගාලෝවාද යන සූත්‍ර ඇසුරින් යථෝක්ත කරුණු අනාවරණය කර ගත හැකිය.

ක්‍රි. පු. 247 දී පමණ මිහිඳු මාහිමියන්ගේ ලංකාගමනය ශ්‍රී ලංකා ඉතිහාසය ඉතා නවමු මාවතකට යොමු කළේ ය. බුදු දහමේ ආභාසය හේතුවෙන් ජන ජීවිතය සපුරා වෙනස් විය. ඔවුන්ගේ සිතුම් පැතුම් ආකල්ප හා චර්යා රටාවන්හි පැහැදිලි වෙනසක් සිදුවීම ආරම්භ විය.

එතැන් සිට ශ්‍රී ලාංකික සමාජය ගමයි - පන්සලයි වැවයි - දාගැබයි ආකෘතියට අනුව සංවිධානය විය. මෙම ආකෘතිය සමාජ විද්‍යාත්මක වශයෙන් සලකා බලන කල සුවිශේෂ වැදගත්කමක් හිමි වේ.

ශ්‍රී ලාංකික සමාජයේ ප්‍රමුඛතම ජීවනෝපාය වනුයේ කෘෂිකර්මාන්තයයි. වැව යනු ආර්ථික සශ්‍රීකත්වයේ පරම සංකේතයයි. කෘෂි කර්මාන්තයේ සශ්‍රීකත්වය මුලුමනින්ම පායේ වැවේ දියවර හා බැඳී පවතියි. වැව ඉස්මත්තේ ඉදි කළ විහාරස්ථානය ගැමි දිවිය දහමෙන් පෝෂණය කරයි. කිසිදු කුල භේදයකින් තොරව වැව සියලු දෙනාගේ ජීවිත ආරක්ෂා කළා සේම ජනතාව ද වැව ආරක්ෂා කළෝ ය.

ශ්‍රී ලාංකික දේශපාලන ක්ෂේත්‍රය ද බුදුදහමේ බලපෑම මත සංවර්ධනය විය. පාලකයාට තම රට වැසියා දරුවන් සේ සළකා දස රාජ ධර්මයෙන් රට පාලනය කිරීම සඳහා විහාරස්ථානය මගින් උපදෙස් ලබා දෙන ලදි. පාලකයා ද නිරන්තරයෙන් විහාරස්ථානයෙන් අනුශාසනා ලබා ගත් බව පැහැදිලි ය.

ශ්‍රී ලාංකික සමාජයෙහි විධිමත් දියුණු ලේඛන සම්ප්‍රදායක් වර්ධනය වන්නේ "පිරිවෙණ" නැමැති බෞද්ධ අධ්‍යයන ආයතනයේ මූලිකත්වයෙනි. පරිපූර්ණ අක්ෂර මාලාවක් පවා නොතිබුණු සමාජයක මෙවැනි ලේඛන කලාවක් හා සාහිත්‍යයක් බිහි වනුයේ ද සමාජ පාලකයන් හා භික්මුණු ශ්‍රේෂ්ඨ උගතුන් බිහි වූයේ ද විහාරස්ථානය මෙන්ම පිරිවෙණ ද මූලික කර ගෙන ය.

ආර්ථික, සමාජ, සංස්කෘතික හා දේශපාලනික කටයුතුවල සංවර්ධනයට ද බෞද්ධ ඉගැන්වීමෙන් ලැබුණු පිටුවහල ඉතා විශාල ය. වෛද්‍ය විද්‍යාව, අධිකරණය, ජ්‍යොතිෂය වැනි ලෞකික විෂයන් පිළිබඳ මනා දැනුමක් ඇති භික්ෂූන් වහන්සේලා ගැන ද තොරතුරු අසන්නට ලැබේ.

**ඉගෙනුම් පල**

1. ශ්‍රී ලාංකේය සමාජය හඳුන්වයි.
2. ශ්‍රී ලාංකීක සමාජය බුදු දහමින් පෝෂණය වූ අයුරු විස්තර කරයි.
3. මිනිසාගේ හැසිරීම් අනුව සමාජ පරිණාමය මන්දගාමී හෝ වේගවත් ක්‍රියාවලියක් බව පැහැදිලි කරයි.
4. ශ්‍රී ලාංකීක සමාජය විහාරස්ථානය හා පිරිවෙණ ඇසුරින් වෙනස් වී පරිණාමය වූ ආකාරය විස්තර කර පෙන්වයි.

**කාලච්ඡේද සංඛ්‍යාව 04**

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය**

- ශ්‍රී ලාංකීක සමාජය බෞද්ධ මූලධර්ම මත ගොඩ නැගීමෙන් පසු අත්කරගත් දියුණු ස්වාභාවය විස්තර කර දෙන්න.

**ආකල්ප හා ඇගයුම්**

1. බෞද්ධ භික්ෂුවගේ කාර්යභාරය පැහැදිලිව හඳුනා ගනියි.
2. ලාංකික සමාජය තුළ විහාරස්ථානය හා පිරිවෙණ මුල්කර ගත් වෙනස් වීම් අගයමින් එහි ගුණාත්මක දෑ ජීවිතයට අදාළ කර ගැනීම

**ගුණාත්මක යෙදවුම්**

- පෑන්, පැන්සල්
- පින්තූර

### ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්

- ශ්‍රී ලාංකික සමාජය තුළ බෞද්ධ දර්ශනය මුල් බැස ගත් ආකාරය විස්තර කර දෙන්න.
- විහාරස්ථානය මගින් ශ්‍රී ලාංකේය සමාජය තුළ ඇති කළ බලපෑම උදාහරණ සමගින් පෙන්වා දෙන්න.
- රට, ජාතිය, සමාජය, සංස්කෘතිය හා භාෂා සාහිත්‍යය සංරක්ෂණයෙහිලා පිරිවෙණ මගින් ඉටු කළ සමාජ මෙහෙවර පහදා දෙන්න.

### ක්‍රියාකාරි සැලැස්ම

| ක්‍රියාකාරකම | ක්‍රමවේදය |
|---|---|
| ගමයි පන්සලයි වැවයි දාගැබයි සහිත පැරණි ශ්‍රී ලංකාවේ ගමක සිතුවමක් ආශ්‍රයෙන් භික්ෂූන් වහන්සේගේ කාර්යභාරය විස්තර කර පෙන්වන්න. | ප්‍රදර්ශන හා සාකච්ඡා ක්‍රමය |
| "මුල් බුදු සමය ආශ්‍රයෙන් ජන ජීවිතය සුවපත්ව වෙනස් වෙමින් ආ ගමන් මඟ වත්මන් ශ්‍රී ලංකා සමාජය තුළ දක්නට නැත," යන මාතෘකාව යටතේ කතාවක් ඉදිරිපත් කිරීමට සිසුන් යොමු කරන්න. | කථනය |

### ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක

- ශ්‍රී ලාංකික සමාජයේ ගම හා පන්සල අතර තිබූ අන්‍යෝන්‍ය සම්බන්ධය උදාහරණ 02ක් මගින් ඉදිරිපත් කිරීම
- පිරිවෙණ මගින් ලබාදුන් අධ්‍යාපනය හා ශික්ෂණය සමාජ ඉදිරි ගමන කෙරෙහි ඉවහල් වූයේ කෙසේ ද? යන්න පැහැදිලි කිරීම
- නූතන ශ්‍රී ලංකා සමාජය තුළ දක්නට ඇති "බෞද්ධ සමාජ ජීවිතය" මුල් බුද්ධ දේශනානුකූලව පවතී දැයි අසා පිළිතුරු ලබා දීම

## 03. සංස්කෘතිය

**නිපුණතාව -** සංස්කෘතිය යන්න විමර්ශනය කරයි

**නිපුණතා මට්ටම -** 3.1 නිර්වචන ඇසුරින් සංස්කෘතිය යන්න විමර්ශනය කරයි.

3.2 සංස්කෘතියට අදාළ විවිධ ගති ලක්ෂණ හඳුනා ගනියි.

3.3 සමාජය පවත්වා ගැනීමෙහිලා සංස්කෘතියේ බලපෑම් පැහැදිලි කරයි.

3.4 ශ්‍රී ලාංකික සංස්කෘතියට එල්ල වූ විදේශීය බලපෑම් හඳුනා ගනියි.

**කාලච්ඡේද සංඛ්‍යාව - 10**

**හැඳින්වීම -**

මිනිසා විසින් ස්වකීය පැවැත්ම සඳහා නිර්මාණය කර ගනු ලබන භෞතික වූත් අභෞතික වූත් සියල්ලෙහි එකතුව සංස්කෘතියයි. සමාජයක වාර්ගික අනන්‍යතාව පැහැදිලි වන්නේ ඔවුන්ගේ සංස්කෘතියට අනුව ය. සංස්කෘතියක අන්තර්ගතය බොහෝ සංකීර්ණ වේ. සංස්කෘතිය නිර්වච නය කර ගැනීම සඳහා සමාජ විද්‍යාඥයින් විසින් වැඩි උනන්දුවක් දක්වා ඇත්තේ, එම සංකීර්ණ බව නිසා ය. සංස්කෘතිය අර්ථකතනය කිරීම සඳහා නිර්වචන රාශියක් ඉදිරිපත්ව තිබීමෙන් ඒ සඳහා සමාජ විද්‍යාඥයන් තුළ වූ උනන්දුවත් එහි වැදගත් කමත් පැහැදිලි වේ. සංස්කෘතිය යන සංකල්පය පිළිබඳ මනා අවබෝධයක් ලබා ගැනීම පිණිස ඒ පිළිබඳ සමාජ විද්‍යාඥයින් විසින් ඉදිරිපත් කරන ලද නිර්වචන කෙරෙහි අවධානය යොමු කිරීම ඉතා වැදගත් වේ.

සංස්කෘතිය යන්න අධ්‍යයනය කිරීමේ දී "මහාසංස්කෘතිය", "උප සංස්කෘතිය" යන සංකල්ප පිළිබඳ අවධානය යොමු කෙරේ. යම් සමාජයක ජීවත්වන ජනවර්ගයකට අයිති සංස්කෘතිය මහා සංස්කෘතිය යනුවෙන් හැඳින් වේ. බහු වාර්ගික සමාජයක මහ සංස්කෘතීන් කිහිපයක් වුව ද පැවතිය හැකි ය. ශ්‍රී ලංකාවේ සිංහල බෞද්ධ සංස්කෘතිය ප්‍රධාන මහා සංස්කෘතිය වන අතර ද්‍රවිඩ මුස්ලිම් මහා සංස්කෘතීන් ද දක්නට ලැබේ. මහා සංස්කෘතියෙ හි සාමාජිකත්වය දරන සාමාජිකයන් සුවිශේෂී සංස්කෘතික ඒකක ගොඩනගා ගන්නේ නම් එවැන්නක් උප සංස්කෘතියක් ලෙස හැඳින්වේ. මුඩුක්කු සමාජ, විශ්වවිද්‍යාල සමාජ, පැවිදි සමාජ වැනි ඒවා උප සංස්කෘතීන් ලෙස හැඳින්විය හැකි ය. උප සංස්කෘතිය ඊටම ආවේණික ලක්ෂණ මෙන්ම මහා සංස්කෘතිකාංග ද අන්තර්ගත වේ.

සමාජයක් පවත්වා ගැනීමෙහි ලා සංස්කෘතිය ඉතා වැදගත් මෙහෙයක් ඉටු කරනු ලබයි. මිනිස් හැසිරීම් සියල්ල නියාමනය කරනු ලබන්නේ සංස්කෘතිය මගින් ය. අනෙක් අතට සංස්කෘතියේ ස්වභාවය තීරණය වීමට එම හැසිරීම් ඉවහල් වේ. මිනිසා විසින් නිර්මාණය කරගනු ලබන ගේ - දොර, යාන - වාහන, ඇඳුම් - පැළඳුම්, කලාව සාහිත්‍යය වැනි සියලු භෞතික අංගයන් භෞතික සංස්කෘතියට අයත් වන අතර සිරිත් - විරිත්, අදහස්, ආකල්ප, ධර්මතා වැනි ඒවා අභෞතික සංස්කෘතියට අයත් වේ. මේ අනුව සංස්කෘතිය භෞතික හා අභෞතික සංස්කෘතිය යනුවෙන් කොටස් දෙකකින් යුක්ත වේ. සමාජය පවත්වා ගැනීමෙහි ලා භෞතික හා අභෞතික යන සංස්කෘති දෙකම එක හා සමානව වැදගත් වේ. මිනිසා සිතන මතන ආකාරය හා ක්‍රියා කරන ආකාරය නිර්ණය කරනු ලබන්නේ එමගින් ය.

ශ්‍රී ලාංකික සංස්කෘතිය නිර්මාණය වීමේ දී විදේශීය බලපෑම් වැදගත් සාධකයක් වී ඇත. මේ අතරින් ඉන්දීය බලපෑම ඉතාමත් වැදගත් වේ. විජයාගමනය මෙරට සංස්කෘතියෙහි සුවිශේෂී සංධිස්ථානයක් විය. විශේෂයෙන් මහින්දාගමනය හා සමග මෙරට සංස්කෘතිය සිංහල බෞද්ධ සංස්කෘතියක් බවට පරිවර්තනය විය. පසුකාලීනව සිදු වූ බටහිර ජාතීන්ගේ ආක්‍රමණ ද සිංහල සංස්කෘතිය තව දුරටත් වෙනස් වීමට හේතු විය. ශ්‍රී ලාංකික සංස්කෘතිය බටහිර ආරට ගමන් කරනු ලබන්නේ එතැන් සිට ය.

**නිපුණතාව -** සංස්කෘතිය යන්න විමර්ශනය කරයි.

**නිපුණතා මට්ටම -** 3.1 "නිර්වචන ඇසුරින් සංස්කෘතිය යන්න විමර්ශනය කරයි"

**කාලච්ඡේද සංඛ්‍යාව -** 2

**ඉගෙනුම් පල**

1. සංස්කෘතිය යන්න අර්ථකතනය කිරීම සඳහා නිර්වචන රාශියක් ඉදිරිපත් වී ඇති බව කියයි.
2. සංස්කෘතිය සඳහා ඉදිරිපත් වී ඇති නිර්වචන කිහිපයක් ලියා දක්වයි.
3. සංස්කෘතිය යනු මිනිසාගේ සමස්ත සමාජ ජීවිතයම වන බව ප්‍රකාශ කරයි.
4. සංස්කෘතිය යන්න නිර්වචන ඇසුරින් හඳුනාගෙන පැහැදිලි කරයි.

හැඳින්වීම -

සංස්කෘතිය යන්න හඳුනා ගැනීම වැදගත් අවශ්‍යතාවකි. ඒ සඳහා සමාජ විද්‍යාඥයින් උනන්දු වීමේ ප්‍රතිඵලයක් ලෙසින් නිර්වචන රාශියක් ඉදිරිපත් වී ඇත. ඊ.බී. ටයිලර්, රැල්ෆ් ලින්ටන්, ආර්. බ්‍රවුන් යන අයගේ නිර්වචන ඇසුරු කරගෙන සංස්කෘතිය පිළිබඳ විමර්ශනය කළ හැකි ය. සමාජයෙහි ජීවත් වීමෙන් ලබා ගන්නා වූත්, ඊළග පරපුරට පැවරීම මගින් පරම්පරාවෙන් පරම්ප රාවට රැගෙන යන්නාවූත්, සමාජීය සත්ත්වයෙකු ලෙස ජීවත් වන ආකාරය පිළිබිඹු කරන්නා වූත් දැනුම් සම්භාරය සංස්කෘතිය ලෙස අවබෝධ කර ගත හැකි ය. මේ නිර්වචනයෙන් මතුවන කරුණු කිහිපයකි.

- සංස්කෘතිය මිනිසා විසින් තමා ජීවත් වෙන සමාජයයෙන් ගෙන තම ජීවිතයට අභ්‍යන්තරීකරණය කර ගනියි.
- ඊළඟ පරම්පරාවට පවරාදීම මගින් පරපුරෙන් පරපුරට අඛණ්ඩව රැගෙන යයි.
- සමාජය විසින් උරුම කරගත් ශිල්ප දැනුම, ආකල්ප, කුසලතා, ඇගයීම්, ගති සිරිත් වැනි දෑ සංස්කෘතිය තුළ අන්තර්ගත වේ.

මිනිසාගේ සමස්ත සමාජ ජීවිතයම සංස්කෘතියට අනුරූප වන බවත් එයින් පාලනය වන බවත් මේ අනුව පැහැදිලි වේ.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය**

- ඉදිරිපත් කිරීම්
- කේවල ක්‍රමය
- සාකච්ඡා ක්‍රමය

**ආකල්ප හා ඇගයුම්**

1. සංස්කෘතිය යනු පුද්ගල ජීවිතය සවිමත් කරන්නක් බව දැන එයට අනුගත වෙමින් සංස්කෘතිය ආරක්ෂා කර ගැනීමට ඉදිරිපත් වෙයි.

**ගුණාත්මක යෙදවුම්**

- පෑන්, පැන්සල්, බ්‍රිස්ටල් බෝඩ්

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්**

- ඊ. බී. ටයිලර්, රැල්ෆ් ලින්ටන් හා ආර්. බ්‍රවුන් යන තිදෙනා විසින් සංස්කෘතිය අළලා ඉදිරිපත් කළ නිර්වචන ලියන ලද පුවරුවක් පංතිය ඉදිරියේ ප්‍රදර්ශනය කරන්න. (ඇමුණුම 01)
- ප්‍රදර්ශනය කරන ලද නිර්වචන පංතිය ඉදිරියේ හඬනගා කියවීම සඳහා සිසුන් තිදෙනෙකු යොමු කරන්න.
- එම නිර්වචනවල අන්තර්ගත කරුණු ඇසුරින් සංස්කෘතිය යනු කුමක් දැයි අවබෝධ කර ගැනීමට සිසුන්ට මග පෙන්වන්න.
- ඒ අනුව මිනිසාගේ සමස්ත ජීවිතයම සංස්කෘතියෙන් පිළිබිඹු වන ආකාරය පෙන්වා දෙන්න.
- සංස්කෘතිය යන්න අවබෝධ කර ගැනීම සඳහා නිර්වචන රාශියක් ඉදිරිපත් වී ඇති බව පෙන්වා දෙන්න.
- නිර්වචන රැසක් ඉදිරිපත් වී ඇත්තේ සංස්කෘතිය යන්න සංකීර්ණ සංකල්පයක් වන බැවින් එය නිරවුල්ව අවබෝධ කර ගැනීමේ වැදගත්කම තේරුම් ගැනීමට සිසුන්ට මඟ පෙන්වන්න.

**ක්‍රියාකාරකම් සැලැස්ම**

| ක්‍රියාකාරකම | ක්‍රමවේදය |
|---|---|
| සංස්කෘතියට ඉදිරිපත් වූ නිර්වචන ලියන ලද පුවරුව පංතියට ඉදිරිපත් කිරීම | ඉදිරිපත් කිරීම් |
| ඉදිරිපත් කළ නිර්වචන පංතිය ඉදිරියේ හඬනගා කියවීම | කේවල ක්‍රමය |
| නිර්වචනවල අන්තර්ගර්ත කරුණු පිළිබඳ සාකච්ඡා කිරීම | සාකච්ඡා ක්‍රමය |

| | |
|---|---|
| මිනිස් ජීවිතයේ සෑම වැදගත් අවස්ථාවක් ම සංස්කෘතියෙන් පිළිබිඹුවන ආකාරය පැහැදිලි කිරීම | සාකච්ඡා ක්‍රමය |
| සංස්කෘතිය සම්බන්ධයෙන් ඉදිරිපත් වී ඇති වෙනත් නිර්වචන කිහිපයක් ඉදිරිපත් කිරීම | සාකච්ඡා ක්‍රමය |

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක**

* සංස්කෘතිය සඳහා ඉදිරිපත් වී ඇති නිර්වචන 02ක් ලිවීම.
* අවමංගල්‍ය අවස්ථාවක දී කැපීපෙනෙන බෞද්ධ සංස්කෘතික ලක්ෂණ 05ක් නම් කිරීම.
* විවාහ උත්සවයක දී අනුගමනය කෙරෙන සංස්කෘතිකාංග 02ක් විස්තර කිරීම.
* සංස්කෘතිය සඳහා නව නිර්වචනයක් ලිවීම.

**ඇමුණුම 01**

"යම් සමාජයක සාමාජිකයා විසින් ගොඩනගා ගන්නා ලද දැනුම, විශ්වාස, කලාව, සදාචාර සිරිත් විරිත්, නීතිය, ආම්පන්න, තාක්ෂණය යන සංකීර්ණ සමස්තය සංස්කෘතිය නම් වේ"

- එඩ්වර්ඩ් බර්නෙට් ටයිලර් - 1871

"උපකරණ, පාරිභෝගික ද්‍රව්‍ය, විවිධ සමාජීය සමූහයන්ගේ ව්‍යුහමය ලක්ෂණ, මානව සංකල්පනා, ශිල්ප, විශ්වාස හා චාරිත්‍රයන්ගෙන් සැදුම් ගත් සමස්තය සංස්කෘතිය නම් වේ"

- බී. මැලිනොවුස්කි - 1944

"යම් සමාජයක සංස්කෘතිය වූ කලී එහි ජනතාවගේ ජීවන ක්‍රමය" යි

- රැල්ෆ් ලින්ටන් - 1945

**නිපුණතාව -** සංස්කෘතිය යන්න විමර්ශනය කරයි.

**නිපුණතා මට්ටම -** 3.2 "සංස්කෘතියට අදාළ විවිධ ගති ලක්ෂණ හඳුනා ගනියි."

**කාලච්ඡේද සංඛ්‍යාව - 03**

**ඉගෙනුම් පල**

1. සංස්කෘතියෙහි අන්තර්ගත ලක්ෂණ හඳුන්වයි.
2. මහ සංස්කෘතිය හා උප සංස්කෘතීන් හි ලක්ෂණ හඳුනාගෙන ඉදිරිපත් කරයි.
3. එකම රටක් තුළ සංස්කෘතීන් එකක් හෝ වැඩි ගණනක් තිබිය හැකි බව නිදසුන් දෙමින් පෙන්වා දෙයි.
4. ශ්‍රී ලාංකික සමාජයෙහි ඇති මහ සංස්කෘතීන් පිළිබඳ අධ්‍යයනයක යෙදෙමින් ඒවායේ විෂමතා හා සමානතා හඳුනාගෙන සහජීවනය ඇතිකර ගැනීම සඳහා යොමු වෙයි.

හැඳින්වීම -

සංස්කෘතියේ අන්තර්ගතයෙහි මහ සංස්කෘතිය හා උප සංස්කෘතිය යන බෙදීමක් තිබේ. මහ සංස්කෘතිය යනුවෙන් හඳින්වෙන්නේ ජාතිය, ආගම වැනි වාර්ගික අනන්‍යතාව මත ගොඩනැගෙන සංස්කෘතියයි. ජන කණ්ඩායමක වාර්ගික අනන්‍යතාව එමගින් ප්‍රදර්ශනය කෙරේ. බහු වාර්ගික සමාජයක මහ සංස්කෘතීන් කිහිපයක් දක්නට ලැබේ. ශ්‍රී ලාංකික සමාජයේ සිංහල, දෙමළ, මුස්ලිම් වැනි වාර්ගික අනන්‍යතාව පිළිබිඹු කරන මහ සංස්කෘතින් කිහිපයක් ඇති බව දැකිය හැකි වේ. මේවා දිගු කල් පවතින පහසුවෙන් වෙනස් කළ නොහැකි ලක්ෂණයන්ගෙන් සමන්විත වේ.

යම් සාමාජිකයෙකු මහ සංස්කෘතියක සාමාජිකත්වය දරමින් ම තමාට සුවිශේෂ වූ වෙනත් අනු සංස්කෘතික කණ්ඩවල සාමාජිකත්වය දරණ අවස්ථා ඇත. එම සාමාජිකත්වය දරණ අනු සංස්කෘතිය උප සංස්කෘතිය යි. යම් මහ සංස්කෘතියක සාමාජිකයෙකු විශ්වවිද්‍යාලයට ඇතුළත් වීමෙන් පසු ඔහු විශ්වවිද්‍යාල උප සංස්කෘතියෙහි සාමාජිකත්වය ද ලබයි. එම උප සංස්කෘතියට ආවේණික ගති ලක්ෂණ අභ්‍යන්තරීකරණය කර ගනියි. ගිහියෙකු පැවිදි වූ විට ඔහු තම මහ සංස්කෘතියේ සාමාජිකත්වය දරමින් ම පැවිදි උප සංස්කෘතියයෙහි සාමාජිකත්වය දරයි.

සංස්කෘතියක අන්තර්ගතයෙහි ජාතිය, භාෂාව, ආගම, කුලය වැනි සාධක ඇතුළත් වේ. එසේ ම ඒ හා බැඳුණු අදහස්, ආකල්ප, කුසලතා, සිරිත් - විරිත්, ශිල්ප ශාස්ත්‍ර ඥානය, නිමැවුම් වැනි බොහෝ දෑ එහි අන්තර්ගත වේ.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය**

- සාකච්ඡා ක්‍රමය
- කණ්ඩායම් ක්‍රමය
- කේවල ඉරිපත් කිරීම්

**ආකල්ප හා ඇගයුම්**

1. විවිධ සංස්කෘතීන්හි ලක්ෂණ හඳුනා ගනිමින් ඒවාට ගරු කිරීමේ වැදගත්කම වටහා ගනියි.

**ගුණාත්මක යෙදවුම්**

- ලියන කඩදාසි

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්**

- සංස්කෘතියේ අන්තර්ගතය හඳුනා ගැනීමට මඟ පෙන්වන්න.
- සමාජයක මහ සංස්කෘතිය යනු කුමක්දැයි හඳුන්වා දෙන්න.
- උප සංස්කෘති ලක්ෂණ හඳුනා ගැනීමට මඟ පෙන්වන්න. (ඇමුණුම් 01 උදව් කර ගන්න)
- එකම සමාජයක මහ සංස්කෘතීන් කිහිපයක් පැවැතිය හැකි බව ශ්‍රී ලාංකික සමාජයෙන් නිදසුන් සපයමින් පෙන්වා දෙන්න.
- එම සංස්කෘතීන්ට ආවේණික ලක්ෂණ පිළිබඳ සාකච්ඡා කරන්න.
- බහු සංස්කෘතික සමාජයක සංස්කෘතික සහජීවනයේ වැදගත්කම අවබෝධ කර ගැනීමට මඟ පෙන්වන්න.

**ක්‍රියාකාරී සැලැස්ම**

| ක්‍රියාකාරකම | ක්‍රමවේදය |
|---|---|
| සංස්කෘතියක අන්තර්ගතය පිළිබඳ හැඳින්වීම | සාකච්ඡා ක්‍රමය |
| මහ සංස්කෘතිය යනු කුමක් ද යන්න හා එහි ලක්ෂණ පිළිබඳ සාකච්ඡා කිරීම | සාකච්ඡා ක්‍රමය |
| උප සංස්කෘති හඳුන්වාදීම හා ඒවාට නිදසුන් සැපයීම (ඇමුණුම් 02) | සාකච්ඡා ක්‍රමය |

| | |
|---|---|
| ශ්‍රී ලංකා සමාජයෙහි ඇති මහ සංස්කෘතිය පිළිබඳ ගවේශනය කිරීම<br>• සිංහල සංස්කෘතිය<br>• ද්‍රවිඩ සංස්කෘතිය<br>• මුස්ලිම් සංස්කෘතිය | කණ්ඩායම් ක්‍රමය<br>කේවල ක්‍රමය |
| ශ්‍රී ලාංකික සමාජයේ පවතින මහ සංස්කෘතීන් හි සමානතා හා විෂමතා සමාලෝචනය කිරීම | සාකච්ඡා ක්‍රමය |
| අන්තර් සංස්කෘතික සහජීවනයේ වැදගත්කම හඳුනා ගැනීම හා ඒ සඳහා ගත හැකි ක්‍රියාමාර්ග යෝජනා කිරීම | සාකච්ඡා ක්‍රමය, කේවල / කණ්ඩායම් ක්‍රමය |

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක**

- උප සංස්කෘතියක් යනු කුමක් දැයි හැඳින්වීම
- ශ්‍රී ලාංකික සමාජයේ උප සංස්කෘතීන් 04ක් නම් කිරීම
- ශ්‍රී ලාංකික සමාජයෙහි පවතින ද්‍රවිඩ, මුස්ලිම්, සිංහල සංස්කෘතීන් හි සමානතා උදාහරණ මගින් ඉදිරිපත් කිරීම
- බහු සංස්කෘතික රටක් වන ශ්‍රී ලංකාවේ අන්තර් සංස්කෘතික සහජීවනයක් ඇති කිරීම සඳහා යෝජනා 02ක් ඉදිරිපත් කිරීම

ඇමුණුම 1

උප සංස්කෘතියක් යනු ජන සමූහයක් තුළ රෝපණය වූ උප සමූහයකි.

සදර්ලන්ඩ්, වුඩ්වර්ඩ් හා මැක්ස්වෙල් යන තිදෙනා පහත සඳහන් පරිදි උප සංස්කෘතීන් වර්ග කොට ඇත.

I ප්‍රාදේශීය උප සංස්කෘති
II ජනවාර්ගික උප සංස්කෘති
III වෘත්තීමය උප සංස්කෘති
IV ග්‍රාමීය හා නාගරික උප සංස්කෘති
V ආගමික උප සංස්කෘති

**ඇමුණුම 2**

- මහ සංස්කෘතිය - කිසියම් රටක මහජාතියට නැතහොත් ප්‍රධාන ජනවර්ගයට අයත් සංස්කෘතිය
- උප සංස්කෘතිය - මහ සංස්කෘතිය නියෝජනය කරන අතරම වෙනස් සුවිශේෂි අංග මත නිර්මාණය වූ කුඩා සංස්කෘතියකි.

  (සමාජ විද්‍යා ශබ්ද කෝෂයෙහි ''ජාතික සංස්කෘතියේ කුඩා අංශයක්'' යනුවෙන් නිර්වචනය කර ඇත.)
- අන්‍ය සංස්කෘතිය - සමාජයක මහ සංස්කෘතියක් පවතින අතර එම සමාජයෙහි පවතින වෙනත් ජනවාර්ගික සංස්කෘති ය.
- බහු සංස්කෘතිය - වාර්ගික විෂමතාවලින් යුත් සංස්කෘතින් කිහිපයක් සහිත සමාජය

**නිපුණතාව -** සංස්කෘතිය යන්න විමර්ශනය කරයි.

**නිපුණතා මට්ටම -** 3.3 "සමාජය පවත්වා ගැනීමෙහිලා, සංස්කෘතියේ බලපෑම පැහැදිලි කරයි"

**කාලච්ඡේද සංඛ්‍යාව -** 02

**ඉගෙනුම් පල**

1. භෞතික සංස්කෘතිය හා අභෞතික සංස්කෘතිය හඳුනාගෙන පැහැදිලි කරයි.
2. සමාජය පවත්වා ගැනීමෙහිලා භෞතික සංස්කෘතියෙන් හා අභෞතික සංස්කෘතියෙන් සිදුවන මෙහෙය නිදසුන් සහිතව පෙන්වා දෙයි.
3. සංස්කෘතියේ වෙනස්වීම සමාජ පරිණාමය සඳහා හේතුවන බව අවබෝධ කර ගෙන ප්‍රකාශ කරයි.
4. සිංහල සංස්කෘතියේ භෞතික ලක්ෂණ හා අභෞතික ලක්ෂණ හඳුනාගෙන ඉදිරිපත් කරයි.

**හැඳින්වීම -**

සමාජයක පැවැත්ම තිරණය කරනු ලබන ප්‍රධාන සාධකය වන්නේ එම සමාජයේ පදනම වන සංස්කෘතිය යි. ඇතැම් සමාජයක් ආවේගශීලි චර්යාවන්ගෙන් යුතු වන්නේත් තවත් සමාජයක් නිමුණු දමුණු, පරහිතකාමී එකක් වන්නේත් මෙකී සංස්කෘතියට සාපේක්ෂව යි.

සංස්කෘතියක් මූලික කොටස් දෙකකින් යුක්ත වේ. එනම්

I භෞතික සංස්කෘතිය
II අභෞතික සංස්කෘතිය

මිනිසා විසින් සිය චිත්ත හා කායික ශක්තිය මෙහෙයවා නිර්මාණය කරගත් ද්‍රව්‍යමය වූ සියල්ල භෞතික සංස්කෘතියට අයත් වේ. එමගින් මිනිසාගේ දැනුම, කුසලතා මෙන්ම තාක්ෂණයේ දියුණුව නිරූපණය කරයි. මිනිසා විසින් කරන ලද හෝ කරමින් පවතින ඉදිකිරීම්, මෙන්ම විවිධ මාදිලියේ ආම්පන්න සියල්ල ඔහුගේ භෞතික සංස්කෘතියට අයත් වේ.

මිනිසාගේ ආධ්‍යාත්මික සංවර්ධනය උදෙසා නිර්මාණය කර ගනු ලබන සිරිත් - විරිත්, අදහස්, ආකල්ප, ධර්මතා සමාජ සම්බන්ධතා ආදි සමාජ අගනාකම් සියල්ල අභෞතික සංස්කෘතියට අයත් වේ. මිනිසා සමාජීය සත්ත්වයෙකු වශයෙන් අත්පත් කරගත් ආධ්‍යාත්මික සංවර්ධනය අභෞතික සංස්කෘතියෙන් නියෝජනය වේ.

සමාජයක් නව අභියෝගයන්ට මුහුණ දෙමින් සාර්ථක ලෙස පවත්වා ගැනීමෙහිලා භෞතික සංවර්ධනය මෙන්ම ආධ්‍යාත්මික සංවර්ධනය ද එකසේ වැදගත් වේ. ප්‍රාථමික සමාජයක් නූතන නාගරික සමාජයක් බවට පත්වීම සඳහා මූලික වශයෙන් භෞතික සංස්කෘතියේ වෙනස්වීම හේතු සාධක වේ. තාක්ෂණයේ දියුණුවත් දියුණු නිෂ්පාදන ක්‍රමෝපායයන්වල බලපෑමත් හේතු කොට ගෙන නූතන සමාජය නිර්මාණය වේ. එසේ ම නූතන සමාජයේ භෞතික වෙනස්වීමට ගැලපෙන පරිදි අභෞතික සංස්කෘතියට අයත් අංගයන් ද හැඩ ගැසිය යුතු වන්නේ ය. මෙලෙස භෞතික හා අභෞතික සංස්කෘතියේ නව ප්‍රවණතාවනට සාපේක්ෂව නූතන සමාජයේ හැඩය හා පැවැත්ම තීරණය වන්නේ ය.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය**

- සාකච්ඡා ක්‍රමය
- කණ්ඩායම් ක්‍රමය
- කේවල ක්‍රමය

**ආකල්ප හා ඇගයුම්**

1. "සමාජයක යහපැවැත්ම" සංස්කෘතික අගනාකම් ආරක්ෂා වීම මත රඳා පවතින බව අවබෝධ කර ගනිමින් සංස්කෘතිය ආරක්ෂා කර ගැනීමට ඉදිරිපත් වෙයි.

**ගුණාත්මක යෙදවුම්**

- පෑන්, පැන්සල්, අනෙකුත් ලිපි ද්‍රව්‍ය

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්**

- භෞතික සංස්කෘතිය හා අභෞතික සංස්කෘතිය නිදසුන් සහිතව හඳුන්වා දෙන්න.
- සමාජයක් පවත්වා ගැනීමෙහිලා සංස්කෘතිය හේතුවන ආකාරය පහදා දෙන්න.
- භෞතික සංස්කෘතියෙන් නියෝජනය වන්නේ මිනිසා විසින් නිර්මාණය කරගනු ලබන සියලු වාස්තවික දේවල් ය. සමාජයක් පවත්වා ගෙන යාම සඳහා සාමාජිකයාගේ නිර්මාණශීලී දායකත්වය වැදගත් වන බව පෙන්වා දෙන්න.
- අභෞතික සංස්කෘතිය යනු මිනිසාගේ සිතුවිලි සමග බද්ධ වූ සංකල්ප පද්ධතියකි. එය, සමාජයක පැවැත්ම කෙරෙහි කරන මෙහෙය පැහැදිලි කරන්න.
- සංස්කෘතිය වෙනස්වන ආකාරය පහදා දෙන්න. භෞතික සංස්කෘතිය ඉක්මනින් වෙනස් වෙන බවත් අභෞතික සංස්කෘතිය ඊට සාපේක්ෂව සෙමෙන් වෙනස් වන බවත් හඳුනා ගැනීමට මඟ පෙන්වන්න.
- සංස්කෘතියේ වෙනස්වීම සමාජ පරිණාමය සඳහා හේතුවන බව පෙන්වා දෙන්න.
- සිංහල සංස්කෘතියේ භෞතික හා අභෞතික ලක්ෂණ හඳුනා ගැනීමට මඟ පෙන්වන්න.

**ක්‍රියාකාරි සැලැස්ම**

| ක්‍රියාකාරකම | ක්‍රමවේදය |
|---|---|
| භෞතික සංස්කෘතිය හා අභෞතික සංස්කෘතිය හැඳින්වීම | සාකච්ඡා ක්‍රමය |
| භෞතික සංස්කෘතියේ අන්තර්ගත ලක්ෂණ හා අභෞතික සංස්කෘතියේ අන්තර්ගත ලක්ෂණ ගවේෂණය කිරීම (ඇමුණුම 01) | කණ්ඩායම් හෝ කේවල ක්‍රමය |
| සමාජයක් පවත්වා ගැනිමෙහිලා සංස්කෘතිය හේතුවන ආකාරය පැහැදිලි කරදීම | සාකච්ඡා ක්‍රමය |
| සංස්කෘතියේ වෙනස් වීමට අනුව සමාජය පරිණාමය වන ආකාරය පෙන්වා දීම | සාකච්ඡා ක්‍රමය |
| සිංහල සංස්කෘතිය තුළ විද්‍යමාන වන භෞතික සංස්කෘතික ලක්ෂණ හා අභෞතික සංස්කෘතික ලක්ෂණ රැස් කිරීම | කණ්ඩායම් ක්‍රමය හෝ කේවල ක්‍රමය |

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක**

- භෞතික සංස්කෘතිය යන්න කෙටියෙන් හැඳින්වීම
- අභෞතික සංස්කෘතිය යන්න කෙටියෙන් හැඳින්වීම
- සමාජයක් පවත්වා ගෙන යාම සඳහා භෞතික සංස්කෘතිය මගින් කරනු ලබන මෙහෙය පිළිබඳ පැහැදිලි කිරීම
- යහපත් සමාජයක් ඇති කර ගැනීම සඳහා අභෞතික සංස්කෘතිය මගින් ඉටුවෙන සේවය උදාහරණ 02කින් පැහැදිලි කිරීම
- "සංස්කෘතියේ වෙනස් වීමට අනුරූපව සමාජය පරිණාමය වේ" මේ මාතෘකාව යටතේ සඟරාවකට ලිපියක් ලිවීම
- සිංහල සංස්කෘතියේ කැපීපෙනෙන අභෞතික ලක්ෂණ ලැයිස්තුවක් සකස් කිරීම

ඇමුණුම 1

| භෞතික සංස්කෘතිය | අභෞතික සංස්කෘතිය |
|---|---|
| ඇඳුම් පැළඳුම්<br>විලාසිතා<br>කලා ශිල්ප<br>බඩු මුට්ටු<br>ගොඩනැගිලි<br>යාන වාහන<br>හට්ටි, මුට්ටි, වට්ටි, පෙට්ටි, නගුල්, වියගහ, කැති, උදලු | සංකේත<br>ඇදහිලි<br>විශ්වාස<br>සිරිත් විරිත්<br>ගුණ ධර්ම<br>සිතුම් පැතුම්<br>පුරුදු |

**නිපුණතාව -** සංස්කෘතිය යන්න විමර්ශනය කරයි

**නිපුණතා මට්ටම -** 3.4 "ශ්‍රී ලාංකේය සංස්කෘතියට එල්ල වූ විදේශීය බලපෑම් හඳුනා ගනියි."

**කාලච්ඡේද සංඛ්‍යාව - 03**

**ඉගෙනුම් පල**

1. ශ්‍රී ලංකාවට එල්ල වූ විදේශීය බලපෑම් නම් කරයි.
2. ශ්‍රී ලාංකික සංස්කෘතිය කෙරෙහි ඇති වූ විදේශීය බලපෑම් විවරණය කරයි.
3. එම බලපෑම් නිසා සිංහල සංස්කෘතියේ සිදු වූ වෙනස්කම් අවබෝධ කරගෙන විස්තර කරයි.
4. සංස්කෘතික "සම්පර්කය" යනු කුමක් දැයි හඳුනාගෙන උදාහරණ මගින් පැහැදිලි කරයි.

**හැඳින්වීම**

ඓතිහාසික වාර්තාවන්ට අනුව ශ්‍රී ලාංකික සංස්කෘතිය අවස්ථා ගණනාවකදී ම විදේශීය බලපෑම්වලට ලක් වී ඇත. ඒ අතරින් විජයාගමනය හා සමග ශ්‍රී ලාංකික සංස්කෘතියට ඉන්දීය බලපෑම එල්ල වී ඇත. ඒ අනුව එතෙක් පැවැති නොයිඳුල් සිංහල සංස්කෘතිය ඉන්දියානු සංස්කෘතික ලක්ෂණ හා මිශ්‍ර වූයේ ය. රාජාණ්ඩු ක්‍රමය, රාජාභිෂේකය, බමුණු දහම වැනි අංගයන් පමණක් නොව ජල කළමනාකරණය තාක්ෂණ ක්‍රම ද මෙහි ස්ථාපිත විය.

මහින්දාගමනයත් සමග එතෙක් පැවැති ශ්‍රී ලාංකික සංස්කෘතිය බොහෝ වෙනස්කම්වලට ලක් විය. බුදුදහම පැමිණීම, ඒ හා බැඳුණු සිරිත් විරිත් හා සාරධර්ම පද්ධතියක් ස්ථාපිත වීම, භාෂාව පෝෂණය වීම, සාහිත්‍යයක් ගොඩ නැගීම හා ඉදි කිරීම් හා වාරිශිෂ්ටාචාරයක් නිර්මාණය වීම වැනි නව සංස්කෘතිකාංගයන් ස්ථාපනය වන්නේ එතැන් සිට ය. සිංහල සංස්කෘතිය වෙනුවට සිංහල බෞද්ධ සංස්කෘතියක් බිහි වූ බව පැවසෙන්නේ මේ තත්ත්වය හේතු කොට ගෙන ය.

බටහිර ජාතීන් තුනකගේ ආක්‍රමණ නිසා ශ්‍රී ලාංකික සංස්කෘතිය තවදුරටත් වෙනස් කරන ලදි. ආර්ථික, දේශපාලන, සංස්කෘතික ආදි සෑම අංශයකම කැපි පෙනෙන වෙනස්කම් රැසක් එහි ප්‍රතිඵලයක් ලෙස ඇති විය. ඉංග්‍රීසි භාෂාව දේශීය භාෂා අභිබවා නැගී සිටීම, කිතුනු ආගම පැතිරයාම, බටහිර සිරිත් විරිත් ජනප්‍රිය වීම, ප්‍රජාතන්ත්‍රවාදි පාලන ක්‍රමය හා ඊට අදාළ පරිපාලන ව්‍යුහයක් ස්ථාපිත වීම හා සාම්ප්‍රදායික ශිල්ප ශ්‍රේණි ක්‍රමය (කුල ක්‍රමය) වෙනුවට පංති ක්‍රමයක් ස්ථාපිත වීම වැනි වෙනස්කම් ප්‍රකට ය. එහි ප්‍රතිඵලයක් ලෙස සිංහල සංස්කෘතියේ ඇතැම් අංග යටපත් වී බටහිර සමාජයට අනුකූල වූ නව සංස්කෘතිකාංග තහවුරු විය.

දුර්වල සංස්කෘතියක් බලවත් සංස්කෘතියක බලපෑමට ලක් වීම නිසා දුර්වල සංස්කෘතියේ අංගයන් යටපත් වී බලවත් සංස්කෘතියේ ලක්ෂණ මතු වීම "සංස්කෘතික සම්පර්කය" නමින් හැඳින්වේ. ශ්‍රී ලාංකික සංස්කෘතියට විදේශීය සංස්කෘතීන්හි බලපෑම් එල්ල වීමෙන් උද්ගත වූයේ ද ඒ හා සමාන තත්ත්වයකි.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය**

- සාකච්ඡා ක්‍රමය
- කේවල ක්‍රමය
- කණ්ඩායම් ක්‍රමය

**ආකල්ප හා ඇගයුම්**

1. විදේශිය බලපෑමට යටත්ව මෙරට සංස්කෘතියේ ඇති වූ වෙනස්කම් සංස්කෘතික "සම්පර්කය" බව වටහා ගනියි.

**ගුණාත්මක යෙදවුම්**

- පෑන්, පැන්සල්, හා වෙනත් ලිපි ද්‍රව්‍ය

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්**

- ශ්‍රී ලාංකික සංස්කෘතිය කෙරෙහි බලපෑම් එල්ල කරන ලද ඉන්දියානු සංක්‍රමණ පිළිබඳ කරුණු සාකච්ඡා කරන්න.

මෙහි දී

- විජයාගමනය
- මහින්දාගමනය හා දුමින්දාගමනය
- ඉන්දියානු වතු කම්කරුවන්ගේ පැමිණීම වැනි කරුණු පිළිබඳ සරළ සාකච්ඡාවක යෙදෙන්න.

- ඉන්දියානු බලපෑම මත ශ්‍රී ලාංකික සංස්කෘතියේ සිදු වූ වෙනස්කම් පිළිබඳව කරුණු රැස් කිරීමට සිසුන්ට මඟ පෙන්වන්න.

- යුරෝපීය ජාතීන් වන
  - පෘතුගීසින්
  - ලන්දේසීන්
  - ඉංග්‍රීසින් ගේ පැමිණීම පිළිබඳ කෙටි සාකච්ඡාවක යෙදෙන්න.

- යුරෝපීය ජාතීන් නිසා ශ්‍රී ලාංකික සංස්කෘතියේ සිදු වූ වෙනස්කම් පිළිබඳ කරුණු ගොනු කිරීමට මඟ පෙන්වන්න.

- "සංස්කෘතික සම්පර්කය" නැමති සංකල්පය පිළිබඳ සිසුන්ගේ දැනුම අවදි කරන්න. (ඇමුණුම 01)

- සංස්කෘතික සම්පර්කය සක්‍රීය වූ අවස්ථාවලට උදාහරණ සැපයීමට සිසුන් යොමු කරමින් මඟ පෙන්වන්න.

**ක්‍රියාකාරි සැලැස්ම**

| ක්‍රියාකාරකම | ක්‍රමවේදය |
|---|---|
| ඉන්දියානු සංක්‍රමණිකයින් නම් කිරීම හා ඔවුන්ගේ සංස්කෘතිය පිළිබඳ කරුණු ඉදිරිපත් කිරීම | සාකච්ඡා කිරීම |
| ඉන්දියානුවන්ගේ බලපෑම මත ශ්‍රී ලාංකික සංස්කෘතියේ සිදු වූ වෙනස්කම් පිළිබඳ කරුණු ගවේශණය කිරීමට අවස්ථාව ලබා දීම<br>● විජයාගමනය<br>● මහින්දාගමනය හා දුමින්දාගමනය<br>● ඉන්දියානු වතු කම්කරුවන්ගේ පැමිණීම | කේවල හෝ කණ්ඩායම් ක්‍රමය |
| යුරෝපීය ආක්‍රමණිකයන් නම් කිරීම,<br>ඔවුන් මෙහි පැමිණි අරමුණු හා<br>ඔවුන්ගේ සංස්කෘතික ලක්ෂණ පෙන්වා දීම | සාකච්ඡා ක්‍රමය |
| යුරෝපීය ජාතින් වන<br>● පෘතුගීසින්<br>● ලන්දේසීන්<br>● ඉංග්‍රීසින් ගේ ආක්‍රමණ නිසා සිංහල සංස්කෘතියේ සිදු වූ වෙනස්කම් පිළිබඳ කරුණු අධ්‍යයනය කිරීම | කේවල හෝ කණ්ඩායම් ක්‍රමය |
| "සංස්කෘතික සම්පර්කය" නැමති සංකල්පය හඳුන්වා දීම | සාකච්ඡා ක්‍රමය |
| ඉන්දියානු හා යුරෝපීය ජාතීන්ගේ බලපෑම මත ශ්‍රී ලංකාවේ සංස්කෘතික සම්පර්කයකට මග පැදෙන බවට උදාහරණ සැපයීම | කේවල හෝ කණ්ඩායම් ක්‍රමය |

අදාළ ඉගෙනුම් පල අත්කර ගැනීම සඳහා ගැළපෙන වෙනත් ක්‍රියාකාරකම් සැලැස්මක් සකස්කර ගැනීමට ගුරුවරයාට අවස්ථාව ඇත.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක**

- ශ්‍රී ලාංකික සංස්කෘතියට විදෙස් බලපෑම් එල්ල වූ අවස්ථා 4ක් නම් කිරීම
- බටහිර ජාතීන් මෙරටට පැමිණි අරමුණු දෙකක් ලිවීම
- ඉංග්‍රීසින්ගේ ආර්ථික කටයුතු නිසා අපේ සංස්කෘතියට වූ බලපෑම පිළිබඳ කරුණු එක් රැස් කිරීම
- "සංස්කෘතික සම්පර්කය" යන්න හඳුන්වා ඊට ශ්‍රී ලාංකික සංස්කෘතියෙන් උදාහරණ 02ක් දැක්වීම

- මහින්දාගමනයෙන් පසු මෙරට සංස්කෘතියෙහි ඇති වූ වෙනස්කම් පිළිබඳ බිත්ති පුවත්පතකට ලිපියක් ලිවීම

**ඇමුණුම**

සංස්කෘතික සම්පර්කය Acculturation

යම් දුර්වල සමූහයක් හෝ සමාජයක්, බලවත් සංස්කෘතියක් හෝ සමාජයක බලපෑම යටතට ආ විට, බලවත් සංස්කෘතියේ අංග ලක්ෂණ දුර්වල සංස්කෘතියට බලපා එකී දුර්වල සංස්කෘතිය වෙනස් කිරීම සංස්කෘතික සම්පර්කය යි. නමුත් සංස්කෘතික සම්පර්කය සිදු වන්නේ වර්ණාත්මක රටාවකට අනුව ය. එනම් සම්පර්කයට ලක්වන්නා වූ සංස්කෘතියක් ප්‍රබල සංස්කෘතියේ සෑම අංගයක් ම තෝරා නොගනියි. විවිධ අවස්ථාවල ඉන්දියානු මහා සංස්කෘතියේ අංග අප සංස්කෘතියට එක්කර ගනු ලැබුව ද වැන්දඹුවන් ගින්දරට දැමීමේ සති පූජාව වැද්ද නොගැනීම ඊට නිදසුන් ලෙස පෙන්වා දිය හැකි ය. මෙයින් පෙන්වා දිය හැකි වන්නේ දුර්වල සමාජය, ප්‍රබල සංස්කෘතියේ සෑම සංස්කෘතික ලක්ෂණයක්ම තම සංස්කෘතියට එක්කර නොගන්නා බවයි. එනම්, වර්ණාත්මකව වඩාත් සාධනීය අංගෝපාංග පමණක් උකහා ගන්න ලද බවයි.

## 04. පුද්ගලයා හා සමාජය

**නිපුණතාව 04** - සාමාජිකයා හැඩ ගැස්වීමෙහිලා සමාජය ඉවහල් වන ආකාරය අධ්‍යයනය කරයි.

**නිපුණතා මට්ටම් -**

4.1 සාමාජිකයාගේ ජීවිතය කෙරෙහි බලපාන සමාජ පසුබිම අධ්‍යයනය කරයි.

4.2 සරල හා සංකීර්ණ සමාජවල ස්වභාවය වෙන්කර හඳුනා ගනියි.

4.3 ශ්‍රී ලාංකීය සමාජයේ විවිධත්වයට පදනම් වන කරුණු අධ්‍යයනය කරයි.

4.4 බෞද්ධ ඉගන්වීමට අනුව සමාජ විවිධත්වය විවරණය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව - 10**

**හැඳින්වීම** -

ලොව සෑම මිනිසෙකුම ජන්ම ලාභය ලබන්නේ කවරාකාර වූ හෝ සමාජ පසුබිමක ය. එම සමාජ පසුබිමට අයත් භාෂාව, සංස්කෘතිය, ආගම හා සිරිත් විරිත් ආදී අත්‍යවශ්‍ය සාධක වලට අනුගත වීමට සාමාජිකයාට සිදු වේ. එමගින් සිය සමාජීය ආත්මය පෝෂණය කරගනු ලබයි. එමෙන්ම එම සාධක මගින් මෙහෙයවනු ලබන ආකාරයට එදිනෙදා ජීවිතයේ කටයුතුවල දී ක්‍රියා කරනු ලැබේ.

ලොව අනෙකුත් ඕනෑම සමාජයක් මෙන්ම ශ්‍රී ලාංකික සමාජය ද විවිධත්වයට ලක් වී ඇත. ඒ කෙරෙහි ආර්ථික, සංස්කෘතික, දේශපාලන සාධක ඉවහල් වී ඇති අතර ඒ අනුසාරයෙන් සමාජය ස්තරගත වන බව තහවුරු වේ. එමෙන් ම ඒ ඒ ස්තරයට සාපේක්ෂව ධර්මතා, සිතුම් පැතුම් වෙනස් වන බවත් පෙනී යයි. කුමන කුලයක වුව ද බුදුන් වහන්සේගේ බෞද්ධ දර්ශනය තුළ ඔවුන් සියලු දෙනාටම අනුගමනය කිරීමට සිදු වන්නේ එකම රීති සමුදායකි. කෙසේ වුව ද කුල ස්තරායන ක්‍රමය ද තව දුරටත් මෙරට සමාජයේ සුවිශේෂ ආයතනයක් ලෙස සක්‍රීය බව ඉතාමත් පැහැදිලි ය. එහෙත් බුදුදහමට අනුව පන්ති හෝ කුල ස්තර ක්‍රම සම්පූර්ණයෙන් අතර්කානුකූලය. එහෙයින් ඒ සියල්ල බුදුදහමින් ප්‍රතික්ෂේප වේ. කෙනෙකු ජීවත් වන රටාවට හෙවත් ධාර්මික හෝ අධාර්මික භාවයට අනුව එම තැනැත්තාට හිමි සමාජ තලය තීරණය වන බව බුදුදහම මගින් පෙන්වා දෙනු ලැබේ.

**නිපුණතාව** - සාමාජිකයා හැඩ ගැස්වීමේහිලා සමාජය ඉවහල් වන ආකාරය අධ්‍යයනය කරයි.

**නිපුණතා මට්ටම** - 4.1 සාමාජිකයාගේ ජීවිතය කෙරෙහි බලපාන සමාජ පසුබිම අධ්‍යයනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව - 02**

**ඉගෙනුම් පල**

1. සාමාජිකයා හා සමාජය අතර සම්බන්ධතාව පැහැදිලි කරයි.
2. සාමාජිකයාගේ පෞරුෂ වර්ධනය සඳහා සමාජ පසුබිම සාධකයක් වන අයුරු පෙන්වා දෙයි.
3. සමාජයේ සාමාජිකයෙකු වශයෙන් කෙනෙකු විසින් ඉටු කළ යුතු කාර්යයන්හි වැදගත්කම අගය කරයි.

**හැඳින්වීම** -

ඕනෑ ම මිනිසෙකු කුමන හෝ සමාජයක සාමාජිකයෙකු වේ. සමාජයක් යන්න බැලූ බැල්මට පුද්ගල එකතුවකි. පුද්ගලයාගෙන් තොරව සමාජයක් පිළිබඳව කතා කළ නොහැකි බැවින් පුද්ගලයා කිසියම් හෝ සමාජයක සාමාජිකයෙකු වීම කිසි සේත්ම වැළැක්විය නොහැක. මෙය ආරෝපිත තත්ත්තවයකි. එනම් උපතින්ම ලැබෙන්නකි. මෙම ආරෝපිත තත්ත්වය පුද්ගලයාගේ ජීවිතය කෙරෙහි සෘජුව ම බලපානු ලබයි.

ආරෝපිත දිශානතික සමාජයක දී ස්ත්‍රී පුරුෂභාවය, කුලය වැනි සාධකවලට අනුව කෙනෙකුගේ තත්ත්වය තීරණය වේ. ඔහුට ඇයට පැවරෙන කාර්යභාරය ද ඊට අනුරූපය. එය තරගකාරීත්වයෙන් තොර සමාජයකි. එහෙයින් සුවිශේෂී නිපුණතාවයන් පිළිබඳ උනන්දුවක් දැක්වීමට වුවමනා නොවීය. මෙවැනි සරල සමාජවල සාමාජිකයාගේ අවශ්‍යතාවන් අතිශයනින් ම සීමා වීම ද හේතු වූ වැදගත් සාධකයක් විය.

සාධික දශානතික නවීන සමාජවල තත්ත්වය ඊට හාත්පසින්ම වෙනස් වේ. එය විවෘත ගුණයෙන් යුක්ත ය. එනිසා ම දැඩි තරගකාරීත්වයක් එහි දැකිය හැකි වේ. එමෙන් ම මෙහි සාමාජිකයාගේ අවශ්‍යතාවන් ඉතාමත් බහුල ය. සංකීර්ණ ය. කෙනෙකුගේ සමාජ තත්ත්වය තීරණය වූයේ අධ්‍යාපන, තාක්ෂණික, ශිල්පීය සුදුසුකම්වලට අනුවයි. තත්ත්වය සුරක්ෂිත වූයේ හෝ එහි තව දුරටත් අභිවෘද්ධියක් ඇති වූයේ කාර්යක්ෂමතාව, නිර්මාණශීලිත්වය වැනි නිර්ණායකයන්ට අනුව ය. එහෙයින් මෙම ගණයේ නවීන සමාජවල සාමාජිකයන් ගිහි පැවිදි හෝ වෙනත් කිසිදු භේදයකින් තොරව තම තමන් අපේක්ෂා කරන සමාජ තලය හෙවත් තත්ත්වය ළඟා කර ගැනීමට නම් ඊට අදාළ සුදුසුකම් සම්පූර්ණ කර ගත යුතු ය. එමෙන් ම එය ආරක්ෂා කර ගැනීමට හා තව දුරටත් ඉහළට යාම සඳහා කාර්යශූරත්වය හා නිර්මාණශීලිත්වය ප්‍රදර්ශනය කළ යුතු ය.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය**

- සාකච්ඡා ක්‍රමය
- ප්‍රදර්ශන ක්‍රමය
- කණ්ඩායම් ක්‍රමය
- ඉදිරිපත් කිරීමේ ක්‍රමය

**ආකල්ප හා ඇගයුම්**

1. සමාජයක් තුළ විවිධ සමාජ පසුබිම් ඇති බව වටහා ගනියි.
2. පුද්ගල පෞරුෂය කෙරෙහි සමාජ පසුබිම ඉවහල් වන බව අවබෝධ කර ගනියි.

**ගුණාත්මක යෙදවුම්**

- වීඩියෝ දර්ශන
- කාර්ය පත්‍රිකා

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්**


- ශිෂ්‍යයා සමග යම් සමාජයක් තුළ පවතින විවිධ සමාජ පසුබිම් පිළිබඳ සාකච්ඡා කරන්න.
- එම සමාජ පසුබිම් තුළ ජීවත්වන සාමාජිකයාට එකී සමාජ පසුබිමට අනුව පැවරෙන කාර්ය භාරය වෙනස් වන බව පෙන්වා දෙන්න.
- භික්ෂු සමාජය හා එහි කාර්ය භාරය උදාහරණයට ගනිමින් අනෙකුත් සමාජවලට වඩා එහි සාමාජිකයාට කිරීමට ඇති කාර්ය භාරය වෙනස් වන බව පෙන්වා දෙන්න.
- පුද්ගල පෞරුෂය වර්ධනය වන ආකාරය භික්ෂු සමාජය ඇසුරින් පෙන්වා දෙන්න.

**ක්‍රියාකාරී සැලැස්ම**

| ක්‍රියාකාරකම | ක්‍රමවේදය |
|---|---|
| විවිධ ජන සමාජවල සාමාජිකයන්ගේ සිරිත් විරිත් දැක්වෙන ඡායාරූප ඉදිරිපත් කිරීම හා නැරඹීමට අවස්ථාව ලබා දෙන්න | ප්‍රදර්ශන ක්‍රමය |
| විවිධ ජන සමාජවල සමාජ පසුබිම පිළිබඳව සාකච්ඡා කරන්න. | සාකච්ඡා ක්‍රමය |
| ශිෂ්‍යයාට ඔහුගේ සමාජ පසුබිම හඳුන්වා දෙන්න. එවැනි සමාජ පසුබිම් වර්ගීකරණය කරන්න. | සාකච්ඡා ක්‍රමය |
| සිසුන් කණ්ඩායම් කර ඇමුණුම් අංක 01 කාර්ය පත්‍රිකාව ලබා දෙන්න | කණ්ඩායම් ක්‍රමය |
| වාර්තා පංතියට ඉදිරිපත් කර ඇගයුම හා ප්‍රතිපෝෂණය ලබා දෙන්න | ඉදිරිපත් කිරීමේ ක්‍රමය |

**ඇගයීම හා තක්සේරුකරණය**

- සමාජයේ ජීවත්වන සාමාජිකයන් පස්දෙනෙකු අයත් විවිධ සමාජ පසුබිම් ලිවීම
- පහත සඳහන් රූප සටහන සම්පූර්ණ කිරීම




- සමාජයේ සාමාජිකයෙකු ලෙස තමන් විසින් ඉටු කළ යුතු කාර්යන් 10ක් ලිවීම

**ඇමුණුම 01**

**කාර්ය පත්‍රිකාව 01**

පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම

01) පහත සාමාජිකයන්ට ඒ ඒ තත්ත්වයට අනුව පැවරී ඇති කාර්යයන් මොනවා ද? යන්නට පිළිතුරු ලිවීම.

I ලියුම් බෙදන්නා

II විහාරාධිපති හිමි

III පරිවෙණාධිපති හිමි

IV දායක සභාවේ සභාපති තුමා

**නිපුණතාව** - සාමාජිකයා හැඩ ගැස්වීමේහිලා සමාජය ඉවහල් වන ආකාරය අධ්‍යයනය කරයි.

**නිපුණතා මට්ටම** - 4.2 සරල හා සංකීර්ණ සමාජවල ස්වභාවය වෙන්කර හඳුනා ගනියි.

**කාලච්ඡේද සංඛ්‍යාව - 02**

**ඉගෙනුම් පල**

1. සරල හා සංකීර්ණ සමාජ අර්ථ දක්වයි.
2. සරල හා සංකීර්ණ සමාජවල වෙනස්කම් පැහැදිලි කරයි.
3. සරල හා සංකීර්ණ සමාජවල හිතකර ලක්ෂණ විමර්ශනය කරයි.

**හැඳින්වීම** -

ලොව සෑම සමාජයක් ම ප්‍රධාන ප්‍රභේද 02කට වර්ගීකරණය කළ හැකි ය. එනම් සරල සමාජ හා සංකීර්ණ සමාජ යනුවෙනි. සරල සමාජ සඳහා ප්‍රධාන උදාහරණයක් ලෙස ග්‍රාමීය සමාජය හඳුන්වා දිය හැකිය. පැරණි ශිලා යුගයේ මිනිසා ජීවත් වීම සඳහා සතුන් දඩයම් කිරීම මූලික කරගත් අතර පසු කාලීනව ආරම්භ වූ කෘෂි කර්මාන්තය සමග ඇති වූ කෘෂි ජීවන රටාවට අනුව මුල්ම ග්‍රාමීය සමාජ ආකෘතිය බිහි වූ බව පැහැදිලි වේ.

වැවයි, දාගැබයි - ගමයි පන්සලයි යන සංකල්පයට අනුව මෙරට ආරම්භක අවදියේ ගම නිර්මාණය වී තිබූ බව පැහැදිලි ය. කෘෂි කර්මාන්තයේ සෑම කටයුත්කතටම මුල පිරීම පන්සල පෙරටු කොට ගෙන ක්‍රියාමත්මක වූ බව ද පැහැදිලි වේ.

මූලික වශයෙන් මෙම සමාජ කෘෂිකාර්මික වූ හෙයින් සාමාජිකයාගේ අවශ්‍යතා ඊට සාපේක්ෂ විය. එනිසාම එහි තරඟකාරී බවක් ද නොවී ය. බාහිර ලෝකය හා සමග කිසිදු සම්බන්ධතාවක් පැවැත් වූයේ නැත. සීමිත අවශ්‍යතාවන් ගම තුළ ම නිපදවා ගනු ලැබී ය. ඒ අනුව මෙම ගැමි සමාජය සරල හා ස්වයංපෝෂිත එකක් විය.

ඉතිහාසඥ ලෙවිස් මට්ෆෙන්ඩ්ට අනුව නගරය මිනිසුන්ගේ හැකියාවන් වර්ධනය කරන ස්ථානයක් මෙන්ම මිනිසාගේ අත්දැකීම් පෘථුල කරන මධ්‍යස්ථානයකි.

නාගරික සංකීර්ණ සමාජයෙන් ප්‍රකට වන ප්‍රධානතම ලක්ෂණය වන්නේ එහි වැසියන් උසස් යැයි සම්මත සංස්කෘතියකට කැමැත්ත දක්වන කොටසක් වීම යි. නගරයෙහි ජීවත් වීම සිය ඵලදායීතාව ඉහළ තලයකට ගෙන යාමට පිටු බලයක් වන බව මෙම වැසියන්ගේ විශ්වාසය යි.

කර්මාන්ත බහුල වීම නාගරික සමාජවල තවත් ලක්ෂණයකි. අඩු ආදායම් ලාභී ග්‍රාමීය ජනතාව සිය ජීවන අභිවෘද්ධිය අරමුණු කොට ගෙන නාගරික සමාජයට සංක්‍රමණය වන අතර එහි ප්‍රතිඵලයක් ලෙස තව දුරටත් නාගරීකරණය වේගවත් වේ. එමෙන් ම නාගරික සමාජවල නිර්මාණය වන විවිධාකාර ගැටලුවලට මුල්වන එක් මූලික හේතුවක් වන්නේ ද මෙම ජන සංක්‍රමණයයි.

පරිපාලන කේන්ද්‍රස්ථාන ස්ථානගතව ඇත්තේ මෙම සංකීර්ණ නාගරික සමාජවල ය. ගමනාගමන පහසුව මෙන්ම දියුණු නවීන මාර්ග පද්ධතිය ද මේ සඳහා බලපා ඇත.

රැකියා පහසුකම් බහුල වන අතර ඉහළ වැටුප් හා රැකියා සුරක්ෂිත බව ද උපරිම තලයක ඇත.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය**

- ඉදිරිපත් කිරීමේ ක්‍රමය
- සාකච්ඡා ක්‍රමය
- ප්‍රශ්නාවලි ක්‍රමය
- ප්‍රදර්ශන ක්‍රමය
- කණ්ඩාම් ක්‍රමය

**ආකල්ප හා ඇගයුම්**

1. ග්‍රාමීය සරල සමාජයෙහි මෙන්ම නාගරීක සංකීර්ණ සමාජයෙහි ද යහ ගුණාංග ඇගයීමට ලක් කරයි.

**ගුණාත්මක යෙදවුම්**

- වීඩියෝ දර්ශන
- කාර්ය පත්‍රිකා

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්**

- සරල සමජය හා එහි අර්ථ ක්‍රමය පිළිබඳව ශිෂ්‍යයා සමග සාකච්ඡා කරන්න.
- සරල සමාජය හඳුනා ගත හැකි විශේෂ ලක්ෂණ සාකච්ඡා කරන්න.
- පහත සඳහන් කරුණු සම්බන්ධව සිසුන්ගෙන් අදහස් ලබාගෙන සාකච්ඡා කරන්න.
    - සරල හා නාගරීක සමාජවල දක්නට ලැබෙන වෙනස්කම්
    - සරල සමාජය නාගරීක සමාජයට වඩා සරල ඇයි?

**ක්‍රියාකාරි සැලැස්ම**

| ක්‍රියාකාරකම | ක්‍රමවේදය |
|---|---|
| සරල කෘෂිකර්මාන්ත දක්වෙන වීඩියෝ දර්ශනයක් නැරඹීමට අවස්ථාව ලබා දීම | ප්‍රදර්ශන ක්‍රමය |
| නාගරික කාර්මික සමාජය දක්වෙන වීඩියෝ දර්ශනයක් නැරඹීමට අවස්ථාව ලබා දීම | ප්‍රදර්ශන ක්‍රමය |
| මෙම වීඩියෝ දර්ශන දෙකෙහි වෙනස්කම් සිසුන් සමග සාකච්ඡා කිරීම | සාකච්ඡා ක්‍රමය |
| සිසුන් කණ්ඩායම් කර ඇමුණුම් අංක 01 කාර්ය පත්‍රිකා ලබා දෙන්න | කණ්ඩායම් ක්‍රමය |
| වාර්තා පංතියට ඉදිරිපත් කර ඇගයුම් හා ප්‍රතිපෝෂණය ලබා දෙන්න | ඉදිරිපත් කිරීමේ ක්‍රමය |

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක**

- "සරල සමාජය" නිර්වචනය කිරීම.
- "නාගරික සමාජය" නිර්වචනය කිරීම.
- සරල හා නාගරික සමාජයෙහි වෙනස්කම් පහක් බැගින් ඉදිරිපත් කිරීම.

ඇමුණුම 01

**කාර්ය පත්‍රිකාව 02**

පහත කණ්ඩායම්වලට දී ඇති සමාජ වර්ග දෙකට අදාල සමාජ වෙනස්කම් ලැයිස්තු ගත කර පංතියට ඉදිරිපත් කරන්න.

A - කණ්ඩායම :- සරල සමාජය

B - කණ්ඩායම :- නාගරික සමාජය

**නිපුණතාව** - සාමාජිකයා හැඩ ගැස්වීමේහිලා සමාජය ඉවහල් වන ආකාරය අධ්‍යයනය කරයි.

**නිපුණතා මට්ටම** - 4.3 ශ්‍රී ලංකේය සමාජයේ විවිධත්වයට පදනම් වන කරුණු අධ්‍යයනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව - 02**

**ඉගෙනුම් පල**

1. එකම සමාජයක් තුළ විවිධ ස්තර ඇති බව පෙන්වා දෙයි.
2. ශ්‍රී ලාංකීක සමාජය තුළ දක්නට ලැබෙන විවිධ සමාජ ස්තර හඳුනා ගෙන විස්තර කරයි.
3. ශ්‍රී ලාංකීක සමාජයේ විවිධත්වය තම අත්දැකීම් ඇසුරෙන් ප්‍රකාශ කරයි.
4. විවිධත්වය සමාජයක සාමාන්‍ය ස්වභාවයක් බව වටහා ගනිමින් ඊට ගරු කරමින් කටයුතු කරයි.

**හැඳින්වීම** -

සමාජ විවිධත්වය කෙරෙහි ජන වාර්ගිකත්වය, භාෂාව සහ ආගම ප්‍රධාන වශයෙන් හේතු වන බව පැහැදිලි වේ. ද්‍රවිඩ ජන වර්ගය උදාහරණයක් වශයෙන් ගෙන බැලීමේ දී කෘෂිකර්මාන්තයේ දී ශ්‍රම දයකත්වය සපයා දෙන හා ශිව දෙවියන්ගේ වාහනය වන ගවයාට වැඳුම් පිදුම් කරන අතර දේව පිළිම වන්දනාව ඔවුන් අතර දක්නට ලැබෙන සුවිශේෂ ලක්ෂණයකි. ඉන්දියානු උප මහාද්වීපය කේන්ද්‍ර කොට ගෙන නිර්මාණය වන හින්දු දහම ආසියාවේ විවිධ රටවල මෙන්ම ශ්‍රී ලංකාවේ ද ප්‍රචලිතව ඇත. හින්දු දහමට ආවේණික සුවිශේෂ විශ්වාස ඇදහිලි, පුද පිළිවෙත්, සිරිත් විරිත්, ස්තෝත්‍ර, කෝවිල් පූජකයන් ආදිය දැකිය හැකි වේ. විවිධ ජනවර්ග වලින් සමන්විත ඉන්දීය සමාජයට පොදුවේ මෙම ආගම මගින් කරන ලද බලපෑම ඉතා විශාල ය. මේ අතුරින් ශ්‍රී ලංකාවට සංක්‍රමණය වූ ප්‍රධාන ජන වර්ගය වන්නේ ද්‍රවිඩයෝ ය. මෙරට වෙසෙන ද්‍රවිඩ ජනයාගේ ජීවන ක්‍රමය කෙරෙන් ප්‍රකට වන්නේ මූලික වශයෙන් හින්දු දහමේ එන ඉගැන්වීම් ය. එහෙයින් අනෙකුත් ජනවර්ගවලට වඩා මෙරට වෙසෙන හින්දු ද්‍රවිඩ ජනයා වෙනස් වන බව පෙනීයයි.

ඉස්ලාම් ධර්මය අදහන මුස්ලිම්වරු තවත් සුවිශේෂ ජන වර්ගයක් වන්නේ ය. ඉස්ලාම් ධර්මය අන්තර්ගත වන්නේ ශුද්ධ වූ අල් - කුර් - ආන් හි ය. ඉස්ලාමික ජනයාගේ සමස්ත ජීවන ක්‍රමය තීරණය වී ඇත්තේ කුරානයේ නිර්දේශයනට අනුව යි. දිනකට පස් වරක් දෙවියන් නමදින ඉස්ලාමිකයා සිකුරාදා දින මධ්‍යාහ්න නැමදීම සඳහා පමණක් පල්ලිය වෙත යා යුතු වේ. එහෙත් එදිනට ද කාන්තාව පල්ලියට පැමිණීමෙන් වැළකී සිටිය යුතු ය. මෙරට මුස්ලිම්වරු වෙළෙඳාම, ගොවිතැන, ධීවර කර්මාන්තය වැනි ජීවිකා වෘත්තිවල නිරත වේ. විවාහ, දික්කාසාද වැනි කටයුතුවල දී මොවුන් අනුගමනය කරන්නේ ශරියා නම් කුරානයෙන් නිර්දේශ කරන ලද සුවිශේෂ නීතිය යි. මේ අනුව මුස්ලිම්වරු ද මෙරට වෙසෙන තවත් සුවිශේෂ ජන වර්ගයක් ලෙස හඳුන්වා දිය හැකි ය.

බෞද්ධ ජන සමාජය තුළ ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ දක්නට ලැබේ. පොහොය දිනවල විශේෂ වැඩ පිළිවෙලකට අනුගත වන බෞද්ධයා දන් දීම, පෙහෙවස් සමාදන් වීම, ධර්මය ශ්‍රවණය කිරීම, වැඳුම්-පිදුම් කිරීම ආදියෙහි නිරත වේ. ගිහි හා පැවිදි යනුවෙන් බෞද්ධ සමාජය මූලික වශයෙන් කොටස් දෙකකට බෙදේ. පැවිදි සමාජය වෙහෙර විහාරස්ථානවලට සීමා වී සුවිශේෂ ආගමික ජීවිතයක් ගත කරනු ලැබේ. ගිහියා පංචශීල ප්‍රතිපත්තියට අනුව

ධර්මානුකූල ජීවිතයක් ගත කරයි. ගිහි ජීවිතයේ හැඩය තීරණය කිරීමෙහිලා බෞද්ධ ඉගැන්වීමෙන් ලැබෙන අනුබලය ඉතා විශාල ය. එහෙයින් සිංහල සංස්කෘතිය සිංහල බෞද්ධ සංස්කෘතිය යනුවෙන් නම් කරනු ලබයි. මෙම තත්ත්වය හමුවේ සිංහල බෞද්ධයා ද තවත් සුවිශේෂ ජන වර්ගයක් නියෝජනය කරන බව පැහැදිලි වේ.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය**

- ප්‍රදර්ශන ක්‍රමය
- සාකච්ඡා ක්‍රමය
- ඉදිරිපත් කිරීමේ ක්‍රමය
- කණ්ඩායම් ක්‍රමය

**ආකල්ප හා ඇගයුම්**

1. සමාජයේ විවිධ ස්තරවලට අයත් ජන කණ්ඩායම් ඇති බව අවබෝධ කර ගනී.
2. භාෂාව, ආගම හා ජන වර්ගය අනුව සමාජ විවිධත්වය ඇති වන බව අවබෝධ කර ගනියි.
3. විවිධත්වයට ගරු කිරීමෙන් සාමය, සහජීවනය සුරකෙන බව අවබෝධ කර ගනියි.

**ගුණාත්මක යෙදවුම්**

- වීඩියෝ දර්ශන
- කාර්ය පත්‍රිකා

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්**

- සමාජයේ ඇති ස්තර කිහිපයක් පෙන්වා දෙන්න.
- බෞද්ධ සමාජ ස්තරය පිළිබඳව සාකච්ඡා කරන්න.
- සාකච්ඡා කරන ලද බෞද්ධ සමාජ ස්තරය හා අනෙකුත් ස්තර අතර ඇති වෙනස්කම් ශ්‍රී ලාංකීක සමාජයෙන් ගත් උදාහරණ ඇසුරින් පැහැදිලි කරන්න.

**ක්‍රියාකාරි සැලැස්ම**

| ක්‍රියාකාරකම | ක්‍රමවේදය |
|---|---|
| ශ්‍රී ලාංකේය සමාජයේ සමාජ විවිධත්වය දක්වෙන වීඩියෝ දර්ශණයක් නැරඹීමට සලස්වන්න. | ප්‍රදර්ශන ක්‍රමය |
| ශ්‍රී ලාංකේය සමාජයේ සමාජ විවිධත්වය පිළිබඳ සාකච්ඡා කරන්න. සාකච්ඡා කරන ලද කරුණු වෙන වෙනම වර්ගීකරණය කර දක්වන්න. | සාකච්ඡා ක්‍රමය |
| ශ්‍රී ලාංකේය සමාජයේ ද සමාජ විවිධත්වයක් ඇති බව පැහැදිලි කර දෙන්න. | සාකච්ඡා ක්‍රමය |
| ශ්‍රී ලාංකේය සමාජයේ විවිධත්වය තම අත්දැකීම් ඇසුරෙන් විස්තර කර දෙන්න. | සාකච්ඡා ක්‍රමය |
| සිසුන් කණ්ඩායම් කර ඇමුණුම් අංක 01 කාර්ය පත්‍රිකාව ලබා දෙන්න. | කණ්ඩායම් ක්‍රමය |
| වාර්තා පංතියට ඉදිරිපත්කර ඇගයුම් හා ප්‍රතිපෝෂණය ලබා දෙන්න. | ඉදිරිපත් කිරීමේ ක්‍රමය |

**ඇගයීම හා තක්සේරුකරණය**

- ශ්‍රී ලාංකේය සමාජයේ විවිධත්වයට පදනම් වන කරුනු මොනවා දැයි විස්තර කිරීම.
- ශ්‍රී ලාංකික සමාජය නියෝජනය කරන ජන වර්ග 05ක් හා ආගම් 05ක් නම් කිරීම.
- ශ්‍රී ලංකාවේ ජන වාර්ගික සාමය හා සමගිය සඳහා ගත හැකි ක්‍රියාමාර්ග 5ක් ඉදිරිපත් කිරීම.

ඇමුණුම 01

**කාර්ය පත්‍රිකාව 03**

පහත කණ්ඩායම් දෙක ශ්‍රී ලාංකික සමාජය ඇසුරෙන් සමාජ විවිධත්වය පැහැදිලි කිරීම.

A - කණ්ඩායම :- ජන වර්ග

B - කණ්ඩායම :- ආගම්

**නිපුණතාව** - සාමාජිකයා හැඩ ගැස්වීමෙහිලා සමාජය ඉවහල් වන ආකාරය අධ්‍යයනය කරයි.

**නිපුණතා මට්ටම** - 4.4 බෞද්ධ ඉගැන්වීම්වලට අනුව සමාජ විවිධත්වය විවරණය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව - 04**

**ඉගෙනුම් පල**

1. බෞද්ධ ඉගැන්වීම්වලට අනුව සමාජ විවිධත්වයේ ස්වභාවය විස්තර කරයි.
2. කුමන ජීවන රටාවකට අයත් වුව ද බෞද්ධ ඉගැන්වීමට අනුව සමානාත්මතාව හිමිවන බව පෙන්වා දෙයි.
3. සමාජ ජීවිතය පහසු කරවන බුදුදහමේ ඉගැන්වීම් පැහැදිලි කරයි.

**හැඳින්වීම** -

ඉන්දියානු සමාජ විවිධත්වය විශ්ලේෂණය කරමින් සමාජ තලය අනුව නොව හුදු චර්යා රටාව අනුව මිනිසා එකිනෙකාගෙන් වෙනස් වන බව බුදුන්වහන්සේ විසින් පෙන්වා දෙන ලදහ.

කුල භේදය මත ගොඩනගා ගත් සමාජ විවිධත්වය රජයමින් පැවති යුගයක බෞද්ධ දර්ශනය මගින් යථාවාදී සමාජයක පැවතිය යුතු සැබෑ ස්වභාවය පිළිබඳ පැහැදිලි විවරණයක් ඉදිරිපත් කරනු ලැබීය.

සුනීත, සෝපාක යනු සැඩොල් කුලයේ ඉපදී ඉමහත් වධ බන්ධනයට ලක් වූ පීඩිතයන් දෙදෙනෙකි. ඔවුන් දෙදෙනාම සමාජයෙන් කොන් කොට අධ්‍යාපනික නිදහස, ජීවත්වීමේ නිදහස අහිමි වීමෙන් සමාජ අසාධාරණයට ලක් වූවන් විය. කුල සමාජයෙහි පහළම මට්ටම නියෝජනය කළ මොවුන් දෙදෙනාට බෞද්ධ ධර්මයෙහි උගන්වන අග්‍ර ඵලය වූ නිර්වාණය දක්වා ගමන් කිරීමට බුදුන් වහන්සේ මඟ පෙන්වූ සේක.

කොසොල් රජු මගධ රට අධිරාජයා ලෙස රාජ්‍යත්වය ඉසිලීම බුදුන් සරණ යාමට බාධාවක් නොවීය. සමාජයේ ඉහළම තලය නියෝජනය කළ පාලකයාට ද බුදුදහම වැළඳ ගැනීමට ඉඩ සලසන ලදී.

අනේපිඩු සිටුතුමා මහා ධනපතියෙකි. මොහු ජේතවනාරාමය වැනි විහාරාම බුදුසසුනට පූජා කළේ ය. බුදුන් වහන්සේ මැදිහත් සිතින් එවැනි ධනපතියන්ට ද බෞද්ධ ධර්මය වැළඳ ගැනීමටත්, කුසල් වඩා ගැනීමටත් මං පෙත් විවර කළ සේක.

එද භාරතීය සමාජය තුළ නගර ශෝභනියන් ලෙස දිවි ගෙවූ අම්බපාලි, සිරිමා වැනි අයට ද බුදුදහමින් නිවි සැනසෙන්නට මග විවර විය. මේ ආකාරයට සමාජ තත්ත්වය නොසලකා හැර වඩාත් මැදහත්ව සෑම තලයකම ජීවත්වන මිනිසුන්ට නිර්වාණය ලබා ගැනීමට මඟ පෙන්වීම බුදුදහමේ මූලික ඉලක්කය විය.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය**

- සාකච්ඡා ක්‍රමය
- ප්‍රදර්ශන ක්‍රමය
- ඉදිරිපත් කිරීමේ ක්‍රමය
- කණ්ඩායම් ක්‍රමය

**ආකල්ප හා ඇගයුම්**


1. යම් සමාජයක විවිධ තල නියෝජනය කරන ජන කොටස් ජීවත් වන බව හඳුනා ගනියි.
2. ස්ත්‍රී පුරුෂ භාවය, කුලය, රැකියාව ආදී තත්ත්ව විවිධත්වයට අනුව කාර්ය කොටස වෙනස් වන බව පෙන්වා දෙයි. කුමන ප්‍රභේදය වුව ද බෞද්ධ ඉගැන්වීම හමුවේ එක හා සමාන බව අවබෝධ කර ගනියි.

**ගුණාත්මක යෙදවුම්**

- බෞද්ධ කතා පුවත් දැක්වෙන වීඩියෝ දර්ශන
- කාර්ය පත්‍රිකා

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්**

- ජාතක කතා ඇසුරින් විවිධ සමාජ ස්තරවල ජීවත් වූ පුද්ගල චරිත කිහිපයක් පෙන්වා දෙන්න.
- ඉහත පුද්ගල චරිත සඳහා බුදුන් වහන්සේ නිර්වාණයට මඟ පෙන්වූ ආකාරය සාකච්ඡා කරන්න.
- බෞද්ධ විවරණය සමානාත්මතාවයෙන් පිරී ඇති බව පෙන්වා දෙන්න.
- සමාජ විවිධත්වය පිළිබඳ බුදුන් වහන්සේගේ ප්‍රධාන වර්ගීකරණය පෙන්වා දෙන්න.




- තත්ත්වය වෙනස් වන ආකාරයට අනුව කාර්යභාරය වෙනස් වෙන ආකාරය පැහැදිලි කරන්න.

**ක්‍රියාකාරකම් සැලැස්ම**

| ක්‍රියාකාරකම | ක්‍රමවේදය |
|---|---|
| සුනීත, සෝපාක, සිරිමා, අනේපිඬු සිටුතුමා වැනි පුද්ගල චරිත පිළිබඳව කථාවක් ඉදිරිපත් කරන්න. | ප්‍රදර්ශන ක්‍රමය<br>ඉදිරිපත් කිරීමේ ක්‍රමය |
| විවිධ සමාජ පසුබිම් හමුවේ බුදුන් වහන්සේ මැදිහත්ව කටයුතු කළ ආකාරය ශිෂ්‍යයාට හඳුන්වා දෙන්න. | ප්‍රදර්ශන ක්‍රමය |
| ඊට අදාල පුරාණ චිත්‍ර මගින් ශිෂ්‍යයාට සමාජ තත්ත්වයන් හඳුනා ගැනීමට ඉඩ ලබා දෙන්න. | ප්‍රදර්ශන ක්‍රමය<br>සාකච්ඡා ක්‍රමය |
| බෞද්ධ ඉගැන්වීම්වලට අනුව සමාජ විවිධත්වයේ ස්වභාවය වටහා දීමට කටයුතු කරන්න. | සාකච්ඡා ක්‍රමය |
| සිසුන් කණ්ඩායම් කර ඇමුණුම් අංක 04 කාර්ය පත්‍රිකාව ලබා දෙන්න. | කණ්ඩායම් ක්‍රමය |
| වාර්තා පංතියට ඉදිරිපත් කර ඇගයුම හා ප්‍රතිපෝෂණය ලබා දෙන්න. | ඉදිරිපත් කිරීමේ ක්‍රමය |

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක**

- බෞද්ධ සමාජයේ විවිධ ස්තර තුළ ජීවත් වූ මිනිසුන් තිදෙනෙකුට බෞද්ධ දර්ශනය මගින් උද කළ යහපත විස්තර කිරීම.
- සැම සමාජ ස්තරයකම වැසියනට බුදුන් වහන්සේ සමානාත්මතාවයෙන් සලකන ලද බව උදාහරණ ඇසුරින් පැහැදිලි කිරීම.
- යහපත් සමාජ ජීවිතයක් උදෙසා උපයෝගී කරගත හැකි බෞද්ධ ඉගැන්වීම් 05ක් සඳහන් කිරීම.

ඇමුණුම 01

**කාර්ය පත්‍රිකාව 04**

පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - කණ්ඩායම

1. සිව්වනක් පිරිස නම් කරන්න.
2. බෞද්ධ ඉගැන්වීම්වලට අනුව සමාජ විවිධත්වයේ ස්වභාවය උදාහරණ 2ක් ඇසුරෙන් පැහැදිලි කරන්න.

**කාර්ය පත්‍රිකාව 04**

B - කණ්ඩායම

1. වර්ණ ධර්ම මොනවා ද?
2. බෞද්ධ සමාජයේ ප්‍රධාන බෙදීම් දෙක නම් කර ඒ පිළිබඳ පැහැදිලි කරන්න.

# 05. සමාජ පාලනය

**නිපුණතාව 05 -** සමාජ පාලනය යන්න අවබෝධ කර ගනියි.

**නිපුණතා මට්ටම -** 1 සමාජ පාලනයෙහි අවශ්‍යතාව ග්‍රාමීය හා නාගරික සමාජ ඇසුරින් අධ්‍යයනය කරයි.

2 සමාජ පාලන කාර්යයට ආගම මගින් කරන බලපෑම ලාංකේය සමාජය ආශ්‍රයෙන් විමර්ශනය කරයි.

3 අධ්‍යාපනයේ බලපෑමෙන් වන සමාජ පාලනය වටහා ගනිමින් අදහස් දක්වයි.

4 සමාජ පාලනය කෙරෙහි බුදුදහමේ ආභාෂයත්, භික්ෂු දයකත්වයක් ඉවහල් වී ඇති ආකාරය පැහැදිලි කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව - 08**

**හැඳින්වීම -**

පොදු අරමුණක් මත අන්තර් සම්බන්ධතා මාර්ගයෙන් එකට බැඳුනු ඒකකය සමාජය ලෙස හඳුන්වන අතර එම සමාජය යහපත් මෙන්ම අයහපත් හෙවත් විවිධාකාර ගති ස්වභාවයන්ගෙන් යුත් පුද්ගලයන්ගේ එකතුවකි. යහපත් චිත්තාවේග සහිත පුද්ගල එකතුවක් සාමය සහ සහජීවනය ගොඩ නගා ගැනීමට හේතු වේ. අයහපත් චිත්තාවේග මගින් යහපැවැත්ම දෙදරවා හරිනු ලබයි. එබැවින් සමාජ පාලනය යනු අත්‍යවශ්‍ය අංගයකි. මානවයාගේ ආරම්භයේ සිටම සමාජ පාලනය පිළිබඳ තොරතුරු ත්‍රිපිටක ග්‍රන්ථ ඇසුරින් අනාවරණය කර ගත හැකි ය. දීඝ නිකායේ අග්ගඤ්ඤ සූත්‍රයෙහි සමාජ පාලනය පිළිබඳ වඩාත් පුළුල් හා ගැඹුරු විවරණයක් ඇතුළත් වේ.

**නිපුණතාව** - සමාජ පාලනය යන්න අවබෝධ කර ගනියි.

**නිපුණතා මට්ටම** - 5.1 සමාජ පාලනයෙහි අවශ්‍යතාව ග්‍රාමීය හා නාගරික සමාජ ඇසුරින් අධ්‍යයනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව - 02**

**ඉගෙනුම් පල**

1. "ගම" යන්න හඳුන්වා දෙමින් ශ්‍රී ලාංකේය ග්‍රාමීය සමාජය පිළිබඳව තොරතුරු ඉදිරිපත් කරයි.
2. ග්‍රාමීය සමාජයෙහි සමාජ පාලනය සිදුවන ආකාරය උදාහරණ මගින් පැහැදිලි කරයි.
3. "නගර" යන්න හඳුන්වා දෙමින් නාගරික සමාජයෙහි ලක්ෂණ පෙන්වා දෙයි.
4. නාගරීකරණය කෙරෙහි බලපාන සාධක අධ්‍යයනය කරයි.

**හැඳින්වීම** -

ගමක් යනු මූලික වශයෙන් කෘෂිකාර්මික ජීවන රටාවකට අනුගත මිනිස් එකතුවකි. නිෂ්පාදන සම්බන්ධතා හෝ වෙනත් සමාජීය බැඳීම් මත පදනම්ව ගොඩනගා ගත් අන්‍යෝන්‍ය සහජීවනයෙන් කටයුතු කරන ජන සමූහයක් ජීවත් වන ජනාවාසයක් ගමක් ලෙස හැඳින්විය හැකි ය. අතීතයේ සිට ගමක පාලනය සිදු වූයේ රජු විසින් පත් කරන ලද නිලතල මාර්ගයෙනි. භූමිය ආර්ථික ක්‍රියාදමයේ පදනම ලෙස සලකමින් වැවත් දාගැබත් කේන්ද්‍ර කරගත් අතීත ශ්‍රී ලාංකේය ගැමි සමාජයේ පැවති සමාජ පාලනය විධිමත් සහ අවිධිමත් දෙයාකාරයෙන් සිදු වූ අයුරු පැහැදිලි වේ.

කාර්මික විප්ලවයත් සමග බිහි වූ නාගරික සමාජය ඊට ආවේණික වූ ගති ලක්ෂණයන්ගෙන් සමන්විත විය. එහි දී ඇතිවෙන වේගවත් පරිවර්තන හමුවේ සමාජ විසංවිධානය මගහරවා පැවැත්ම පවත්වා ගෙන යාම සඳහා සමාජ පාලනයේ අවශ්‍යතාව අතිශයින්ම තව දුරටත් තීරණාත්මක විය.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය**

- ඉදිරිපත් කිරීම්
- සාකච්ඡා ක්‍රමය
- කණ්ඩායම් ක්‍රමය

**ආකල්ප හා ඇගයුම්**

1. ග්‍රාමීය මෙන්ම නාගරික සමාජයේ සමාජ පාලන උපක්‍රම ක්‍රියාත්මක වන බව සහ එහි අදාලත්වය අගයයි.

**ගුණාත්මක යෙදවුම්**

- ලියන කඩදාසි
- අදාළ පින්තූර

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්**

- මානවයාගේ ආරම්භයේ සිට සමාජ පාලනය ආශ්‍රිත තොරතුරු කෙරෙහි අවධානය යොමු කරවන්න.
- "ගම" පිළිබඳ ඓතිහාසික තොරතුරු, ශ්‍රී ලාංකේය ග්‍රාමීය සමාජය ආශ්‍රිත තොරතුරු හා ග්‍රාමීය සමාජය තුළ සමාජ පාලනය සිදුවන ආකාරය උදහරණ සහිතව පැහැදිලි කරන්න.
- නගරය හඳුන්වා දෙමින් නාගරික සමාජයෙහි ලක්ෂණ, නාගරීකරණය කෙරෙහි බලපාන සාධක සාකච්ඡා කරන්න.

**ක්‍රියාකාරකම් සැලැස්ම**

| ක්‍රියාකාරකම | ක්‍රමවේදය |
|---|---|
| පිවිසීම - ග්‍රාමීය හා නාගරික සමාජය නිරූපණය කෙරෙන පින්තූර හෝ සමාජ අවස්ථාවක් පන්තියට ඉදිරිපත් කරන්න. | ඉදිරිපත් කිරීම |
| එහි සඳහන් ලක්ෂණ සිසුන් හා සාකච්ඡා කරන්න. | සාකච්ඡා ක්‍රමය |
| නාගරික සහ ග්‍රාමීය වශයෙන් පන්තිය කණ්ඩායම් දෙකකට බෙදා පෙළ පොත ඇසුරින් ග්‍රාමීය හා නාගරික සමාජය පිළිබඳව ප්‍රශ්න සහ පිළිතුරු සැපයීමට උපදෙස් දෙන්න. | කණ්ඩායම් ක්‍රමය |
| ප්‍රශ්න වාචිකව මෙන්ම ලිඛිතව ඉදිරිපත් කරමින් පිළිතුරු සාකච්ඡා කරන්න. | සාකච්ඡා ක්‍රමය |

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක**

කණ්ඩායම් දෙකේ ප්‍රශ්න සහ පිළිතුරු ඇසුරින් පහත සඳහන් කරුණු සාකච්ඡා කිරීම.

- ග්‍රාමීය සහ නාගරික සමාජ බිහි වූ ආකාරය හා වර්ධනය වූ ආකාරය කෙටියෙන් පැහැදිලි කිරීම.
- ශ්‍රී ලාංකේය ග්‍රාමීය හා නාගරික සමාජවල ලක්ෂණ 05 බැගින් ඉදිරිපත් කිරීම
- එකී සමාජ තුළ ක්‍රියාත්මක වන සමාජ පාලන උපක්‍රම තම අත්දැකීම් ඇසුරින් ඉදිරිපත් කිරීම.

**නිපුණතාව** - සමාජ පාලනය යන්න අවබෝධ කර ගනියි.

**නිපුණතා මට්ටම** - 5.2 සමාජ පාලනයට ආගම මගින් කරන බලපෑම ලාංකේය සමාජය ඇසුරින් විමර්ශනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව - 02**

**ඉගෙනුම් පල**

1. ශ්‍රී ලාංකේය සමාජයෙහි වෙසෙන විවිධ ජනවර්ග සහ ඔවුන්ගේ ආගම් පිළිබඳව දැනුවත්භාවය ප්‍රදර්ශනය කරයි.
2. මෙම විවිධ ආගම් සමාජ පාලනයට කරන බලපෑම ලාංකේය සමාජය ඇසුරින් පෙන්වා දෙයි.

**හැඳින්වීම** -

බහු වාර්ගික ජන කොටස් වලින් යුත් ශ්‍රී ලාංකේය සමාජය බහු ආගමික සහ බහු සංස්කෘතික ලක්ෂණ වලින් සමන්විත ය. සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර්, මැලේ ආදී ජන වර්ගයන් පිළිවෙළින් බෞද්ධ, හිංදු, ඉස්ලාම්, ක්‍රිස්තියානි ආදි ආගම් අදහනු ලැබේ. මෙම ආගම් මගින් සමාජ පාලනයට කරනු ලබන බලපෑම ශ්‍රී ලාංකේය සමාජය ඇසුරින් අධ්‍යයනය කිරීමට මෙහි දී අවධානය යොමු කරනු ලැබේ.

බෞද්ධාගම මගින් කරනු ලබන සමාජ පාලනය දෙස බැලීමේ දී පෙනී යන්නේ බෞද්ධ ඉගැන්වීම් ඒ සඳහා සුවිශාල දයකත්වයක් සපයන ආකාරය යි. මහින්දගමනයත් සමග ශ්‍රී ලාංකේය සමාජය තුළ ඇති වන බෞද්ධාගමික ප්‍රබෝධය සාමකාමී සහජීවනය සහිත සමාජයක් බිහිවීමට ඇවැසි දයකත්වය සැපයීය. පංචශීලය මත පදනම් වූ ධාර්මික සමාජයකට එමගින් අඩිතාලම දමන ලදී. බුදුරජාණන් වහන්සේ අනුදැන වදළ ලිච්ඡවී රජදරුවන් අනුගමනය කළ සප්ත අපරිහානිය ධර්ම එකල මෙරට රජවරුන් පවා රට පාලනය කිරීමේ දි අනුගමනය කිරීමට පෙළඹීන. බුදුදහමින් දේශිත අලේපේච්ච බව, ලද දෙයින් සතුටු වීම, සැහැල්ලු පැවතුම් ඇති බව, පෝෂණය පහසු බව යන ධර්ම කරුණු ස්වයං විනයක් ගොඩ නගා ගැනීමට අවැසි පදනම සකස් කරන ලදි.

ශ්‍රී ලාංකිය දෙමළ ජනතාව තම පාරම්පරික සංස්කෘතියේ සංකේතය ලෙස සලකන්නේ හින්දු කෝවිලයි. බ්‍රහ්ම, විෂ්ණු, ශිව යන දෙවිවරුන් කෙරෙහි දැඩි ආගමික භක්තියකින් යුතු වූ ද්‍රවිඩ ජනතාවට සාමකාමී අයුරින් ජීවත් වීමට හින්දු දහමෙන් ලැබෙනුයේ ඉතා අගනා මග පෙන්වීමකි. බ්‍රහ්ම ලෝකය හා සත්ත්වයා මවයි. කුල විසමතාව එකිනෙකාගේ පව් පිං ප්‍රකාරව බ්‍රහ්මගේ කැමැත්ත පරිදි තිරණය කරනු ලැබූවකි. එහෙයින් එයට අභියෝග කළ නොහැක. දැහැමි ජනයාගෙන් සැදි හින්දු සමාජය සුරක්ෂිතව රැක බලා ගනු ලබන්නේ විෂ්ණු ය. යම් දිනෙක සමාජය අධර්මානුකූල වූවහොත් එදිනට ශිව විසින් සිය තෙවන ඇසින් බලා සමස්ත ලෝකයම දවා අලු කරනු ලැබේ. මෙම ඉරණමට යාමට මහත් බියක් දක්වන හින්දු භක්තිකයා මනා පාලනයකින් යුත් දැහැමි ජීවිතයක් ගත කරයි.

නබිනායකතුමා, අල්ලා දෙවියන් ආගමික නායකත්වයෙහි ලා සලකමින් කටයුතු කරන මුස්ලිම් ජනතාව ඉස්ලාම් ආගමික සිරිත් විරිත්, වත් පිළිවෙත් අනුගමනය කරමින් ඔවුන්ගේ ආගමික නීති ග්‍රන්ථ වල සඳහන් ආකාරයට ජීවන පදනම සංවිධානය කර ගෙන ඇත. ඉස්ලාම් පල්ලිය ඔවුන්ගේ ප්‍රධාන ආගමික ආයතනය වන අතර එය සමාජ අනුකලනයට මුල්වන මූල ස්ථානය ලෙසින් සමාජ පාලනයේ ලා විශාල කාරයභාරයක් ඉටු කරයි.

ශ්‍රී ලාංකේය කතෝලික බැතිමතුන් ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ දේශනා කරන ලද ධර්ම කරුණු අනුගමනය කරමින් සාමය, සමාදනය පෙරදැරිකරගත් දිවිපෙතෙක් ගත කරනු ලබයි. දේශපාලනික, ආර්ථික, සංස්කෘතික, අධ්‍යාපනික සහ සමාජීය වශයෙන් මූලික මිනිස් අයිතිවාසිකම් අහිමි වූ සහෝදර ජනතාවගේ ජීවිත නගා සිටුවීමට සෑම කිතුනුවෙකුම වගකීමෙන් බැඳී සිටියි. ඇති-නැති, ඉහළ-පහළ සෑම කිතුනුවෙකුම සහෝදරත්වයෙන් එකට ජීවත් විය යුතු ය. එසේ වුවහොත් පමණක් දේව කරුණාව ලබන්නට කෙනෙකු සුදුස්සෙක් වන්නේ ය. ඒ අනුව සෑම කෙනෙකුම අන්‍යෝන්‍ය කරුණාවෙන් ජීවත් වන හෙයින් කිතුනු සමාජය නිතැතින්ම පාලනය වෙයි.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය**

- කේවල ඉදිරිපත් කිරීම්
- කණ්ඩායම් ඉදිරිපත් කිරීම්

**ආකල්ප හා ඇගයුම්**

1. සෑම ආගමක් මගින් ම යහපත් සමාජයක් ගොඩ නගා ගැනීමෙහිලා උපකාරී වන ධර්ම කරුණු උගන්වන බව ප්‍රකාශ කරයි.
2. සෑම සාමාජිකයෙකු විසින්ම ආගමෙ හි සඳහන් ධර්ම කරුණු නිවැරදිව, නිරවුල් ව වටහා ගනිමින් ආගමානුකූල ලෙස කටයුතු කළ යුතු බව දක්වයි.

**ගුණාත්මක යෙදවුම්**

- පාඩමට අදාළ පින්තූර, විස්තර ඇතුළත් පොත් පත්

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්**

- ශ්‍රී ලාංකේය සමාජය බහු සංස්කෘතික, බහු ආගමික සමාජයක් වන ආකාරය පැහැදිලි කරන්න.
- එක් එක් ආගම්වළ සංකේත, ප්‍රකට ධර්ම කරුණු සිසුන් දන්නා පරිදි ප්‍රකාශ කරන්නට අවස්ථාව දී ඒවා සාකච්ඡා කරන්න.
- එම ආගමික වටිනාකම් සමාජ පාලනයට දයක වන ආකාරය සාකච්ඡා කරන්න.

**ක්‍රියාකාරී සැලැස්ම**

| ක්‍රියාකාරකම | ක්‍රමවේදය |
|---|---|
| ආගමික ග්‍රන්ථ ඉදිරිපත් කරමින් පාඩමට පිවිසෙන්න. (ත්‍රිපිටකය හෝ ධම්ම පදය, බයිබලය, භගවත් ගීතාව, කුරාණය යන ආගමික ග්‍රන්ථ හෝ එම ධර්ම කරනු ඇතුළත් පොත්) | ඉදිරිපත් කිරීම |
| මෙම ආගම්වල ඉගැන්වෙන ධර්ම කරුණු මෙම වැදගත් ග්‍රන්ථවල සඳහන් වන ආකාරය සිසුන් හා සාකච්ඡා කරන්න. | සාකච්ඡා ක්‍රමය |
| පන්තිය කණ්ඩායම් කර බෞද්ධ, හින්දු, කතෝලික, ඉස්ලාම් යන ආගම් හි සංකේත, විශ්වාස, වත් පිළි වෙත් සමාජ පාලනයට ඉවහල් වන අයුරු පිළිබඳ ඉදිරිපත් කිරීමටකට අවස්ථාව දෙන්න. | කණ්ඩායම් ක්‍රමය |

**ඇගයීම හා තක්සේරුකරණය**

- විවිධ ආගම් වලට අදාළ ආගමික ග්‍රන්ථ එක බැගින් නම් කිරීම.
- එක් එක් ආගමට අයත් වැදගත් උත්සව දින 02 බැගින් ලිවීම.
- එක් එක් ආගමෙහි සඳහන් වන යහපත් පෞරුෂ වර්ධනයට අදාළ කරුණු 02 බැගින් ලිවීම.
- එක් එක් ආගමේ සඳහන් සමාජ පාලනයට දායකත්වය සපයන ධර්ම කරුණු 02 බැගින් ලිවීම.

**නිපුණතාව** - සමාජ පාලනය යන්න අවබෝධ කර ගනියි

**නිපුණතා මට්ටම** - 5.3 අධ්‍යාපනය සමාජ පාලනයට දයක වන ආකාරය අවබෝධ කර ගනියි.

**කාලච්ඡේද සංඛ්‍යාව - 02**

**ඉගෙනුම් පල**

1. 'අධ්‍යාපනය' පිළිබඳ නිර්වචන ඉදිරිපත් කරයි.
2. අධ්‍යාපනය ලබා ගත හැකි විධිමත් හා අවිධිමත් ආයතන නම් කරයි.
3. අධ්‍යාපනය මගින් පුද්ගල පෞරුෂ වර්ධනය කරන ආකාරය පැහැදිලි කරයි.
4. අධ්‍යාපනය මගින් බිහි කරන යහපත් සාමාජිකයෙකු සමාජ සංවර්ධනයට දයක වන ආකාරය පිළිබඳ අදහස් දක්වයි.

**හැඳින්වීම** -

දරුවාගේ මුල්ම පාසල නිවස යි. මව ප්‍රමුඛ කොට ගත් පවුලේ සාමාජිකයන් ඇසුරේ සමාජානුයෝජනය වන දරුවා ඉන් පසු විධිමත් අධ්‍යාපනය සඳහා පාසල වෙත යොමු කරනු ලැබේ. මෙහි දී පූර්ව ළමා විය අධ්‍යාපනය මගින් මූලික විධිමත් අධ්‍යාපනයට යොමු කරන අතර එතැන් සිට අවුරුදු 13 ක් පාසල් අධ්‍යාපනය ලබමින් ඉන් අනතුරුව උසස් අධ්‍යාපනයට යොමු වේ. මෙහි දී පාසල සිසුන්හට අධ්‍යාපනය ලබා දීමේ ප්‍රධාන විධිමත් ආයතනය ලෙස ක්‍රියා කරයි. එහි දී පෞරුෂ සංවර්ධනය, සාක්ෂරතා ඥානය, භාෂා ඥානය, චින්තන ශක්තිය වර්ධනය සහ විවිධ නිපුණතා වර්ධනය උදෙසා වැදගත් කාර්ය භාරයක් ඉටු කරනු ලැබේ. සංස්කෘතිය විකාශනය කිරීම, පවත්නා විශ්වාස, ප්‍රතිමාන සහ වටිනාකම්වලට අගයක් ලබා දීම යනු පාසල මගින් ඉටු කරන තවත් කාර්යයන් ය. පිරිවෙන් අධ්‍යාපනය මගින් වන්නේ ගිහි පැවිදි සිසුන් හට මනා පෞරුෂ සංවර්ධනයක් සඳහා අවශ්‍ය මග පෙන්වීමයි.

මේ අනුව අධ්‍යාපනයෙන් ලබා ගන්නා ශික්ෂණය සමාජ පාලනය උදෙසා කරනු ලබන්නේ ධනාත්මක බලපෑමකි.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය**

- සාකච්ඡා ක්‍රමය
- කථන අවස්ථා

**ආකල්ප හා ඇගයුම්**

1. පුද්ගල පෞරුෂ වර්ධනය සඳහා අධ්‍යාපනයෙන් ඉටුවන මෙහෙවර අගය කරයි.
2. දැනුම, යහපත් ආකල්ප, මෙන්ම ශක්‍යතා වර්ධනය කර ගැනීම සඳහා ශිෂ්‍යයා නිරතුරුව කටයුතු කළ යුතු බව වටහා ගනියි.

**ගුණාත්මක යෙදවුම්**

- ලියන කඩදසි
- පෑන්

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්**

- අධ්‍යාපනය පිළිබඳව නිර්වචන එකක් හෝ දෙකක් සිසුන්ට ප්‍රදර්ශනය කරන්න.
- එහි සඳහන් කරුණු සිසුන් හා සාකච්ඡා කරන්න.
- අතීතයේ අධ්‍යාපනය ලබා ගත් අයුරුත් වර්තමානයේ අධ්‍යාපනය ලබා ගන්නා ආකාරයත් පිළිබඳ සිසුන් සමග සාකච්ඡා කරන්න
- අධ්‍යාපානය ලබා ගැනීමෙන් අත් කර ගත හැකි ප්‍රතිලාභ පිළිබඳව සිසුන්ගේ අවධානය යොමු කරවන්න.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය**

- සාකච්ඡා ක්‍රමය
- කේවල ක්‍රියාකාරකම්

**ක්‍රියාකාරි සැලැස්ම**

| ක්‍රියාකාරකම | ක්‍රමවේදය |
|---|---|
| පහත සඳහන් මාතෘකා යටතේ තනි තනිව කතා කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දීම.<br>තුන්ඩු දැමීම මගින් මාතෘකා තෝරා ගැනීමට අවස්ථාව දෙන්න.<br>මාතෘකා<br>• පවුල හා අධ්‍යාපනය<br>• පෙර පාසල් අධ්‍යාපනය<br>• පාසල් අධ්‍යාපනය<br>• පිරිවෙන් අධ්‍යාපනය<br>• පැරණි අධ්‍යාපන ආයතන | මාතෘකාව පිළිබඳ විනාඩියක් කතා කරන්න. (කථනය) |

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක**

- "අධ්‍යාපනය" පිළිබඳ නිර්වචනයක් ඉදිරිපත් කිරීම.
- "අධ්‍යාපනය" ලබා ගත හැකි විධිමත් හා අවිධිමත් ආයතන 02ක් නම් කිරීම.
- අධ්‍යාපනය මගින් පුද්ගල පෞරුෂය වර්ධනය වන ආකාරය කෙටියෙන් පැහැදිලි කිරීම

**නිපුණතාව** - සමාජ පාලනය යන්න අවබෝධ කර ගනියි.

**නිපුණතා මට්ටම** - 5.4 සමාජ පාලනය කෙරෙහි බුදුදහමේ ආභාෂයත්, භික්ෂු දයකත්වයත් ඉවහල් වී ඇති ආකාරය පැහැදිලි කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව - 02**

**ඉගෙනුම් පල**

1. භික්ෂූන් වහන්සේගෙන් ඉටුවන ආගමික මෙහෙවර පැහැදිලි කරයි.
2. අතීතයේ භික්ෂූන් වහන්සේගෙන් ඉටු වූ අධ්‍යාපනික හා සමාජීය මෙහෙවර පිළිබඳ උදහරණ ඉදිරිපත් කරයි.
3. වර්තමාන භික්ෂූන් වහන්සේගේ ආගමික, සමාජීය, අධ්‍යාපනික මෙහෙවර අගයමින් අදහස් දක්වයි.
4. සමාජ පාලනයෙහිලා භික්ෂූන් වහන්සේගෙන් ඉටු වන මෙහෙය අගයයි.

**හැඳින්වීම** -

එදා බරණැස් නුවර ඉසිපතනාරාමයේ දී පස්වග තවුසන්ගෙන් භික්ෂු සමාජය ආරම්භ විය. යසකුල පුත්‍රයා ප්‍රමුඛ මිත්‍රයන් 54 සමග පස්වග තවුසන් ද ඇතුළත් ව පළමු රහත් සැටනම බුදුරජාණන් වහන්සේගේ උපදේශය පරිදි බොහෝ ජනයාගේ හිත සුව පිණිස ධර්ම ප්‍රචාරණ කාර්යයේ නිරත වූහ. මේ සඳහා රාජ්‍ය අනුග්‍රහය ද නොමදව ලැබුනු ආකාරය බෞද්ධ සාහිත්‍යය විමර්ශනය කිරීමේ දී මනාව පැහැදිලි වේ.

ධර්මාශෝක රජුගේ පුත් මිහිදු මාහිමියන් ලක්දිවට වැඩම වීමත් සමගින් දෙවනපෑතිස් රජු සමයේ ආරම්භ වූ ශ්‍රී ලංකාවේ භික්ෂු සමාජය එදා සිට අද දක්වාම ලෝකයාගේ හිත සුව පිණිස යෙදෙමින් ඉටු කරනු ලබන්නේ අනුපමේය මෙහෙවරකි.

ධාර්මික මෙන් ම නිවැරදි ගිහි ජීවිතයක් ගත කිරීම සඳහා බුදුදහමේ ඉගැන්වෙන ධර්ම කරුණු අනුව යාමට මඟ පෙන්වනු ලබන්නේ භික්ෂූන් වහන්සේ විසිනි. රාජ්‍ය පාලනයේ දී පවා අතීතයේ සිට අද දක්වාම රාජ්‍ය නායකයා ද භික්ෂූන් වහන්සේගේ ආශිර්වාදය සහ අවවාද අනුශාසනා ලබා ගන්නා ලද්දේ මහත් වූ ගෞරවයෙනි.

ආගමික ශ්‍රද්ධාවෙන් යුක්තව පන්සිල් සුරකිමින් දැහැමි බෞද්ධයෙකු ලෙස ජීවත් වීමට මඟ පෙන්වීමේ දී භික්ෂූන් වහන්සේගෙන් මෙන්ම භික්ෂුනින් වහන්සේගෙන් ඉටුවන සේවය අනුපමේය වන්නේ ය. තව ද අතීතයේ මෙන්ම වර්තමානයේ ද පිරිවෙණ නම් අධ්‍යාපන ආයතනය මගින් ද සමාජ පාලනයට මහඟු දයකත්වයක් සපයා දෙනු ලැබේ.

ඒ අනුව සලකා බලන විට ශාසනික, ජාතික මෙන් ම අධ්‍යාපනික වශයෙන් ද එදා සිට අද දක්වා ම භික්ෂූන් වහන්සේගෙන් ඉටුවන මෙහෙවර අතිමහත් බව තහවුරු වේ.

නියත වශයෙන් ම එහි අවසන් ඵලය වන්නේ සාමකාමී ධර්මානුකූල සමාජයක් බිහි වීමයි. සමාජ විද්‍යාවේ දී එම ස්වභාවය හඳුන්වනු ලබන්නේ සමාජ පාලනය යනුවෙන් ය.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය**

- සාකච්ඡා ක්‍රමය
- කණ්ඩායම් ක්‍රමය

**ආකල්ප හා ඇගයුම්**

1. ධාර්මික සමාජයක් බිහි කිරීම සඳහා භික්ෂූන් වහන්සේගෙන් සිදුවන ආගමික, සමාජීය සහ අධ්‍යාපනික මෙහෙවර පසසයි.

**ගුණාත්මක යෙදවුම්**

- ලියන කඩදසි

## ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්

- ශ්‍රී ලාංකේය සමාජයේ බෞද්ධ ජනතාව අතර දක්නට ලැබෙන සිරිත් විරිත්, වන්දනා ක්‍රම, ඇදහිලි, විශ්වාස පිළිබඳ කෙටි සාකච්ඡාවක යෙදෙන්න.
- භික්ෂූන් වහන්සේ විසින් කරනු ලබන ආගමික සේවය පිළිබඳව සිසුන්ගෙන් විමසන්න.
- අතීතයේ සිට වර්තමානය දක්වාම අධ්‍යාපනික වශයෙන් භික්ෂූන් වහන්සේ විසින් ඉටු කරන මෙහෙවර සාකච්ඡා කරන්න.
- ඉහත ක්‍රියාවලි මාර්ගයෙන් සමාජ පාලනය සක්‍රීය වන ආකාරය සිසු අදහස් විමසමින් සාකච්ඡා කරන්න.

**ක්‍රියාකාරී සැලැස්ම**

| ක්‍රියාකාරකම | ක්‍රමවේදය |
|---|---|
| පන්තිය කණ්ඩායම්වලට බෙදන්න. | කණ්ඩායම් ක්‍රමය |
| පහත මාතෘකා බෙදා දී තොරතුරු සටහන් කරගන්නට අවස්ථාව දෙන්න.<br>• භික්ෂූන් වහන්සේගේ අතීත සහ වර්තමාන ආගමික මෙහෙවර මගින් සිදුවන සමාජ පාලනය<br>• භික්ෂූන් වහන්සේගේ සමාජීය මෙහෙවර මගින් වූ භික්ෂු සමාජ පාලනය<br>• භික්ෂූන් වහන්සේගේ අධ්‍යාපනික දායකත්වය එදා සහ අද | කණ්ඩායම් සාකච්ඡා |
| නියමිත කාලයෙන් පසු කණ්ඩායම්වලට තම තොරතුරු ඉදිරිපත් කරන්නට අවස්ථාව දෙන්න. | කණ්ඩායම් ඉදිරිපත් කිරීම් |

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක**

- අතීතයේ අධ්‍යාපනික වශයෙන් විශාල මෙහෙවරක් ඉටු කළ පිරිවෙන් අධ්‍යාපනික ආයතන 03ක් නම් කිරීම.
- එම පිරිවෙන් හි පෙරමුණ ගත් භික්ෂූන් වහන්සේලා නම් කිරීම.
- වර්තමාන සමාජය තුළ භික්ෂූන් වහන්සේගෙන් ඉටු වන ආගමික, සමාජීය සහ අධ්‍යාපනික සේවා 02 බැගින් ලිවීම.
- "සමාජ පාලනයෙහිලා භික්ෂුවගෙන් ඉටුවිය යුතු සේවය" යන මාතෘකාව යටතේ බිත්ති පුවත්පතකට ලිපියක් ලිවීම.

# 06. සමාජ ගැටලු

**නිපුණතාව 06 -** සමාජය හා සමාජ ගැටලු අතර සම්බන්ධතාව හඳුනා ගනියි.

**නිපුණතා මට්ටම් -** 6.1 සමාජ ගැටලුවල මූලික ලක්ෂණ පැහැදිලි කරයි.

6.2 සමාජ ගැටලු වර්ගීකරණය කරයි.

6.3 සමාජ ගැටලු නිවාරණය සඳහා වන බෞද්ධ නිර්දේශ ඉදිරිපත් කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව - 08**

**හැඳින්වීම -**

සමාජ ගැටලු යනු මිනිස් ක්‍රියාකාරකම්වල ප්‍රතිඵලයක් ලෙස නිර්මාණය වන තත්ත්වයකි. මේ අනුව ඒ ඒ පරිසර මෙන්ම ජීවන රටාවට ද සාපේක්ෂව නිර්මාණය කර ගනු ලබන සමාජ ගැටලුවල ස්වභාවය වෙනස් වන බව තහවුරු වේ.

ගණිකා වෘත්තිය, සොරකම කැලි කසල ප්‍රශ්නය මෙන්ම වකුගඩු රෝගය, දුගී බව, මුඩුක්කු සමාජ, සියදිවි නසා ගැනීම ආදිය සමාජ ගැටලු සඳහා නිදසුන් වේ. සමාජ ගැටලුවක් යනු සමාජය නමැති දේහයට වැළඳෙන රෝගයකි. එහෙයින් එය සමස්ත සමාජ දේහය ම අඩපන කිරීමට හේතු වේ. මෙයින් අදහස් වන්නේ ගැටලුවලින් පීඩාවට පත් සමාජයකට සාර්ථක පැවැත්මක් නොමැති බවයි. එහෙයින් හැකිතාක් කඩිනමින් එවැනි ගැටලු නිවාරණය කර ගත යුතු ය. මිනිසා විසින් නිර්මාණය කරගනු ලබන සෑම සමාජ ගැටලුවක් ම නිවාරණය කර ගැනීමේ හැකියාව ද එකී මිනිසාට ම ඇති බව සමාජ විද්‍යාවවේ පිළිගැනීමයි.

බුදුදහම යනු සමාජ ගැටලු හා පුද්ගල ගැටලු නිරාකරණයට මාර්ගෝපදේශය ලබා දෙන ප්‍රායෝගික දහමකි. එහි දී සූත්‍ර දේශනා මෙන්ම අනෙකුත් සාහිත්‍ය මූලාශ්‍ර ද අධ්‍යයනය කිරීමෙන් සමාජ ගැටලු නිවාරණය සඳහා මාර්ගෝපදේශය සලසා ගත හැකි ය.

**නිපුණතාව** - සමාජය හා සමාජ ගැටලු අතර සම්බන්ධතාව හඳුනා ගනියි.

**නිපුණතා මට්ටම්** - 6.1 සමාජ ගැටලුවල මූලික ලක්ෂණ පැහැදිලි කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව - 02**

**ඉගෙනුම් පල**

1. සමාජ ගැටලුවල මූලික ලක්ෂණ හඳුනාගෙන ප්‍රකාශ කරයි.
2. සමාජ ගැටලු නිර්මාණය වීමෙහිලා සමාජීය වශයෙන් සිදුවන බලපෑම පැහැදිලි කරයි.
3. සමාජ ගැටලු විසඳා ගැනීමට දායකත්වය සපයයි.

**හැඳින්වීම** -

සමාජ ගැටලු යනු ගුණ ධර්ම හෙවත් ධර්මතා සහ අගනාකම් බිඳවැටීම නිසා නිර්මාණය වන තත්ත්වයකි. මූලික වශයෙන් සමාජ ගැටලුවල බලපෑම පොදු සමාජ පැවැත්මට අහිතකර වන්නේ ය.

සමාජ ගැටලුවක සුවිශේෂ ලක්ෂණ.

1. සමාජ ගැටලුවක් සමාජය විසින් නිර්මාණය කර ගැනීම
2. සමාජයේ බහුතරයකට එහි බලපෑම එල්ල වීම
3. එකී බලපෑම හානිකර වීම
4. සුදුසු පිළියම් යෙදීමෙන් සමාජයටම නිවාරණය කර ගත හැකි වීම

**C. Wrisht Mills** නම් සමාජ විද්‍යාඥයා සමාජ බලවේග පුද්ගලයාට බලපෑම් කරන්නේ කෙසේ දැයි පෙන්වා දී ඇත.

සමාජ බලවේගයක් ලෙස සාමාජිකයා ජීවත් වන සමාජ පරිසරය ද බෙහෙවින් වැදගත් වේ. එනම් පැල්පත් නිවාස අශ්‍රිත ජනාවාසවල ජීවත් වන සාමාජිකයන් විවිධ අපරාධ කෙරේ යොමු වන්නේ නිතැතින්ම ය. බහුතරයක් පැල්පත් වාසීන් හට ස්ථිර රැකියා අවස්ථා නොමැත. එහෙයින් ඔවුහු ජීවත් වීම සඳහා සොරකම් කිරීම, මත් කුඩු විකිණීම, ගණිකා වෘත්තියෙහි නියැලීම, මිණී මැරීම වැනි සාපරාධී කටයුතුවල යෙදෙති. මෙම විෂමාචාර ක්‍රියා නිරීක්ෂණය කරන බොහෝමයක් දරුවන් එමග ගනිමින් තම ජීවිකාව ද ඒ ආකාරයට ම සරිකර ගැනීමට පෙළඹේ.

කොළඹ නගරයේ සමස්ත ජන සංඛ්‍යාවෙන් 52% මුඩුක්කු පැල්පත් වාසීන් ය. දිගින් දිගට ම මොවුන් විසින් කරනු ලබන සාපරාධී ක්‍රියා හෙවත් අපරාධ හේතු කොට ගෙන එකී සමාජයට මෙන්ම මහා සමාජයට ද වන හානිකර බලපෑම කෙතරම් ද යන්න තක්සේරු කර ගැනීම එතරම් අපහසු කාර්යයක් නොවන්නේ ය. මුඩුක්කු සමාජවල බහුල වශයෙන් දක්නට ලැබෙන අපරාධ කිහිපයක් පහත දැක්වේ.

- මත්කුඩු භාවිතය
- මත්කුඩු විකිණීම
- මධ්‍යසාර විකිණීම සහ භාවිතය
- කොල්ලකෑම්
- බාබුල් භාවිතය හා විකිණීම
- වංචා
- ගණිකා වෘත්තිය
- මත් පෙති ජාවාරම
- කොන්ත්‍රාත් මිණී මැරුම් යන ආදිය සඳහන් කළ හැකි ය.

මෙලෙස සමාජ විරෝධී ක්‍රියාවන්හි නියැලෙන්නන් නිසා සිදුවන සමාජ බලපෑම අතිමහත් ය. මත් කුඩු භාවිතය හේතු කොට ගෙන මානසික විකෘතිතාවන්ට පත්වන හා කායික රෝග වලට ගොදුරුවන ජනගහනය ඉතා විශාලය. පෙනහලු හා හෘද රෝගීන් බොහෝමයක් අඩු වයස් මට්ටම්වල පසුවන්නන් වේ. ඔවුන් අනාගතයේ දී රැකියාවක් කරමින් මෙරට සංවර්ධනය කෙරෙහි වැඩි දයකත්වයක් සපයන්නන් විය යුතු වේ. එහෙත් රෝගීන් බවට පත් වීමෙන් අනාගත ආර්ථික ඉලක්ක බිඳ වැටෙනවා ඇත. රෝගීන් සහ මානසික විකෘතිතාවයන්ගෙන් යුත් ජනයාගෙන් බහුල රටක සමාජ ආර්ථික ඉලක්ක සපුරා ගත නොහැකි වීම සාමාන්‍ය තත්ත්වයකි.

ගණිකා වෘත්තිය හේතු කොට ගෙන ලිංගිකත්වය හා බැඳුනු සමාජ හර බිඳ වැටෙනු ඇත. HIV මෙන්ම අනෙකුත් හානිකර සමාජ රෝග ව්‍යාප්ත වේ. පවුල් බිඳ වැටීමට හා දූ දරුවන් අතරමං වීමට ද ගණිකා වෘත්තියෙන් වන බලපෑම ඉතා විශාල ය. මෙම ගැටලුව පාලනය කර ගැනීම සඳහා ජාතික ධනයෙන් සුවිශාල ප්‍රමාණයක් වාර්ෂිකව වැය කිරීමට සිදු වීමෙන් සංවර්ධන අවකාශයන් මග හැරෙනු ඇත. ප්‍රතිකාර සඳහා ද වාර්ෂිකව වැය කළයුතු ධනස්කන්ධය ඉතා විශාල ය.

සමස්ත සාමාජිකත්වය පංච ශීල ප්‍රතිපත්තියෙහි පිහිටුවීම වනාහි අනේක විධ ගැටලු නිවාරණයෙහි ලා නිර්දේශිත බෞද්ධ ප්‍රතිපත්ති මාලාවේ එන පළමු පියවර යි. ඊට අමතරව මහා මංගල, පරාභව, ව්‍යග්ගපජ්ජ වැනි සූත්‍ර දේශනාවල අන්තර්ගත ප්‍රතිපත්ති ප්‍රචලිත කිරීමෙන් ළඟා කර ගත හැකි ප්‍රතිඵල ඉතා විශාල ය.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය**

- ඉදිරිපත් කිරීමේ ක්‍රමය
- සාකච්ඡා ක්‍රමය
- කණ්ඩායම් ක්‍රමය
- ප්‍රදර්ශන ක්‍රමය

**ආකල්ප හා ඇගයුම්**

1. සමාජ ගැටලු නිර්මාණය වන්නේ සාමාජිකයාගේ සිතුම් පැතුම් හා හැසිරීම්වල ප්‍රතිඵලයක් ලෙස බව වටහා ගනී. සාමාජිකයා නිවැරදි කර ගැනීමෙන් සමස්ත සමාජයම යහපත් කර ගත හැකි බව අවබෝධ කර ගනියි

2. සමාජ ගැටලු විසඳීමෙහිලා භික්ෂුවට ද වැදගත් කාර්ය භාරයක් පැවරී ඇති බව වටහා ගනියි. ඒ සඳහා මැදිහත් වන භික්ෂුව ද යහපත් ගුණාංගවලින් සන්නද්ධ විය යුතු බව වටහා ගනියි.

**ගුණාත්මක යෙදවුම්**

- පින්තූර පත්‍රිකා
- වීඩියෝ දර්ශන
- කාර්ය පත්‍රිකා

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්**

- සමාජ ගැටලු යනු මොනවා දැයි හඳුන්වා දෙන්න.
- සමාජ ගැටලු කිහිපයක් උදාහරණ ලෙස දක්වන්න. ඒවා මගින් තමාට සහ සමාජයට වන බලපෑම උදාහරණ මගින් පෙන්වා දෙන්න.
- සමාජ ගැටලු විසඳීම කෙරෙහි අවධානය යොමු කරන්න. ඒ සඳහා සමාජය මැදිහත් වීමේ වටිනාකම සාකච්ඡා කරන්න.
- සමාජ ගැටලු විසදා ගැනීමෙන් යහපත් සමාජයක් බිහි කර ගත හැකි බව පෙන්වා දෙන්න.

**ක්‍රියාකාරී සැලැස්ම**

| ක්‍රියාකාරකම | ක්‍රමවේදය |
|---|---|
| සමාජ ගැටලු දැක්වෙන වීඩියෝ දර්ශනයක් නැරඹීමට සලස්වන්න. | ප්‍රදර්ශන ක්‍රමය |
| එහි අන්තර්ගතව තිබූ සමාජ ගැටලුවක් උදාහරණයට ගෙන විස්තර කරන්න. | සාකච්ඡා ක්‍රමය |
| එකී සමාජ ගැටලු ඇති වීමට හේතු සාකච්ඡා කරන්න. | සාකච්ඡා ක්‍රමය |
| එම සමාජ ගැටලුව නිසා ඇතිවන බලපෑම පින්තූර කිහිපයක් මගින් පෙන්වා දෙන්න. | සාකච්ඡා ක්‍රමය<br>ප්‍රදර්ශන ක්‍රමය |
| සිසුන් කණ්ඩායම් කර ඇමුණුම් අංක 01 කාර්ය පත්‍රිකා ලබා දෙන්න. | කණ්ඩායම් ක්‍රමය |
| වාර්තා පංතියට ඉදිරිපත් කර ඇගයුම් හා ප්‍රතිපෝෂණය ලබා දෙන්න. | ඉදිරිපත් කිරීමේ ක්‍රමය |

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක**

- සමාජ ගැටලුවක් යනු කුමක් දැයි පැහැදිලි කිරීම.
- සමාජ ගැටලුවල මූලික ලක්ෂණ නම් කිරීම.
- සමාජ ගැටලු අවම කර ගැනීමට සමාජයේ පර්ශ්වයෙන් ලබා දිය යුතු දයකත්වය කවරාකාර දැයි පැහැදිලි කිරීම.

**ඇමුණුම 01**

**කාර්ය පත්‍රිකාව 01**

පහත වගුව පුරවන්න

| | සමාජ ගැටලුව | සමාජයට වන බලපෑම | වළක්වා ගැනීමට කළහැකි දේ |
|---|---|---|---|
| A කණ්ඩායම | • මත් කුඩු<br>• කැළිකසල ගැටලුව | | |
| B කණ්ඩායම | • ගණිකා වෘත්තිය<br>• ඩෙංගු උවදුර | | |

**නිපුණතාව** - සමාජය හා සමාජ ගැටලු අතර සම්බන්ධතාව හඳුනා ගනියි.

**නිපුණතා මට්ටම් -** 6.2 සමාජ ගැටලු වර්ගීකරණය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව - 03**

**ඉගෙනුම් පල**

1. සමාජ ගැටලු වර්ග කර දක්වයි.
2. සමාජ ගැටලුවක් එහි මූලික ලක්ෂණ වලට අනුව පැහැදිලි කරයි.
3. සමාජ ගැටලු බහුල වීම සමාජ පරිහාණියට හේතුවන ආකාරය පෙන්වා දෙයි.

**හැඳින්වීම** -

සමාජ ගැටලු ප්‍රභේද කිහිපයකට වෙන් කළ හැකි ය. එනම්,

සමාජ, ආර්ථික, දේශපාලන, ආගමික, පාරිසරික, සෞඛ්‍ය, හා අධ්‍යාපන ආදි වශයෙනි. යම් සමාජයක දැකිය හැකි කවර හෝ ගැටලුවක් මෙකී මූලයන් එකක් හෝ කිහිපයක් මත පදනම් වන බව තහවුරු වනු ඇත.

සියදිවි නසා ගැනීම සුවිශේෂී සමාජ ගැටලුවක් ලෙස හඳුනාගත හැකි ය. එමිල් ඩුර්කයිම්ට අනුව සමාජ, ආර්ථික, දේශපාලනික සාධක වල ප්‍රතිඵලයක් ලෙස මෙම ගැටලුව උද්ගත වේ. එනම් සමාජමය සාධක මත මෙම ගැටලුව පදනම් වන බවයි. සමාජ ක්‍රමයේ එතෙක් පැවති සුගම පැවැත්ම එසේ නොමැති නම් සමාජ රිද්මය වෙනස්කම්වලට භාජනය වන විට එහි ප්‍රතිඵලයක් ලෙස විවිධ ප්‍රතිවිපාක අපේක්ෂා කළ හැකි ය. එවැනි එක් ප්‍රතිවිපාකයක් ලෙස සිය දිවි නසා ගැනීම හඳුන්වා දිය හැකි ය.

1) මමායනික සියදිවි නසා ගැනීම. ඉච්ඡාභංගත්වය හෙවත් තමා බලපොරොත්තු වූ ඉලක්ක ළඟා කර ගැනීමට නොහැකි වූ විට සාමාජිකයා මෙම ගණයේ සියදිවි නසා ගැනීමට යොමු වෙයි

2) පරහිතකාමී සියදිවි නසා ගැනීම. තමා අදහන සමාජයේ පරමාර්ථ වෙනුවෙන් සියදිවි නසා ගනියි. ත්‍රස්තවාදී කණ්ඩායම්, සමුරායිවරු මෙලෙස පරහිතකාමීත්වය වෙනුවෙන් සියදිවි නසා ගන්නා කණ්ඩායම් වේ. සති පූජාව ද මෙම ගණයට අයත් වේ.

3) අනෝමීය සියදිවි නසා ගැනීම. සමාජය දියුණු වීමත් සමගම මානව සම්බන්ධතා බිඳ වැටීයයි. නව සමාජ ක්‍රමයට ආවේණික නව ධර්මතා හෙවත් ප්‍රතිමාන පිළිබඳ නිරවුල්ව තේරුම් ගත නොහැකි සාමාජිකයා ව්‍යාකුලත්වයට පත්වේ. නැතහොත් අතරමං වේ. එහිදී මුහුණ පෑමට සිදුවන විවිධාකාරයේ ගැටලු හමුවේ කෙනෙකු සියදිවි නසා ගනී.

පෞරුෂ සංවර්ධනය, මානව සම්බන්ධතා ශක්තිමත් කිරීම, අන්තර් පුද්ගල අදහස් ආකල්ප හුවමාරුව වැඩි කිරීම වැනි ක්‍රමෝපාය මගින් සියදිවි නසා ගැනීම වළක්වා ගත හැකි ය.

දුගී බව හා ආදායම් විෂමතාව සමාජ ගැටලු අතර ඇති තවත් සුවිශේෂී එකකි. නූගත්කම, විරැකියාව, ජීවන හුරු පුරුදු ආදිය දුගී බවට මං පාදන ප්‍රධානතම සාධක වේ. දිළිඳුකම හෙවත් දුගී බව සිව් ආකාර වේ.

- ★ සමාජීය දිළිඳු බව
- ★ සදාචාරමය දිළිඳු බව
- ★ අන්ත දිළිඳු බව
- ★ සාපේක්ෂ දිළිඳුකම

සමාජීය දිළිඳු බව දේපල, ධනය, ආර්ථික සාධක වල හිමිකමට සාපේක්ෂය. සදාචාරමය දිළිඳුකමට අනුව සමාජය හෝ එහි උපසංස්ථා සමූහ ආදියේ පවත්නා සදාචාර මට්ටම් හා ඒවා පිළිගන්නා ස්වරූපය වෙනස් වේ. අන්ත දිළිඳුකම යනු අවම ජීවන අවශ්‍යතා හෝ ළඟා කර ගත නොහැකි තත්ත්වය යි. සමාජයකින් සමාජයකට හෝ රටකින් රටකට සාපේක්ෂව ආර්ථික හා සමාජ තත්ත්වය සලකා කරන ගණනය සාපේක්ෂ දිළිඳුකම නම් වේ.

ශ්‍රී ලංකාවේ දිළිඳු බව නැති කිරීම සඳහා විවිධ ක්‍රියා මාර්ග ගෙන තිබේ. ආහාර සහනාධාර මුද්දර ක්‍රමය, ජනසවි ව්‍යාපෘතිය, සමෘද්ධි ව්‍යාපෘතිය, ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන යෝජනා ක්‍රමය, නිවාස සංවර්ධන ව්‍යාපෘති ඒ සඳහා නිදසුන් වේ.

ළමා අපයෝජනය යනු වැඩිහිටියෙකු විසින් ස්වකීය අවශ්‍යතාවන් සඳහා ළමයා යන අර්ථකතනයට අයත් වන්නෙකු යොදා ගැනීමයි. ළමා අපයෝජනය විවිධ ස්වරූපයෙන් හඳුනාගත හැක. කායික හිංසනය එනම් අමානුෂික පහරදීම, නිරාහාරව තැබීම්, දම්වැල්වලින් බැඳ තැබීම, හිර කිරීම ආදිය සඳහන් කළ හැකි ය. මෙහි ප්‍රතිවිපාක කෙටි කාලීන හෝ දීර්ඝ කාලීන විය හැකි ය. ශාරීරික වශයෙන් තැලීම්, කැළැල්, පිලිස්සුම් තුවාල ආදිය ප්‍රධාන තැනක් ගනියි. චිත්ත වේගී අපයෝජනය ලෙස රළු වචන කතා කිරීම, බිය ගැන්වීම, තර්ජනය කිරීම හුදකලා වට පත් කිරීම ආදිය හැඳින්විය හැකි ය.

ලිංගික අපයෝජනය ද ළමා අපයෝජනයේ තවත් පැත්තකි. මෙහි දී වැඩිහිටියන් විසින් සිය ලිංගික අවශ්‍යතා සඳහා බාල වයස් දරුවන් යොදා ගනු ලැබේ. එය ළමා අපයෝජනයෙහි වඩාත් අහිතකර ප්‍රභේදයක් ලෙස දැක්විය හැක.

කැලි කසල ගැටලුව වර්තමානය වන විට සුවිශේෂී සමාජ ගැටලුවක් බවට පත්ව ඇත. එදිනෙදා ජීවිතයේ දී කිසියම් ජනාවාසයක ඒකරාශී වන අප ද්‍රව්‍ය නිසි පරිදි කළමණාකරණය නොකළ හොත් උද්ගතවන තත්ත්වය කැලි කසල ගැටලුව නමින් හඳුන්වනු ලැබේ. එදිනෙදා රැස් වන කැලි කසල අතුරින් කොටසක් දිරනසුළු වේ. ඒවා භාවිතයෙන් ජීව වායු උත්පාදනය කර ගැනීමට ද අවසානයේ කාබනික පොහොර නිපදවා ගැනීමට ද හැකි වේ. එමගින් ජාතික අර්බුධ තුනකට එකවර පිළිතුරු සපයා ගත හැකි බව පැහැදිලි වේ. එනම් විදුලිය, පොහොර හා කැලිකසල යන අර්බුධ තුනය. පොලිතින්, වීදුරු වැනි අනෙකුත් අප ද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය කර යළි භාවිතයට ගත හැකි වේ. රජය මැදිහත් වී ඒ සඳහා අවශ්‍ය මූලික ක්‍රියාමාර්ග ගත යුතු අතර රටේ ජනතාව තම තමන්ගේ නිවසේ හෝ සේවා ස්ථානයේ එකතුවන අප ද්‍රව්‍ය නිසියාකාරව වර්ගීකරණය කර භාර දීමට තරම් කාරුණික විය යුතු ය.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය**

- ඉදිරිපත් කිරීමේ ක්‍රමය
- ප්‍රදර්ශන ක්‍රමය
- සාකච්ඡා ක්‍රමය
- කණ්ඩායම් ක්‍රමය

**ආකල්ප හා ඇගයුම්**

1. සමාජ ගැටලු හඳුනා ගෙන ඒවා ඇතිවන ආකාරය අවබෝධ කර ගනියි.
2. සමාජ ගැටලුවල මූලික ලක්ෂණ ආශ්‍රයෙන් සමාජ ගැටලු විවරණය කර ගැනීමට පෙළඹෙයි.
3. සමාජ ගැටලු ඇතිනොවන ලෙස ජීවත්වීමේ වටිනාකම අවබෝධකර ගනියි.

**ගුණාත්මක යෙදවුම්**

- වීඩියෝ දර්ශන
- පුවත් පත් ලිපි
- කාර්ය පත්‍රිකා

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්**

- එක් සමාජ ගැටලුවක් මාතෘකාව කර ගනිමින් එම ගැටලුව ශිෂ්‍යයාට හඳුන්වා දෙන්න.
- එම සමාජ ගැටලුවට ලක් වූවෙකුගේ අත්දැකීම් ඇතුළත් පුවත් පත් ලිපියක් සිසුන්ට අධ්‍යයනය කරන්නට අවස්ථාව දෙන්න.
- සමාජ ගැටලුලට අදාළ මූලික ලක්ෂණ එම ලිපිය ආශ්‍රිතව පෙන්වා දෙන්න.
- සමාජ ගැටලුවක් මුළු මහත් සමාජයටම අහිතකර තත්ත්වයක් වන අයුරු උදාහරණ මගින් පෙන්වා දෙන්න.
- සමාජ ගැටලු විසඳා ගැනීමේ වැදගත්කම පෙන්වා දෙන්න.

**ක්‍රියාකාරකම් සැලැස්ම**

| ක්‍රියාකාරකම | ක්‍රමවේදය |
|---|---|
| සමාජ ගැටලුවකට ලක් වූවෙකුගේ අත්දැකීම් අඩංගු පුවත් පත් ලිපියක් විස්තර කරන්න.<br>නැතිනම්, | ප්‍රදර්ශන ක්‍රමය<br>ඉදිරිපත් කිරීමේ ක්‍රමය |
| සමාජ ගැටලුවකට ලක් වූවෙකුගේ අත්දැකීම් අඩංගු වීඩියෝ දර්ශනයක් නැරඹීමට සලස්වා ඒ ගැන සිසුන් සමග සාකච්ඡා කරන්න. | ප්‍රදර්ශන ක්‍රමය<br>සාකච්ඡා ක්‍රමය |
| සමාජ ගැටලුවක මූලික ලක්ෂණ සාක්ච්ඡා කරන්න. | සාකච්ඡා ක්‍රමය |
| එම සමාජ ගැටලුව නිසා ඇතිවන ආකල්පමය වෙනස්කම් සාකච්ඡා කරන්න | සාකච්ඡා ක්‍රමය |
| විවිධ සමාජ පසුබිම් අනුව විවිධ සමාජ ගැටලු ඇති වන බව පෙන්වා දෙන්න. | සාකච්ඡා ක්‍රමය |
| සිසුන් කණ්ඩායම් කර ඇමුණුම් අංක 01 කාර්ය පත්‍රිකා ලබා දෙන්න. | කණ්ඩායම් ක්‍රමය |
| වාර්තා පංතියට ඉදිරිපත් කර ඇගයුම් හා ප්‍රතිපෝෂණය ලබා දෙන්න. | |

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක**

- සමාජ ගැටලුවක ඇති මූලික ලක්ෂණ නම් කිරීම.
- ඔබ හඳුනාගත් සමාජ ගැටලු වර්ග 04ක් නම් කිරීම.
- එලෙස හඳුනාගත් සමාජ ගැටලුවල අඩංගු වන මූලික ලක්ෂණ 03 බැගින් ඉදිරිපත් කිරීම.
- සමාජ ගැටලු නිරාකරණයට ගතහැකි ක්‍රියාමාර්ග ඉදිරිපත් කිරීම

**ඇමුණුම 01**

**කාර්ය පත්‍රිකාව 02**

පහත කණ්ඩායම්වලට අදාළ සමාජ ගැටලුව පිළිබඳව සපයා ඇති මාතෘකා ආශ්‍රය කර ගනිමින් පොත් පිංචක් නිර්මාණය කරන්න.

- සමාජ ගැටලුව
- මූලික ලක්ෂණ
- නිවාරණයට ඔබේ අදහස් හා යෝජනා

A කණ්ඩායම - දූප්පත් කම

B කණ්ඩායම - කැලි කසල ගැටලුව

**නිපුණතාව** - සමාජය හා සමාජ ගැටලු අතර සම්බන්ධතාව හඳුනා ගනියි.

**නිපුණතා මට්ටම්** - 6.3 සමාජ ගැටලු නිවාරණයේ දී බෞද්ධ නිර්දේශ ඉදිරිපත් කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව - 03**

**ඉගෙනුම් පල**

1. සමාජ ගැටලු නිරාකරණයට අදාළ බෞද්ධ ඉගැන්වීම් නම් කරයි.
2. බෞද්ධ මාර්ගෝපදේශ ඇසුරින් සමාජ ගැටලු විසඳීම සඳහා සුදුසු ක්‍රියා මාර්ග යෝජනා කරයි.
3. සමාජ ගැටලු නිවාරණයෙහිලා බෞද්ධ ඉගැන්වීම්වල ඇති අදාළත්වය පැහැදිලි කරයි.

**හැඳින්වීම** -

සමාජ ගැටලු නිවාරණය කෙරෙහි බුදුදහම ඉටු කරන්නේ සුවිශේෂී කාර්යභාරයකි. මෙහි දී සමාජ ගැටලු නිවාරණයට බුදුදහම යොදා ගෙන ඇති මාර්ගෝපදේශ විවරණය කළ යුතු ය.

දිළිඳු බව යනු තවත් ගැටලු රාශියකට මඟ විවර කරනු ලබන කේන්ද්‍රීය සමාජ ගැටලුවකි. බොහෝ දෙනා දිළිඳු බව අර්ථකතනය කරනුයේ අඩු ආදායම සහ පහළ පරිභෝජන මට්ටම යන නිර්ණායක වෙත අවධානය යොමු කරමින් ය. එහෙත් බෞද්ධ මාර්ගෝපදේශනයට අනුව පරම ධනය වන්නේ සතුට ය. ආර්ථික සුරක්ෂිතතාවය (අත්ථි සුඛ), උපයාගත් භව භෝග භුක්ති විඳීම (භෝග සුඛ), ණයෙන් තොර වීම (අණන සුඛ) සහ ධර්මානුකූල උපයා ගැනීම (අනවජ්ජ සුඛ) යන සිව් වැදෑරුම් සුඛය මත මිනිසාගේ සැබෑ සතුට හා පොහොසත්කම රඳා පවතින බව බෞද්ධ ඉගැන්වීම යි.

බුදුදහමේ ධනය ඉපයීය යුතු ආකාරය නිර්දේශ කර ඇත. කිසිවෙකුටත් හානිකර නොවන ආකාරයේ කර්මාන්ත, වෙළෙඳ ව්‍යාපාර, ගොවිතැන ආදිය ධනෝපායන මාර්ග ලෙස නිර්දේශ කර ඇත. අවි ආයුධ, මස් මාංශ වෙළෙඳාම නොකළ යුතු ය. කිරුම් මිනුම්වල දී වංචා නොකළ යුතු ය.

සමාජ ගැටලු මුළු මනින්ම උපුටා දැමීමට තරම් පංචශීල ප්‍රතිපදාව අර්ථවත් වේ. පරපණ නැසීමෙන් වැළකීමට අදළ නීතියක් තමන්ට ම පනවා ගත හැකි වන්නේ නම් මුළු මහත් සමාජයම සුරක්ෂිත වේ. එවැනි සමාජයකින් මනුෂ්‍ය ඝාතන වාර්තා නොවනු ඇත. එය තව දුරටත් තහවුරු කිරීමට "අත්ථානං උපමංකත්වා" යන ධම්ම පදයේ එන මාර්ගෝපදේශය වඩාත් වැදගත් වේ. කිසිවෙකුත් නොදුන් දෙයක් බලෙන් නොගන්නේ නම් සමාජ ගැටලු ඇති නො වේ. බොරු නොකිරීම මගින් සමාජය තුළ වැරදි අවබෝධය නිසා උද්ගත වන සමාජ ගැටලු සියල්ල මගරවා ගත හැකි වේ.

වැරදි කාම සේවනයයෙහි නොහැසිරෙන්නේ නම් HIV වැනි ඉතා භයානක ලෙඩ රෝග ව්‍යාප්ත වීම වළක්වා ගත හැකි වෙනවා පමණක් නොව අනේක විධ සමාජ ගැටලුවලින් තොර සමාජයක් බිහිකර ගැනීමට ද මග පෑදෙනු ඇත.

සදිසා නමස්කාරය මගින් ශිෂ්ට සම්පන්න මිනිසෙක් නිර්මාණය වන්නේ කෙසේ දැයි දක්වා තිබේ. මෙමගින් කම්කරුවාගේ සිට වෘත්තිකයා දක්වා සැමගේ සමානාත්මතාව හා නිසි ගෞරවය තහවුරු වේ. එවැනි සමාජ පසුතලයක් ද දහසකුත් එකක් සමාජ ගැටලු නිවාරණය කර ගැනීමට මහත් සේ උපකාර වනු ඇත.

මහා මංගල සූත්‍රයෙහි අටතිසක් මංගල කරුණු දක්වා තිබේ. එම මංගල කරුණු අනුගමනය කරන සමාජයක අසහනකාරී සමාජ ගැටලු උද්ගත නොවනු ඇත.

මේ අනුව බුදුදහම මගින් සමාජ ගැටලු ඇති නොවන පරිදි සමාජය සංවිධානය කර ගත හැකි ආකාරය මනා ලෙස පෙන්වා දෙන ලද බව පැහැදිලි වේ.

කරණීය මෙත්ත සූත්‍රය දේශනා කොට ඇත්තේ සියලු ම සතුනට මෛත්‍රී කිරීම සඳහා ය. සෑම කෙනෙකුම අනෙකා කෙරෙහි මෛත්‍රී සහගතව කටයුතු කරන්නේ නම් අවෛරී සමාජයක් නිර්මාණය වේ. එය ආචාරශීලී සමාජයක් ද වේ. එවැනි තැනක සමාජ ගැටලු උද්ගත වීමට ඇති අවකාශය ඉතාමත් සීමිත වේ.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය**

- ඉදිරිපත් කිරීමේ ක්‍රමය
- ප්‍රදර්ශන ක්‍රමය
- කණ්ඩායම් ක්‍රමය
- සාකච්ඡා ක්‍රමය

**ආකල්ප හා ඇගයුම්**

1. සමාජ ගැටලු ඇති වන්නේ මානව චර්යාවේ ප්‍රතිඵලයක් හැටියට බව වටහා ගනියි.
2. සෑම ගැටලුවක්ම ඇති වීමට පෙර බෞද්ධ මාර්ගෝපදේශයට අනුව ක්‍රියා කර වළක්වා ගත හැකි බව අවබෝධ කර ගනියි.
3. බෞද්ධ ඉගැන්වීම් අනුගමනය කිරීමෙන් සමාජ ගැටලුවලින් තොර පවුලක්, ගමක් ගොඩනගා ගත හැකි බව වටහා ගනියි.

**ගුණාත්මක යෙදවුම්**

- බෞද්ධ පොත්පත්, සූත්‍ර, හා ධම්ම පද පොත්
- පින්තූර පත්‍රිකා
- කාර්ය පත්‍රිකා

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්**

- සමාජ ගැටලු හඳුන්වා දෙන්න.
- සමාජ ගැටලු ඇති වීමට පෙර බෞද්ධ මාර්ගෝපදේශයන් ලබා ගෙන ඒවා වළක්වා ගත හැකි බව උදාහරණ මගින් පෙන්වා දෙන්න.
- බෞද්ධ ඉගැන්වීම් අනුගමනය කිරීමෙන් සමාජ ගැටලු අවම කරගත හැකි බව අවබෝධ කර දෙන්න.
- ඕනෑම සමාජ ගැටලුවක් සාර්ථක ලෙස විසඳා ගැනීම සඳහා බෞද්ධ මාර්ගෝපදේශයන් උපකාරී කරගත හැකි බව වටහා දෙන්න.

**ක්‍රියාකාරී සැලැස්ම**

| ක්‍රියාකාරකම | ක්‍රමවේදය |
|---|---|
| පන්සිල් පද ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න. | ඉදිරිපත් කිරීමේ ක්‍රමය |
| කරණීය මෙත්ත සූත්‍රය හා එහි සිංහල අනුවාදය ඇති වීඩියෝ දර්ශනයක් පංතිය ඉදිරිපිට පෙන්වීමට සලස්වන්න. | ප්‍රදර්ශන ක්‍රමය |
| එහි තේරුම විස්තර කරන්න. | සාකච්ඡා ක්‍රමය |
| සමාජ ගැටලු නිවාරණය වැදගත් වන ආකාරය සාකච්ඡා කරන්න. | සාකච්ඡා ක්‍රමය |
| සිසුන් කණ්ඩායම් කර ඇමුණුම් අංක 01 කාර්ය පත්‍රිකා ලබා දෙන්න. | කණ්ඩායම් ක්‍රමය |
| වාර්තා පංතියට ඉදිරිපත් කර ඇගයුම හා ප්‍රතිපෝෂණය ලබා දෙන්න. | ඉදිරිපත් කිරීමේ ක්‍රමය |

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක**

- සමාජ ගැටලු පාලනය සඳහා සූත්‍ර දේශනා වැදගත් වන්නේ කෙසේ දැයි එක් සූත්‍රයක් උදාහරණයට ගෙන පැහැදිලි කිරීම
- බෞද්ධ මාර්ගෝපදේශයෙහි සමාජ ගැටලු නිවාරණය සඳහා ඉදිරිපත් කර ඇති උදාහරණ 02ක් දැක්වීම
- මත්ද්‍රව්‍ය භාවිතය තුරන් කිරීම සඳහා උපයෝගී කර ගත හැකි බෞද්ධ ඉගැන්වීම් පැහැදිලි කිරීම

**ඇමුණුම 01**

**කාර්ය පත්‍රිකාව 01**

පහත දැක්වෙන එක් එක් කණ්ඩායමට අදාළ සමාජ ගැටලුව ගෙන, එය නිවාරණය සඳහා බෞද්ධ මාර්ගෝපදේශ දායක කරගත හැකි අයුරු පෙන්වා දෙන්න.

A කණ්ඩායම - ගණිකා වෘත්තිය

B කණ්ඩායම - මත් ද්‍රව්‍ය භාවිතය

## 07. සමාජය අධ්‍යයනය පිළිබඳ සමාජ විද්‍යාත්මක ප්‍රවේශය හඳුනා ගැනීම

**නිපුණතාව 07 -** සමාජය අධ්‍යයනය කිරීම සඳහා යොද ගනු ලබන විද්‍යාත්මක ප්‍රවේශය හඳුනා ගනියි.

**නිපුණතා මට්ටම් -** 7.1 සමාජ විද්‍යාත්මක පර්යේෂණවල අවශ්‍යතාව පැහැදිලි කරයි.

7.2 සමාජ විද්‍යාත්මක පර්යේෂණ ක්‍රමවේදය අධ්‍යයනය කරයි.

7.3 තොරතුරු රැස් කිරීමේ විධික්‍රමයක් ලෙස නිරීක්ෂණය භාවිත කරයි.

7.4 සාකච්ඡාව තොරතුරු රැස් කිරීමේ ක්‍රමවේදයක් ලෙස යොදා ගනියි.

**කාලච්ඡේද සංඛ්‍යාව - 07**

**හැඳින්වීම -**

I විද්‍යාවක් යනු දැනුම් සම්භාරයක එකතුවකි. එකී දැනුම තර්කානුකූල නැතහොත් විද්‍යාත්මක විය යුතු ය. විද්‍යාත්මක දැනුම යනු විධිමත් පර්යේෂණ මාර්ගයෙන් අනාවරණය කර ගනු ලබන දැනුමයි. මේ අනුව සමාජ විද්‍යා පර්යේෂණ වල මූලික ඉලක්කය වන්නේ නව දැනුම අනාවරණය කර ගැනීම යි.

එම දැනුම අනාවරණය කර ගැනීමේ දී විද්‍යාත්මක ක්‍රම (SCIENTIFIC METHOD) අනුගමනය කිරීම විද්‍යාවන්හි විශේෂ ලක්ෂණයකි. ඒ අනුව "තාර්කික විධික්‍රම මාර්ගයෙන් සමාජ සංසිද්ධි විග්‍රහ කිරීම විද්‍යාත්මක ක්‍රමය ලෙස සැලකිය හැකිය." යනුවෙන් අර්ථ දැක්විය හැකි ය. විද්‍යාත්මක විධික්‍රම මාර්ගයෙන් පළමුව රැස්කර ගනු ලබන්නේ තොරතුරු හෙවත් දත්ත ය. ප්‍රාථමික හා ද්විතීයික යනුවෙන් දත්ත ප්‍රභේද 2කි. යළි එකී දත්ත ප්‍රමාණාත්මක හා ගුණාත්මක යනුවෙන් දෙකකට බෙදේ.

ප්‍රාථමික දත්ත ලබා ගැනීමේ දී ප්‍රශ්න මාලා, නිරීක්ෂණය, සම්මුඛ සාකච්ඡා යන ශිල්ප ක්‍රම භාවිත කළ හැකිය. ද්විතීයික දත්ත රැස් කිරීමේ දී පොත් පත්, ලිපි ලේඛන පරිශීලනය කරයි. ප්‍රමාණාත්මක දත්ත මෙන් ම ගුණාත්මක දත්ත ද ලබා ගැනීමට උපයෝගී කරගත හැකි වන මෙම ශිල්ප ක්‍රම සමීක්ෂණ සැලැස්ම සමග මෙන්ම සිද්ධි අධ්‍යයනය, මානව වංශ ලේඛන ක්‍රමය වැනි ප්‍රවේශයන්හි දී ද භාවිත කෙරේ. කිසියම් සිද්ධියක්, අවස්ථාවක් හෝ ගැටලුවක් පිළිබඳව දත්ත දයකයෙකු හා සමග විමර්ශනාත්මකව අදහස් හුවමාරු කර ගැනීම සම්මුඛ සාකච්ඡාව ලෙස හැඳින්විය හැකි ය.

**නිපුණතාව** - සමාජය අධ්‍යයනය කිරීම සඳහා යොදා ගනු ලබන විද්‍යාත්මක ප්‍රවේශය හඳුනා ගනියි.

**නිපුණතා මට්ටම** - 7.1 සමාජ විද්‍යාත්මක පර්යේෂණවල අවශ්‍යතාව හඳුනා ගනියි.

**කාලච්ඡේද සංඛ්‍යාව** - 01

**ඉගෙනුම් පල**

1. පර්යේෂණයක් යනු කුමක් ද යන්න නිර්වචන අනුසාරයෙන් හඳුන්වයි.
2. පර්යේෂණයක් විද්‍යාත්මක පර්යේෂණයක් වන අයුරු පැහැදිලි කරයි.
3. පර්යේෂණයක් කරන්නේ මන් ද යන්න පිළිබඳ විවරණාත්මකව අදහස් දක්වයි.
4. පර්යේෂණවල අවශ්‍යතාව පැහැදිලි කරයි.

**හැඳින්වීම** - 17 - 18 සියවස් යනු මානවයාගේ තාර්කික බුද්ධිය අවදි වන කාල පරාසය ලෙස සැලකිය හැකිය. විද්‍යාත්මක ක්‍රමය (SCIENTIFIC METHOD) අනුගමනය කරමින් සමාජ සංසිද්ධි විග්‍රහ කිරීම විද්‍යාත්මක ක්‍රමය ලෙස සැලකිය හැකි ය. තෝරාගත් නියැදියක් ඇසුරින් ක්‍රමාණුකූලව සහ විද්‍යාත්මකව තොරතුරු ගවේෂණය කිරීම විද්‍යාත්මක පර්යේෂණයකි. (ADVANCED LEARNER'S DICTIONARY) ශබ්ද කෝෂයෙහි සඳහන් වන ආකාරයට -

"ක්‍රමානුකූල පර්යේෂණයක් හෝ සොයා බැලීමක් මාර්ගයෙන් ගැටලුවකට අදාළ හේතු සාධක සොයා බැලීම" පර්යේෂණයක් වේ.

"නිශ්චිත ක්‍රමයකට අනුව තොරතුරු ගවේෂණය කිරීම විද්‍යාත්මක කලාවක් ලෙසට හැඳින්විය හැකි ය.

(කොතාරි - Kothari)

මේ ආකාරයේ විවිධ ක්‍රම උපයෝගී කොට ගෙන සමාජීය දැනුම ඒකරාශී කරන්නේ මන් ද යන ගැටලුව උද්ගත වේ. කිසියම් පර්යේෂණයක් සඳහා නිමිත්ත වන්නේ ගැටලුවකි. ඕනෑම සමාජ ගැටලුවක බලපෑම හානිකර ය. එහෙයින් එකී ගැටලු නිවාරණය කර සමාජය සුවපත් කර ගත යුතු ය. ගැටලු නිවාරණය සඳහා නිසි පිළියම් යෙදීමට නම් ගැටලුව නිර්මාණය කිරීමෙහිලා පාදක වූ හේතු සාධක, කවරේ දැයි නිවැරදිව තේරුම් ගත යුතු ය. පර්යේෂණයක මූලික කාර්යය වන්නේ ගැටලු නිර්මාණය කිරීමෙහිලා පාදක වන මෙකී සැබෑ හේතු සාධක අනාවරණය කර ගැනීමයි. මේ අනුව වරින් වර උද්ගත වන ගැටලු නිවාරණය කර ජන ජීවිතයට හිතකර යහපත් සමාජයක් ගොඩ නගා ගැනීමේ දී සමාජ විද්‍යාත්මක පර්යේෂණ මගින් ඉටු කරනු ලබන මෙහෙවර ඉතාමත් වැදගත් වන බව පැහැදිලි වේ.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය**

- සාකච්ඡා ක්‍රමය
- ප්‍රදර්ශන ක්‍රමය
- ඉදිරිපත් කිරීම්

**ආකල්ප හා ඇගයුම්**

1. සමාජය සහ සාමාජිකයා අතර පවතින මනා සබඳතාව වටහා ගැනීමට සමාජ පර්යේෂණ වැදගත් වෙන බව සත්‍යාක්ෂණය කරයි.
2. සමබර සමාජයක් සහතික කර ගැනීමෙහි දී පර්යේෂණවල දායකත්වය ප්‍රමාණය කරයි.
3. නිවැරදි ක්‍රමවේදයකින් ලබා ගන්නා දත්ත මගින් පර්යේෂණ අරමුණු ඉටු කර ගැනීමට පහසු වන බව වටහා ගනියි.

**ගුණාත්මක යෙදවුම්**

- පෑන්, පැන්සල්
- බිස්ටල් බෝඩ්
- නිර්වචන ලියන ලද පුවරු

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්**

- පර්යේෂණයක් යනු කුමක් ද? යන්න නිර්වචන ඇසුරින් පහදා දෙන්න.
- පර්යේෂණයක දී තොරතුරු ලබා ගන්නා ආකාරය පෙන්වා දෙන්න.
- පර්යේෂණ කිරීමේ වැදගත්කම හඳුනා ගැනීමට මඟ පෙන්වන්න.
- පර්යේෂණවල අවශ්‍යතාව තේරුම් ගැනීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- පර්යේෂණ අනාවරණ ඇතුළත් පොත් හා ලිපි පෙන්වන්න. (හැකිනම් පමණි)


**ක්‍රියාකාරී සැලැස්ම**

| ක්‍රියාකාරකම | ක්‍රමවේදය |
|---|---|
| කොතාරි (Kothari) ගේ නිර්වචනය ලියන ලද පුවරු පංතියේ ප්‍රදර්ශනය කරන්න. | ඉදිරිපත් කිරීම |
| ඉදිරිපත් කරණ ලද නිර්වචනය ඇසුරින් පර්යේෂණවල ඇති වැදගත්කම සිසුන්ට හඳුනා ගැනීමට මඟ පෙන්වන්න. | සාකච්ඡා ක්‍රමය |
| සමාජ පර්යේෂණවල අරමුණු සිසුන් හා සාකච්ඡා කරන්න. | සාකච්ඡා ක්‍රමය |
| සමාජය සහ සාමාජිකයා අතර සබඳතාව අඛණ්ඩව පවත්වා ගැනීම සඳහා පර්යේෂණ ප්‍රතිඵල මැදිහත් වන බව පෙන්වා දෙන්න. | කේවල හෝ කණ්ඩායම් වශයෙන් |

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක**

- සමාජ පර්යේෂණ අර්ථ දක්වන ලද නිර්වචන 02ක් ලිවීම.
- පර්යේෂණ ක්‍රියාවලියක අරමුණු කවරේ දැයි දැක්වීම.
- සමාජ විද්‍යා පර්යේෂණවල ප්‍රායෝගික වැදගත් කම පැහැදිලි කිරීම.

**ඇමුණුම 01**


ගැටලුව
පර්යේෂණ
පර්යේෂණ
විද්‍යාත්මක පර්යේෂණ
සරල විමර්ශන
යථාර්ථය
නිගමනය
විසඳුම්
සාර්ථක
වඩාත් සාර්ථක
ප්‍රතිඵලය

**නිපුණතාව** - සමාජය අධ්‍යයනය කිරීම සඳහා යොද ගනු ලබන විද්‍යාත්මක ප්‍රවේශය හඳුනා ගනියි.

**නිපුණතා මට්ටම** - 7.2 සමාජ විද්‍යාත්මක පර්යේෂණ ක්‍රමවේදය අධ්‍යයනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව - 02**

**ඉගෙනුම් පල**

1. පර්යේෂණයක් සහ විද්‍යාත්මක පර්යේෂණයක් අතර වෙනස පහදයි.
2. සමාජීය විද්‍යාත්මක ක්‍රමවේදය පැහැදිලි කරයි.
3. උපන්‍යාසයක් ගොඩනගා ගන්නා අයුරු පැහැදිලි කරයි.
4. පර්යේෂණයක් කිරීමට අවශ්‍ය ප්‍රශ්නාවලියක ආකෘතියක් ඉදිරිපත් කරයි.

**හැඳින්වීම -**

විද්‍යාත්මක පර්යේෂණයක් කිරීමේ දී පර්යේෂණ විධික්‍රම උපයෝගී කර ගත යුතු ය. විද්‍යාත්මක විෂයයක පදනම (Knowledge) දැනුම ය. එම දැනුම නිර්මාණය කර ගැනීමේ දී විද්‍යාත්මක ක්‍රමවේදය (SCIENTIFIC METHODOLOGY) අනුගමනය කිරීම විද්‍යාවන්හි විශේෂ ලක්ෂණයකි. ඒ අනුව "තාර්කික විධික්‍රම මත පදනම් වන සමාජ සංසිද්ධි විග්‍රහ කිරීම විද්‍යාත්මක ක්‍රමය ලෙස සැලකිය හැකිය." මෙම විද්‍යාත්මක ක්‍රමය ගොඩනංවනු ලබන්නේ බුද්ධි ප්‍රබෝධයේ ආරම්භක සමය ලෙස සැලකෙන 17 සියවසේ සිටය. ශුද්ධ විද්‍යාවන්හි යොදා ගනු ලබන විද්‍යාත්මක ක්‍රමය පසු කාලයේ දී සමාජීය විද්‍යාවන්ට ද යොදා ගත හැකි බව තහවුරු විය.

1971 දී වොල්ටර් වොලස් (WALTER WALLACE) විද්‍යාත්මක චක්‍රයක් ඉදිරිපත් කරන ලදි. ඔහු විසින් THE LOGIC OF SCENCE IN SOCIOLOGY නම් කෘතියෙහි විද්‍යාත්මක චක්‍රය ක්‍රියාත්මක විය යුතු අවධි 4ක් දක්වා තිබේ. ඒ අනුව


01. න්‍යාය (THEORY)
02. උපන්‍යාස (HYPOTHESIS)
03. නිරීක්ෂණය (OBSERVATION)
04. ආනුභවික සාමාන්‍යකරණය (EMPIRICAL GENERALIZA TION)

යන කොටස් ය. සමාජ විද්‍යාත්මක පර්යේෂණයක් කිරීමේ දී අනුගමනය කළ යුතු ක්‍රම දෙකකි. එනම්.

I උද්ගාමී තර්කනය (INDUCTIVE LOGIC)

II නිගාමී තර්කනය (DEDUCTIVE LOGIC)

**උද්ගාමී තර්කන ක්‍රමය**




16 වන සියවස වන විට යුරෝපයේ දාර්ශනිකයන් අතර ප්‍රචලිතව පැවැති තර්කන ක්‍රමය වූයේ උද්ගාමී තර්කනය යි. එය ඇරිස්ටොටල් විසින් නිර්මාණය කරන ලද්දකි. උද්ගාමී තර්කනය පිය වර තුනක් (3) යටතේ ගැටලු විග්‍රහ කරයි.

- ★ සියලු මිනිස්සු මැරෙන සුළුය
  (ප්‍රධාන ප්‍රමේය)
- ★ සොක්‍රටීස් ද මිනිසෙකි
  (අප්‍රධාන ප්‍රමේය)
- ★ එබැවින් සොක්‍රටීස් මැරෙන සුළුය
  (නිගමනය)

විද්‍යාත්මක ක්‍රමය ශුද්ධ විද්‍යාවට යොදාගත හැකි වුවත් සමාජීය විද්‍යාවට යොදා ගැනීම ඉතා අසීරු කාර්යයක් ලෙස සලකනු ලැබී ය. ශුද්ධ විද්‍යාව දේවල් හා ද්‍රව්‍ය, පිළිබඳ අධ්‍යයනය කරන අතර සමාජීය විද්‍යා මිනිස් ක්‍රියාකාරකම් පිළිබඳ අධ්‍යයනය කරනු ලැබේ. කෙසේ වුව ද පසු කාලය වන විට එමිල් ඩුර්කයිම්, මැක්ස් වේබර් වැනි සම්භාව්‍ය සමාජ විද්‍යාඥයින් සිය පර්යේෂණවලදී මෙම ක්‍රමවේදය සාර්ථක ලෙස යොද ගැනීමට සමත් විය. ඔගස්ට් කොම්ට්ගේ මතය වූයේ ද මෙම විද්‍යාත්මක ක්‍රමය සමාජ විද්‍යාත්මක පර්යේෂණ සඳහා සාර්ථක ලෙස යොද ගැනීමට කිසිදු බාධාවක් නොමැති බවයි. සියදිවි නසා ගැනීම පිළිබඳ අධ්‍යයනයේ දී එමිල් ඩුර්කයිම් ද ප්‍රොතෙස්තන්ත්‍ර ආචාර ධර්ම හා ධනවාදයේ සාරය පිළිබඳ අධ්‍යයනයේ දී මැක්ස් වේබර් ද මෙම විද්‍යාත්මක ක්‍රමය සාර්ථක ලෙස භාවිත කිරීම නිදසුන් වශයෙන් දැක්විය හැකි ය.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය**

- සාකච්ඡා ක්‍රමය
- කණ්ඩායම් ක්‍රමය
- ඉදිරිපත් කිරීම

**ආකල්ප හා ඇගයුම්**

1. පර්යේෂණයකින් ලබා ගන්නා තොරතුරු සමාජයේ ඉදිරි ප්‍රගමනයට හේතු වන අයුරු වටහා ගනියි.
2. සමාජ ගැටලු අධ්‍යයනය කිරීමේ දී විද්‍යාත්මක පර්යේෂණවල වැදගත්කම පැහැදිලි කරයි.

**ගුණාත්මක යෙදවුම්**

- පෑන්, පැන්සල්
- වෙනත් ලිපි ද්‍රව්‍යය

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්**

- විද්‍යාත්මක පර්යේෂණයක් යනු කුමක් ද යන්න සිසුන් හට පැහැදිලි කරන්න.
- විද්‍යාත්මක පර්යේෂණයකින් තොරතුරු ලබා ගැනීම සඳහා සිසුන් යොමු කරන්න.
- පර්යේෂණයක් කිරීමෙන් ලැබෙන ප්‍රයෝජන පිළිබඳ සිසුන්ගෙන් විමසන්න.
- පර්යේෂණවල අවශ්‍යතාව නූතන සමාජයට දැඩිව දැනෙන බව නිදසුනක් ඇසුරින් පහදන්න.
- ගැටලු අවම කිරීම සඳහා පර්යේෂණවල අවශ්‍යතාව පෙන්වා දෙන්න.

**ක්‍රියාකාරකම් සැලැස්ම**

| ක්‍රියාකාරකම | ක්‍රමවේදය |
|---|---|
| මර්ටන් **(MERTON)** ගේ නිර්වචනයට අනුව ගැටලුවක් විසඳා ගැනීමට පර්යේෂණ යොදා ගන්නා අයුරු සිසුන් සමග සාකච්ඡා කරන්න. | සාකච්ඡා ක්‍රමය |
| විද්‍යාත්මක පර්යේෂණයක දී විධිමත් සහ අවිධිමත් තොරතුරු ලබා ගන්නා අයුරු පිළිබඳව සිසුන් දැනුවත් කරන්න. | ඉදිරිපත් කිරීම් ක්‍රමය |
| ගැටලුවකට අදාළ තොරතුරු ලබා ගැනීම සඳහා සිසුන් (ක්‍රියාකාරකමක) යොදවන්න. (අසල්වැසි පංති කාමරය) | කණ්ඩායම් හෝ කේවල |
| සිසුන් ලවා පර්යේෂණ ආකෘති පත්‍රයක් සකස් කර වන්න. | කේවල හෝ කණ්ඩායම් |
| පර්යේෂණ කෘති කිහිපයක් පෙන්වන්න. | ඉදිරිපත් කිරීම්<br>ප්‍රදර්ශනය කිරීම් |

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක**

- පර්යේෂණයක් යනු කුමක් දැයි කෙටියෙන් පැහැදිලි කිරීම.
- විද්‍යාත්මක පර්යේෂණයක වැදගත්කම පැහැදිලි කිරීම.
- නිරීක්ෂණය මගින් දත්ත ලබා ගැනීමෙන් ලැබෙන ප්‍රයෝජන 5ක් ලිවීම.

**නිපුණතාව** - සමාජය අධ්‍යයනය කිරීම සඳහා යොදා ගනු ලබන විද්‍යාත්මක ප්‍රවේශය හඳුනා ගනියි.

**නිපුණතා මට්ටම** - 7.3 තොරතුරු රැස්කිරීමේ ක්‍රමයක් ලෙස නිරීක්ෂණය භාවිත කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව - 2**

**ඉගෙනුම් පල**

1. පර්යේෂණයක දී නිරීක්ෂණ ක්‍රියාවලියෙහි ඇති වැදගත්කම පෙන්වා දෙයි.
2. නිරීක්ෂණය නිර්වචන අනුසාරයෙන් පැහැදිලි කරයි. (BLAXTER : 2002)
3. නිරීක්ෂණ ක්‍රියාවලියේ පියවර පිළිවෙළින් පැහැදිලි කරයි.
4. නිරීක්ෂණය කරනු ලබන ක්ෂේත්‍රය පිළිබඳව අවධානය යොමු කිරීමේ ඇති වැදගත්කම පැහැදිලි කරයි.
5. නිරීක්ෂණ ක්‍රියාවලියේ දී අත්වන වාසි සහ අවාසිදායක තත්ත්වයන් ප්‍රකාශ කරයි.

**හැඳින්වීම** -

නිරීක්ෂණය යනු සාමාන්‍ය සමාජය ඇසුරු කිරීමෙන් හෝ ඒ දෙස විමසිලිමත් ලෙස බලා සිටිමින් අවශ්‍ය තොරතුරු රැස් කර ගැනීමයි. නිරීක්ෂණය මූලික වශයෙන් කොටස් 2කට බෙදේ.

1. සරල නිරීක්ෂණය
2. ගැඹුරු නිරීක්ෂණය යනුයි.

එමෙන් ම සහභාගී නිරීක්ෂණය, සහභාගී නොවන නිරීක්ෂණය යනුවෙන් එය යලි කොටස් දෙකකට බෙදේ. සහභාගී නිරීක්ෂණය බොහෝ විට ගැඹුරු නිරීක්ෂණය හා සමාන වේ. එමෙන් ම සහභාගී නොවන නිරීක්ෂණය සරල නිරීක්ෂණයට සමානයි. සම්මුඛ සාකච්ඡා හෝ ප්‍රශ්න මාලා ක්‍රම යටතේ මූලික වශයෙන් තොරතුරු රැස්කරනු ලබන අවස්ථාක දී වැඩිමනක් තොරතුරු ලබා ගැනීම සඳහා අවට වට පිටාව කෙටි කාලයක් තුළ නිරීක්ෂණය කිරීම සරල නිරීක්ෂණයයි. එහෙත් ගැඹුරු නැතහොත් සහභාගී නිරීක්ෂණයේ දී පර්යේෂකයා දිගු කාලයක් අධ්‍යයනයට ලක්කරන සමාජයෙහි පදිංචිව සිටිමින් දිවා රාත්‍රී දෙකෙහිම අදාළ තොරතුරු රැස් කරයි. මෙහි දී දෛනිකව සාමාන්‍ය ආකාරයට ගලා යන සමාජය දෙස විමසිලිමත්ව බලා සිටිනවා හැර පර්යේෂකයා විසින් කිසිදු බලපෑමක් නොකිරීම සුවිශේෂ කොන්දේසියක් වේ. මෙම ක්‍රමය යටතේ ඉතාමත් නිවැරදි හා ගැඹුරින් තොරතුරු රැස් කර ගැනීමට හැකි බව තහවුරු වී ඇත. බී. මැලිනොවුස්කි සිය ට්‍රෝබ්‍රියන්ඩ් අධ්‍යයනයේ දී ද වික්ටෝරියා බේකර් සිය සුදු වතුර ආර අධ්‍යයනයේ දී ද සහභාගී නිරීක්ෂණ ක්‍රමය යොදා ගන්නා ලදී.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය**

- සාකච්ඡා ක්‍රමය
- කණ්ඩායම් කිරීම්
- ඉදිරිපත් කිරීම්

**ආකල්ප හා ඇගයුම්**

1. පර්යේෂණයක දී නිරීක්ෂණ ක්‍රියාවලියෙහි වැදගත්කම අගයයි.
2. පන්ති කාමරය නිරීක්ෂණය කර තොරතුරු රැස් කරයි.
3. දත්ත ලබා ගැනීමේ දී නිරීක්ෂණ ක්‍රමයේ ඇති වැදගත්කම හඳුනා ගනියි.

**ගුණාත්මක යෙදවුම්**

- පෑන්, පැන්සල්
- වෙනත් ලිපි ද්‍රව්‍යය
- පර්යේෂණ කෘති

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්**

- දත්ත ලබා ගැනීමේ ක්‍රියාවලියේ දී නිරීක්ෂණ ක්‍රමයේ ඇති වැදගත්කම පැහැදිලි කර දෙන්න.
- නිරීක්ෂණ ක්‍රියාවලියේ ස්වභාවය පිළිබඳව උදාහරණ සහිතව පැහැදිලි කරන්න.
- නිරීක්ෂණ ක්‍රියාවලියෙහි දී සැළකිය යුතු කරුණු පැහැදිලි කරන්න.
- නිරීක්ෂණ ප්‍රභේද වෙන වෙනම උදාහරණ සහිතව පැහැදිලි කරන්න.
- දෛනික ජීවිතයේ දී නිරීක්ෂණය පර්යේෂණ ක්‍රමයක් ලෙස වැදගත් වන අයුරු සිසුන්ට පැහැදිලි කරන්න.
- නිරීක්ෂණ ක්‍රියාවලියේ දී ලබා ගත හැකි ජීවිත පරිඥානය පිළිබඳව සිසුන්ට උදාහරණ සහිතව පෙන්වන්න.
- සත්‍යය තත්ත්ව හෙළිදරව් කර ගැනීමට නම් නිරීක්ෂණ ක්‍රමය වැදගත් වෙන අයුරු සිසුනට වටහා දෙන්න.

**ක්‍රියාකාරි සැලැස්ම**

| ක්‍රියාකාරකම | ක්‍රමවේදය |
|---|---|
| පර්යේෂණ සඳහා නිරීක්ෂණ ක්‍රමය වැදගත් වෙන අයුරු වටහා දෙන්න. | සාකච්ඡා ක්‍රමය |
| නිරීක්ෂණ ක්‍රියාවලියෙහි පියවර උදාහරණ සහිතව පැහැදිලි කර දෙන්න. | ප්‍රදර්ශන ක්‍රමය |
| සිසුන්ට නිරීක්ෂණ ක්‍රමය ඇසුරින් පර්යේෂණයක් කරන අයුරු ප්‍රායෝගිකව ක්‍රියාකාරකම්වල යෙදීමෙන් ඉගෙනීමට අවස්ථාව සලසන්න. | කණ්ඩායම් හෝ කේවල වශයෙන් |
| නිරීක්ෂණයේ දී සැලකිය යුතු කාරණා ප්‍රායෝගික ක්‍රියාකාරකමේ යෙදෙන අතරතුරම ඉදිරිපත් කිරීමට සිසුන්ට අවස්ථාව දෙන්න. | ඉදිරිපත් කිරීම |
| හැකිනම් පමණක් පර්යේෂණ කර සාර්ථකව නිම කරන ලද ග්‍රන්ථ කිහිපයක් දක ගැනීමට අවස්ථාව සලසා දෙන්න.<br>උදා:- මහාචාර්ය නන්දසේන රත්නපාලගේ<br>ශ්‍රී ලංකාවේ යාචකයා<br>ශ්‍රී ලංකාවේ ගණිකාවෝ<br>මනුෂ්‍ය ප්‍රේතයන් සමග කළ දුෂ්කර ක්‍රියාවක් | ප්‍රදර්ශන ක්‍රමය හෝ ඉදිරිපත් කිරීම් ක්‍රම මගින් |

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක**

- උගත් නිර්වචනයක් ඇසුරින් නිරීක්ෂණ ක්‍රමය යනු කුමක් දැයි පැහැදිලි කිරීම
- සාර්ථක නිරීක්ෂණයක් කිරීමට අනුගමනය කළ යුතු පියවර පැහැදිලි කිරීම
- නිරීක්ෂණ ක්‍රමය මගින් තොරතුරු ලබා ගැනීමේ දී සැලකිය යුතු ගුණාංග විස්තර කිරීම
- නිරීක්ෂණ ක්‍රමයේ වාසි සහ අවාසි 03 බැගින් ඉදිරිපත් කිරීම

**නිපුණතාව** - සමාජය අධ්‍යයනය කිරීම සඳහා යොද ගනු ලබන විද්‍යාත්මක ප්‍රවේශය හඳුනා ගනියි.

**නිපුණතා මට්ටම** - 7.4 සම්මුඛ සාකච්ඡාව තොරතුරු රැස් කිරීමේ ක්‍රමයක් ලෙස යොදා ගනියි.

**කාලච්ඡේද සංඛ්‍යාව - 2**

**ඉගෙනුම් පල**

1. තොරතුරු ලබා ගැනීමේ දී සම්මුඛ සාකච්ඡා ක්‍රමයේ ඇති වැදගත්කම ප්‍රකාශ කරයි.
2. සම්මුඛ සාකච්ඡා ක්‍රමයේ පියවර උදාහරණ සහිතව පෙන්වා දෙයි.
3. සම්මුඛ සාකච්ඡා ක්‍රමයේ වාසි සහ අවාසි උදාහරණ සහිතව ප්‍රකාශ කරයි.
4. පර්යේෂණ අවස්ථාවක දී නිවැරදි ලෙස සම්මුඛ සාකච්ඡාවක යෙදේ.

හැඳින්වීම -

සම්මුඛ සාකච්ඡා ක්‍රමය යොද ගෙන තොරතුරු රැස් කිරීම ආරම්භ කිරීමට දත්ත දයකයා හෝ කණ්ඩායම සමග මනා සම්බන්ධතාවක් ගොඩ නගා ගත යුතු ය. පර්යේෂකයා පිළිබඳ විශ්වාසය තරවුරු වන තරමට වඩාත් නිවැරදි දත්ත ලබා ගැනීමට හැකි වේ.

ප්‍රමාණාත්මක දත්ත මෙන්ම ගුණාත්මක දත්ත ලබා ගැනීම සඳහා සම්මුඛ සාකච්ඡා ශිල්ප ක්‍රමය යොදා ගනියි. දත්තදායකයින් මුණගැසී පර්යේෂකයා සහ දත්තදායකයා අතර කෙරෙන සාකච්ඡාව ඇසුරින් දත්ත රැස් කිරීම මෙහි මූලික කාර්යයයි. දත්තදායකයින් තනි පුද්ගලයන් වශයෙන් මුණ ගැසීම මෙන්ම කණ්ඩායම් වශයෙන් මුණගැසී සාකච්ඡා පැවැත්වීමට ද මෙහිදී ඉඩකඩ තිබේ.

ප්‍රමාණාත්මක දත්ත ලබා ගැනීමේ අපේක්ෂාවෙන් වුව ද සම්මුඛ සාකච්ඡා ශිල්ප ක්‍රමය භාවිත කරන්නේ නම් වඩාත් සාර්ථක ලෙස එය ඉටුකර ගැනීමට පර්යේෂකයාට හැකි වේ. අවශ්‍ය පරිදි පර්යේෂකයාට ඕනෑම දිශාවකට සාකච්ඡාව යොමු කරමින් වඩාත් ඵලදායි ලෙස දත්ත හෙවත් තොරතුරු රැස්කර ගැනීමට නිදහසක් ඇත. එය මෙම ක්‍රමයේ ඇති විශේෂතම ලක්ෂණය යි.

දත්තදායකයාගේ ඉරියව් නිරීක්ෂණය කිරීමට ද මෙහිදී පර්යේෂකයාට අවස්ථාව සැලසී ඇත. ඒ අනුව දත්තදායකයා යම් දෙයක් සඟවන්නේ යැයි හැඟී ගිය හොත් හරස් ප්‍රශ්න අසමින් ඒ සියල්ල හෙළිදරව් කර ගැනීමට දක්ෂ පර්යේෂකයෙකු හට හැකියාව ඇත. මේ අනුව අනපේක්ෂිත තොරතුරු මෙන්ම අපේක්ෂා නොකළ එහෙත් පර්යේෂණයට ඉතා වැදගත් වැඩිමනත් තොරතුරු ද මෙම ක්‍රමය යටතේ රැස්කර ගැනීමට හැකි වේ.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය**

- සාකච්ඡා ක්‍රමය
- කාණ්ඩායම් ක්‍රමය
- ඉදිරිපත් කිරීම්

**ආකල්ප හා ඇගයුම්**

1. පර්යේෂණ ක්ෂේත්‍රයට යෝග්‍ය වෙන අයුරින් සම්මුඛ සාකච්ඡා ක්‍රමයට යොමු වේ.
2. වඩාත් සාර්ථක තොරතුරු ලබා ගැනීම සඳහා සම්මුඛ සාකච්ඡා ක්‍රමය භාවිත කිරීමේ වැදගත්කම වටහා ගනියි.

**ගුණාත්මක යෙදවුම්**

- පෑන්, පැන්සල්, ලිපි ද්‍රව්‍ය
- නිර්මාණාත්මක පුවරු

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්**

- දත්ත රැස්කිරීමේ ක්‍රමයක් ලෙස සම්මුඛ සාකච්ඡාවෙහි වැදගත්කම පෙන්වා දෙන්න.
- සම්මුඛ සාකච්ඡාවක් කරන අයුරු ප්‍රායෝගිකව අත්දැකීම් මගින් ලබා ගැනීමට යොමු කරන්න.
- සම්මුඛ සාකච්ඡා ක්‍රමයේ ඇතිවිය හැකි බාධක මෙන්ම තර්ජන පිළිබඳව ද සිසුන්ට අවබෝධය ඇති කරවන්න.
- සම්මුඛ සාකච්ඡාවක ප්‍රභේද උදහරණ සහිතව සිසුන්ට හඳුනා ගැනීමට අවස්ථාව සලසන්න.
- සම්මුඛ සාකච්ඡා ක්‍රමයේ ඇති වාසි සහ අවාසි පිළිබඳ සිසුන් සාකච්ඡාවක යොදවන්න.
- අසල්වැසි පංති කාමරයේ සිසුන් සමග සම්මුඛ සාකච්ඡාවක යොදවන්න. (විනාඩි කිහිපයක්)
- අන්තර් සබඳතා වර්ධනයට සම්මුඛ සාකච්ඡා ක්‍රමය වැදගත් වෙන අයුරු සිසුන්ට ප්‍රායෝගිකව පැහැදිලි කරවන්න.
- සම්මුඛ සාකච්ඡා කිරීමට යන ජන වර්ගය, ගෝත්‍රය ආගම්, කුල ආදිය පිළිබඳව පර්යේෂකයා සතුව තිබිය යුතු මනා අවබෝධය සිසුන්ට පහදා දෙන්න.
- සම්මුඛ සාකච්ඡාවකට සුදුසු ස්ථාන, වේලාවන් වෙන් කරවා ගැනීම පිළිබඳ සිසුන්ට අවබෝධයක් ලබා දිය යුතු ය. පහදා දෙන්න.


**ක්‍රියාකාරී සැලැස්ම**

| ක්‍රියාකාරකම | ක්‍රමවේදය |
|---|---|
| සම්මුඛ සාකච්ඡාවක් යනු කුමක් ද? යන්න නිර්වචන අනුසාරයෙන් පැහැදිලි කරමින් පාඩමට ප්‍රවේශ වන්න. | සාකච්ඡා ක්‍රමය |
| සම්මුඛ සාකච්ඡාවක පියවර පුවරු මත ලියා හෝ ලියමින් සිසුන්ට අවබෝධ කර ගැනීමට පෙන්වන්න. | ඉදිරිපත් කිරීම |
| දත්තදායකයෙකුගෙන් තොරතුරු ලබා ගැනීමේ දී සැලකිය යුතු කරුණු පිළිබඳව අවබෝධය ලබා ගැනීමට සිසුන්ට මඟ පෙන්වන්න. | සාකච්ඡා ක්‍රමය |
| තොරතුරු ලබා ගැනීමට බලාපොරොත්තුවෙන ජන කණ්ඩායම, ආගම්, ජාති කුල මල ගෝත්‍ර පිළිබඳ පූර්ව අවබෝධය වැදගත් වේ. මේවා සිසුන්ට හඳුනා ගැනීමට මඟ පෙන්වන්න. | සාකච්ඡා කිරීම |
| සම්මුඛ සාකච්ඡා කිරීමට සුදුසු ස්ථාන, වේලාවන් සහ ඇසිය යුතු ප්‍රශ්ණ පිළිබඳ සිසුන්ට අවබෝධය ලබා ගැනීමට අවස්ථාව සලසන්න. | කණ්ඩායම් හෝ කේවල ක්‍රමය |

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක**

- සම්මුඛ සාකච්ඡාවක් යනු කුමක් දැයි නිර්වචන අනුසාරයෙන් පැහැදිලි කිරීම
- සම්මුඛ සාකච්ඡාවක දී අනුගමනය කරන පියවර පැහැදිලි කිරීම
- සම්මුඛ සාකච්ඡාවක් කිරීමෙන් ලැබෙන වාසි 5ක් සහ අවාසි 5ක් ලිවීම
- සම්මුඛ සාකච්ඡාවක දී යොද ගනු ලබන ආකෘති පත්‍රයක් සකස් කිරීම
  (ගුරුවරයාගේ සහය ඇතිව)

**ඇමුණුම 01**


සම්මුඛ සාකච්ඡා ක්‍රමය
සාමාජිකයා
ව්‍යුහගත සම්මුඛ සාකච්ඡා
අර්ධ ව්‍යුහගත සම්මුඛ සාකච්ඡා
ව්‍යුහගත නොවන සම්මුඛ සාකච්ඡා
පුද්ගල කේන්ද්‍රීය සම්මුඛ සාකච්ඡා
ඉලක්ක කණ්ඩායම් සම්මුඛ සාකච්ඡා
වස්තු ද්‍රව්‍ය මුල් කරගත් සම්මුඛ සාකච්ඡා
තොරතුරු
නිරවද්‍යතාව
සාවද්‍යතාව
නිගමන
ප්‍රතිපල

කියවන්න මේ පොත්


1. රත්නපාල නන්දසේන "(2012) සමාජ විද්‍යා පර්යේෂණ මූල ධර්ම, ආර්ය ප්‍රකාශකයෝ, වර්තා පොත
2. අමරසේකර දයා "(1995) සරල සමාජ විද්‍යාව, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, මරදාන, කොළඹ 10
3. කුමාර හේමන්ත එන්. වී. ජී. ඒ. (2015) සමාජ විද්‍යාව ප්‍රවේශය, රුහුණු අධ්‍යයන කවය, මාතර
4. උයන්ගොඩ ජයදේව (2011) "සමාජීය විද්‍යා පර්යේෂණ යෝජනාවලියක් ලිවීම න්‍යායික හා ප්‍රයෝගික මඟ පෙන්වීමත්, සමාජ විද්‍යාඥයින්ගේ සංගමය, කොළඹ
5. බණ්ඩාර ඩී. එම්. එස්. ඩී. (2015) සමාජ ගවේෂි - ශාස්ත්‍රීය සංග්‍රහය ඇස්. ගොඩගේ සහ සහෝදරයේ, මරදාන, කොළඹ 10
6. බණ්ඩාර ඩී. එම්. එස්. ඩී. (2014) අපරාධ සමීක්ෂා - ශාස්ත්‍රීය සංග්‍රහය ඇස්. ගොඩගේ සහ සහෝදරයේ, මරදාන, කොළඹ 10
7. විජේවර්ධන නිරංජි, බණ්ඩාර ඩී. එම්. එස්. ඩී. (2016) සමාජීය විද්‍යා මූලධර්ම ඇස්. ගොඩගේ සහ සහෝදරයේ, මරදාන, කොළඹ 10
8. විනීත හිමි ඩී. බණ්ඩාර ඩී. එම්. එස්. ඩී. (2018) මූලික සමාජ විද්‍යා, සහස්‍ර ප්‍රකාශකයෝ කොළඹ 10